සැම සුරැකි සාමකාමී දේශයක්

பாதுகாப்பானதும் அமைதியானதுமான நாடொன்றுக்காக

**For a Secured & Peaceful Country**

# කාර්යසාධන වාර්තාව

# முன்னேற்ற அறிக்கை

# Performance Report 2018



**ආරක්ෂක අමාත්‍යාංශය**

பாதுகாப்பு அமைச்சு

Ministry of Defence

# කාර්යසාධන වාර්තාව
# 2018

## ආරක්ෂක අමාත්‍යාංශය

15/5, බාලදක්ෂ මාවත,
කොළඹ -03

# පටුන


| | පිටු අංකය |
|---|---|
| ගරු ආරක්ෂක අමාත්‍යතුමාගේ පණිවුඩය | i |
| ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | ii |
| ආරක්ෂක ලේකම්තුමාගේ පණිවුඩය | iii |
| ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය | iv |
| අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | v |
| අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් | vi |
| අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | vii |
| **අමාත්‍යාංශයේ අංශයන්හි ප්‍රගතිය** | |
| 1. ආරක්ෂක අංශය | 1-2 |
| 2. තාක්ෂණික අංශය | 3-9 |
| 3. පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය | 10-11 |
| 4. පරිපාලන අංශය | 12-14 |
| 5. සිවිල් ආරක්ෂක සහ සංවර්ධන අංශය | 15-16 |
| 6. මුදල් අංශය | 17-20 |
| 7. ප්‍රතිපත්ති හා සැලසුම් අංශය | 21 |
| 8. අභ්‍යන්තර විගණන අංශය | 22 |
| 9. නීතිය හා සාමය අංශය | 23-28 |
| 10. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය | 29-34 |
| 11. හමුදා සම්බන්ධතා කාර්යාලය | 35-38 |
| 12. ජාත්‍යන්තර සබඳතා අංශය | 39-40 |
| 13. මාධ්‍ය කේන්ද්‍රය | 41-42 |
| **අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය** | |
| 14. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 43-48 |
| 15. රාජ්‍ය බුද්ධි සේවය | 49 |
| 16. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය | 50 |
| 17. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය | 51-55 |
| 18. සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | 56-58 |
| **ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වූ ආයතනයන්හි ප්‍රගතිය** | |
| 19. ජාතික ශිෂ්‍යභට බලකාය | 59-63 |
| 20. රණවිරු සේවා අධිකාරිය | 64-66 |
| 21. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | 67-75 |
| 22. ආරක්ෂක සේවා විද්‍යාලය | 76-77 |

# ගරු ආරක්ෂක අමාත්‍යතුමන්ගේ පණිවුඩය



ජාතික ආරක්ෂාව යනු කිසිදු ලෙසකින් දෙවැනි කොට සැලකිය නොහැකිය ඉතා භාරධූර කාර්යයකි. අප හමුවේ ඇති අභියෝග මෙන්ම අප ඉදිරියේ විද්‍යමාන නොවන අන්තරායන් ද පෙරතියා හඳුනාගෙන, ඒවා මගින් මෙරට ස්ථාවරත්වය සහ ජනජීවිතයට අහිතකර බලපෑම් එල්ලකිරීමට පෙර ඒවා නිෂ්ක්‍රීය කර දැමීම, 'සැම සුරැකි සාමකාමී දේශයක්' ගොඩනැගීමේ පදනමයි.

සාමය, සංහිඳියාව මෙන්ම සංවර්ධනය ද ළඟා කර ගත හැක්කේ ජාතික ආරක්ෂාව සහ නීතිය හා සාමය තහවුරු කිරීමෙන් පමණක් බව දශක තුනක් තිස්සේ දිග්ගැස්සුණු සන්නද්ධ අරගලයක් සාර්ථකව අවසන් කළ ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය මනාව අවබෝධ කරගෙන සිටීම සතුටට කරුණකි. මෙවන් සන්දර්භයක් තුළ, ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය මෙන්ම රටේ සංවර්ධනයට ද සුවිශාල දායකත්වයක් ලබා දෙන ආරක්ෂක අමාත්‍යාංශයේ 2018 වර්ෂය සඳහා වන කාර්ය සාධන වාර්තාවට පණිවිඩයක් ලබා දෙනුයේ ඉමහත් සතුටිනි.

මෙම 2018 වර්ෂව තුළ දී, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඉතා වැදගත් පියවර කිහිපයක් තැබීමට අමාත්‍යාංශයට හැකිවී තිබේ.ඒවා අතර, ආරක්ෂක සහයෝගිතාව වර්ධනය කර ගැනීම, ආරක්ෂක මෙවලම් අත්පත්කර ගැනීම, හමුදාවන්ගේ සූදානම වර්ධනය සඳහා නව ක්‍රමෝපාය දියත් කිරීම ඇතුළු බොහෝ පියවර ඇත. එමෙන්ම , මේ රටට ඉතා හානිකර ලෙස ක්‍රියාත්මක වෙමින් තිබූ නීති විරෝධී මත්ද්‍රව්‍ය උවදුරින් රට මුදා ගැනීම සඳහා තරාතිරම නොබලා කටයුතු කරමින්, මත් ද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක් සහ විශාල ජාවාරම්කරුවන් සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමට හැකිවීම පිළිබඳව මෙම ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පතිතුමා ඇතුළු සමස්ත ආරක්ෂක අංශ වෙත ස්තූතිය පිරිනමමි.

අපගේ දේශයේ සමස්ත ආරක්ෂාව තහවුරු කරමින්, ශ්‍රී ලංකාව සියලු ජනවර්ගයන්ට සහ ආගමික ලබ්ධිකයන්ට සාමයෙන් සහ සතුටින් ජීවත් විය හැකි බව තහවුරු කිරීම සඳහා ගරු රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු සියලු ආරක්ෂක නිලධාරීන් සිදුකරන සුවිශේෂී කාර්යභාරයට ස්තූතිවන්ත වෙමින්, ශ්‍රී ලංකාද්වීපයේ ආරක්ෂාව කිසිදු ලෙසකින් අභියෝගයට ලක් නොවන බව තහවුරු කිරීම පිණිස ආරක්ෂක අමාත්‍යාංශය කැපවී සිටින බව සතුටින් දන්වා සිටිමි.

මෛත්‍රීපාල සිරිසේන
ආරක්ෂක අමාත්‍ය

# ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



ආරක්ෂක අමාත්‍යතුමන් ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ නිබඳ මඟපෙන්වීම හා උපදෙස් ඇතිව අප මාතෘභූමිය තුල සාමය සහ සහජීවනය ගොඩනගමින් සංවර්ධන මාවතක් වෙත රට අධිෂ්ඨානශීලිව ගමන් ගන්නා මොහොතක ජාතික ආරක්ෂාව පිළිබඳව වඩාත් සැලකිලිමත්ව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය තමන්ට පැවරී ඇති වගකීම මැනවින් වටහා ගනිමින් කටයුතු කිරීම පැසසිය යුතුය.

ආරක්ෂක  රාජ්‍ය අමාත්‍යාංශය ගෙවීගිය සිව් වසරක කාලය තුල රණවිරුවන් ගේ සුභසාධනය වෙනුවෙන් ඔවුන් දිරිගන්වමින් නිර්මාණශීලි වැඩසටහන් රැසක් ආරම්භ කරන ලදි. ඒවා අතරින් 'විරුසර වරප්‍රසාද' වැඩපිළිවෙල,'විරුසුමිතුරු' නිවාස වැඩසටහන,'කණිෂ්ට ශිෂ්‍යභට' වැඩසටහන, විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් නීල හරිත ආර්ථිකයක් සඳහා වූ 'කෘෂිකාර්මික ස්වයං රැකියා' වැඩසටහන ආදිය සැබෑ රණවිරු සුබසාධනය අපේක්ෂාවෙන් දියත් කළ අතර, එම වැඩසටහන්  ඉදිරියේදී තවදුරටත් ශක්තිමත්  වනු ඇත.

කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාල ලබමින් සිටින ඉහළ ප්‍රගතියද බටලන්ද අණ හා මාණ්ඩලික විද්‍යාලය ජාත්‍යන්තර වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ලබන ඉහළ ප්‍රගතියත් තවදුරටත් වර්ධනය කළ යුතුය.

අප අමාත්‍යාංශය යටතේ ඇති ආයතන පසුගිය කාලය පුරා සිදුකළ කාර්යභාර්යය ජනතාව අතරේ සන්නිවේදනය කිරීමට සිව් වසරක සංවර්ධන ප්‍රගතිය කෘතියක් ලෙස සම්පාදනය කිරීමට කැපවූ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සුනිල් සමරවීර මහතා ඇතුලු අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් ඇතුලු කාර්ය මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

රුවන් විජයවර්ධන
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

# ආරක්ෂක ලේකම්තුමාගේ පණිවුඩය



''සැම සුරැකි සාමකාමී දේශයක්'' යන ආරක්ෂක අමාත්‍යාංශයේ දැක්ම පෙරදැරිව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස 2018 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය විමර්ශනය කරනු ලබන 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට සුබ පැතුම් එක් කරනුයේ හදපිරි සතුටිනි.

ත්‍රිවිධ හමුදාව, පොලිසිය ඇතුළු අමාත්‍යාංශයට අනුබද්ධ අනෙකුත් ආයතන මෙන්ම ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනයන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස හා මහජන ආරක්ෂාව හා සාමය සුරැකීම පිණිස මෙහෙයවීම ආරක්ෂක අමාත්‍යාංශයේ වගකීමයි. භෞමික අඛණ්ඩතාවයෙන් යුත් ස්වෛරී රටක්, තරගකාරී ආර්ථිකයක් සහ උසස් ජීවන තත්ත්වයක් තහවුරු කිරීම සඳහා උපායමාර්ගික සැළසුම් හා ප්‍රතිපත්ති සකස් කරමින් හා ක්‍රියාවට නංවමින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීමෙහිලා ආරක්ෂක අමාත්‍යංශය මඟින් 2018 වර්ෂය තුළ ඉටු කරනු ලැබූ මෙහෙය සුවිශේෂී වේ.

විශේෂයෙන් ත්‍රිවිධ හමුදාව, වෙරළ ආරක්ෂක බලකාය හා සිවිල් ආරක්ෂක බලකාය ගොඩබිම හා මුහුද වටා ආරක්ෂක පවුරක් මෙන් මව්බිම සුරැකීමෙහිලා කැපවීමෙන් කටයුතු කරන අතර විවිධ වැඩසටහන් හරහා ඔවුන් දැනුමින් සන්නද්ධ කරමින් ද ධාරිතා සංවර්ධනය හරහා හැකියාවෙන් පිරිපුන් කරමින්ද පාදක ව්‍යුහමය පහසුකම් නවීකරණය කරමින් හා නව පහසුකම් ඇති කරමින් සිය රාජකාරී ඉටු කිරීමට අවැසි පරිසරය නිර්මාණය කරමින්ද අමාත්‍යාංශය සිය වගකීම් නොපිරිහෙලා ඉටු කර ඇති ජාතික ආරක්ෂාව කෙරෙහි අභ්‍යන්තරිකව හා බාහිරව එල්ල වූ ගැටළු මනාව කළමනාකරණය කරමින් දූරදර්ශීව හා උපක්‍රමශීලීව ජාතික ආරක්ෂාව තහවුරු කිරීමටත් මහජන සාමය ආරක්ෂා කිරීමටත් ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරමින් රටවල් අතර සුහදතාවය වර්ධනය කිරීමටත් අමාත්‍යාංශය කැපවීමෙන් කටයුතු කරන ලදී.

එමෙන්ම, යුද්ධයේදී ජීවිත අහිමි වූ මෙන්ම ආබාධිත වූ රණවිරුවන් හා ඔවුන්ගේ පවුල් සඳහා විවිධ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ජීවන තත්ත්වය නඟා සිටුවීමටද ආරක්ෂක හමුදාව භාරයේ තිබූ පුද්ගලික, රජයේ හා විවිධ රජයේ ආයතනවලට අයත් ඉඩම් නිදහස් කරමින් රටේ සංවර්ධනය මෙන්ම සංහිඳියාව ඇති කිරීම සඳහා ද පියවර ගනු ලැබිණි.

තවදුරටත්, වත්මන් පරපුරට නිදහස්ව හා නිවහල්ව ජීවත්වීමටද, මතු පරපුර සඳහා තිරසාර සාමය ළඟාකර දීම උදෙසා ද කැපවීමෙන් හා ධෛර්යයෙන් යුතුව කටයුතු කිරීමට අමාත්‍යංශය හා අනුබද්ධ ආයතනයන්හි නිළධාරීන්ට හා කාර්ය මණ්ඩලයට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ජෙනරාල් එස්.එච්.එස් කෝට්ටේගොඩ(විශ්‍රා)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ආරක්ෂක ලේකම්

# ආරක්ෂක රාජ්‍ය ලේකම්තුමාගේ පණිවුඩය



තිරසර සංවර්ධන ඉලක්ක හඹායමින් දැවැන්ත සංවර්ධන ගමනක නියැලෙන මව් රටට ශක්තියක් වෙමින් සාර්ථක ව්‍යාපෘති රැසක ප්‍රතිලාභ ජනගතකළ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ගෙවුනු වසර පසුවිපරම් කෙරෙන කාර්ය සාධනය 2018 ග්‍රන්ථයට සුභපැතුම් එක්කරන්නේ ඉමහත් සතුටිනි.

රටට සාමය දිනාදුන් රණවිරු පවුල් සුරක්ෂා කරමින්ද, රටේ අනාගත පරපුර අධ්‍යාපනයෙන් සන්නද්ධ කරමින්ද, වරෙක රටට අවශ්‍ය අනාගත නායකයින් තැනීමෙහි පුරෝගාමියා වෙමින්ද, තවත් වරෙක ආරක්ෂක අංශවල දෙස් - විදෙස් නිළධාරීන් පශ්චාත් උපාධිධරයින් ලෙස අභිසෙස් ගන්වමින්ද ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ස්වකීය අනුබද්ධ සිවි ආයතනයන් සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව සිය වගකීම් නොපිරිහෙළා ඉටුකරමිනි සිටියි.

විශ්‍රාමික රණවිරුවන් ආර්ථික ක්ෂේත්‍රයෙහිලා බල ගන්වන, වස විසෙන් තොර භෝග නිෂ්පාදනයට රණවිරුවන් යොමුකළ 'කෘෂි ව්‍යාපෘතිය' කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නවමු පෙරළියක් ඇති කළ එහි අවධානය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමුකරවීමෙහිලා සමත් සාර්ථක වැඩසටහනක් වීම අපිට අභිමනකි. දීප ව්‍යාප්ත වැඩසටහනක් ලෙසින් ක්‍රියාත්මක වූ මෙම විශ්‍රාමික රණවිරු කෘෂිකර්ම වැඩසටහන හරහා මේ වනවිට ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව දහස ඉක්මවයි. සණස සංවර්ධන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මූල්‍ය සහකරු ලෙස අත්වැල් බැඳ ගනිමින් ඒ හරහා විශාල පිරිසකට කෘෂි ණය ආධාර ලබාදීමට හැකිවීම අප ලද භාග්‍යයකි. ගෙවුනු වසර තුළ පමණක් නියමු කෘෂිකාර්මික පුහුණු වැඩසටහන් 10 ක් පමණ සාර්ථකව අවසන් කළ අපි බීජ පැළ, මීමැසි පෙට්ටි ප්‍රදානය කරමින් විරු ගොවීන් දිරිමත් කළෙමු.

නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව දියත්කළ 'විරු සුමිතුරු' නිවාස ව්‍යාපෘතියෙන් ගෙවුනු වසර තුළ රණවිරු පවුල් රැසකට හිසට සෙවණක් ලැබිණි. 2018 වසරේ පූර්ණ නිවාස 186 ක් හා අර්ධ නිවාස 52 ක් වැඩ අවසන් කර ඇති අතර තවත් පූර්ණ නිවාස 106 හා අර්ධ නිවාස 1154ක් ඉදිකෙරෙමින් පවතී.

මව්බිමේ සාමය වෙනුවෙන් උරදුන් රණවිරුවන්ට සමාජයේ මුල්තැන් දුන් 'විරුසර වරප්‍රසාද ' කාඩ්පත2018 වසර අවසන් වනවිට රණවිරු පවුල් 41,697 ක් වෙත සෙත සැළසීය. මෙම කාඩ්පත හරහා ආර්ථික, සමාජීය සෑම අංශයකින්ම ප්‍රතිලාභ රණවිරු පවුල් වෙත හිමිගැන්විණි.

මෙම ජයග්‍රහණයන් පසුපස සවියයක් වන ගරු ආරක්ෂක අමාත්‍යතුමා, ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක ලේකම්තුමා ප්‍රමුඛ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලයට සේම අනුබද්ධ සිවි ආයතනයන්හි ආයතන ප්‍රධානීන් හා එම කාර්ය මණ්ඩලවල ප්‍රශස්ත මෙහෙවර මෙහිලා කෘතවේදීව සිහිකරමි.

සුනිල් සමරවීර
ලේකම්
ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

# අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

"සැම සුරැකි සාමකාමී දේශයක් "

## මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත්

සුරක්ෂිත ස්වෛරී රටක්

තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම

සහ

ක්‍රියාවට නැංවීම

2015 ජනවාරි 18 දිනැති අංක 1897/15 හා 2015 නොවැම්බර් 23 දිනැති අංක 1942/8 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර ද්විත්වය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් පහත දැක්වේ.


## කාර්යය හා කර්තව්‍යයන්

- ★ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයන්ට සහ 11 වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
- ★ ආරක්ෂක සේවාවන්හි කාර්යයන් පහසුකරලීම තුළින් රටේ ආරක්ෂාව සැළසීම.
- ★ අභ්‍යන්තර ආරක්ෂාව පවත්වා ගෙන යාම
- ★ රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන්
- ★ ආගන්තුක හමුදාවන් හා සබඳතා
- ★ වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු
- ★ පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි
- ★ ප්‍රදීපාගාර නඩත්තුව (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාරය හැර)
- ★ ආරක්ෂක සේවයේ පුද්ගලයින් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබාදීම
- ★ ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය
- ★ පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු
- ★ ගලවා ගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම
- ★ 11 වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
- ★ 11 වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

## 11 වැනි තීරුව - අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාව

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
2. ශ්‍රී ලංකා නාවික හමුදාව
3. ශ්‍රී ලංකා ගුවන් හමුදාව
4. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
5. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
6. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
7. රණවිරු සේවා අධිකාරිය
8. ආරක්ෂක සේවා විද්‍යාලය
9. ජාතික ශිෂ්‍යභට බලකාය
10. ජාතික ආරක්ෂක අරමුදල
11. රාජ්‍ය රහස් තොරතුරු සේවය
12. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
13. රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ්
14. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය
15. ලංකා ලොජිස්ටික්ස් ලිමිටඩ්

# අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# අමාත්‍යාංශයේ අංශයන්හි කාර්යසාධනය

# 1. ආරක්ෂක අංශය

## 1.1. සමාලෝචනය

ත්‍රිවිධ හමුදාව සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතන වල ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය, සුභසාධන කටයුතු, සැපයුම් හා සේවා කටයුතු මෙන්ම එක්සත් ජාතීන්ගේ සාමසාධක කටයුතු, විදේශ තානාපති කාර්යාල සඳහා ආරක්ෂක පරිවාරක නිලධාරීන් පත් කිරීම ආදී කටයුතු ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණය කරමින් කරනු ලබන වෙනත් විවිධ සේවා සැපයීම් කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ආරක්ෂක අංශය වෙත පැවරී ඇති රාජකාරි කටයුතු පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ 03 යටතේ සිදු කරයි.

➢ මානව සම්පත් කළමනාකරණය (Human Resources Management)

ආරක්ෂක අංශයට පැවරී ඇති ප්‍රධාන රාජකාරි වන්නේ ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ හා වෙරළ ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීම්, උසස් කිරීම්, සේවයෙන් පහකිරීම, විශ්‍රාම ගැන්වීම්, පෞද්ගලික හා රාජකාරි, විදේශ නිවාඩු, සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීම ආදී ආයතනික කටයුතු වේ.

➢ මානව සම්පත් සංවර්ධනය (Human Resources Development)

ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට දේශීය, විදේශීය පුහුණු පාඨමාලා ලබාදීම, විදේශීය හමුදා සාමාජිකයන් හට මෙරට පුහුණු අවස්ථා ලබාදීම, දේශීය මෙන්ම විදේශීය වශයෙන් සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයන් යොමු කිරීමද එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නම් කර ඇති රටවලට යුධ නිරීක්ෂකයන් යැවීම, හට පිරිස් සහභාගී කරවීම, හට පිරිස් වලට අවශ්‍ය වන උපකරණ සහ බෙහෙත් ද්‍රව්‍ය ආදී පහසුකම් සැපයීමේ රාජකාරි ද මේ යටතේ සිදු වේ.

ඊට අමතරව, ත්‍රිවිධ හමුදා අයවලුන්හට පදක්කම් හා සන්ධාර පිරිනැමීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ ඉල්ලීම් හා දුක්ගැනවිලි සම්බන්ධව ක්‍රියා කිරීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට විශේෂ පදනම යටතේ විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමේ අවස්ථාවන් ලබාදීම, වන්දි මුදල් ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

➢ සාමාන්‍ය සේවා (General Services)

සාමාන්‍ය සේවා යටතේ, ත්‍රිවිධ හමුදා අයවලුන්ට පදක්කම් හා සන්ධාර පිරිනැමීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ ඉල්ලීම් හා දුක්ගැනවිලි සම්බන්ධව ක්‍රියා කිරීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට විශේෂ පදනම යටතේ විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමේ අවස්ථාවන් ලබාදීම. වන්දි මුදල් ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

## 1.2 2018 වර්ෂයේ කාර්යසාධනය

➢ මානව සම්පත් කළමනාකරණය (Human Resources Management)

ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ බඳවා ගැනීම්, උසස් කිරීම්, සේවයෙන් පහකිරීම ආදී ආයතනික කටයුතු, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු සහ ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයෙහි ආයතනික කටයුතු මේ යටතේ සිදු කරනු ලබයි.

| සන්නද්ධ හමුදාව | උසස් කිරීම් | විශ්‍රාම ගැන්වීම් | අධිකාරිගත කිරීම |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 203 | 326 | 175 |
| නාවික හමුදාව | 187 | 66 | 136 |
| ගුවන් හමුදාව | 84 | 124 | 111 |

1.1 වගුව : ත්‍රිවිධ හමුදාවන්හි උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම් , අධිකාරිගත කිරීම්

| සන්නද්ධ හමුදාව | පෞද්ගලික නිවාඩු | රාජකාරි නිවාඩු |
|---|---|---|
| යුද්ධ හමුදාව | 385 | 142 |
| නාවික හමුදාව | 171 | 83 |
| ගුවන් හමුදාව | 130 | 75 |

1.2 වගුව : විදේශ නිවාඩු (පෞද්ගලික හා රාජකාරි)

| සන්නද්ධ හමුදාව | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| යුද්ධ හමුදාව | 425 |
| නාවික හමුදාව | 265 |
| ගුවන් හමුදාව | 229 |
| සිවිල් නිලධාරීන් | 18 |
| එකතුව | 937 |

1.3 වගුව : තීරුබදු අනුග්‍රහය යටතේ සන්නද්ධ හමුදා නිලධාරීන් හට නිකුත් කර ඇති වාහන බලපත්‍ර

ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ ආයතනික කටයුතු

- කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමේ කටයුතු සිදුකිරීම
- ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතන පනත සකස් කිරීමේ කටයුතු සිදුකිරීම
- වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු කටයුතු
- වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ජාත්‍යන්තර ජපන් මිත්‍රත්ව පදනම යටතේ අක්වෙරළ මුර යාත්‍රා 2ක් ලබාගැනීම
- වෙරළාරක්ෂක පනත සඳහා සංශෝධන සිදුකිරීම

➢ මානව සම්පත් සංවර්ධනය (Human Resources Development)

ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට දේශීය, විදේශීය පුහුණු පාඨමාලා ලබාදීම, විදේශීය හමුදා සාමාජිකයන් හට මෙරට පුහුණු අවස්ථා ලබාදීම සහ දේශීය මෙන්ම විදේශීය වශයෙන් සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයන් යොමු කිරීමද මේ යටතේ සිදුකරනු ලබයි.

| රට | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | එකතුව |
|---|---|---|---|---|
| ඉන්දියාව | 146 | 136 | 109 | 391 |
| පකිස්තානය | 96 | 66 | 93 | 255 |
| බංගලාදේශය | 52 | - | 15 | 67 |
| නේපාලය | 04 | - | - | 04 |
| මැලේසියාව | 03 | - | - | 03 |
| චීනය | 41 | 27 | 17 | 85 |
| එකතුව | 342 | 229 | 234 | 805 |

1.4 වගුව : විදේශ රාජ්‍යයන් මගින් ප්‍රදානය කරන ලද පුහුණු පාඨමාලා

| රට | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| ඉන්දියාව | 02 | - | 01 |
| පකිස්තානය | 02 | 02 | 01 |
| බංගලාදේශය | 02 | 02 | 02 |
| චීනය | 04 | 03 | 01 |
| පිලිපීනය | - | 01 | - |
| ඉන්දුනීසියාව | 02 | - | - |
| එකතුව | 12 | 08 | 05 |

1.5 වගුව : ජාතික ආරක්ෂක පාඨමාලා

| රට | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| පාකිස්ථානය | 02 | - | 01 |
| බංගලාදේශය | 02 | 02 | 01 |
| නේපාලය | 02 | 02 | 02 |
| ඉන්දුනීසියාව | 04 | 03 | 01 |
| මැලේසියාව | - | 01 | - |
| ඉන්දියාව | 02 | - | - |
| එකතුව | 12 | 08 | 05 |

1.6 වගුව : මාණ්ඩලික පාඨමාලා

| පාඨමාලා වර්ගය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | වෙරළාරක්ෂක දෙපා. |
|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදයෙන් ලද පාඨමාලා | 45 | 34 | 26 | 06 |
| ලැයිස්තු ගත නොවන පාඨමාලා | 34 | 34 | 26 | 04 |
| එකතුව | 79 | 68 | 52 | 10 |

1.7 වගුව : ලැයිස්තුගත නොවන පාඨමාලා

### සම්මන්ත්‍රණ, වැඩමුළු හා සංචාර

විදේශ රටවලින් විදේශ සංචාර/වැඩමුළු හා සම්මන්ත්‍රණ අවස්ථා 114 ක් යුධ හමුදාව වෙනුවෙන් ද 42 ක් නාවික හමුදාව වෙනුවෙන් ද 78 ක් ගුවන් හමුදාව වෙනුවෙන් ද 13 ක් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ද ලබා දී ඇත.

### එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක හමුදා පුහුණු කටයුතු

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නම් කර ඇති රටවලට යුධ නිරීක්ෂකයන් යැවීම, භට පිරිස් සහභාගී කරවීම, භට පිරිස් වලට අවශ්‍ය වන උපකරණ, බෙහෙත් ද්‍රව්‍ය ආදිය එම රටවලට සැපයීමේ රාජකාරි කටයුතු මේ යටතේ සිදු වේ.

| විස්තරය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| නිලධාරීන් | 76 | 40 | 116 |
| සෙසු නිලධාරීන් | 374 | 178 | 552 |
| එකතුව | 450 | 218 | 668 |

1.8 වගුව : සාමසාධක රාජකාරි වෙනුවෙන් යොමු කර ඇති භට පිරිස් ප්‍රමාණය

- සාමාන්‍ය සේවා

ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ ඉල්ලීම්, දුක්ගැනවිලි සම්බන්ධව ක්‍රියා කිරීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට විශේෂ පදනම යටතේ විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමේ අවස්ථාවන් ලබාදීම හා වන්දි මුදල් ලබා දීම මෙහිදී සිදුවේ.

| වන්දි මුදල් හා දීමනා | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | එකතුව |
|---|---|---|---|---|
| මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන් වෙත වැටුප් හා දීමනා ගෙවීම | 50 | 18 | 5 | 73 |
| ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ අයවලුන් වෙත අවුරුදු 55 තෙක් වැටුප් හා දීමනා ගෙවීම | 831 | 17 | 3 | 851 |
| මියගිය රණවිරුවන්ගේ වැන්දඹුවන් නැවත විවාහ වීමේදී ලබා දෙන විශේෂ වන්දි මුදල | 33 | 2 | 1 | 36 |
| දරුවන්ගේ වයස අවුරුදු 26 දක්වා වැටුප් හා දීමනා ගෙවීම | 37 | - | - | 37 |
| ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී ඉඳුරාම ත්‍රස්තවාදී නොවන හේතු මත මියගිය හා ආබාධිත රණවිරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම | 483 | 158 | 94 | 735 |

1.9 වගුව : ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට වන්දි හා දීමනා ගෙවීම

### විශ්ව විද්‍යාල ප්‍රවේශ

විශ්ව විද්‍යාලවල 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් වෙනුවෙන් ලබා දී ඇති විශේෂ ප්‍රවේශය වෙනුවෙන් ලද අයදුම්පත් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමුකර ඇත.

| සන්නද්ධ හමුදාව | ඉංජිනේරු විෂය ධාරාව | වෛද්‍ය පාඨමාලා / දන්ත වෛද්‍ය විෂය ධාරාව |
|---|---|---|
| යුද්ධ හමුදාව | 10 | 19 |
| නාවික හමුදාව | - | 07 |
| ගුවන් හමුදාව | - | - |
| එකතුව | 10 | 26 |

1.10 වගුව : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කර ඇති අයදුම්පත්

### විවිධ ඉල්ලීම්

සන්නද්ධ හමුදා පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් සෘජුවම සහ ජනාධිපති ලේකම් කාර්යාලය, විවිධ මැති ඇමතිවරුන් පුද්ගලයින් හා ආයතන විසින් ආරක්ෂක අංශය වෙත යොමු කළ ලිපි සඳහා වාර්තා කැඳවා උපදෙස් ලබා දීම හා ඉදිරි කටයුතු සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම සිදු කර ඇත.

| සන්නද්ධ හමුදාව/ආයතන | ප්‍රමාණය |
|---|---|
| යුද්ධ හමුදාව | 852 |
| නාවික හමුදාව | 132 |
| ගුවන් හමුදාව | 91 |
| මහජන පෙත්සම් කාරක සභාව මගින් | 24 |
| ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ ලිපි | 05 |
| එකතුව | 1104 |

1.11 වගුව : විවිධ ඉල්ලීම්

### පදක්කම් හා සන්ධාර ප්‍රදානය

| පදක්කම් වර්ගය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| විදේශ සේවා පදක්කම | - | 5 | 111 |
| දීර්ඝ සේවා පදක්කම | 5291 | 2213 | 444 |
| දේශ පුත්‍ර පදක්කම | 10546 | - | 90 |
| ප්‍රශංසනීය සේවා පදක්කම | - | 12 | - |
| කාර්යක්ෂම සේවා පදක්කම | 16 | - | - |
| උත්තම සේවා පදක්කම | 3633 | 1242 | 471 |
| පූර්ණ භූමි පදක්කම | 12960 | - | - |
| උතුරු නැගෙනහිර සංග්‍රාම් පදක්කම | 9918 | - | - |
| එකතුව | 42364 | 3472 | 1116 |

1.12 වගුව : පදක්කම් හා සන්ධාර ප්‍රදානය කිරීම්

## 1.3 අනාගත අපේක්ෂා

- ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් ලබා ගැනීම.
- ලිපි ගොනු පරිලෝකනය කිරීමේ කටයුතු සිදු කිරීම. මගින්, ලිපිගොනු පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- තැපැල කළමනාකරණය කිරීම.


# 2. තාක්ෂණ අංශය

## 2.1 සමාලෝචනය

ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන සන්නිවේදන හා ඉංජිනේරු කටයුතු ද මහජනතාවට තම උපයෝජනයන් පරිහරණය කළ හැකි වන පරිදි ඒවා උපයෝගී කර ගැනීම හා සංවර්ධනය කිරීම සඳහා ඉවහල් වන්නා වූ ක්‍රමෝපායන් හෙවත් උපායමාර්ගයන් සකස් කිරීම ද ආරක්ෂක අමාත්‍යාංශීය තාක්ෂණ අංශය වෙත පැවරී ඇත. ගුවන් විදුලි සන්නිවේදනය, විදුලි සංදේශ සේවා, රූපවාහිනි විකාශන කටයුතු, දත්ත සන්නිවේදනය නිරීක්ෂණ සැපයීම සහ රටේ ජාතික ආරක්ෂාවට බලපාන්නා වූ සන්නිවේදන, නාවික සහ අවේක්ෂණ උපකරණ ආනයනය, ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අවශ්‍ය කරන අනුමැතිය ලබා දීම යන කාර්යයන් සන්නිවේදන විෂය පථයට අදාල වේ.

ජාතික ආරක්ෂාව තහවුරු කරන අතර රජය විසින් උපදෙස් ලබා දෙන පරිදි දිවයින පුරා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය සිවිල් සහ ක්ෂේත්‍ර ඉංජිනේරු සහාය සැලසීම ඉංජිනේරු විෂය පථයට අදාල කාර්යභාරයන් සේ දැක්විය හැකිය. තාක්ෂණ අංශය විසින් රේඛීය අමාත්‍යාංශ සහ ආයතනයන් සමඟ ජාතික ආරක්ෂාවට අදාල සන්නිවේදන සහ ඉංජිනේරුමය කාර්යයන් සම්බන්ධයෙන් සමායෝජන සහ සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරනු ලබයි. මේ වන විට තාක්ෂණික අංශය මගින් ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රධාන ව්‍යාපෘතීන් වන්නේ ආරක්ෂක මුලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතිය (DHQC) සහ උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල (SDCN) ව්‍යාපෘතියයි. ඊට අමතරව, පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (CRD) විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කිරීමද මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

## 2.2 2018 වර්ෂයේ කාර්යසාධනය





2.1 ප්‍රස්ථාරය: කුළුණු ඉදිකිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම

වසර 2018 දී තාක්ෂණ අංශය මගින් කුළුණු 129 ක් ඉදිකිරීම සඳහා සන්නිවේදන සේවා සැපයුම්කරුවනට අවශ්‍ය ආරක්ෂණ නිෂ්කාශන ලබාදෙන ලද අතර විද්‍යුත්/සන්නිවේදන උපයෝගයන් 104 ක විකුණුම් බලපත්‍ර සඳහාද ආරක්ෂණ නිෂ්කාශන ලබා දෙන ලදි.

- සන්නිවේදන සහ නාවුක උපකරණ, රථවාහන නිශ්චය කරගැනීමේ පද්ධති, බහුකාර්ය වර්ණ මුද්‍රණ යන්ත්‍ර, ඩ්‍රෝන (Quad Copter, Airplane, UAV) සහ වෘත්තීමය නොවන ගුවන් විදුලි බලපත්‍ර හිමියන්ට ගුවන් විදුලි උපකරණ (දේශිය/විදේශිය) සහ ජීපීඑස් ආනයනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දී ඇත.

- විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ එක්ව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ධීවර ට්‍රෝලර් යාත්‍රා 418 ක් සඳහා ගුවන් විදුලි සංඥා/සංඛ්‍යාත බෙදාදීම මත ආරක්ෂක නිෂ්කාශන ලබාදෙන ලදි.




2.2 ප්‍රස්ථාරය: කුළුණු ඉදිකිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දීම

### තාක්ෂණ අංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

➢ ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

1979 කොළඹ ප්‍රධාන සැළසුමට අනුව, වාණිජ සංවර්ධනය උදෙසා සඳහා ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් ඉඩම් විශාල සංඛ්‍යාවක් මුදාහැරීමට හැකි වන අයුරින් රජයේ කාර්යාල කොළඹ සිට නව පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත රැගෙන යාමට සැළසුම් කරන ලදී. සියලු ආරක්ෂක අංශ එක් ආරක්ෂක මූලස්ථාන සංකිර්ණයක් යටතට ගෙනයාම තුලින් මූලිකවම අපේක්ෂා කරනුයේ මේ වන විට ආයතන කිහිපයක් අතර බෙදී පවතින සම්පත් ඵලදායී අන්දමින් ප්‍රයෝජනයට ගැනීම, යටිතල පහසුකම් ද්විකරණය වීම අවම කිරීම, ඔවුන්ගේ මෙහෙයුම්/පරිපාලන/ප්‍රවර්ධන යන කාර්යයන්හි කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය වන පරිදි ආරක්ෂක අංශ සාමාජිකයන් වෙත නවීන පහසුකම් වලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් ලබාදීම සහ සංකේන්ද්‍රගත සංවර්ධන කලාපය තුළ පිහිටි අධි ආරක්ෂිත කලාප සංඛ්‍යාව අවම කිරීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සහ මහජනතාවට ඇතිවන අපහසුතාවන් අවම කිරීම යනාදිය වේ. 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙහි ඉදිකිරීම් කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී. ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීමේ පහසුව සහ මූල්‍යමය ශක්‍යතාව පිළිබඳ සළකා බැලීමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු අදියර 02 කට වෙන් කර ඇත.

#### භෞතික ප්‍රගතිය

2018 ජනවාරි 01 දිනට ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය 47% (පළමු අදියර) ක් වූ අතර 2018 දෙසැම්බර් මස 31 වන දිනට සමස්ත ප්‍රගතිය (පළමු අදියර) 51.3% ක් විය.

#### මූල්‍ය ප්‍රගතිය

| | | |
|---|---|---|
| **ප්‍රතිපාදන (රු.) -2018** | | 4,000,000,000.00 |
| **ශුද්ධ ප්‍රතිපාදන (රු.)** | | 3,920,243,250.00 |
| **වියදම (රු.)** | | |
| **වෙනත් ගෙවීම්** | 2,958,941,181.91 | |
| **එල්සී ගෙවීම්** | 617,847,625.58 | |
| **2018 සැප් .01 දිනට වියදම** | | 3,576,788,807.49 |
| **2018 සැප්.01 දිනට ශේෂය** | | **343,454,442.51** |

2.1 වගුව: මූල්‍යමය ප්‍රගතිය

- ආරක්ෂක මූලස්ථාන සංකිර්ණය පිළිබඳ ව්‍යාපෘතිය - පළමු අදියර

නිලධාරින් 250 ක් සඳහා ස්ථිර නිවාස සහ සෙසු නිලයන් සඳහා තාවකාලික නවාතැන් පහසුකම් සළසමින් ප්‍රධාන ගොඩනැගිලි සංකිර්ණය (බිම් කැබලි 09ක්), සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජලාපවාහන පද්ධතිය සහ ජල පොම්පාගාරයක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වේ.

ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙන කාලය තුල පැන නැගුනු මූල්‍යමය සීමාකිරීම් හා එකී ගොඩනැගිල්ලේ යුද්ධ හමුදා මූලස්ථානය ස්ථාපනය කිරීමේ පවතින දැඩි අවශ්‍යතාවය මත මෙම පළමු අදියර තවදුරටත් පහත සඳහන් අදියර වලට බෙදා ඇත.

**අදියර 01:** 2019 අප්‍රේල් අග වන විට ගොඩනැගිලි අංක 06,07 යන කොටස් සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජලපවාහන සහ ජල පොම්පාගාරය ඉදිකර අවසන් කිරීම.

**අදියර 02:** පළමු අදියරේ අවසන් නොවූ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම.

- ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිළිබඳ ව්‍යාපෘතිය - දෙවන අදියර

ත්‍රිවිධ හමුදා නිලධාරීන් 500ක් සහ නේවාසික සෙසු නිලයන් 6100 ක් සඳහා භෝජනාගාර සහ අනෙකුත් බාහිර අංගයන් ඇතුළු පහසුකම් සහිතව ස්ථිර වාසස්ථාන සැපයීම මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වේ.

- ව්‍යාපෘති කළමනාකරණය සහ ඉදිකිරීම් කටයුතු

ඉදිකිරීම් කටයුතු පහසුවෙන් කරගෙන යාම සඳහා ව්‍යාපෘතියට අදාලව විශේෂ ව්‍යුහයන් පිහිටුවන ලදි.

- ව්‍යාපෘති කලමනාකරණය සහ ප්‍රසම්පාදනය සඳහා
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා
- ඉදිකිරීම් කළමනාකරණ ඒකකය

මෙම ව්‍යාපෘතියට අදාලව ව්‍යුහගත සැලැස්ම, යාන්ත්‍රික, ඉංජිනේරු , ජලනල සහ තොරතුරු තාක්ෂණ සහ ප්‍රමාණ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය කටයුතු කරනු ලබයි.

## භෞතික ප්‍රගතිය



යෝජිත ආරක්ෂක අමාත්‍යාංශ ගොඩනැගිල්ල (Block No 1)



යෝජිත යුද්ධ හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල (Block No 06)



යෝජිත යුද්ධ හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල (Block No 07)



යෝජිත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාල ගොඩනැගිල්ල (Block No 08)



යෝජිත නාවික හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල (Block No 03)



යෝජිත ගුවන් හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල (Block No 04)



යෝජිත සන්නිවේදන ගොඩනැගිල්ල



යෝජිත ආරක්ෂක ගොඩනැගිල්ල



යෝජිත ජලපොම්පාගාරය



යෝජිත මළාපවාහන පද්ධතිය

## ➢ උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය



දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ වියහැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටුවේ.

වසර 2016 වන විට විදුලි උත්පාදක යන්ත්‍ර 22න් 10ක් ස්ථාපනය කර අවසන් කර ඇති අතර ඉතිරි විදුලි ජනක යන්ත්‍ර අදාල කාර්යයන් සඳහා බෙදාහැර ඇත. ස්වයං ආධාරක කුළුණු 11ක් ඉදිකිරීම දැනට



සිදු කරමින් පවතින අතර ලබන වසර මැද අවසන් වන විට ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට නියමිතය. ක්ෂුද්‍ර තරංග ගුවන්විදුලි සබඳතා 37ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.

සමාලෝචනයට බඳුන් කරනු ලබන කාලය තුල (එනම් 2018 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා) භෞතික ප්‍රගතිය 2.7% ක් වන අතර මූල්‍යමය ප්‍රගතිය වාර්ෂික වෙන්කිරීම හා සසඳා බලන කල (රු.මි. 658.74) 17.2% ක අගයක පවතී.

## ➢ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

2015 වර්ෂයේ සිට පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මොරගහහේන පාර, පිටිපන යන ස්ථානයේ සංකීර්ණයක ස්ථාපනය කර ඇති අතර මෙම මධ්‍යස්ථානයේ සේවයේ නියුතු පර්යේෂණ නිලධාරීන්හට නවාතැන් පහසුකම් සැපයීම සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර 2017 ජනවාරි මස ගරු ආරක්ෂක ලේකම් තුමාගේ සුරතින් විවෘත කෙරිණි.

### දැක්ම

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පරමාර්ථය වනුයේ නවීන තාක්ෂණයෙන් යුත් උපකරණයන් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ආරක්ෂක රාජ්‍ය අංශ සහ රාජ්‍ය ආයතනයන් වෙත අවශ්‍ය නව සොයා ගැනීම් සිදුකිරීම වේ. එමඟින්, ජාත්‍යන්තරය සමග තරඟ කළ හැකි නවීන තාක්ෂණයෙන් යුතු සොයා ගැනීම් සිදුකරනු ලබන දේශීය ආයතනයක් බිහි කිරීම.

### අරමුණු

- ආරක්ෂක අංශ වෙත අවශ්‍ය වන නවීන තාක්ෂණයෙන් යුතු උපකරණයන් සොයා ගැනීම හා නිෂ්පාදනය කිරීම.
- ආරක්ෂක හමුදාවන් වෙනුවෙන් අවශ්‍යවන උසස් තාක්ෂණයෙන් යුත් අවි ආයුධ පද්ධති හා නව තාක්ෂණික උපකරණයන් මෙරටදීම නිෂ්පාදනය කිරීම.
- ශ්‍රීලංකාව තුළ ආරක්ෂක හමුදාවන්ට අවශ්‍ය වන උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදුකිරීම හා එම උපකරණයන්හි රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම.
- රාජ්‍ය ආරක්ෂාවට හා රටේ සංවර්ධනයට අවශ්‍ය වන තාක්ෂණික සහය ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය උපකරණ මෙරට නිෂ්පාදන කිරීම හා වැඩිදියුණු කිරීම.

➢ 2018.12.31 දිනට ව්‍යාපෘතීන් හි ප්‍රගතිය

| අ/අං | ක්‍රියාකාරකම්/ව්‍යාපෘතිය | හැඳින්වීම | වත්මන් ප්‍රගතිය/මූල්‍ය |
|---|---|---|---|
| 1 | Smart Target System for Jungle Lane Firing | යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා කැලෑබද සටන් (Jungle Lane Firing) පුහුණුව සඳහා භාවිතා කළ හැකි පද්ධතියකි. | දැනට මෙම සමස්ත ව්‍යාපෘතියේ 98% කට ආසන්න ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇති අතර, මෙහි අත්හදා බැලීමේ කටයුතු සඳහා යුද්ධ හමුදා විශේෂ බලකාය වෙත ලබාදී ඇත. 2019 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතය. |
| 2 | Development of Low Cost Secure Voice Encryption | දැනට යුද්ධ හමුදාවන් තුළ සන්නිවේදන කටයුතු සඳහා භාවිතා කරන රේඩියෝ පද්ධති වලින් සිදුවන දුරකථන සම්බන්ධතාවයන්ගේ රහස්‍ය භාවය තහවුරු කිරීමට සමත් පද්ධතියකි. | මේ වන විට සමස්ත ව්‍යාපෘතියෙන් 55% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඉදිරි පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී. |
| 3 | Integration effect on Intelligence Preparation of the Battlefield (IPB) and Development of Training Simulator | අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුව ලබන නිලධාරීන්ගේ ක්‍රියාන්විත අභ්‍යාස සැලසුම් සිදුකිරීම සඳහා නිපදවීමට නියමිත පරිගණක සමාකෘතියකි. | මේ වන විට සමස්ත ව්‍යාපෘතිය අවසන්කර ආසේඅමාවි වෙත භාරදී ඇත. |
| 4 | Election Complaints Management System | මැතිවරණ පැමිණිලි කළමනාකරණ පද්ධතියකි. | මෙම ව්‍යාපෘතිය නිමකර මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදී ඇත. |
| 5 | Reference System Mapping & tracking of endangered species Asian elephants in Sri Lanka | වන අලින්ගේ ගමන් මාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ජංගම දුරකථන සහ Web තාක්ෂණය උපයෝගි කරගනිමින් මෘදුකාංගයක් නිර්මාණය කිරීම. | සමස්ත ව්‍යාපෘතියෙන් 75% ක පමණ කොටසක් නිමකර ඇති අතර, ඉදිරි පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී. |
| 6 | Electronics alarm systems for border villages to prevent wild elephant intrusions attacks | ශබ්ද තරංග උපයෝගි කර ගනිමින් වල් අලි පලවා හැරීම සඳහා මෘදුකාංගයක් නිර්මාණය කිරීම | මෙම ව්‍යාපෘතිය අත්හදා බැලීමේ කටයුතු මාදුරුඔය යුද්ධ හමුදා කඳවුරේදී සිදුකිරීමට කටයුත කර ඇත. දැනට 60% ක පමණ කොටසක් නිමකර ඇති අතර, ඉදිරි පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී. |
| 7 | HI&TECH SOLDIER – III | නවීන තාක්ෂණය උපයෝගිකර ගනිමින් සංක්‍රාමික භූමියේ සටන්බිමේ සිටින සොල්දාදුවන් සාම්ප්‍රදායික ක්‍රමවේදයෙන් බැහැරව අති නවීන අංග උපාංගවලින් යුතුව සවිමත් කිරීමට මෙම මෘදුකාංගය ඉවහල් වේ. | මෙම මෘදුකාංග පද්ධතිය දියකාවා මෙහෙයුම් අභ්‍යාසයේදී උපයෝගි කර ගනිමින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව දැනට යුද්ධ හමුදාව වෙත උපයෝගි කර ගැනීම සඳහා භාර දීමට කටයුතු කර ඇත. 80% ක ප්‍රමාණයක් නිර්මාණය කර ඇත. |
| 8 | Mail Management System - MOD | ආරක්ෂක නිලධාරීන්ට ලැබෙන ලිපි වර්ගීකරණයට ලක්කර අදාල ශාඛා/ආයතන වෙත යොමු කිරීම කාර්යක්ෂමව හා පහසුවෙන් ඉටුකරගැනීම නිර්මාණය කර කරන ලද පරිගණක දත්ත පද්ධතියකි. | මෙම ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතු මේ වන විට අවසන් කර ආරක්ෂක නිලධාරීන් වෙත භාරදී ඇත. |
| 9 | Land Acquisition Management System | ආරක්ෂක අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය වෙත ත්‍රිවිධ හමුදාවන්ට අයත් ඉඩම් අත්පත් කරගැනීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම. | දැනට මෙම ව්‍යාපෘතියේ දත්ත ඇතුළත් කර අතිරේක ලේකම් පාර්ලිමේන්තු කටයුතු ප්‍රතිපත්ති හා සැලසුම් කාර්යාලය වෙත වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා ලබාදී ඇත. |
| 10 | Process Management System for Dte Welfare – SL Army | යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම මත එහි දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතියෙන් දැනට 20% ක ප්‍රමාණයක් අවසන් කර ඇත. දත්ත එක් රැස් කිරීමේ කටයුතු සිදු කෙරේ. |
| 11 | Drone Mapping Survey for AERO City Development Project Ministry of Megapolis & Western Development. | නියමුවන් රහිත ගුවන් යානා යොදා ගනිමින් මහ නගර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව සිදුකර ගෙන යනු ලබන ගුවන් නගර ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භූමියේ තොරතුරු එක්රැස් කිරීම. | මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිමකර මහනගර සහ බස්නාහිර සංර්ධන නිලධාරීන් වෙත භාරදී ඇත. |
| 12 | Development Smart Jacket with Tracking System (GPS/GPRS) | සංග්‍රාම භූමියේ සිටින සොල්දාදුවන්ගේ ගමන් මාර්ග අධ්‍යයනය කිරීම සඳහා සූර්ය බලය උපයෝගිකර ගෙන ක්‍රියාත්මක වන Smart Jacket එකක් නිර්මාණය කිරීම . | සමස්ත ව්‍යාපෘතියෙන් 30% ක පමණ කොටසක් නිමකර ඇති අතර, ඉදිරි පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී. 2019 වර්ෂයේ භාරදීමට සැලසුම් කර ඇත. |
| 13 | Small Arms Firing Simulator(SAFS) | ත්‍රිවිධ හමුදා, පොලීසිය සහ පුද්ගලික ආරක්ෂක සේවාවන්හි නියුතු පුද්ගලයන්ට අවි පුහුණුව ලබාදීමට හැකිවීම සහ පුහුණු වෙඩික්කරුවන්ගේ හැකියාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට භාවිතා කරන පුහුණු සමාකෘතියකි. | මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇති අතර, නිෂ්පාදන කටයුතු සිදුකෙරේ. තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රතිපාදන මත SAFS පද්ධතීන් 6ක් දිවයින පුරා යුද්ධ හමුදා පුහුණු පාසල් 6ක් වෙත සහ නාවික හමුදාව වෙත එක් පද්ධතියක් වශයෙන් නිම කර ඇත. |
| 14 | Simulation Platform with 3DOF (SP3DOF) | ත්‍රිවිධ හමුදාවේ රථ, ගුවන් යානා සහ නාවික යාත්‍රා වල චලිත රථාවන් අනුකරණය කළ හැකි වේදිකාවක් මත නිමවා පුහුණු සාමාකෘතීන් සඳහා යෙදවීම. | 95% පමණ ව්‍යාපෘතිය නිමකර ඇති අතර, අවසාන අදියරට අවශ්‍ය ඉලෙක්ට්‍රොනික උපාංග මිලදී ගැනීම් සිදුවෙමින් පවතී. රථවාහන සාමාකෘතිය සමග සම්බන්ධ කිරීම සිදුකරයි. |
| 15 | Atmospheric Water Generator Project | වර්ෂාව නොමැති අවස්ථාවලදී වායුව ජලය බවට පත්කිරීම කළ හැකි පද්ධතියකි. | දැනට මෙම සමස්ත ව්‍යාපෘතියේ 10% ක පමණ ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇත. |
| 16 | Smart Target & Evaluation System Shooters and Weapons Systems Project | දැනට යුද්ධ හමුදා පනාගොඩ කඳවුරෙහි පවතින ඉලෙක්ට්‍රොනික් වෙඩි පිටිය අධිතාක්ෂණික මෙවලම් භාවිතයෙන් නවීකරණය කිරීම හා නිරවද්‍ය පුහුණු පද්ධතියක් ස්ථාපිත කිරීම | දැනට මෙම සමස්ත ව්‍යාපෘතියේ 60%ක පමණ ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇත. |
| 17 | Under Water Robotic vessel Development Project | දුරස්ථ පාලනය සහිතව සහ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කළ හැකි දිය යටින් ගමන් කරන යාත්‍රා නිෂ්පාදනය කෙරේ. | ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස දියයට කිමිදුම් රොබෝ යන්ත්‍රය (MAGURA II) නිෂ්පාදනය කර අවසන් පරීක්ෂණ කටයුතු සහ වැඩිදියුණු කිරීම් සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ 95% ක ප්‍රමාණයක් සාර්ථකව නිම කර ඇති අතර, දෙවන අදියරය ආරම්භකර (MAGURA III) නිෂ්පාදනය 10% පමණ නිමකර ඇත. |

2.2 වගුව: 2018.08.31 දිනට ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

- 2016 වර්ෂයේ ආරම්භ කර 2018 වර්ෂය දක්වා අඛණ්ඩව පැවති ව්‍යාපෘති

| අ/අං | ක්‍රියාකාරකම්/ව්‍යාපෘතිය | හැඳින්වීම | වත්මන් ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | Development of a Solar Paint | බොහෝ සාම්ප්‍රදායික සූර්ය කෝෂවල නිෂ්පාදන වියදම හා ස්ථාපනය කිරීමට යන වියදම අධික වන අතර එයට විසඳුමක් ලෙස නිපදවිය හැකි සූර්ය කෝෂ නිපදවීම පිළිබඳ පර්යේෂණ සිදුකිරීම. | ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ කටයුතු අවසන්ව ඇති අතර, ප්‍රායෝගික භාවිතය සඳහා වූ සැලසුම් 2019 වසරට අදාළ ව්‍යාපෘති ප්‍රතිපාදන තුළින් සිදුකිරීමට නියමිතය. |
| 2 | Development of Anti - Befouling and Anti corrosive paint using Nano Technology | මෙමගින් ශ්‍රී ලංකාවට ආවේනික මල නොබැඳෙන තීන්ත ආලේපනයක් නිර්මාණය කිරීම. | දැනට මෙම  සමස්ත ව්‍යාපෘතියේ 75% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇති අතර, පර්යේෂණ කටයුතු සඳහා රසායනික විද්‍යාගාරයක් ඉදිකරමින් පවතී. |
| 3 | Total Training Simulator Solutions for Long/ Middle Range Weapon & Close Combat Operations | ත්‍රිවිධ හමුදාවන් වල භාවිතා වන සියලුම දිග හා මධ්‍ය දුර අවි සහ සමාකෘති නිර්මාණය කිරීමට මෙමගින් හැකියාව ඇත. | මේ වන විට මෙම ව්‍යාපෘතියෙන් 70% කට ආසන්න ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇත. තාක්ෂණික අත්හදා බැලීම සඳහා දැනට පවතින අවි පද්ධතීන් ලබාගත යුතුයි |
| 4 | Customizable Fire Control Solution With Stabilize Platform. | විවිධ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වෙනස් කළ හැකි අවි හැසිරවීමේ පද්ධතියක් නිර්මාණය කිරීම. | මේ වන විට මෙම ව්‍යාපෘතියෙන් 80% කට ආසන්න ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇත. |
| 5 | Guided Rocket and Missile System Development Project | ශ්‍රී ලංකා හමුදාවන් සඳහා මිසයිල හා රොකට් තාක්ෂණය හඳුන්වාදීම ඊට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම. | ව්‍යාපෘතිය සඳහා යොදාගන්නා සියලුම රසායනික සංයෝග හා අමුද්‍රව්‍ය පර්යේෂණ මට්ටමින් පසුව හඳුනාගෙන ඇති අතර, මෙම රසායනික සංයෝග විවිධාකාර ලෙස සංයෝග කර ඝන ප්‍රචාලක (Solid Propellants) මිසයිල වල විදීමේ ශක්තිය හා දුර වෙනස් කිරීම සිදුකළ හැකි  බව හඳුනාගෙන ඇත. ඒ අනුව මූලික පරීක්ෂණ කටයුතු අවසන් කර කුඩා මිසයිල කිහිපයක් අත්හදා බලා ඒවා අපේක්ෂිත පරිදි ප්‍රතිඵල ලබාදී ඇත. ඒ අනුව ප්‍රධාන මට්ටමේ මිසයිලයක් දියත් කිරීම සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිළදීගනිමින් පවතී. ඉතා නුදුරේදීම අත්හදා බැලීම් සිදුකළ හැකිය. මෙම ව්‍යාපෘතිය 65% ප්‍රමාණයක් දැනට අවසන් කර ඇත. |
| 6 | Development of Hydrogen Fuel Cell for Quod Copters and UAVS | නියමුවන් රහිත ගුවන් යානා සඳහා අවශ්‍ය ජීවකාලය වැඩි විද්‍යුත් කෝෂ (බැටරි) නිෂ්පාදනය කිරීම | මේ වන විට මෙම ව්‍යාපෘතියෙන් 40% ක ආසන්න ප්‍රමාණයක් සිදුකර අවසන් කර ඇත. |
| 7 | Armor Tank Simulator System Development | යුධ ටැංකි වෙඩිතැබීම් හා ක්‍රියාන්විතයේදී භාවිතා කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා පුහුණු සමාකෘතියක්  සකස් කිරීම. | සන්නද්ධ රථයක ආකෘතියක් (BTR) මේ සඳහා යොදාගෙන අවශ්‍ය නිර්මාණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. මෙහි පළමු සමාකෘතිය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය වෙත 2019 වසරේ මැයි වනවිට ලබාදීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මේ වන විට  ව්‍යාපෘතියෙන් 80% පමණ නිමකර ඇත. |
| 8 | Brain Controlled Interface for Artificial Limbs (BCI) | මිනිස් මොළයේ තරංග මගින් පාලනය කරනු ලබන කෘත්‍රිම බාහුවක් නිර්මාණය කිරීම | ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ කටයුතු අවසන් අතර, අවසන් ආකෘතියද නිර්මාණය කර ඇත 2019 ප්‍රතිපාදන වලින් නිම කිරීමට සැලසුම් කර ඇත. |
| 9 | Indoor Positioning System | GPS සංඥා ලබාගත නොහැකි අවස්ථාවන්හිදී පුද්ගලයෙකුගේ/ වස්තුවක පිහිටීම නිවැරදිව සොයා ගැනීම සඳහා වූ පද්ධතියක් නිර්මාණය කිරීම. | මේ වන විට මෙම සමස්ත ව්‍යාපෘතියෙන් 45% ක ප්‍රමාණයක් නිමකර ඇති අතර, එහි ඉදිරි පර්යේෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. 2019 ප්‍රතිපාදන වලින් නිම කිරීමට සැලසුම් කර ඇත. |

2.3 වගුව:  2016 වර්ෂයේ ආරම්භ කර 2018 වර්ෂය දක්වා අඛණ්ඩව පැවති ව්‍යාපෘති

- 2015 වර්ෂයේ ආරම්භ කර 2018 වර්ෂය දක්වා අව්ච්ඡේද වූ ව්‍යාපෘති

| අ/අං | ක්‍රියාකාරකම්/ව්‍යාපෘතිය | හැඳින්වීම | වත්මන් ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | Braille to Sinhala Converter | අන්ධ පුද්ගලයින් සඳහා පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මෙම පද්ධතිය භාවිතයෙන් පහසුවෙන් හා ඉක්මනින් ලබාගත හැකිවීම. | මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| 2 | Development of virtual reality parachute jumper and skydiver training Simulator | ත්‍රිවිධ හමුදා රාජකාරි නියුතු පැරෂුට් පුහුණුවන්නන් සඳහා පුහුණු ආකෘතියක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ තුළින් පැරෂුටය තුළින් පැනීමේ සිට බිම පතිත වන තෙක් සජීවීව ඇති වන සියලුම ක්‍රමවේදයන් හා බලපෑම ඒ ආකාරයෙන් පුහුණු වන්නන් හට ලබාගැනීමත් ඒ පිළිබඳ උපදේශකයින් හට නිරීක්ෂණ කිරීමට හැකිවීම ප්‍රධාන ලක්ෂණයකි. දියුණු රටවල ක්‍රියාත්මක මෙම සාමාකෘති නිර්මාණය සඳහා විශාල මුදලක් වැය වන අතර, මෙම ව්‍යෘපෘතිය තුළින් එම අවශ්‍යතාවය අඩු පිරිවැයකින් සිදුකිරීමට හැකියාව ලැබී ඇත. | මේ වන විට සමස්ත ව්‍යාපෘතියෙන් 98% පමණ ප්‍රමාණයක් සිදුකර අවසන්ව ඇත. අවශ්‍යවූ විදුලිපංකා 02 ක් ලැබීමට අපේක්ෂිත කාලයට වඩා වැඩිකාලයක් ගතවිය 2019 වසරේ මුල් කාර්තුවේදී ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට නියමිතය. |
| 3 | Underwater Acoustic Sensor Array (UASA) | මෙම ශ්‍රේණිගත සංවේදක පද්ධතිය මගින් දිය යට සිදුවන ක්‍රියාකාරකම් ශබ්ද තරංග විශ්ලේෂණය මගින් හඳුනා ගැනීමේ හැකියාව ඇති කිරීමේ පද්ධතියක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. | ව්‍යාපෘතියේ පළමු පියවර යටතේ ජල ස්ථර තුළින් පැමිණෙන ශබ්ද තරංග හඳුනාගැනීමේ මෙවලම් නිෂ්පාදනය කර පරීක්ෂා කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය ආශ්‍රිත මුහුදු ජලයේ ගුණාංග (ලවණතාව, උෂ්ණත්වය, ඝනත්වය) දවස පුරාත් වර්ෂය පුරාත් වෙනස්වන අයුරු දැක්වෙන දත්ත ගබඩාවක් නිර්මාණය කිරීමට නියමිතය. එම දත්ත ගබඩාවේ දත්තයන්ට අනුකූලව ලැබෙන ශබ්ද තරංග විශ්ලේෂණය කර එහි ප්‍රභවය සහ ස්ථානය හඳුනා ගැනීමට පරීක්ෂණ සිදුවෙමින් පවතී. ව්‍යාපෘතියෙන් 82% ක් නිමකර ඇත. |
| 4 | Design & Development of HF/VHF & UHF Radio Transceiver | දේශීය අනන්‍යතාවය සහිත රහස්‍ය පණිවිඩ හුවමාරුව සඳහා ආරක්ෂිත ගුවන් විදුලි යන්ත්‍රයක් නිර්මාණය කිරීම | VHF මොඩියුලය නිම කර ඇති අතර, 2019 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට නියමිතය. |
| 5 | Train Tracking System. | දුම්රිය ධාවනය වන ගමන් පථයන් GPS තාක්ෂණය මගින් පාලන මැදිරියට හා මගීන්ට දුම්රියේ පැමිණීම හා ස්ථානය සනාථකර ගැනීමට හැකි ක්‍රමයකි. මෙහි අත්හදා බැලීමේ කටයුතු සිදුකරමින් ඇත. නිම කිරීම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය මැදිහත් වීම මත සිදුකරනු ලබයි. | සමස්ත ව්‍යාපෘතිය මෙ විට අවසන් කර ඇත. මෙම පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සිදුකර අවසන් අතර, GPS/GSM උපකරණ දුම්රිය 10 ක යොදවා ධාවනය කිරීමට කටයුතු කර ඇත. |
| 6 | Medium Range UAV System development (Phase 1) | LIHINIYA MK I යනු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පර්යේෂණ හා සංවර්ධන කණ්ඩායමක් මගින් නිපදවනු ලැබූ නියමුවන් රහිත ගුවන් යානා (UAV) පද්ධතියකි.මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන මොඩියුල දෙකක් ඇත. එනම්<br>• නියමුවන් රහිත ගුවන් යානාව (UAV Aircraft)<br>• භූමි පාලක මධ්‍යස්ථානය (Ground Control Station) | මෙම පද්ධතිය නියමුවන් රහිත ගුවන් යානා දෙකකින් සහ භූමි පාලන මධ්‍යස්ථාන එකකින් සමන්විත වේ.<br>මෙය දැනට පුහුණු වීම් කටයුතු සඳහා භාවිතා කිරීමට අංක 111 බලඝනයට බාරදී ඇත.<br>මේ සමග මෙම පද්ධතිය භාවිතා කිරීමට අවශ්‍ය කාර්ය සංග්‍රහයන්ද එම බලඝනයට භාරදී ඇත. (Phase 1) |
| 7 | Medium Range UAV System development (Phase 2) | LIHINIYA MK II යානය single pusher වර්ගයේ එන්ජිමක් සහ High Wing, Twin Tail Boom එකකින් සමන්විත HTOL වර්ගයේ UAV යානාවකි.<br>• LIHINIYA MK II යානය මධ්‍යම දුර උපායමාර්ගික යානයක් (medium range tactical UAV) ලෙස මෙහෙයුම් සඳහා භාවිතා කළ හැකිය.<br>• උපරිම බර - 52 kg<br>• මෙහෙයුම් සීමාව - මුහුදු මට්ටමේ සිට අඩි 10000ක් දක්වා<br>• දරා ගැනීමේ කාලය - 7Hrs<br>• මුළු ඉන්ධන ධාරිතාව- 19 Ltr<br>• උපරිම ප්‍රවාහනය කළ හැකි බර -1.5 kg<br>• උපරිම ගුවන් වේගය - 70 knots<br>• පරාසය (Range) - 100 km | 80% සම්පූර්ණ කර ඇත<br>දිගු දුර පරාස දත්ත සම්බන්ධකයක් සහ ප්‍රචාලන පද්ධතියේ අමතර කොටස් මිලදීගත යුතුව ඇත. |

2.4 වගුව: 2015 වර්ෂයේ ආරම්භ කර 2018 වර්ෂය දක්වා අව්ච්ඡේද වූ ව්‍යාපෘති

### ➢ ගැටළු සහ අභියෝග

#### ආරක්ෂක මුලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

- EOT හිමිකම්
- අනපේක්ෂිත අතිරේක වැඩ සහ පිරිවැය යෙදවුම්
- දැනටමත් සවිකරන ලද / අවසන් කරන ලද යටිතල පහසුකම් සඳහා සහතික වීම
- නඩත්තු ඒකකය ස්ථාපනය කිරීම හා පිරිවැය යෙදවුම්

#### උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණය අත්පත්කරගැනීම සම්බන්ධයෙන් පැවති ගැටළු ස්වයං ආධාරිත සංනිවේදන කුළුණු 11 ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කටයුතු ඇරඹීමෙහිලා ප්‍රමාදවීමට හේතුවිය. ලංසුකරුවන්ගෙන් බොහෝ දෙනෙකු අසම්පූර්ණ ලංසු ඉදිරිපත් කර ඇති බැවින් කුළුණු සහ ක්ෂුද්‍ර තරංග ගුවන්විදුලි සඳහා ටෙන්ඩර් යළි කැඳවීමට සිදුවිය. ස්වයං ආධාරිත සන්නිවේදන කුළුණු 11 ඉදිකිරීම අවසන් වූ පසුව ඉතිරි විදුලි ජනක යන්ත්‍ර (12) සවිකරනු ලැබිය හැකිය.

#### පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය පර්යේෂණ අංශ 15 කින් සමන්විත වුවද දැනට ඇති ගොඩනැගිලි වල සීමිතභාවය හේතුකොට ගෙන අංශ කිහිපයක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. තවද, මෙම ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අංශ මගින් අනෙකුත් අංශ වලට අදාල පර්යේෂණ කටයුතු සිදුකරන බැවින්, ඒ සදහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් හා අනෙකුත් ගොඩනැගිලි අවශ්‍යතාවයන් හේතුකොටගෙන මහත් අපහසුතාවයකින් යුතුව පරීක්ෂණ කටයුතු මේවන විට සිදුකරමින් පවතී.

මෙම මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබන ත්‍රිවිධ හමුදාවට ආවේණික වු නවීන අවි ආයුධ නිෂ්පාදනය කිරීමේදී ඒ සදහා පිටතින් ලබාගත යුතු හමුදා අවශ්‍යතා සඳහාම පමණක් භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය හා ඉලෙක්ට්‍රොනික් මෙවලම් ප්‍රසම්පාදන කම්ටු ක්‍රියාවලියට යටත්ව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළදී ගැනීමට කටයුතු කිරීමේදී ඔවුන්හට ඒ සබැඳිව නිසියාකාර අවබෝධයක් නොමැති කමින් බොහෝ අවස්ථාවන්හිදී ඒ සදහා මිළගණන් පත් ඉදිරිපත් කරනු නොලබයි. සමහර සැපයුම්කරුවන් මිළගණන්පත් ලබාදුන්නද ප්‍රසම්පාදන කමිටු අවසානයේ ඔවුන් එම උපකරණ ලබාදීමට මැළිකමක් දක්වන අතර ඊට ප්‍රධාන හේතුව වන්නේ ඔවුන්හට මෙම උපකරණ සම්බන්ධව අවශ්‍ය දැනීම නොමැතිවීමයි. මෙවැනි උපකරණ මිළදී ගැනීම සදහා ඉදුරාම එවැනි උපකරණ නිෂ්පාදනය කරනු ලබන රටවල් වෙතින් මිළදී ගැනීමට හැකිවන්නේ නම් කඩිනමින් එම උපකරණ මිළදී ගැනීමට හා අනවශ්‍ය මුදල් ප්‍රමාණයක් ඒ සදහා වියදම් කිරීමට අවශ්‍ය නොවන අතර, සැලසුම්කර ගත් පරිදි කඩිනමින් පරීක්ෂණ ව්‍යාපෘති සැලැස්මකට අනුව නිම කිරීමට හැකියාවක් ලැබේ.

ත්‍රිවිධ හමුදාව සඳහා සිදුකරනු ලබන පර්යේෂණ කටයුතු වල ඇති රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් බැවින්, එහි ප්‍රගති සමාලෝචනය මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රතිපත්තිය වුවද බොහෝ විට එම පරීක්ෂණ කටයුතු සඳහා උපකරණ මිළදී ගැනීම සඳහා පැවැත්වෙන ප්‍රසම්පාදන කමිටු වලදී එම ව්‍යාපෘති වල සියලු විස්තර ඔවුන් වෙත ලබාදෙන ලෙස ඉල්ලුම් කරනු ලබයි. එහිදී එම තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගත නොහැකි වී ඇත.

මෙම මධ්‍යස්ථානය වෙත ත්‍රිවිධ හමුදාව වෙතින් යොමුකරන ලද තාක්ෂණ නිළධාරීන් හට ඔවුන්ගේ මූලික වැටුපට අමතරව ඔවුන් විසින් සිදුකරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් කිසිදු ගෙවීමක් නොකරන බැවින්, ඔවුන් රඳවා තබා ගැනීම අපහසු වන අතර, ඔවුන් දිරි ගැන්වීම සඳහා ඔවුන් විසින් සිදුකරනු ලබන සාර්ථක ව්‍යාපෘති සඳහා අතිරේක දීමනාවක් ලබා දීම අවශ්‍යව ඇත.

## 2.3 අනාගත අපේක්ෂා

### ✶ ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

- ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය සඳහා ගොඩනැගිලි අංක 06 , 07 සහ 08 නිම කිරීම.
- සන්නිවේදන ගොඩනැගිල්ල සහ සංඥා කුළුණ (පොදු පහසුකම්) නිම කිරිම
- ආරක්ෂක ගොඩනැගිල්ල නිම කිරිම (පොදු පහසුකම්)
- හමුදා මූලස්ථානය /ආරක්ෂක නිලධාරීන් සඳහා අනෙකුත් ඉදිකිරිම් කටයුතුවලට අවහිරයක් නොවන පරිදි මාර්ග පද්ධතියක් ඉදිකිරිම
- ජල පොම්පාගාරය සහ ප්‍රධාන ජල සැපයුම් ඒකකය නිම කිරිම (පොදු පහසුකම්)
- සෙසු නිලයන් 2000කට තාවකාලික නවාතැන් - කින්නදෙණිය
- මළපවාහන පද්ධතිය නිම කිරීම (පොදු පහසුකම්)

### ✶ උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

2018 වර්ෂය තුල කුළුණු 11 ක් ඉදිකිරීම හා 2019 වසර තුල ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සබඳතා සහ ජාල කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම නිම කිරීම හා ජාලය වැඩිදියුණු කිරීම සඳහා අනාගත අවශ්‍යතා සමාලෝචනය කිරීමට පද්ධතීන්ගේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

### ✶ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය දැනට ඇති සීමිත ඉඩපහසුකම් සහ නවීන විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කර මෙම මධ්‍යස්ථානය යටතේ ඇති සියලුම අංශ සක්‍රීය ලෙස පර්යේෂණ කටයුතු සඳහා දායක කර ගැනීමට අවශ්‍ය විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

- සාර්ථකව පර්යේෂණ කටයුතු සිදුකිරීමෙන් පසුව නිපදවනු ලබන නිෂ්පාදන සදහා ඒ සදහා දායකත්වය ලබාදෙන ලද නිළධාරීන් හට ව්‍යාපෘති අවසානයේ පර්යේෂණ දීමනා හිමිගැන්වීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සදහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය බිහිකිරීමේ මූලික අරමුණු වූයේ ත්‍රිවිධ හමුදාව සදහා කාර්මික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීමේදී ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සහ ඒ තුළින් ජාතික ආරක්ෂාව සදහා වන ඵලදායි උපාය මාර්ග සහ ප්‍රතිපත්ති ඇති කරගැනීමයි. ඒ අනුව, පසුගිය වසර 10 තුළ ඉතාමත් සාර්ථකව පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරමින් මෙම මධ්‍යස්ථානය විශාල කාර්යභාරයක් ඉටුකරන ලදී. එහි සේවාවන් වැඩිදුරටත් ව්‍යාප්ත කරමින් මෙම අමාත්‍යාංශයේ උපදෙස් මත රාජ්‍ය ආරක්ෂාව සඳහා බලපාන වෙනත් රජයේ ආයතන සඳහාද පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සේවාවන් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව, වෙනත් රාජ්‍ය ආයතන හා සම්බන්ධ කටයුතු කිරීමේදී රාජ්‍ය නීති රීති, රෙගුලාසි වලට අනුව විවිධ ගැටළු පැන නැගී ඇති බැවින් එම පර්යේෂණ කටයුතු ඉටුකිරීමට විවිධ බාධාවන් ඇති වී තිබේ. එබැවින්, දේශීය වශයෙන් ඉටුකර ගත හැකි කාර්යයන් බොහෝමයක් සිදුකර ගැනීමට නොහැකි වීම තුළින් විශාල මුදල් ප්‍රමාණයක් ඒ සදහා විදේශීය රටවලට ගෙවීමට සිදුවී ඇත. එබැවින් මෙම කරුණු සැළකිල්ලට ගෙන පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, පර්යේෂණ හා සංවර්ධන කාර්යංශයක් ලෙස ස්වාධීනව ආරක්ෂක නිලධාරීන් යටතේ ස්ථාපනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කඩිනම් කර ඒ සදහා අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාගැනීමට කටයුතු 2019 වර්ෂයේදී අවසන් කිරීම.

- මධ්‍යස්ථානයේ විශාල ගැටළුවක්ව පවතින යුධමය මෙවලම් නිෂ්පාදන සදහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ ඉඳුරාම අදාළ රට වලින් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් තුළ ගෙන්වා ගැනීමට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට ඇවැසි ඉදිරි කටයුතු සිදුකිරීම.

# 3. පාර්ලිමේන්තු කටයුතු අංශය

## 3.1 සමාලෝචනය

අමාත්‍යාංශයේ කාර්යභාර්යයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදාළ රාජකාරි සිදු කෙරෙනුයේ පාර්ලිමේන්තු කටයුතු අංශය මඟිනි. එමෙන්ම, ත්‍රිවිධ හමුදා සහ නිලධාරීන් යටතේ වන අනෙකුත් ආයතනයන්ට අදාළ ඉඩම් සම්බන්ධ කටයුතු , ඉඩම් අත්කරගැනීම් වලට අදාළ මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි පිළිබඳ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. ඊට අමතරව, ත්‍රිවිධ හමුදාවන් සහ සිවිල් ආරක්ෂක බලකාය සඳහා නිල ඇඳුම් හා රෙදිපිළි ද්‍රව්‍ය සැපයීමට අදාළව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දේශීය සැපයුම්කරුවන්ගෙන් රෙදිපිළි මිලදී ගැනීමේ වැඩ පිළිවෙල සමඟ සම්බන්ධවී ක්‍රියා කිරීමද මෙම අංශය සතු කාර්යයකි.

## 3.2. 2018 වර්ෂයේ කාර්යසාධනය

### ➢ ඉඩම් රාජකාරී

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නිලධාරීන්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන ආදී ආයතන සමඟ සම්බන්ධීකරණය වී ත්‍රිවිධ හමුදාවේ සහ අමාත්‍යාංශයේ පරිහරණය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ හා අත්කර ගැනීමේ කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් අතර වේ. ඊට අදාලව 2018 වර්ෂයේදී පහත කාර්යභාරය ඉටු කරන ලදී.

- ත්‍රිවිධ හමුදාව මඟින් ඉඩම් පවරා ගැනීමේ/ අත්කර ගැනීමේ අයදුම්පත් ලබා ගැනීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ඉඩම් හිමිකාරිත්වය පැවරී ඇති වෙනත් ආයතන මඟින් නිර්දේශ සහ නිරීක්ෂණ ලබා ගැනීම.
- අවශ්‍ය සියලු ලියකියවිලි සහිතව ඉඩම් අත්කර ගැනීමේ/ පවරා ගැනීමේ ඉල්ලීම් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත හෝ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම.
- ඉඩම්වල හිමිකාරිත්වය පිළිබඳ ගැටළු මතුවන අවස්ථාවලදී ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.
- ඉඩම් මැනීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉඩම් සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අත්කර ගනු ලබන ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා අරමුදල් වෙන්කර ගැනීමට හෝ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදන මඟින් අරමුදල් වැය කිරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.
- විශේෂිත අවස්ථාවලදී ඉඩම් අත්කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

ඊට අමතරව, ජනකොටස් අතර සංහිඳියාව සහ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට සහාය දැක්වීමේ රජයේ වැඩ පිළිවෙළට සහාය දැක්වීමක් වශයෙන් මෙම අංශය ත්‍රිවිධ හමුදාව සමඟ එක්ව ත්‍රිවිධ හමුදාව භුක්ති විඳින ඉඩම්වලින් නිදහස් කළ හැකි ඉඩම් හඳුනාගෙන නිදහස් කර භාරදීමත්, අවශ්‍ය අවස්ථාවලදී හමුදා කඳවුරු ප්‍රතිස්ථානගත කිරීමට කටයුතු සම්පාදනය කිරීමත් කරනු ලබයි.

ඉහත පරිදි 2018 වර්ෂයේ ඉඩම් නිදහස් කිරීම් වලදී උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය පිළිබඳව ජනාධිපති කාර්යසාධක බලකාය යටතේ නිදහස් කිරීම් කඩිනම් කිරීම සඳහා සුවිශේෂි වු කාර්යභාරයක් ඉටු කරන ලදී.

| පළාත | යුද්ධ හමුදාව | | නාවික හමුදාව | | ගුවන් හමුදාව | | එකතුව | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රජයේ ඉඩම් | පෞද්. ඉඩම් | රජයේ ඉඩම් | පෞද්. ඉඩම් | රජයේ ඉඩම් | පෞද්. ඉඩම් | රජයේ ඉඩම් | පෞද්. ඉඩම් | |
| උතුර | 4706.35 | 910.67 | 9.76 | 108.15 | 0.00 | 0.00 | 4716.11 | 1018.82 | 5734.93 |
| නැගෙනහිර | 22.00 | 36.50 | 0.00 | 3.67 | 0.00 | 0.00 | 22.00 | 40.17 | 62.17 |
| එකතුව | 4728.35 | 947.17 | 9.76 | 111.82 | 0.00 | 0.00 | 4738.11 | 1058.99 | 5797.10 |

3.1 වගුව : 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් නිදහස් කිරීමේ ප්‍රගතිය

### ➢ පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදාල රාජකාරි

**● පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් නඟනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.**

නිලධාරීන්ට අයත් අංශ හා ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් පාර්ලිමේන්තු ප්‍රශ්න 15 ක් සඳහා මෙම කාලසීමාව තුළදී ත්‍රෛභාෂාවන්ගෙන් පිළිතුරු සකස් කර නියමිත වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. ආරක්ෂක අමාත්‍යාංශීය උපදේශක කාරක සභාවේ පළමු රැස්වීම 2018.10.17 දින පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ සියලුම යෝජනාවලට පිළිතුරු යොමු කර ඇත.

**● මහජන පෙත්සම් කාරක සභාව**

ත්‍රිවිධ හමුදාව ඇතුළු මෙම නිලධාරීන් යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් මහජනයා විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අවශ්‍ය විස්තර අදාල අංශ/ ආයතන වලින් ලබා ගෙන පිළිතුරු සකස් කොට මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලැබේ. 2018 වසරේදී මෙම අංශය මඟින් සෘජුව මහජන පෙත්සම් කාරක සභාවට පෙත්සම් හතරක් (04) සඳහා පිළිතුරු යවා ඇති අතර, අනෙකුත් පෙත්සම් සඳහා අමාත්‍යාංශයේ අදාල අනෙකුත් අංශවලින් පිළිතුරු යැවීම පිණිස එම අංශවලට යොමු කර ඇත.

**● ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්. (Sectoral Oversight Committees)**

ආරක්ෂක නිලධාරීන්ට අදාල ආංශික අධීක්ෂණ කමිටුව පාර්ලිමේන්තුවේදී පවත්වන අවස්ථාවලදී අදාල නිලධාරීන් ඊට සහභාගී කරවීම, අවශ්‍ය තොරතුරු හා වාර්තා ඉදිරිපත් කිරීම සිදු කර ඇත. ඊට අමතරව අනෙකුත් අමාත්‍යාංශවල ආංශික අධීක්ෂණ කමිටු සහ අනුකමිටු සඳහා කැඳවීම් කළ අවස්ථාවන්හි අදාල නිලධාරීන් සහභාගි කරවන ලද අතර, ඒවා සඳහා අවශ්‍ය තොරතුරු හා වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.

**● පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවලදී ස්ථාවර නියෝග යටතේ අසන ප්‍රශ්න හා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පාර්ලිමේන්තුවේදී අසන ප්‍රශ්න**

සමාලෝචිත කාලසීමාව තුල පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවලදී අසන ලද ප්‍රශ්න 04 ක් සහ ස්ථාවර නියෝග යටතේ මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව අසන ලද ප්‍රශ්න 02 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

**● අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම.**

මෙම අංශයේ විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ 06 ක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එසේම, වෙනත් අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 35 ක් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කරන ඇත.

- ත්‍රිවිධ හමුදාවන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා නිල ඇඳුම් සහ රෙදිපිළි ද්‍රව්‍ය සැපයීම - DTAC

ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක නිලධාරීන් යටතේ ඇති අනෙකුත් රජයේ ආයතනයන්හි රෙදිපිළි අවශ්‍යතා දේශීය රෙදිපිළි නිෂ්පාදකයින් වෙතින් ලබා ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයවී සිදු කරන ලදී. 2018 වර්ෂය සඳහා අවශ්‍ය රෙදිපිළි අදාල නිෂ්පාදන ආයතන වෙතින් මිලදී ගැනීම සඳහා රු.1,596,474, 650.00 ක මුදලක් සහ ඊට අදාල එකතු කළ අගය මත බදු (VAT) මුදල ඒ සඳහා වැය කිරීමටත් ටෙන්ඩර් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

- මහජන ඉල්ලීම් සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු

මහජනතාව විසින් මෙම නිලධාරීන්ට සෘජුවම යොමු කරනු ලබන සහ ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ නිලධාරීන් සහ වෙනත් රාජ්‍ය ආයතන මඟින් යොමු කරනු ලබන ඉල්ලීම් හා දුක් ගැනවිලි සම්බන්ධව සහන සැලසීමටත්, ඒ පිළිබඳ වාර්තා / පිළිතුරු යැවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර 2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස 31 දක්වා කාලපරිච්ඡේදය තුළ මහජන ඉල්ලීම් හා දුක් ගැනවිලි 87 ක් ලැබී තිබුණි.

## 3.3 අනාගත අපේක්ෂා

- උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන පෞද්ගලික ඉඩම් වලින් රටෙහි ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඉඩම් පමණක් රඳවාගෙන අනෙකුත් කොටස් නිදහස් කර නීත්‍යානුකූල හිමිකරුවන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂිතය. ඒ සඳහා දැනට සකස් කර ඇති, යෝජිත ඉඩම් නිදහස් කිරීමේ සැළැස්ම පහත සඳහන් පරිදි වන අතර කාලීනව මතුවන අවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛතාවයන් මත සංශෝධනය වනු ඇත.

| පළාත | දිස්ත්‍රික්කය | නිදහස් කිරීමට යෝජිත ඉඩම් ප්‍රමාණය (අක්කර) | |
|---|---|---|---|
| | | පෞද්. ඉඩම් | රජයේ ඉඩම් |
| උතුර | යාපනය | 1.47 | 262.58 |
| | කිලිනොච්චි | 535.49 | 50.61 |
| | මුලතිව් | 273.00 | 80.92 |
| | මන්නාරම | 532.60 | 6.00 |
| | වව්නියාව | 52.03 | 7.64 |
| | එකතුව | 1394.59 | 407.75 |
| නැගෙනහිර | අම්පාර | 2.00 | 0.50 |
| | මඩකලපුව | 5.00 | 13.60 |
| | ත්‍රිකුණාමලය | 33.38 | 5.00 |
| | එකතුව | 40.38 | 19.10 |
| මුළු එකතුව | | 1434.97 | 426.85 |

3.2 වගුව : 2019 වසරේදී නිදහස් කිරීමට යෝජිත ඉඩම්

# 4. පරිපාලන අංශය

## 4.1 සමාලෝචනය

පරිපාලන අංශය මඟින් අමාත්‍යාංශයේ සියලුම අභ්‍යන්තර අංශයන්හි පරිපාලන කටයුතු සිදු කරන අතර තැපැල්, ප්‍රවාහන, සන්නද්ධ හමුදා හා සුභසාධන, අපි වෙනුවෙන් අපි හා සංඥා යන අංශයන් පරිපාලන අංශය යටතේ පාලනය වේ. එමෙන්ම, නිලධාරීන් යටතේ වන පහත සඳහන් ආයතනයන්හි ද ආයතනික, පරිපාලනමය හා නඩත්තු කටයුතු සිදු කරනුයේ මෙම අංශය මඟිනි.

➢ පරිපාලන අංශය

### පිරිස් පරිපාලන හා ආයතනික කටයුතු

- ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව හා ඊට අනුෂාංගික සියලුම ආයතන කටයුතු.
- යුද්ධ, ගුවන් හා නාවික යන දෙපාර්තමේන්තුවල සේවය කරන සියලුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන සිවිල් නිලධාරීන් සම්බන්ධ ආයතනික කටයුතු (පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හැර).
- ආරක්ෂක නිලධාරීන් යටතේ වන රාජ්‍ය බුද්ධි සේවය, ඒකාබද්ධ භාෂා පුහුණු ආයතනය, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි දෙපාර්තමේන්තුගත සිවිල් නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම් ඇතුළත් ආයතනික කටයුතු.

### මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය

- අමාත්‍යාංශයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් හට දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම.
- කාර්මික හා වෘත්තීය පුහුණු ආයතනයන්හි, අභ්‍යාසලාභීන් හට සය (06) මාසික පරිගණක පුහුණු අවස්ථා ලබා දීම.

### නඩත්තු හා කළමනාකරණ කටයුතු සිදු කිරීම

- ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන මාධ්‍ය කේන්ද්‍රය පිරිසිදු කිරීමේ සේවා කටයුතු.
- ආරක්ෂක අමාත්‍යාංශයේ වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු (ප්‍රවාහන අංශය මඟින්).

### ජාතික වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම

- ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විවිධ සැමරුම්, සුභසාධන වැඩසටහන්, සේවා සැපයීම් ඇතුළු ජාතික වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයේ දායකත්වය ලබා දීම හා ක්‍රියාත්මක කරවීම.

### රණවිරු සුභසාධනය

- ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක සේවාවන්හි රණවිරුවන් වෙනුවෙන් සුභසාධන කටයුතු සිදු කිරීම පරිපාලන අංශය යටතේ වන සන්නද්ධ හමුදා සුභසාධන අංශය මඟින් හා අපි වෙනුවෙන් අපි අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ යටතේ රණවිරුවන් වෙනුවෙන් නිවාස ලබා දීම ඇතුළු වෙනත් සුභසාධන කටයුතු සිදු කරනු ලැබේ.

## 4.2 2018 වර්ෂයේ කාර්යසාධනය

| වගකීම | ක්‍රියාකාරකම් | කාර්යසාධනය | | |
|---|---|---|---|---|
| **ඵලදායිතාව වැඩි දියුණු කිරීම** | පුද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම | සම්පූර්ණ කරන ලද තොරතුරු ඇතුළත් ලිපිගොනු - 391 | | |
| | අප්‍රමාදීව ගෙවීම් පියවීම - බිල්පත් අනුමැතිය ලබා දීම | පරිපාලන අංශය මඟින් යොමු කරන ලද වවුචර් - 2840 | | |
| | අමාත්‍යාංශයේ තැපෑල කාර්යක්ෂමව බෙදා හැරීම | | **ලැබෙන** | **යවන** |
| | | **ලි.ප.තැ.** | 11,200 | 12,920 |
| | | **අතින්** | 35,400 | 34,960 |
| | | **තැපැල්** | 25,200 | 27,000 |
| **නිවැරදි තීරණ සඳහා තොරතුරු කළමනාකරණ පද්ධති සකස් කිරීම** | **1. මානව සම්පත් කළමනාකරණ පද්ධතිය** | | | |
| | • නව පත්වීම් ලබා දීම | 97 | | |
| | • විශ්‍රාම ගැන්වීම | 05 | | |
| | • උසස් කිරීම | 09 | | |
| | • වැටුප් වර්ධක ලබා දීම | 314 | | |
| | • ස්ථාන මාරුවීම් | 41 | | |
| | **2. වාහන කළමනාකරණ පද්ධතිය** | | | |
| | • වාහන අළුත්වැඩියාවන් | 100 | | |
| | • අළුතින් ගෙන්වන ලද වාහන | 10 | | |
| | • වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන | 02 | | |
| **මානව සම්පත්, දැනුම හා හැකියාවන් පෝෂණය කිරීම**<br>• **පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පහසුකම් සැලසීම**<br>• **අමාත්‍යාංශයේ නිලධාරීන් 114 ක් සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූලික පරිගණක පුහුණුවක් ලබා දීම** | වැඩමුළු සංවිධානය | 04 | | |
| | සුභසාධන ක්‍රියාකාරකම් සංවිධානය | 03 | | |
| | අභ්‍යාසලාභී පුහුණුවන්නන් වෙත මාස 06 ක පුහුණුව ලබා දීම | 47 | | |
| | දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම | **දේශීය** | **විදේශීය** | |
| | | 20 | 24 | |

4.1 වගුව : 2018 වර්ෂයේ කාර්යසාධනය

## ➢ සන්නද්ධ හමුදා සුභසාධන අංශය

මව්බිමේ ඒකීයත්වය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා සටන් කළ ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක සේවාවන්හි රණවිරුවන් වෙනුවෙන් සුභසාධන කටයුතු මෙම අංශය මගින් සිදු කෙරෙන අතර ඒ වෙනුවෙන් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

- පදිංචි රජයේ සහ මහවැලි ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමට නිර්දේශ ලබාදීම.
- රණවිරුවන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුලත් කිරීමට පහසුකම් සැලසීම.
- රණවිරු කලත්‍රයන් රණවිරුවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් කොටස් ලබාදීම.
- පස්වැනි වසර ශිෂ්‍යත්වය සමත් රණවිරු දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීම.
- රණවිරුවන්ගේ අඩක් නිමකරන ලද නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා මෙත් සෙවණ ව්‍යාපෘතිය යටතේ මූල්‍යාධාර ලබාදීම.
- රණවිරුවන් හට රාජ්‍ය සේවයේ ස්ථාන මාරු ලබාගැනීමට පහසුකම් සැලසීම.
- රණවිරුවන් වෙනුවෙන් විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | බෙදාදී ඇති ඉඩම් කොටස් ගණන බෙදාදී ඇති ඉඩම් කොටස් ගණන | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | පොලිස් සේවය | සිවිල් ආරක්ෂක සේවය | |
| කුරුණෑගල | කොටවෙහෙර | 12 | 06 | 04 | - | - | 22 |

4.2 වගුව : රණවිරුවන්ට නිවාස ඉදිකරගැනීම සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය

| ශිෂ්‍යාධාර ලැබූ රණවිරු දරුවන් ගණන | | | | එකතුව |
|---|---|---|---|---|
| යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | පොලිස් සේවය | |
| 125 | 11 | 05 | 20 | 161 |

4.3 වගුව: ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන මත 5 වසර ශිෂ්‍යත්වය සමත් රණවිරු දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘතිය

## ➢ ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන මත රණවිරුවන්ට නිවාස ඉදිකරගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘතිය (මෙත් සෙවණ)

මෙත් සෙවණ ව්‍යාපෘතිය මගින් ත්‍රිවිධ හමුදා ප්‍රතිලාභීන් 300 දෙනෙකු සඳහා ඔවුන්ගේ අඩක් නිමි නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා රු.750,000/- ක මූල්‍යාධාර ලබා දෙන ලදී.

| හමුදාව | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | එකතුව |
|---|---|---|---|---|
| I කොටසේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 91 | 34 | 20 | 145 |
| II කොටසේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 107 | 36 | 12 | 155 |
| සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 198 | 70 | 32 | 300 |

4.4 වගුව : මෙත් සෙවණ නිවාස ලාභීන්

| විස්තරය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | එකතුව |
|---|---|---|---|---|
| රජයේ සහ මහවැලි ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමට නිර්දේශ ලබාදීම | 92 | 16 | 18 | 126 |

4.5 වගුව : රණවිරුවන් පදිංචි රජයේ සහ මහවැලි ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුබලපත්‍ර ලබාදීමට නිර්දේශ ලබාදීම

| වර්ෂය | සන්නද්ධ හමුදාව | ශ්‍රේණිය | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2 | 3 | 4 | 5 | 7 | 8 | 9 | 10 | 11 | |
| 2018 | යුද්ධ හමුදාව | 3 | - | 1 | - | 1 | 2 | - | - | 1 | 8 |
| | නාවික හමුදාව | - | 3 | 2 | 1 | 2 | - | - | 1 | - | 9 |
| | ගුවන් හමුදාව | 4 | 2 | 2 | 1 | 1 | 3 | 1 | - | - | 14 |
| | පොලිස් | 1 | 1 | - | - | - | - | 1 | - | - | 3 |
| එකතුව | | 8 | 6 | 5 | 2 | 4 | 5 | 2 | 1 | 1 | 34 |

4.6 වගුව : රණවිරුවන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුලත් කිරීමට සහන ලිපි ලබාදීම

| සන්නද්ධ හමුදාව | ගුරු සේවයෙහි ස්ථාන මාරුවීම් | සෞඛ්‍ය සේවයෙහි ස්ථාන මාරුවීම් | වෙනත් රාජ්‍ය ආයතන ස්ථාන මාරුවීම් | එකතුව |
|---|---|---|---|---|
| යුද්ධ හමුදාව | 13 | 17 | 3 | 33 |
| නාවික හමුදාව | 18 | 9 | 9 | 36 |
| ගුවන් හමුදාව | 10 | 7 | 6 | 23 |
| එකතුව | 41 | 33 | 18 | 92 |

4.7 වගුව : රණවිරු කලත්‍රයන් හට රාජ්‍ය සේවයේ ස්ථාන මාරු ලබාගැනීමට සහන ලිපි ලබාදීම.

දඹුල්ල, කොටවෙහෙර, ඇලහැර, ගම්පහ, කොළඹ, හම්බන්තොට යන කොට්ඨාසවල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණය සහ ආධාර මත සැමට සෙවණ නිවාස ව්‍යාපෘතිද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

### ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන මත 5 වසර ශිෂ්‍යත්වය සමත් රණවිරු දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘතිය

- 2018 වර්ෂයේදී 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් රණවිරු දූ දරුවන් 200 කට පමණ ශිෂ්‍යත්ව ලබාදීම.

### ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රතිපාදන මත රණවිරුවන්ට නිවාස ඉදිකරගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීමේ ව්‍යාපෘතිය

- 2019 වර්ෂයේදී රණවිරුවන් 200 ක් හා ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 25 ක් වෙනුවෙන් ඔවුන්ගේ අඩක් ඉදිකරගත් නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා රු.750,000.00 බැගින් මූල්‍යාධාර ලබාදීම.

## ➢ ''අපි වෙනුවෙන් අපි'' රණවිරු නිවාස ව්‍යාපෘති අංශය

2008 අංක 6 දරණ ''අපි වෙනුවෙන් අපි'' අරමුදල යටතේ ස්ථාපිත ''අපි වෙනුවෙන් අපි'' අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් සන්නද්ධ හමුදා සාමාජිකයන්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීමට සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මූලික වශයෙන් මෙම අංශය යටතේ සිදු වේ. රණවිරුවන් සඳහා නිවාස ප්‍රතිලාභ ලබා දෙනු ලබන මූලික ක්‍රමවේද දෙකකි.

1. සම්පූර්ණ නිවාස ඉදිකර ප්‍රදානය කිරීම.
2. අඩක් නිමකළ නිවාස සම්පූර්ණ කිරීම සඳහා මූල්‍යාධාර පිරිනැමීම.

## රණවිරු නිවාස ඉදි කිරීම








| ව්‍යාපෘතිය | එක් නිවසක් සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල | ඉලක්කගත ප්‍රතිලාභීන් ගණන | වැයවන පිරිවැය |
|---|---|---|---|
| සම්පූර්ණ නිවාස ව්‍යාපාතිය | රු. 1,500,000.00 | 50 | රුපියල් මිලියන 75 යි |
| අර්ධ නිවාස ව්‍යාපාතිය | රු. 750,000.00 | 400 | රුපියල් මිලියන 300 යි |
| එකතුව | - | 450 | රුපියල් මිලියන 375 යි |

4.8 වගුව : 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | සම්පූර්ණ නිවාස ඉදිකර ප්‍රදානය කළ සංඛ්‍යාව | අර්ධ නිවාස සම්පූර්ණ කිරීම සඳහා | එකතුව |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 48 | 240 | 288 |
| නාවික හමුදාව | - | 100 | 100 |
| ගුවන් හමුදාව | 02 | 60 | 62 |
| එකතුව | 50 | 400 | 450 |

4.9 වගුව : 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ප්‍රගතිය

## 4.3 අනාගත අපේක්ෂා

### ➢ පරිපාලන අංශය

- අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් හඳුනා ගැනීම මඟින් අවශ්‍යතාව අනුව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- මෙම නිලධාරීන් මඟින් සහ වෙනත් අමාත්‍යාංශ මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහභාගි කරවීම තුළින් ඔවුන්ගේ සේවය කාර්යක්ෂම කිරීම.
- පුහුණු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම මඟින් නිවැරදි දත්ත පවත්වාගෙන යාම.
- සුභසාධන කටයුතු සංවිධානය කිරීම.

### ➢ සන්නද්ධ හමුදා සුභසාධන අංශය

| | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය | බෙදාදීමට නියමිත ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අනුරාධපුර | මහවිලච්චිය | කට්ටි 32 |
| 02 | පුත්තලම | ආණමඩුව | කට්ටි 10 |
| 03 | පුත්තලම | මුන්දලම | කට්ටි 17 |
| 04 | පොළොන්නරුව | ඇළහැර | කට්ටි 207 |
| 05 | රත්නපුර | කොලොන්න | කට්ටි 21 |

4.10 වගුව : රණවිරුවන්ට නිවාස ඉදිකරගැනීම සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය.

# 5. සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය

## 5.1 සමාලෝචනය

සිවිල් ආරක්ෂක අංශය වෙත පැවරී ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේ දී පහත දැක්වෙන මූලික පරමාර්ථයන් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් කටයුතු කරනු ලැබේ.

- සුරක්ෂිත සිවිල් සමාජයක් ගොඩනැගීම.
- වාණිජ ක්ෂේත්‍රයේ පුපුරණ ද්‍රව්‍ය භාවිතයේ දී සුරක්ෂිත බව තහවුරු කිරීම.
- නියාමනය කරන ලද පෞද්ගලික ආරක්ෂක සේවා පහසුකම් සැපයීම හා සමුද්‍ර ආරක්ෂක සේවා පහසුකම් සැපයීමේ ආයතන තහවුරු කිරීම.
- සන්නද්ධ සේවා පොලිස්, සිවිල් ආරක්ෂක බලකා සමාජිකයින් වෙත හා ඔවුන්ගේ දරුවන් වෙත අධ්‍යාපනික හා වෘත්තීය සංවර්ධන අවස්ථා සැපයීම.

## 5.2 2018 වර්ෂයේ කාර්යසාධනය

| ක්‍රියාකාරකම | | 2018 කාර්යසාධනය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්ෂික අපේක්ෂිත ඉලක්කය | 1 කාර්තුව | | 2 කාර්තුව | | 3 කාර්තුව | | 4 කාර්තුව | | අවසන් කළ මුළු ගණන |
| | | | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | 8/31 දිනට අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | |
| 1 | පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 4090 | 1011 | 941 | 956 | 767 | 1114 | 810 | 1009 | 799 | 3317 |
| 2 | පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 2690 | 453 | 248 | 1107 | 1012 | 865 | 647 | 265 | 129 | 2036 |
| 3 | තොග වෙළෙඳුන්ට පුපුරණ ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම | 645 | 167 | 149 | 155 | 121 | 163 | 120 | 160 | 111 | 501 |
| 4 | ගිනිකෙළි හා අලිවෙඩි නිෂ්පාදනය සඳහා පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීම | 98 | 40 | 14 | 10 | 9 | 18 | 23 | 30 | 15 | 61 |
| 5 | ගිනිපෙට්ටි නිෂ්පාදනය සඳහා පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම | 54 | 10 | 20 | 11 | 10 | 15 | 23 | 18 | 12 | 65 |
| 6 | වීසා නිකුත් කිරීම | 10 | 2 | 1 | 4 | 1 | 3 | 1 | 1 | 3 | 6 |
| 7 | විදේශීය ප්‍රභූන් සඳහා අවසර ලබාදීම | 40 | 6 | 7 | 9 | 9 | 16 | 7 | 9 | 7 | 30 |
| 8 | පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන සඳහා බලය ලබා දීම | 20 | 5 | 5 | 3 | 2 | 9 | 1 | 3 | 20 | 28 |
| 9 | පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන ලියාපදිංචිය අළුත් කිරීම් | 140 | 80 | 69 | 15 | 6 | 5 | 2 | 40 | 75 | 152 |
| 10 | අන්තරායකර බහාලුම් සහිත නැව් මෙහෙයුම් සඳහා අනුමැතිය ලබා දීම | 1480 | 397 | 282 | 358 | 344 | 372 | | 405 | 327 | 953 |
| 11 | අදුරු වීදුරු සඳහා බලය ලබාදීම (වාහන) | 267 | 160 | 29 | 60 | 33 | 30 | 14 | 17 | 4 | 80 |
| 12 | සිවිල් ආරක්ෂක අංශයේ සේවකයින්ගේ- වාර්ෂික වැටුප් වර්ධක | 52 | 23 | 17 | 8 | 14 | 13 | 5 | 8 | 8 | 44 |
| 13 | සිවිල් ආරක්ෂක අංශයේ සේවකයින්ගේ- ස්ථාන මාරුවීම් | 1 | 1 | 1 | | 4 | | 0 | | 3 | 8 |
| 14 | මුහුදු ආරක්ෂණ මෙහෙයුම් - රක්නා ලංකා මගින් | 1815 | 330 | 357 | 467 | 438 | 491 | 500 | 527 | 606 | 1901 |
| | • අවි සහිත සමුද්‍රාරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව | 268 | 44 | 62 | 71 | 48 | 73 | 35 | 80 | 49 | 194 |
| | • T 56 | 100 | 17 | 23 | 16 | 11 | 31 | 5 | 36 | 8 | 47 |
| | • 84 S | 122 | 26 | 30 | 22 | 32 | 45 | 25 | 29 | 35 | 122 |
| | • 12 BOW | - | - | - | - | 0 | - | _ | - | _ | |
| | • LMG | 24 | 2 | 12 | 1 | 5 | 6 | 5 | 15 | 7 | 29 |
| | • පතරොම් | 107500 | 16200 | 41900 | 12000 | 22500 | 30200 | 21359 | 49100 | 26800 | 112559 |
| | • අවි රහිත සමුද්‍රාරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව | 3720 | 898 | 856 | 994 | 914 | 901 | 991 | 927 | 1091 | 3852 |

| | ක්‍රියාකාරකම | 2018 කාර්යසාධනය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්ෂික අපේක්ෂිත ඉලක්කය | 1 කාර්තුව | | 2 කාර්තුව | | 3 කාර්තුව | | 4 කාර්තුව | | අවසන් කළ මුළු ගණන |
| | | | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | 8/31 දිනට අවසන් කළ ගණන | අපේක්ෂිත ඉලක්කය | අවසන් කළ ගණන | |
| **මුහුදු ආරක්ෂණ මෙහෙයුම් - ශ්‍රී ලංකා නාවික හමුදාව මගින්** | | | | | | | | | | | |
| 15 | වාණිජ නැව් කොළඹ වරායේ තාවකාලිකව අවි ගබඩා කිරීම | 221 | 35 | 59 | 55 | 39 | 68 | 35 | 63 | 45 | 178 |
| 16 | අවි රහිත නෙදර්ලන්ත ආරක්ෂකයින් යෙදවූ නැව් මෙහෙයුම් | 29 | 9 | 0 | 10 | 0 | 6 | 1 | 4 | _ | 1 |
| 17 | ගොඩබිමින් අවි ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය | 154 | 39 | 60 | 33 | 56 | 25 | 50 | 57 | 83 | 249 |
| 18 | ගුවනින් අවි ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය | 54 | 10 | 10 | 18 | 21 | 13 | 11 | 13 | 14 | 56 |
| | • අවි | 741 | 196 | 114 | 189 | 88 | 155 | 79 | 201 | 186 | 467 |
| | • පතරොම් | 15500 | 35990 | 30394 | 40380 | 61585 | 35700 | 23500 | 42930 | 44675 | 160154 |
| 19 | අමතර අවි මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනය-ගාලු වරාය | 980 | 207 | 246 | 230 | 226 | 230 | 151 | 313 | 235 | 858 |
| 20 | සමුද්‍රාරක්ෂක භටයින් නැව් නැගීම / බැසීම | 3 | 2 | 0 | 1 | 0 | - | 1 | - | _ | 1 |
| 21 | නැව් තුල අවි සීල්කර තබා ගැනීමට අනුමැතිය දීම | 4 | - | 0 | 2 | 1 | 2 | 0 | - | _ | 1 |
| 22 | වරායෙන් පිටත නැව් මෙහෙයුම් | 68 | 21 | 15 | 17 | 5 | 15 | 6 | 15 | 22 | 48 |
| 23 | වරාය ඇතුළත නැව් මෙහෙයුම් | 30 | - | 13 | 9 | 10 | 11 | 10 | 10 | 13 | 46 |
| 24 | සමුද්‍රාරක්ෂකයින් පුහුණු කිරීම් | 7 | - | 0 | 7 | 0 | - | 0 | - | 4 | 4 |
| 25 | වගා ආරක්ෂාව/ සත්ත්ව පාලනය සඳහා අවි ඉල්ලීම/ බලපත්‍ර ලබාදීම | 150 | 10 | 0 | 110 | 0 | 20 | 0 | 10 | 12 | 12 |
| 26 | දේපළ හා ජීවිත ආරක්ෂාව සඳහා -.38 හා මිමි 9 අවි ඉල්ලීම | 85 | 15 | 0 | 40 | 2 | 25 | 5 | 5 | 15 | 22 |
| 27 | රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් | 65 | 15 | 0 | 15 | 1 | 15 | 3 | 20 | 41 | 4 |
| 28 | රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් (NSB) | 2000 | 300 | 0 | 300 | 0 | 1100 | 450 | 300 | 40 | 490 |
| 29 | ක්‍රීඩා කටයුතු සඳහා අවි ඉල්ලීම් | 70 | 20 | 0 | 35 | 0 | 5 | 3 | 10 | නැත | 3 |
| 30 | ක්‍රීඩා කටයුතු සඳහා නිකුත්කර ඇති ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම | 825 | 395 | 35 | | 47 | | 0 | 452 | නැත | 82 |
| 31 | වායු රයිෆල් ආනයනය කිරීම් | 6000 | 1500 | 2382 | 1500 | 521 | 1500 | 876 | 1500 | නැත | |
| 32 | අබලන් ගිනි අවි වෙනුවෙන් නව ගිනි අවි නිකුත් කිරීම | 60 | 20 | 0 | 15 | 0 | 15 | 0 | 10 | 0 | 0 |
| 33 | අවුරුදු 65 ඉක්ම වූ ගිනි අවි හිමි කරුවන්ගේ "පවුල" තුළ ගිනි අවි පැවරීම සඳහා ලද අයදුම්පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම | 200 | 50 | 29 | 50 | 19 | 60 | 8 | 40 | 10 | 66 |
| 34 | නිදහස් ගිනි අවි බලපත්‍ර / නව නිකුත් කිරීම් - මහජන නියෝජිතයින් | 54 | 14 | 5 | 14 | 5 | 13 | 0 | 13 | 1 | 11 |
| 35 | නිදහස් ගිනි අවි බලපත්‍ර /අළුත් කිරීම් - මහජන නියෝජිතයින් | 336 | 98 | 76 | | 21 | | 10 | 238 | 8 | 115 |
| 36 | .38 හා මිමි 9 අවි - බලපත්‍ර අළුත් කිරීම් | 2073 | 716 | 496 | | 32 | | 4 | 1357 | 919 | 1451 |
| 37 | .38 හා මිමි 9 අවි පැවරීම් | | | 3 | | 0 | | 0 | | 2 | 5 |
| * | 2017.11.01 දින සිට ගිනි අවි නිකුත් කිරීම තාවකාලිකව නවතා ඇත. | | | | | | | | | | |

# 6. මුදල් අංශය

## 6.1 සමාලෝචනය

ආරක්ෂක අමාත්‍යාංශයේ ගිණුම් අංශය යටතේ පවතින උප අංශ 05කි.

- ප්‍රසම්පාදන අංශය
- ගෙවීම් අංශය
- මුදල් අංශය
- ණය හා අත්තිකාරම් අංශය
- වැටුප් අංශය

## කාර්යයන්

- අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සැකසීම, වාර්ෂික අග්‍රිම ඉල්ලුම් කිරීම, මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම, ආදායම් ගිණුම් සැකසීම, වාර්ෂික විසර්ජන ගිණුම් සකස් කිරීම හා නිලධාරීන් යටතේ වන නිල බැංකු ගිණුම් සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව ඇතුළුව නිලධාරීන් යටතේ වන දෙපාර්තමේන්තු, ආයතන සහ ව්‍යාපෘතීන්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ වෙනුවෙන් ආර්ථික වශයෙන් ඵලදායි ලෙස භාණ්ඩ හා සේවා මිලදී ගැනීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් ජංගම වත්කම් කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයේ සහ ඒ යටතේ වන ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා වැටුප් දීමනා ගෙවීම සහ ණය අත්තිකාරම් ගෙවීම් කටයුතු කිරීම හා අදාළ පහසුකම් සැලසීම.
- අමාත්‍යාංශයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා ගෙවීම් කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු ආයතන හා ව්‍යාපෘතිවල සිදුවන නැතිවීම් අලාභහානි කපා හැරීම් සහ ගිණුම් තැබීමේ කටයුතු සිදු කිරීම.

| | ආයතනය/අංශය | පුනරාවර්තන වියදම (රු. මිලියන) | | | ප්‍රාග්ධන වියදම (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන ප්‍රමාණය | 2018.12.31 ට සත්‍ය වියදම | වියදම % | ප්‍රතිපාදන ප්‍රමාණය | 2018.12.31 ට සත්‍ය වියදම | වියදම % |
| 1 | අමාත්‍ය කාර්යාලය | 22.2 | 17.3 | 77.93 | 1.9 | 1.2 | 62.06 |
| 2 | සාමාන්‍ය පරිපාලනය | 2,996.8 | 2,927.6 | 97.69 | 4,533.3 | 3,399.9 | 75.00 |
| 3 | රාජ්‍ය බුද්ධි සේවාව | 1,448.8 | 1,374.2 | 94.85 | 193.3 | 188.8 | 97.65 |
| 4 | ජාතික ශිෂ්‍ය භට බලකාය | 457.1 | 417.2 | 91.27 | 35.5 | 17.7 | 49.93 |
| 5 | පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 13.1 | 12.8 | 97.81 | 43.0 | 42.5 | 98.75 |
| 6 | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය | 65.2 | 61.7 | 94.62 | 3.2 | 2.9 | 89.81 |
| 7 | රාජ්‍ය අමාත්‍ය කාර්යාලය | 36.3 | 25.0 | 68.79 | 1.6 | 1.0 | 60.44 |
| 8 | යටිතල පහසුකම් සංවර්ධනය | 1,925.1 | 1,827.9 | 94.95 | 6,821.2 | 6,087.2 | 89.24 |
| එකතුව | | 6,964.6 | 6,663.7 | 95.68 | 11,633.1 | 9,741.2 | 83.74 |


6.1 වගුව: මූල්‍යමය ප්‍රගතිය

### ➢ මුදල් අංශය

අමාත්‍යාංශයේ 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා 2019 ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

2018 වර්ෂයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කර ඇත.

- වැටුප් හා සංඛ්‍යා ලේඛන වාර්තාව
- ජාතික ආරක්ෂක අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- මාසික ගිණුම් සාරාංශය
- මාසික අක්මුදල් ඉල්ලුම් වාර්තාව
- හිඟ බිල්පත් වාර්තාව
- බැංකු ගිණුම් පිළිබඳ විස්තරය
- අක්මුදල් සැසඳුම
- මාසික අක්මුදල් සැසඳුම
- වාර්ෂික අක්මුදල් ඉල්ලුම් වාර්තාව
- විසර්ජන ගිණුම
- බැංකු සැසඳුම් ප්‍රකාශය
- සත්‍ය අදායම් වාර්තාව
- හිඟ ආදායම් වාර්තාව
- ආදායම් ගිණුම
- පොදු තැන්පත් සැසඳුම
- සමුච්චිත වියදම් වාර්තාව
- කාර්යසාධක වාර්තාව
- ශුන්‍ය ප්‍රතිපාදන වාර්තාව




6.1 ප්‍රස්ථාරය: 2017.12.31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2017.12.31 දිනට | | 2018.12.31 දිනට | |
|---|---|---|---|---|
| | අනුමත වාර්ෂික අක්මුදල් සීමාව | අක්මුදල් ලැබීම් | අනුමත වාර්ෂික අක්මුදල් සීමාව | අක්මුදල් ලැබීම් |
| පුනරාවර්තන | 5,938.39 | 3,649.825 | | 4,151.956 |
| ප්‍රාග්ධන | 6,150.36 | 2,880.862 | | 1,335.337 |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 75.00 | 8,000 | 100.000 | 96.125 |

6.2 වගුව: 2018 වාර්ෂික අක්මුදල් අවශ්‍යතාව භාණ්ඩාගාර අනුමැතිය මත මාසිකව අක්මුදල් ලබාගැනීම

| ආදායම් ශීර්ෂ | ඇස්තමේන්තුව (රු.මිලි) | 2017.12.31 ට ගිණුම්ගත කිරීම් |
|---|---|---|
| පුපුරණ ද්‍රව්‍ය හා බලපත්‍ර ගාස්තු | 22.6 | 21.02 |
| රජයේ ගොඩනැගිලි කුලී ආදායම | 3.7 | 3.72 |
| කුලී ආදායම | 80.7 | 821.23 |

6.3 වගුව: 2018 වර්ෂයේ අමාත්‍යාංශ ආදායම් ගිණුම්ගත කිරීම

| ආයතනය | අමතර ප්‍රතිපාදන සඳහා නිර්දේශ කිරීම් (රු.මිලියන) | අනුමැතිය ලබාගත් ප්‍රමාණය | ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් සඳහා නිර්දේශ | අනුමැතිය (රු.මිලියන) |
|---|---|---|---|---|
| නිලධාරීන් | 1,925.5 | 1,925.50 | 225,356 | 179,765 |
| වෙනත් දෙපාර්තමේන්තු | | | | |
| යුද්ධ හමුදාව | 12,499,000 | 839,300 | 102,095,110 | 2,335,110 |
| නාවික හමුදාව | 529,100 | 157,909.10 | 435,000 | 100 |
| ගුවන් හමුදාව | 839,319 | 389,462 | 481,500 | 166,319 |
| සිවිල් ආරක්ෂක දෙ. | 55,240 | - | 830,960 | 828,900 |
| වෙරළ ආරක්ෂක දෙ. | 17,300 | 2,500 | 4,000 | 17,300 |

6.4 වගුව: නිලධාරීන් හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන හා ව්‍යාපෘතිවලට අවශ්‍ය ප්‍රතිපාදන සම්බන්ධ කටයුතු

| විස්තරය | ඉල්ලුම් කළ ප්‍රමාණය | නිර්දේශ ලබාදුන් ප්‍රමාණය |
|---|---|---|
| බැංකු ගිණුම් විවෘත කිරීම | 02 | 02 |
| බැංකු ගිණුම් හවසා දැමීම. | 01 | - |

6.5 වගුව: අමාත්‍යාංශයේ හා ඒ යටතේ වෙනත් දෙපාර්තමේන්තු වල බැංකු ගිණුම් වලට අදාළ කටයුතු

| මුදල් රෙගුලාසි | ඉල්ලුම් කළ ප්‍රමාණය (රු.මිලියන) | නිර්දේශ ලබාදුන් ප්‍රමාණය රු. මිලියන |
|---|---|---|
| මු.රෙ. 115 | 35 | 35,875 |
| මු.රෙ. 835 | 46.50 | 42 |

6.6 වගුව: මු.රෙ. 115 යටතේ ගෙවීම් සහ මු.රෙ. 835 යටතේ ගොඩනැගිලි කුලී සඳහා අනුමැතිය

## ➢ ගෙවීම් අංශය

ගෙවීම් අංශය විසින් පහත දැක්වෙන ආයතන වලට අදාලව වුචර්පත් සඳහා ගෙවීම් කරනු ලැබේ.

- අමාත්‍ය කාර්ය මණ්ඩලය
- අමාත්‍යාංශ පරිපාලන හා කාර්ය මණ්ඩලය
- රාජ්‍ය බුද්ධි සේවාව
- සංවර්ධන හා පර්යේෂණ ආයතනය
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
- මාධ්‍ය කේන්ද්‍රය

2018 වර්ෂය තුළ අදාළ සියලු වියදම් ගෙවීම සිදු කර ඇති අතර 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ගෙවීම් අංශයට වවුචර්පත් 10211 කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇත. 2016 හා 2017 වර්ෂවලට සමගාමීව 2018 වර්ෂයේදී ද ගෙවීම් අංශයට ලැබී ඇති වවුචර්පත් සම්බන්ධව නියමිත කාල සීමාව තුළ පහත දැක්වෙන පරිදි ක්‍රියාකර ඇත.

- ගෙවීම් අංශයට ලැබෙන සියලුම වවුචර්පත් G-35 Vouchers Management Systems වැඩසටහන යටතේ පරිගණක ගතකර ඇති අතර ගෙවීම් කළ පසු චෙක්පත් අංකද පරිගණක ගත කිරීම.
- අමාත්‍යාංශය විසින් බාහිර ආයතන වලට නිකුත් කරනු ලබන චෙක්පත් 100% ක් මුද්‍රණය කර ලබාදීම හා විශ්වසනීයත්වය වඩාත් තහවුරු වන පරිදි කටයුතු කිරීම.
- අදාළ ආයතන වලට ඔවුන්ගේ ගිණුම් හරහා Slip Payments මගින් ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම මගින් කාර්යක්ෂමතාවය වැඩි කිරීම.

## ගැටළු සහ අභියෝග

- ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීම නිසා 2018 වර්ෂයට අදාළ රු. මිලියන 15,712,668.37 ක් 2019 වර්ෂයේදී ගෙවීමට සිදුවීම.
- ගෙවීම් සඳහා වවුචර්පත් ඉදිරිපත් කිරීම ප්‍රධාන වශයෙන් පරිපාලන අංශය, සැපයීම් හා අලාභහානි අංශය හා ප්‍රවාහන අංශය හරහා සිදු කෙරෙන අතර ඒ සඳහා යම් කාලයක් ගත වන බැවින් ගෙවීමේදී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව ඇතැම් විට ගැටළු ඇති වේ. විදුලි බිල්පත් හා ජල බිල්පත් සඳහා මෙම ප්‍රමාදයන් බොහෝවිට බලපෑම් ඇති වීම නිසා එම බිල්පත් සඳහා අධිභාර ගෙවීමට සිදුවීම.
- මානව සම්පත් හා භෞතික සම්පත්වල විශේෂයෙන් පරිගණක ඌණතාවයන් පවතින බැවින් වඩාත් කාර්යක්ෂමව කටයුතු කරගෙන යෑමද ගැටළු සහගත වීම.

## ➢ ණය අත්තිකාරම් අංශය

රාජ්‍ය සේවකයන්ගේ සුභසිද්ධිය සඳහා රජය මගින් සහනදායි පොළී ක්‍රමයක් යටතේ අමාත්‍යාංශයේ මෙන්ම රාජ්‍ය බුද්ධි සේවයේ හා භාෂා පුහුණු මධ්‍යස්ථානවල සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයින් සඳහා ණය පහසුකම් ලබාදීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

| විස්තරය | වියදමෙහි උපරිම හර සීමාව (රු.මි) | ලැබීම්වල අවම සීමාව (රු.මි) | හර ශේෂ උපරිම සීමාව (රු.මි) |
|---|---|---|---|
| 2018 විසර්ජන පනතට අනුව | 100.0 | 50.0 | 275.0 |
| 2018.01.01 සිට 2018.12.31 දක්වා | 96.1 | 53.6 | 210.8 |

6.7 වගුව: 2018 වර්ෂය සඳහා විසර්ජන පනතින් අත්තිකාරම් "බී" ගිණුම සඳහා ඉහත සඳහන් සීමාවන් යටතේ බලය ලබා දීම

රාජ්‍ය සේවකයන්ගේ සුභසිද්ධිය සඳහා මෙම අංශය විසින් 2018 වසර තුළදී ඉහත සීමාවන්ට යටත්ව අදාළ නිලධාරීන් හා සේවකයන් සඳහා රජයේ ප්‍රතිපාදන යටතේ ලබා දුන් ණය පිළිබඳ සාරාංශගත තොරතුරු පහත පරිදි වේ.

| ණය වර්ගය | රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් සඳහා (රු.මි) | අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා (රු.මි) | ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය | මුළු එකතුව |
|---|---|---|---|---|
| විශේෂ අත්තිකාරම් | 2.6 | 0.25 | 0.012 | 2.8 |
| උත්සව අත්තිකාරම් | 11.9 | 1.8 | 0.46 | 14.2 |
| ආපදා ණය | 56.3 | 14.6 | 8.2 | 79.0 |
| පාපැදි ණය | | 0.006 | | 0.006 |
| ණය බරින් මිදීමේ ණය | | 0.007 | | 0.007 |
| එකතුව | **70.8** | **16.7** | **8.7** | **96.1** |

6.8 වගුව: සීමාවන්ට යටත්ව අදාළ නිලධාරීන් හා සේවකයන් සඳහා රජයේ ප්‍රතිපාදන යටතේ ලබා දුන් ණය

- 2018.01.01 දින සිට 2018.12.31 දක්වා කාලය තුළ ඉහත නිලධාරීන්ගේ ශුභ සිද්ධිය සඳහා ණය වශයෙන් ලබා දුන් මුළු ණය මුදල රු. 96,126,556.27 කි.
- 2018.01.01 දින සිට 2018.12.31 දක්වා මෙම අමාත්‍යාංශ නිර්දේශයන් සහිතව වාණිජ බැංකු වෙත දේපළ ණය ලබා දීම සඳහා යොමු කෙරුණු අයදුම්පත් ගොණු ප්‍රමාණය 17කි.
- ඇටෝර්නි බලය අවලංගු කර දේපළ නිරවුල් කිරීම් - 150
- ඉහත කාලපරිච්ඡේද සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ අයත් ණය දීම්, අවකරණ හා අය කර ගැනීම් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.
- මු.රෙ.506 (ඩී) ප්‍රකාරව 2018.12.31 දිනට රජයේ අත්තිකාරම් බී ගිණුම් සැසඳීම් ප්‍රකාශය 2019.02.28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

## ➢ ප්‍රසම්පාදන අංශය

ත්‍රිවිධ හමුදාව ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති සියලු දෙපාර්තමේන්තු හා ව්‍යාපෘතින්ට අදාළ ප්‍රසම්පාදන කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලබයි. මේ යටතේ ත්‍රිවිධ හමුදාවට අදාළව රු.මිලියන 200 ඉක්මවන වටිනාකමින් යුත් ප්‍රසම්පාදන කටයුතු (අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව - SCAPC) හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු (අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - MPC) මෙම අංශය විසින් සිදුකරනු ලබයි.

2018 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රසම්පාදන කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ආයතනය | ප්‍රසම්පාදන ප්‍රමාණය | වටිනාකම රු.මි. | ප්‍රගතිය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලංසුලේඛන කෙටුම්පත් කිරීම | ලංසු ලේඛන නිකුත් කිරීම | ලංසු ලේඛන ඇගයීම | ප්‍රසම්පාදන කමිටු තීරණ | අභියාචනා | ප්‍රදානය කළ | අවලංගු කළ |
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 08 | 4,618.34 | - | - | - | 05 | - | - | 03 |
| 02 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 18 | 10,696.60 | 04 | - | 02 | 08 | 04 | - | - |
| 03 | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 05 | 1,658.00 | - | - | - | - | - | 05 | - |
| 04 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 01 | 205.00 | - | - | - | - | 01 | - | - |
| 05 | උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය | 01 | 602.00 | - | 01 | - | - | - | - | - |

6.9 වගුව: ප්‍රසම්පාදන මට්ටම- SCAPC

| අංකය | ආයතනය | ප්‍රසම්පාදන ප්‍රමාණය | වටිනාකම රු.මි. | ප්‍රගතිය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලංසුලේඛන කෙටුම්පත් කිරීම | ලංසු ලේඛන නිකුත් කිරීම | ලංසුලේඛන ඇගයීම | ප්‍රසම්පාදන කමිටු තීරණ | යළි කැඳවූ | ප්‍රදානය කළ | අවලංගු කළ |
| 01 | ආරක්ෂක අමාත්‍යාංශය | 160 | 214.50 | - | - | - | - | - | 160 | 160 |
| 02 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 07 | 921.20 | 01 | - | 01 | 01 | - | 04 | - |
| 03 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 02 | 323.00 | - | 01 | - | - | - | 01 | - |
| 04 | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 11 | 998.00 | - | - | - | - | 02 | 09 | - |
| 05 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 13 | 1,501.00 | 02 | - | 02 | - | - | 09 | - |
| 06 | රාජ්‍ය බුද්ධි සේවාව | 32 | 37.30 | - | - | - | - | - | 32 | - |
| 07 | උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය | 02 | 440.00 | - | - | - | - | - | 02 | - |

6.10 වගුව: ප්‍රසම්පාදන මට්ටම- MPC

- ඉන්දියානු/වෙනත් ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රසම්පාදනයන්

| අ/අ | ආයතනය | ප්‍රසම්පාදන ප්‍රමාණය | වටිනාකම ඇ.එ.ඩො.මි | කාලසීමාව තුළ ප්‍රදානය කළ ප්‍රමාණය | යළි කැඳවීම | අවසන් නොවූ |
|---|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 02 | 12.99 | 01 | 01 | 01 |
| 02 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 02 | 3.22 | - | 01 | 01 |

6.11 වගුව: ප්‍රසම්පාදන මට්ටම - SCAPC

- මු.රෙ.අනුමැතිය ලබාදීම

| අංකය | ආයතනය | අනුමැතිය දුන් ප්‍රමාණය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 133 |
| 02 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 30 |
| 03 | රාජ්‍ය බුද්ධි සේවාව | 12 |
| 04 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 225 |
| 05 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 05 |

6.12 වගුව: මු.රෙ.136 යටතේ අනුමැතිය ලබාදීම්

| අංකය | ආයතනය | අනුමැතිය දුන් ප්‍රමාණය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 34 |
| 02 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 47 |
| 03 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 54 |
| 04 | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | - |

6.13 වගුව: ණයවර ලිපි සඳහා අනුමැතිය ලබාදීම

ඊට අමතරව, ත්‍රිවිධ හමුදාවට අදාල වාහන කුලී පදනම මත ලබා ගැනීමට අනුමැතිය ලබාදීම හා CEPEC අනුමැතිය ලබාදීම යන කාර්යයන් ද මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

## ➢ සැපයීම් හා අලාභහානි අංශය

- ආරක්ෂක අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා නීති රෙගුලාසි අණ පනත්වලට අනුකූලව ආර්ථික වශයෙන් ඵලදායී ලෙස භාණ්ඩ මිලදී ගැනීම හා ගබඩා කිරීම, අදාල අංශ වෙත නිකුත් කිරීම හා ලේඛන ගත කිරීම.
- වාර්ෂික සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම මගින් අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන සියලුම දෙපාර්තමේන්තු සහ ආයතනවලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට පහසුකම් සැපයීම හා මග පෙන්වීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා භාණ්ඩ අපහරණ කටයුතු සිදු කිරීම මගින් මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තුවලට හා ආයතන වලට අයත් මූල්‍ය නොවන වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම, නිසි පරිදි අනවශ්‍ය භාණ්ඩ අපහරණය කිරීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු සහ ආයතන සතු දේපළවලට හා භාරයට පත්කළ දේපළ වලට හානිවීම සම්බන්ධව මු.රෙ.102 හි විධිවිධාන අනුව කටයුතු කිරීම.
- මු.රෙ.104(3) ප්‍රකාරව ප්‍රාථමික වාර්තාව ලද විගස මු.රෙ.104(4) අවසාන වාර්තාව සහ පරීක්ෂණ මණ්ඩල වාර්තාව කැඳවා ඊට වගකිව යුත්තන් වේ නම් දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුළත්ව ඔවුන්ගෙන් අලාභය අය කර ගැනීම තුළින් රජයේ පාඩුව අවම කර ගැනීම.
- ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය මගින් අමාත්‍යාංශ සතු ස්ථාවර වත්කම් කළමනාකරණය කිරීම.
- පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම හා ලේඛනගත කිරීමට අදාල කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම.
- මු.රෙ.855 යටතේ මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු හා ආයතනවල අවශ්‍යතාවන් හඳුනාගෙන ඊට ගැළපෙන ආකාරයට පුවත්පත් මිලදී ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි ඇස්තමේන්තුගත වාහන හා යන්ත්‍ර සූත්‍ර දේශීය නියෝජිත ආයතනයක් න් වෙතින් අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) යටතේ අනුමැතිය ලබාදීම මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියට දායක වීම.

2018.01.01 සිට 2018.12.31 දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රගතිය

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ව්‍යාපෘති වලට අදාල ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම. (103 වැය ශීර්ෂයට අදාලව)
- 2018 වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් රු.41,423,906.55 ක ආදායමක් උපයාගෙන රජයේ අරමුදලට බැර කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන ආයතනවලට තම කාර්යභාරය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිසි ප්‍රමිතියට අනුකූලව අවම පිරිවැය දරමින්, ප්‍රසම්පාදන සැලැස්මට අනුව විනිවිදභාවයකින් යුතුව ලබාදීම.
- 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු, අපහරණ කටයුතු නිසි පරිදි ඉටුකර අවශ්‍ය දත්තයන් මහා භාණ්ඩාගාරය වෙත ලබාදීම.
- රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි ඇස්තමේන්තුගත වාහන හා යන්ත්‍ර සූත්‍ර දේශීය නියෝජිත ආයතනයන් වෙතින් අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 9.3.1 (ආ) යටතේ අනුමැතිය ලබා දීම.
- 2018 ප්‍රසම්පාදන සැලැස්මට අනුව කාර්යක්ෂම හා ඵලදායි අයුරින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම, ගබඩා කිරීම හා බෙදාහැරීම.
- අලාභහානි සම්බන්ධ ගොනුවල කටයුතු හා කපාහැරීම, අයකර ගැනීම නොපමාව සිදු කිරීම.

| සන්නද්ධ හමුදාව | ගොනු සංඛ්‍යාව |
|---|---|
| යුද්ධ හමුදාව | 40 |
| නාවික හමුදාව | 60 |
| ගුවන් හමුදාව | 26 |

6.14 වගුව: ණයවර ලිපි සඳහා අනුමැතිය ලබාදීම

''අපි වෙනුවෙන් අපි'' අරමුදල

''අපි වෙනුවෙන් අපි'' අරමුදල 2008 අංක 6 දරණ ''අපි වෙනුවෙන් අපි'' අරමුදල් පනත මගින් පිහිටුවා ඇත.

- සන්නද්ධ සේවාවල සාමාජිකයන් හට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහාය ලබාදීම සඳහා යෝජනා ක්‍රම ඇති කිරීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයන්හට නිවාස පහසුකම් ලබා ගැනීම සඳහා ආධාර ලබාදීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම සඳහා සහ එම ණය ගෙවීම සඳහා එම සන්නද්ධ හමුදා සාමාජිකයන් හට ආධාර ලබා දීම සඳහා විධිවිධාන සැළැස්වීම.
- සන්නද්ධ හමුදා සමාජිකයකු මිය යන අවස්ථාවේදී හෝ තුවාල සිදු වන අවස්ථාවකදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම.

රාජ්‍ය ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් හා පනත මගින් නම් කරන ලද තනතුරු දරණ හා නීතිය මූල්‍ය යන ක්ෂේත්‍ර වල සුදුසුකම් පළපුරුද්ද, විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් වෙත අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පැවරී ඇත.''අපි වෙනුවෙන් අපි'' අරමුදලේ ප්‍රධාන පරමාර්ථයන් වන සන්නද්ධ හමුදා සාමාජිකයන් හට නිවාස පහසුකම් සළසා දීම හා ඒ සඳහා ආධාර ලබා දීම යටතේ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියදී දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් නමින් හා ක්‍රියාන්විතයේදී ආබාධිත වූවන් හා සේවයේ නියුතු රණවිරුවන් වෙනුවෙන් දිප ව්‍යාප්තව නිවාස ඉදි කර දීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.ඒ අනුව 2018 වර්ෂය තුළදී දිපව්‍යාප්තව රණවිරු සම්පූර්ණ හා අර්ධ නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන පහත පරිදි නිදහස් කර ඇත.

➢ නිවාස සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන

| අංක | විස්තරය | මුළු වියදම (රු.) |
|---|---|---|
| 01. | සම්පූර්ණ නිවාස 50 ක් සඳහා | 75,000,000.00 |
| 02. | රණවිරු අර්ධ නිවාස ඉදි කිරීම සඳහා (පළමු වාරිකය නිදහස් කිරීම) | 400,643,632.00 |
| 03. | ව්‍යාපෘති මෙහෙයුම් වියදම් (පුනරාවර්තන වියදම්) | 8,269,041.00 |

6.15 වගුව: නිවාස සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන

තවද, විශ්‍රාමික නිලධාරි සංගමය මගින් සිදු කරනු ලබන රණවිරු සුභසාධන හා ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු.1,043,500.00 ක මුදලක් නිදහස් කරන ලදී. 2019 වර්ෂයේ දී ''අපි වෙනුවෙන් අපි'' අරමුදල මගින් රණවිරුවන්ගේ අර්ධ නිවාස අවශ්‍යතා සළකා බලා අර්ධ නිවාස 600 ක් ඉදිකිරීමට අපේක්ෂිත අතර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත කාලීන යෝජනාවන් සළකා බලා රණවිරු සුභසාධනය වෙනුවෙන් අවශ්‍ය කටයුතුකිරීමට අපේක්ෂා කෙරේ.

➢ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ අයවැය පිළියෙල කිරීම, අයවැය ප්‍රතිපාදනයන්ට අනුකූල පරිදි වියදම් දැරීම, වාර්ෂික විසර්ජන ගිණුම් සැකසීමට අදාළ තොරතුරු ලබාදීම, ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම සහ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ මූල්‍ය අංශය මගිනි.

| විස්තරය | ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය | ජාතික ශිෂ්‍යභට බළකාය | ආරක්ෂක සේවා විද්‍යාලය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 177.00 | 69.60 | - |
| ප්‍රාග්ධන වියදම් | 12.00 | 15.00 | 93.07 |

6.16 වගුව:2018.12.31 දිනට ප්‍රගතිය (රු.මිලියන)

# 7. ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

## 7.1 සමාලෝචනය

ප්‍රතිපත්ති හා සැලසුම් අංශය අමාත්‍යංශයේ විෂය පථයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම හා නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් හා ඊට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කාර්යයෙහි නියැලී සිටියි. වාර්ෂික ප්‍රතිපාදන මගින් ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු නිලධාරීන්ට අනුබද්ධ ආයතන සමඟ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම හා සංහිඳියාව ඇති කිරීම සඳහා වන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබයි.

### කාර්යභාර්යයන්

- ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා සම්බන්ධීකරණය
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ප්‍රතිපාදන යෙදවීම අධීක්ෂණය කිරීම.
- වාර්ෂික ප්‍රතිපාදන වෙන් කරගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- විවිධ ව්‍යාපෘති, වැඩසටහන් සහ වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- ආරක්ෂක නිලධාරීන් හා ඊට අනුබද්ධ ආයතන මගින් සිදු කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය හා එකී ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දීම.
- රේඛීය නිලධාරීන්න්ට අදාළව ක්‍රියාත්මක වන රජයේ විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- ව්‍යාපෘති/ වැඩසටහන් හි භෞතික ප්‍රගතිය අධීක්ෂණය.
- කාර්යසාධන වාර්තාව සහ ප්‍රගති වාර්තාව සකස් කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.

## 7.2 2018 වර්ෂයේ කාර්යසාධනය

➢ විවිධ ව්‍යාපෘති, වැඩසටහන් සහ වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

රු.මි.20 ඉක්මවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ක්‍රියාකරනු ලබන අතර 2018 වර්ෂයේ නව ව්‍යාපෘති 37 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

➢ කාර්යසාධන වාර්තාව සකස් කිරීම.

2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පිළියෙළ කොට පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ඊට අමතරව, ත්‍රිවිධ හමුදාවන්ට හා නිලධාරීන් යටතේ වන ආයතනයන්ට අයත් කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

➢ ප්‍රගති සමාලෝචනය

කාර්තුමය වශයෙන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා නිලධාරීන්ට අනුබද්ධ සියලුම ආයතනයන්හි සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

➢ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස්කිරීම

නිලධාරීන් හා ඊට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය විශ්ලේෂණය කරමින් 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වන කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රගති වාර්තාව 2018 අයවැය විවාදය අවස්ථාවේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

➢ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

2018 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර එම සැලැස්ම ජනාධිපති ලේකම් කාර්යාලය, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

➢ ව්‍යාපෘති ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

නිලධාරීන් හා ඊට අනුබද්ධ ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල මාසික හා කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

➢ මානුෂීය සොයාගැනීමේ හා මුදාගැනීම් කණ්ඩායම්හි ධාරිතා සංවර්ධනය

ආපදා කළමනාකරණය සම්බන්ධව ත්‍රිවිධ හමුදාවේ සෝදිසි කිරීමේ හා මුදා ගැනීමේ කණ්ඩායම්වල කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා පුහුණු ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙනු ලැබූ අතර ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

## 7.3 අනාගත අපේක්ෂා

- 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම හා ප්‍රතිපාදන ඵලදායිව යෙදවීම.
- 2018 වර්ෂයට අයත් කාර්ය සාධන වාර්තාව සකස් කිරීම හා නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- 2020 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට සහාය වීම හා අමාත්‍යාංශ ප්‍රගතිය අයවැය කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රගති වාර්තාව - 2019 සකස් කිරීම.
- ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- නව ව්‍යාපෘති හඳුනා ගැනීම, නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම

# 8. අභ්‍යන්තර විගණන අංශය

8.1 2018 වර්ෂයේ කාර්යසාධනය

| ආයතනය | විගණන විෂයපථය හා විගණන පරීක්ෂණය සිදු කළ දිනය |
|---|---|
| ආරක්ෂක අමාත්‍යංශය | ප්‍රවාහන අංශය - 2018/01/22 |
| | සැපයුම් අංශය හා ගබඩාව - 2018/03 |
| | ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව (2018 මාර්තු) - 2018/06/14 |
| | ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව (2018 අප්‍රේල්) - 2018/08/09 |
| | ගෙවීම් අංශය හා මුදල් අංශය - 2018/08/27 |
| | ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව (2018 මැයි) - 2018/08/28 |
| | ප්‍රවාහන අංශය - 2018/09/12 |
| | අපි වෙනුවෙන් අපි අරමුදල - 2018/10/17 |
| ආරක්ෂක රාජ්‍ය අමාත්‍යංශය | ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2018/07/04<br>ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2018/08/08<br>ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2018/08/31<br>ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 20 18/09/26 |
| යුද්ධ හමුදාව | හයිලෙග් බූට් මිලදීගැනීම පිළිබඳ 2018/04/23 විමර්ශනය |
| නාවික හමුදාව | බැංකු සැසඳුම් පරීක්ෂාව - 2018/07/12<br>ආහාර ප්‍රසම්පාදන ඒකකය - 2018/11/30 |
| ගුවන් හමුදාව | ප්‍රසම්පාදන අංශය - 2018/06/06 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | හොරොව්පතාන බලකාය - 2018/10/06 |
| වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | වරුණ කඳවුර (වැල්ලවත්ත) - 2018/12/03<br>ප්‍රධාන කාර්යාලය 2018/12/03 |
| ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | ප්‍රසම්පාදන අංශය හා ගිණුම් අංශය - 2018/03/19<br>විශේෂ විමර්ශනය (ගෙවීම්) - 2018/06/04<br>විශේෂ විමර්ශනය (ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහලට භාණ්ඩ මිළදීගැනීම) - 2018/01/22 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනිඅවි ප්‍රසම්පාදන ඒකකය | ප්‍රසම්පාදන අංශය - 2018/06/11 |
| රක්නා ආරක්ෂණ ලංකා සමාගම | කේටරින් අංශය - 2018/07/13 |
| ආරක්ෂක සේවා විද්‍යාලය | ගබඩා පරීක්ෂාව - 2018/08/24 |
| ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය | ගබඩා පරීක්ෂාව - 2018/09/13 |
| පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | ප්‍රසම්පාදන අංශය - 2018/11/02 |
| රණවිරු සේවා අධිකාරිය | ගෙවීම් අංශය හා ගබඩාව - 2018/04/11 |
| ජාතික ශිෂ්‍යභට බලකාය | ප්‍රසම්පාදන අංශය හා ගබඩාව - 2018/04/11 |

8.1 වගුව : 2018 සිදුකර ඇති විගණන පරීක්ෂණයන්

# 9. නීතිය හා සාමය අංශය

## 9.1 සමාලෝචනය

2015.11.24 දිනැති අංක 1942/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවනු ලැබූ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන නිලධාරීන් එදින සිට 2018.03.27 දක්වා 2018.03.28 දිනැති අංක 2064/26 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නීතිය හා සාමය නිලධාරීන් ලෙස ස්ථාපිතවන තෙක් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන විෂය පථයට අනුකූලව සිය කාර්යභාර්යය ඉටු කරන ලදී. පසුව නීතිය හා සාමය නිලධාරීන් ලෙස 2018.05.11 දක්වාත් අනතුරුව 2018.05.12 දිනැති අංක 2070/56 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ විෂය පථයට එක් වූ ප්‍රධාන අංශයක් ලෙසත් 2018.11.05 දිනැති අංක 2096/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථයට එක් වූ අංශයක් ලෙසත් රටේ නීතිය හා සාමය තහවුරු කිරීමට රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව නීතිය හා සාමය අංශයට පැවරුණු විෂය පථයන් ඔස්සේ ක්‍රියාකරමින් සිටියි.

ඒ අනුව, අංශයට පැවරුණු ප්‍රධාන වගකීමක් වන නීතිගරුක පුරවැසියන්ගෙන් යුත් සමාජයක් ස්ථාපිත කිරීම උදෙසා නීතිය හා සාමය පවත්වාගෙන යෑම, අපරාධ, ප්‍රචණ්ඩත්වය, හිංසනය හා නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම, අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම, සමාජ විනය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියත්, විශේෂ කාර්ය බලකායත් ක්‍රියා කරමින් සිටියි. ඒ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් ද අනගි සහායක් ලබා දෙනු ලබන අතර රටේ ව්‍යසනයක්ව පවතින අන්තරායකර ඖෂධ පාලනය හා වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසියත්, විශේෂ කාර්ය බලකායත්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයත් කටයුතු කරමින් සිටියි.

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ සියලුම ජනතාවගේ නිදහස හා සාමය ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව විශ්වාසය තහවුරු කිරීම යන නිලධාරීන්ට පැවරී ඇති භාරදූර වගකීම ඉටුකිරීම සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය කරමින් සමාජ සහජීවනය තහවුරු කිරීමටත් සැමට එකලෙස ජීවත් වීමට සුදුසු සමාජ වටපිටාවක් සකස් කිරීම සඳහාත් වන රාජ්‍ය ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියා මාර්ග ගැනීමටත් නීතිය හා සාමය අංශය උර දෙමින් සිටියි.

සමස්තයක් ලෙස සළකා බැලීමේදී රටේ නීතිය හා සාමය සුරක්ෂිත කිරීම, රථවාහන ගමනාගමනය හා මාර්ග ආරක්ෂාවට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම, අන්තරායකර ඖෂධ සංසරණය හා භාවිතය වැළැක්වීම හා පාලනයට ඵලදායී සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම යනාදී කර්තව්‍යයන් ඉටු කරමින් අමාත්‍යාංශයීය අරමුණු ළඟා කරගැනීමට සහාය දැක්වීමට මෙම අංශය කටයුතු කරමින් සිටියි. ඒ සඳහා ප්‍රතිපත්ති සැකසීම, මගපෙන්වීම, ක්‍රියාකාරීත්වය අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු ඉටුකරමින් රටේ සමාජ සංවර්ධනය තුළින් සංවර්ධිත රටක් බිහිකරලීමේ කාර්යයට දායකත්වය සපයනු ලබයි.

**මාර්ගෝපදේශකත්වය තහවුරු කරමින්...............**

''නව ව්‍යවස්ථා සංශෝධනයක් මගින් අධිකරණ, පොලිසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිසන් සභා ස්ථාපිත කරමි.''

''රාජ්‍ය සේවය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන බව හා අපක්ෂපාතීව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවය හා පොලිසිය සඳහා නිර්දේශපාලනික කුසලතා පදනමක් හඳුන්වා දෙන්නෙමි.''

''සියලු තරාතිරම්වල පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා නිසා රටතුළ ඇදහිය නොහැකි පරිමාණයෙන් වර්ධනයවී ඇති දරුවන් හා කාන්තාවන් ගොදුරුවන අපචාර වළක්වාලීමට උපරිම ක්‍රියාමාර්ග ගන්නා අතර ඊට අදාල නඩු විභාග ඉතා කෙටි කලකදී අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නෙමි. එමගින් ළමා හා කාන්තා දූෂණ සහමුලින්ම නවතාලීමට කටයුතු කරන්නෙමි.''

**මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය**
**(පිටු අංක 16)**

''මත්කුඩු ජාවාරම්කරුවන් මැඩලීම සඳහා ජාතික ඔත්තු සේවය, විශේෂ කාර්ය බලකාය, ශ්‍රී ලංකා රේගුව, අන්තරායකර ඖෂධ පාලක අධිකාරිය ආදිය ඒකාබද්ධ කර විශේෂ බලකායක් ස්ථාපිත කරන්නෙමි.''

''මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් ගලවා ගැනීම සඳහා සුවිශේෂී පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමි.''

**2018 අය වැය යෝජනා ඇසුරින්..........**

''ජනප්‍රිය සංචාරක ස්ථානවල සංචාරකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා පොලිසිය විසින් සංචාරක පොලිස් ස්ථාන 20 ක් ස්ථාපනය කිරීමට පියවර ගනු ඇත.''

**(අංකය 136)**

''රටේ ආරක්ෂාව තහවුරු කිරීමේදී සයිබර් ත්‍රස්තවාදය, මූල්‍ය අපරාධ, මත්ද්‍රව්‍ය හා මිනිස් වෙළඳාම, අසමමිතික තර්ජනයන් ලෙස හඳුනාගෙන ඇත. අපගේ ආරක්ෂක බලඇණි අදාළ උපකරණ ඇතුළු යටිතල පහසුකම්වලින් සමන්විත විය යුතුය. එපමණක් නොව තොරතුරු හා තාක්ෂණික දැනුම ඇතුළු පහසුකම් පූර්ණව සැපයීමේ වගකීමක් අප වෙත පැවරී ඇත. එහිදී ජනතාවගේ පෞද්ගලිකත්වය සහ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි තොරතුරු විග්‍රහ කිරීමත්, එම තොරතුරු සම්බන්ධයෙන් රට තුළ මෙන්ම අසල්වැසි රාජ්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ වගකීම ද අපට තිබෙනවා. ඒ නිසා පහත දැක්වෙන පරිදි අදාළ සම්පත් වෙන් කෙරේ.''

''ජනතා හිතෛෂී නීති බලාත්මක කිරීමේ වෘත්තීයමය ආයතනයක් ලෙස ක්‍රියාකිරීම සඳහා හඳුනාගත් ප්‍රජා පොලිස් කටයුතු, පොලිස් ප්‍රතිසංවිධානය කාර්යයේ මූලික අංගයක් ඉදිරිපත් කෙරේ.''

''ගරු අග්‍රාමාත්‍යතුමාගේ අදහසක් අනුව පොලිස් සහ අපරාධ කටයුතු පිළිබඳ විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කෙරේ. මෙහිදී මානව හිමිකම්, ජාත්‍යන්තර නීතිය හා ආරක්ෂාව, අපරාධ විද්‍යාව, අධිකරණ සහ විමර්ශන සහ බුද්ධිමය විශ්ලේෂණ ක්‍රම ආදී ක්ෂේත්‍ර පිළිබඳ මූලික අවධානයක් යොමු කෙරේ.''

''නූතන අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකා පොලිසියේ, අන්තර්ජාල අපරාධ විමර්ශන අංශය ශක්තිමත් කෙරේ.''

### අරමුණු

- රට තුළ ජීවත්වන සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මග පෙන්වීම.
- ගමනාගමනය පහසු කිරීම සඳහා රථවාහන හැසිරවීම හා මාර්ග තදබදය අවම කිරීම පිළිබඳ නීති රීති සැකසීම.
- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම උදෙසා ජාතික පොලිස් කොමිසන් සභාව සමග එක්ව අවශ්‍ය පියවර ගැනීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය, සංසරණය වැළැක්වීම සහ භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

### කාර්යයන් හා කර්තව්‍යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- ජාතික පොලිස් කොමිසන් සභාවේ උපදෙස් අනුව පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම.
- රථවාහන ගමනාගමනය පාලනය කිරීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය.

## අංශයේ කාර්ය මණ්ඩලය

| අනු අංක | තනතුර | සේවය | පන්තිය | වැටුප් පරිමාණය | අනුමත ගණන | | 2018.12.31 දිනට සේවක ගණන | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | ස්ථිර | අනියම් |
| 1 | ලේකම් | - | - | SL -2006 | 01 | | | |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | විශේෂ | SL 3-2006 | 02 | | 02 | |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | විශේෂ | SL 3-2006 | 01 | | | |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 03 | | 02 | |
| 5 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | I | SL 1-2006 | 01 | | | |
| 6 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | |
| 7 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | 01 | |
| 8 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | II/III | SL 1-2006 | 02 | | 01 | |
| 9 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1-2006 | 03 | | 03 | |
| 10 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 02 | | 01 | |
| 11 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | II/III | | 01 | | | |
| 12 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7-2006 A | 01 | | 01 | |
| 13 | භාෂා පරිවර්තක (සිංහල-දෙමළ) | භා.ප.සේ | I/II | MN 6-2006A | 01 | | | |
| 14 | භාෂා පරිවර්තක (සිංහල- ඉංග්‍රීසි) | භා.ප.සේ | විශේෂ, I | MN 6-2006A | 01 | | 01 | |
| 15 | සම්බන්ධීකරණ ලේකම් - ලේකම් | තාවකාලික | - | - | | 01 | | |
| 16 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික නිලධාරී | තො.ස.තා.සේ | I / II | MN 6-2006A | 01 | | | |
| 17 | සංඛ්‍යා ලේඛන නිලධාරී | | I/II | | 01 | | 01 | |
| 18 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | III,II,I | MN 4-2006 A | 24 | | 16 | |
| 19 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | | | | 01 | | |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III,II,I | MN 2-2006 A | 40 | | 37 | |
| 21 | රියදුරු | රි.සේ | III,II,I විශේෂ | PL3-2006 | | | | |
| 22 | කාර්යාල කාර්ය සහයක | කා. සේ .සේ | III,II,I, විශේෂ | PL1-2006 | 15 | | 13 | |
| 23 | කැමරා ක්‍රියාකරු සහායක | තාවකාලික | | | 18 | 01 | 17 | |
| එකතුව | | | | | 120 | 03 | 95 | |

9.1 වගුව : 2018.12.31 දිනට අංශයේ කාර්ය මණ්ඩලය

අනුමත තනතුරු ලේඛනයට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මාධ්‍ය අධ්‍යක්ෂවරයෙක් (ශ්‍රී.ලං.ප.සේ.නොවන) සේවය කරයි.

## ආංශීය කාර්ය සාධනය

➢ ආංශීය අරමුණු ළඟා කර ගැනීම

- මානව සම්පත් සංවර්ධනය

අංශයේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් 2018 වර්ෂය තුළ නිලධාරීන් 105 ක් විවිධ පුහුණු පාඨමාලා සඳහා යොමුකර ඇත. මේ යටතේ රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකුද, පරිගණකගත රජයේ ගෙවීම් පද්ධතිය පිළිබඳ පුහුණුව සඳහා නිලධාරීන් සිව්දෙනෙක්ද, අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා නිලධාරීන් 40 ක්ද, ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලා සඳහා නිලධාරීන් සිව්දෙනෙක්ද, දෙවන භාෂා පාඨමාලා සඳහා අංශයේ විවිධ ශ්‍රේණිවල නිලධාරීන් 46 දෙනෙකු ද මාණ්ඩලික නිලධාරීන් හයදෙනෙකු රටවල් හතරක විදෙස් පුහුණු හා විදෙස් සමුළු සඳහා ද සහභාගී කරවමින් පුහුණුව ලබා දීමට කටයුතු කරන ලදී.

- විශේෂිත වූ කාර්යයන් විධිමත්ව ක්‍රියාත්මක කිරීම

චක්‍රලේඛනානුකූලව සකස් කළ යුතු අංශයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, 2017 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, 2019 අය වැය විසර්ජන පනත පාර්ලිමේන්තු විවාදයේදී ප්‍රයෝජනයට ගතහැකි වනසේ ප්‍රගති වාර්තාව යන වාර්තා සකස්කර අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

අංශයේ හා අංශය යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන කාර්යයන් විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව නෛතික රාමුවක් තුළ සිදු කිරීම සඳහා විවිධ කාර්යයන් පාදක කර ගනිමින් සමාලෝචිත කාලය තුළ අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 62 ක් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකා සඳහා ලබා දුන් අනුමැතිය හා නිර්දේශ අනුව අංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල කාර්යයන් විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ක්‍රියාත්මක මට්ටමේ පවතී.

ශ්‍රී ලංකා පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා 12 ක් ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ අයවැය දෙපාර්තමේන්තුවට ලබා දීමට හැකිවන සේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදුකර ඇත.

අංශයේ හා අංශය යටතේ පැවති ආයතනවලට අදාලව අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ රු.මි. 952.04 ක වටිනාකමින් යුතු ප්‍රසම්පාදන තුනක්, අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ රු.මි. 453.08 ක වටිනාකමින් යුතු ප්‍රසම්පාදන පහක් සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන් හයක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. 2018 වර්ෂය තුළ ලංසු විවෘත කිරීම් 20 ක් සිදු කර තිබේ. ඉන් 14 ක් නිලධාරීන් සඳහාත්, 04 ක් විශේෂ කාර්යය බලකාය සඳහාත්, 02 ක් ශ්‍රී ලංකා පොලිසිය සඳහාත් අදාල ප්‍රසම්පාදන කටයුතු සඳහා වේ.

ප්‍රසම්පාදනයට අදාලව ණයවර ලිපි ලබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් හා විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් ණයවර ලිපි 23ක් සඳහා නිර්දේශ කිරීම් නිකුත් කර ඇත.

ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම 2017 - 2021 යටතේ කෲර වධහිංසාව පිටු දැකීම අංශයට අදාල මාසික කමිටු රැස්වීම් පැවැත්වීම හා ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු සාර්ථක කිරීමට අදාලව දක්වා ඇති කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සිදු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු වාර්තා 09 ක් හා ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්න 13 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව යන ආයතන වෙතින් ඉල්ලුම් කරන ලද නිර්දේශ සඳහා වාර්තා 53 ක් සකස් කර ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩලය මඟින් ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා යොමුකරන වෙනත් අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සඳහා ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලදී.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වල ආයතනික සහ පරිපාලනමය කාර්යයන්ට දායකවීම

ශ්‍රී ලංකා පොලීසියේ සහායක සේවා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සංශෝධනයට ජාතික පොලිස් කොමිසන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලදී.

අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවට අයත් ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ උසස්වීම් 167 ක්, උසස්වීම් පෙරදාතම කිරීම් 15 ක්, සේවය ස්ථිර කිරීම් 18 ක්, විශ්‍රාම ගැන්වීම් 38 ක්, කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් 04 ක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. ඊට අදාලවම අනුමැතිය සඳහා ඉල්ලීම් 75 ක් ජාතික පොලිස් කොමිසම වෙත යොමු කිරීමටද කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ උසස්වීම් 204 ක්, උසස්වීම් පෙරදාතම කිරීම් 89 ක්, විශ්‍රාම ගැන්වීම් 337 ක්, නැවත සේවයේ පිහිටුවීම් 1,252 ක්, ස්ථානමාරු 317 ක්, විනය කටයුතු වලට අදාල ඉල්ලීම් 1,272 ක් සහ ස්ථානාධිපතිවරුන්ගේ ස්ථානමාරුවීම් 78 ක් ජාතික පොලිස් කොමිසන් සභාව වෙත අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කර ඉදිරි කටයුතු සිදු කර ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය සඳහා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිය ලත් වෛද්‍යවරුන් ස්ථිර සේවයට සහ හෙද නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියදුරු සහ පොලිස් සහායක සේවා තනතුරු සඳහා පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන් බඳවා ගැනීමට සහ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී විවිධ හේතූන් මත සක්‍රිය සේවයේ නොසිටි පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන් හට ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් පිරිනැමීම සඳහා අදාල කටයුතු සිදුකරමින් පවතී.

ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 320 දෙනෙකු විදේශ පුහුණු සඳහා සහභාගී කරවීමට අනුමැතිය ලබා දීම සිදු කර ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ජාතික පොලිස් කොමිසන් සභාවේ නියමය පරිදි 1989/90 වර්ෂ වලදී උප සේවා උපපොලිස් පරීක්ෂකවරු ලෙස ශ්‍රී ලංකා පොලීසියට බැඳී ඇති අසාධාරණයට ලක්ව සිටි පොලිස් පරීක්ෂකවරු 14 දෙනෙකු අධිසේවක පදනම මත ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ අධිසේවක තනතුරු 14 ක් ඇති කිරීමටත් එම නිලධාරීන් ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට උසස් කිරීමටත් කටයුතු කරන ලදී.

දේශපාලනමය වශයෙන් අසාධාරණයට ලක් වූ නිලධාරීන් සම්බන්ධයෙන් සළකා බැලීම සඳහා වූ ත්‍රිපුද්ගල කමිටුව ඉදිරියේ නිලධාරීන් 379 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලදුව, ඉන් 129 දෙනෙකු දේශපාලනමය වශයෙන් අසාධාරණයට ලක් වූ බවට නිර්දේශ ඉදිරිපත් කරන ලදී. එම නිලධාරීන් 129 දෙනා සම්බන්ධයෙන් සහන නිර්දේශ කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනුණි. එම නිර්දේශ අනුව ඊට අදාළ කටයුතු අවසන් වෙමින් පවතී.

සමාලෝචිත වර්ෂය තුළ නව පොලිස් ස්ථාන සහ මුරපොල 17 ක් හා විශේෂිත පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් ස්ථාන, පොලිස් මුරපොළවල්, රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවාඩු නිකේතන ආදිය සඳහා හා විශේෂ කාර්ය බලකා කඳවුරු සඳහා ඉඩම් කොටස් 640 ක ප්‍රමාණයක් පවරා ගැනීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඉන් ඉඩම් කොටස් 271 ක නිරවුල්භාවය පරීක්ෂා කිරීම අවසන් කර ඇත.

ශ්‍රී ලංකා පොලීසියේ 2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් නිලධාරීන් 145 ක් සඳහා පූර්ණ භූමි සම්මානය, නිලධාරීන් 13 ක් සඳහා දේශපුත්‍ර සම්මානය, නිලධාරීන් 723 ක් සඳහා පොලිස් විශිෂ්ට සේවා පදක්කම සහ එක් නිලධාරියෙකු සඳහා රිවිරැස මෙහෙයුම් පදක්කම හා සන්ධාරය පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලදී.

චිත්‍රපට රූගත කිරීම්, ටෙලි නාට්‍ය, වෙළඳ දැන්වීම්, විවාහ මංගල්‍යය, විවිධ පුහුණුවීම් සහ වෙනත් ආරක්ෂාව සම්බන්ධව අනුමැතිය ලබා දීම් 270 ට අදාළව කටයුතු කරන ලදී.

දේශීය ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් 80ක් සහ විදේශ ප්‍රභූන්, තානාපති කාර්යාල, බන්ධනාගාර යනාදිය සඳහා ආරක්ෂාව සැපයීමේ ඉල්ලීම් අනුව නිලධාරීන් යෙදවීමට කටයුතු කර ඇත.

- ඉලක්කගත ප්‍රගතිය අධීක්ෂණය

එක් එක් ආයතන වලට ආවේණික වූ ගැටළු හඳුනා ගැනීමත් ඒ සඳහා අවශ්‍ය කඩිනම් විසඳුම් සෙවීමත් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් ඒ අනුව ඉදිරි සැලසුම් සකස් කිරීමටත් අවශ්‍ය පියවර ගනිමින් 2018 වර්ෂයේ මාසික හා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් නමයක් සහ කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.

- මහජන දුක්ගැනවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම

නීතිය හා සාමය අංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම, රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය සඳහා මහජනතාවට අවස්ථාව ලබා දෙමින් සහ නීතිය හා සාමය අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වල නිලධාරීන්ට පවතින ගැටළු සහ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් හදිසි ඇමතුම් සේවා සහ විවිධ දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රමවේදයන් පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

එම ක්‍රමවේදයන් මඟින් 2018 වර්ෂය තුළ ලද හා විසඳු පැමිණිලි සංඛ්‍යාව පහත සංඛ්‍යා වගුව මඟින් දැක්වේ.

| අනු අංකය | කළමනාකරණ ක්‍රමවේදය | 2018 | | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳු පැමිණිලි සංඛ්‍යාව | |
| 01 | අමාත්‍යාංශ මහජන දිනය | 1,070 | 476 | 45% |
| 02 | 118 හදිසි ඇමතුම් | 41,319 | 41,319 | 100% |
| 03 | ජනපතිට කියන්න | 3,871 | 3,437 | 89% |
| 04 | පොලිස්පතිට කියන්න | 2,046 | 1,644 | 80% |
| 05 | පොලිස්පති මහජන සහන දිනය | 1,328 | 1,047 | 78% |
| 06 | පොලිස් මහජන සහන මැදිරිය | 1,171 | 598 | 51% |
| 07 | 119 හදිසි ඇමතුම් | 1,123,210 | 1,118,801 | 99% |
| එකතුව | | 1,174,015 | 1,167,322 | 99% |

9.2 වගුව : මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව

## අංශය යටතේ පවතින ආයතන වල කාර්යභාරය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට අවශ්‍ය පියවර ගැනීම

- නීතිය හා සාමය පවත්වාගෙන යාමට ජාත්‍යන්තර සහයෝගීතාවය ලබා ගැනීම

නීතිය හා සාමය පවත්වා ගෙන යාම උදෙසා ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාරය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට 2018 වර්ෂය තුළදී ඉන්දුනීසියාව හා ඉරානය සමඟ අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹෙන ලදී. ඊට අමතරව, කටාර් රාජ්‍යය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, වියට්නාමය, දකුණු අප්‍රිකාව, රුසියාව, තජිකිස්ථානය යන රටවල් සහ අන්තර්ජාතික රතු කුරුස කමිටුව සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම හා ගිවිසුම් අත්සන් තැබීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

- ශ්‍රී ලංකා පොලීසිය නව ආරකින් යුතුව මහජනතාව සමඟ සම්බන්ධ කරවීම

ශ්‍රී ලංකා පොලීසිය කාලීන හා අනාගත අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි ප්‍රතිසංවිධානය සඳහා තත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා නිසි පරිදි හදුනාගෙන යාවත්කාලීන කිරීමටත් අනාගතයේ යහපත් හා කාර්යක්ෂම පොලිස් සේවයක් ස්ථාපිත කිරීම සඳහාත් විශේෂඥයන්ගෙන් යුක්ත කමිටුවක් 2016 වර්ෂයේදි ස්ථාපිත කරන ලදී. එම කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ වාර්තාව 2018.05.11 හා 2018.09.04 යන දිනයන්හිදී විෂයභාර ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම් ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන්, ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් හා අනෙකුත් පාර්ශවකරුවන්ගේද සහභාගීත්වය ඇතිව පැවැත්වූ වැඩමුළු දෙකකදී සමාලෝචනය කෙරිණ. එහිදී එකඟ වූ කරුණු ද ඇතුලත්ව සකස් කරන ලද පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්ම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.

- ශ්‍රී ලංකා පොලිසිය සඳහා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා පොලිසිය සඳහා යෝජිත ජාතික පොලිස් හා අපරාධ යුක්ති විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමට අදාල පනත කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් සැපයීමට 2018.10.02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව විශ්ව විද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් සකස් කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇත.

- ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

දඩ මුදල් අයකර ගැනීම වේගවත් කිරීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණු කරගනිමින් රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට මෙම යෝජනාව ඉදිරිපත් වී ඇත. මේ සම්බන්ධව මුදල් හා ජනමාධ්‍යය නිලධාරීන් යටතේ පිහිටුවා ඇති රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාව සඳහා වන ජාතික නියෝජිතායතනය වෙතින් ලබා ගත් උපදෙස් අනුව යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.

- පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම

ශ්‍රී ලංකා පොලිසියේ අණ පාලන, සන්නිවේදන, පරිගණක බුද්ධිමය කටයුතු ආවේක්ෂණ සහ සෝදිසි කිරීම් ධාරිතාවයන් වැඩි දියුණු කිරීම තුලින් ආයතනයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම අරමුණු කොට ගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන ද දෙවන අදියර මුළු දිවයිනම ආවරණය වන පරිදි ද ක්‍රියාත්මක කිරීමට නියමිතය. ප්‍රදානයන් හෝ සහනදායී ණය ආධාර මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි ආයතන වලින් යෝජනා ලබා ගෙන සුදුසු ආයතනයක් තෝරා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය අධීක්ෂණය

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා පොලිසිය සඳහා සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වෙන් වී තිබූ රු.මි. 1,954 ක ප්‍රතිපාදන වලින් රු.මි. 1,760 ක් වැය දරා ඇති අතර එක් එක් ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| ව්‍යාපෘතිය | 2018 ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| නව ගොඩනැගිලි ඉදිකිරීම | 1,433 | 1,407.59 | වැඩ අවසන් 17<br>ඉදි කරමින් පවතින 31 |
| පොලිස් අභ්‍යාස ආයතනය සංවර්ධනය | 243 | 109.22 | වැඩ අවසන් 01<br>ඉදි කරමින් පවතින 07 |
| කළුතර පොලිස් විද්‍යාලය සංවර්ධනය | 65 | 59.28 | වැඩ අවසන් 02<br>ඉදි කරමින් පවතින 04 |
| පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම | 85 | 67.82 | වැඩ අවසන් 125<br>ඉදි කරමින් පවතින 02 |
| අශ්වයින් හා සුනඛයින් මිලදී ගැනීම | 128 | 116.99 | මිලදී ගත් අශ්වයින් 18<br>මිලදී ගත් සුනඛයින් 45<br>ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින දේශීය සුනඛයින් 10 |
| එකතුව | 1,954 | 1,760.90 | |

9.3 වගුව : ශ්‍රී ලංකා පොලිසියේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය



ඉදි කළ කටුපොත පොලිස් ස්ථානය



ඉදි කළ මලලසේකර මාවත කාන්තා හට නිවාස ගොඩනැගිල්ල

2018 වර්ෂයේ දී විශේෂ කාර්ය බලකාය සඳහා රු.මි. 1,686.3 ක ප්‍රතිපාදන සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වෙන්වූ අතර ඉන් රු.මි.1,152.5 ක් වැය කර තිබේ. එක් එක් ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත සංඛ්‍යා වගුවෙන් ඉදිරිපත් කෙරේ.

| ව්‍යාපෘතිය | 2018 ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම | 169.5 | 117.53 | වැඩ අවසන් 25<br>ඉදි කරමින් පවතින 19 |
| නව ගොඩනැගිලි ඉදිකිරීම | 310.80 | 220.68 | වැඩ අවසන් 16<br>ඉදි කරමින් පවතින 18 |
| කඳවුරු 07ක බැරැක්ක පහසුකම් සංවර්ධනය | 110 | 32.8 | වැඩ අවසන් 02<br>ඉදි කරමින් පවතින 05 |
| එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා නිලධාරීන් යෙදවීම | 1,096 | 781.5 | නිලධාරීන් පුහුණු කර අවශ්‍ය උපකරණ වලින් කොටසක් මිලදී ගෙන ඇත. |
| එකතුව | 1,686.3 | 1,152.5 | |

9.4 වගුව : විශේෂ කාර්ය බලකායේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසියට අයවැය යෝජනා මගින් සංචාරක පොලිස් ඒකක ඇති කිරීම, ප්‍රජා පොලිස් සංකල්පය හඳුන්වා දීම, නූතන අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩි දියුණු කිරීම, අන්තර්ජාල අපරාධ විමර්ශන අංශය ශක්තිමත් කිරීම, පොලිස් ප්‍රතිසංවිධානය, පොලිස් හා අපරාධ කටයුතු පිළිබඳ විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම යන සංවර්ධන කාර්යයන් හයක් සඳහා රු.මි. 745 ක් වෙන් කරන ලද අතර ඊට අදාළව සිදු කරන ලද කාර්යයන් සඳහා වර්ෂය තුළදී රු.මි. 41.94 ක වියදමක් දරා ඇත.



ඉදි කළ වි.කා.බ. තංගල්ල කඳවුරේ නිලධාරි නිල නිවස්නය



ඉදි කළ වි.කා.බ. කටුකුරුන්ද පුහුණු පාසලේ ශ්‍රවණාගාරය සහ නේවාසික ගොඩනැගිල්ල

- රටේ සාමාන්‍ය ජන ජීවිතයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාම

රට තුළ වාර්තාවන අපරාධ කඩිනමින් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික මඟපෙන්වීම් ලබාදීම

රට තුළ නීතිය හා සාමය පවත්වා ගෙන යාමේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් හා ව්‍යාපෘති හේතුවෙන් 2018 වර්ෂය තුළ අපරාධ වාර්තාවීම් ප්‍රමාණය හා අපරාධ විසඳීම් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් පහත පරිදි වේ.

| අපරාධ වර්ගය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් ප්‍රගතිය | % | වාර්තාවීම් | විසඳීම් ප්‍රගතිය | % | වාර්තාවීම් | විසඳීම් ප්‍රගතිය | % |
| බාල අපරාධ | 36,937 | 26,869 | 72% | 35,979 | 28,016 | 78% | 36,355 | 28,246 | 78% |
| සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි | 45,579 | 30,481 | 67% | 42,224 | 29,303 | 69% | 41,888 | 27,831 | 66% |
| සුළු වැරදි දේපල වලට එරෙහි | 33,349 | 15,969 | 48% | 32,881 | 16,664 | 51% | 31,415 | 14,143 | 45% |
| සුළු පැමිණිලි | 1,039,350 | 1,038,942 | 99% | 1,029,087 | 1,029,047 | 99% | 1,013,661 | 971,617 | 96% |
| ළමයින්ට එරෙහි බල අපරාධ සහ සුළු අපරාධ | 5709 | 3,294 | 58% | 5,054 | 3,711 | 73% | 5,799 | 3,172 | 55% |
| කාන්තාවන්ට එරෙහි බල අපරාධ හා සුළු අපරාධ | 9,042 | 4,976 | 55% | 8,444 | 6,100 | 72% | 8,211 | 5,168 | 63% |
| දූෂණ වැරදි | 1,255 | 1,217 | 97% | 1,055 | 1,025 | 97% | 954 | 868 | 91% |
| ව්‍යවස්ථාපිත වැරදි | 46,171 | 44,177 | 96% | 49,013 | 46,857 | 96% | 40,607 | 38,102 | 94% |

9.5 වගුව : අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය

බාල අපරාධ, දූෂණ වැරදි හා ව්‍යවස්ථාපිත වැරදි වල විසඳුම් ප්‍රගතිය වන්නේ සැකකරුවන් අත්අඩංගුවට ගත් ප්‍රමාණය වන අතර සුළු වැරදි හා සුළු පැමිණිලි වලදී ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමුකර හෝ නඩු පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ ප්‍රමාණය ප්‍රගතිය ලෙස සඳහන්කර ඇත.

- ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

රථවාහන අනතුරු පිළිබඳ තොරතුරු යාකර ඇති පහත වගු අංක 06 අනුව, මුළු රථවාහන අනතුරු ප්‍රමාණය 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ 6% කින් අඩුවීමක් පෙන්නුම් කරයි. රටේ වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතින අවධියක ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනයවීමේ වේගය මේ අයුරින් පාලනය වීම සඳහා රථවාහන තදබදයට පිළියම් යෙදීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම, රථවාහන තදබදය අවම කිරීම සඳහා රථවාහන කළමනාකරණය කිරීමට නව වැඩසටහන් හඳුන්වා දීම, රථවාහන වැරදි හා රිය අනතුරු සම්බන්ධවූවන්ට විරුද්ධව නඩු පැවරීම, දඩපත් ලබාදීම සහ ඊට අදාළව ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය යනාදිය බලපා ඇති බව පෙන්වා දිය හැකිය.

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | මුළු වාහන සංඛ්‍යාව | වාහන 1,000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 2016 | 2,824 | 8,148 | 14,604 | 13,510 | 39,086 | 6,795,469 | 6 |
| 2017 | 2,922 | 8,302 | 13,592 | 13,072 | 37,889 | 7,247,122 | 5 |
| 2018 | 2,953 | 8,475 | 12,264 | 12,064 | 35,756 | 7,727,921 | 5 |

9.6 වගුව : රථවාහන අනතුරු

- මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම සඳහා සක්‍රියව දායක වීම

''දකුණු ආසියානු මත්ද්‍රව්‍ය පිළිබඳ නීතිය බලාත්මක කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම'' පිළිබඳ ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක මධ්‍යස්ථානයේ සාමාජිකත්වය දරන බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා ශ්‍රී ලංකාව යන රටවල් අතර මත්ද්‍රව්‍ය සංසරණය වළක්වාලීම සඳහා ගනු ලබන පියවරක් වශයෙන් ඊට අදාළව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ අවශ්‍ය ඉදිරි කටයුතු ආරම්භ කර ඇත.

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතෙහි විධිවිධාන සඳහා නව සංශෝධන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2018.09.21 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

දිවයින පුරා ව්‍යසනයක්ව පවතින මත්ද්‍රව්‍ය ජාවාරම් වඩාත් සාර්ථකව පාලනය කිරීමට ත්‍රිවිධ හමුදාවේ දායකත්වය ලබා ගනිමින් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම සඳහා මත්ද්‍රව්‍ය පාලනය පිළිබඳ විශේෂ විධිවිධාන පනතක් කෙටුම්පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පනත කෙටුම්පත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. සියලු ප්‍රයත්නයන් යොදවමින් මත්ද්‍රව්‍ය උවදුර මැඩලීමට පියවර ගැනීම මෙහි අරමුණයි.

දිවයින පුරා ක්‍රියාත්මක වන නීති විරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය වෙත ලබා දුන් උපදෙස් සහ සහායන් මත සිදු කරන ලද වැටලීම් අනුව 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී නිද්‍රාජනක හා සුරා සම්බන්ධ වැරදි වාර්තාවීම් 12% කින් ඉහළ ගොස් ඇත. වාර්තාවීම් වලින් 94% ක් විසඳා අවසන් කිරීමට හැකියාව ලැබී ඇත.

| අනු අංක | වරද | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| 1 | නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි | 88,352 | 86,330 | 107,944 | 104,641 | 124,940 | 120,052 |
| 2 | සුරා සම්බන්ධ වැරදි | 120,105 | 111,028 | 120,198 | 113,037 | 129,813 | 119,514 |
| එකතුව | | 208,482 | 197,358 | 228,142 | 217,678 | 254,753 | 239,566 |
| ප්‍රතිශතය | | 94% | | 95% | | 94% | |

9.7 වගුව : නිද්‍රාජනක ද්‍රව්‍ය

2017 වර්ෂයට සාපේක්ෂව නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් 2018 වර්ෂයේදී 15% කින් වර්ධනය වී ඇති අතර ඒ සඳහා දිවයින තුළ නිද්‍රාජනක ද්‍රව්‍ය ව්‍යාප්තව ඇති ආකාරය විශ්ලේෂණය කර එමඟින් වැඩිම පැමිණිලි ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන වැටලීම් සිදුකිරීම ප්‍රමුඛත්වයෙහිලා සළකා කටයුතු කිරීමට අදාළ උපදෙස් ලබාදීම හේතු වී ඇති බව පෙනේ. ඒ අනුව අත්අඩංගුවට ගත් නිද්‍රාජනක ද්‍රව්‍ය ප්‍රමාණයන් පහත පරිදි වේ.

| නිද්‍ර ජනක | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | | | 2017 | | | 2018 | | |
| | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. |
| ගංජා | 36,817 | 698 | 506 | 19,723 | 980 | 949 | 884 | 457 | 162 |
| අබිං | 15 | 399 | 970 | - | 02 | 575 | - | 08 | 380 |
| හෂීස් | 27 | 443 | 650 | 39 | 042 | 554 | 82 | 291 | 597 |
| හෙරොයින් | 205 | 147 | 430 | 124 | 829 | 051 | 721 | 363 | 175 |
| මෝෆීන් | - | 74 | 730 | - | - | 250 | - | 194 | 784 |
| කොකේන් | 1,302 | 735 | 42 | 222 | 122 | 075 | 09 | 859 | 780 |
| වෙනත් | 506 | 523 | 334 | 383 | 602 | 853 | 556 | 389 | 26 |
| එකතුව | 38,872 | 3,019 | 3,662 | 20,481 | 2,577 | 3,307 | 10,254 | 563 | 904 |

9.8 වගුව : නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය

## විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්

රට තුළ සිදුවන අවිධිමත් හා විනාශකාරී ක්‍රියාකාරකම් මර්දනය කිරීම වෙනුවෙන් විශේෂ කාර්ය බලකාය වර්ෂය තුළ දී සැලසුම් සහගත වැටලීම් සිදුකරන ලද අතර එසේ සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය පහත දැක්වේ.





විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වල අවස්ථාවන්

| අනු අංක | සිදු කළ වැටලීම් | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| 1 | කසල තේ | 35 | 32 | 30 |
| 2 | ගවයින් ප්‍රවාහනය කිරීම | 42 | 128 | 88 |
| 3 | පාරිභෝජනයට නුසුදුසු මාංශ | 35 | 51 | 79 |
| 4 | අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය | 44 | 154 | 248 |
| 5 | මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් (නීති විරෝධී මත්පැන්/රජයේ අරක්කු / විදේශ මත්පැන්) | 247 | 755 | 1,328 |
| 6 | වෙනත් (වැලි, පස්, වල්ලපට්ට, නිධන් කැනීම්, දැව, මැණික් ගැරීම, දුම් වැටි) | 702 | 4,582 | 5,939 |
| 7 | විෂ මත්ද්‍රව්‍ය | 349 | 940 | 1,934 |
| එකතුව | | 1,454 | 6,642 | 9,646 |

9.9 වගුව : විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්

ඉහත සංඛ්‍යා දත්ත අනුව විශේෂ කාර්ය බලකාය මඟින් සිදුකරන ලද වැටලීම්වල සැළකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. එය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ 356% ක ඉහළ යාමක් වන අතර 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේ ඉහළ යෑම 45% කි. 2018 වර්ෂයේ වැටලීම් ප්‍රගතිය සඳහා ප්‍රධාන වශයෙන් මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් සහ වෙනත් වැටලීම්වල වර්ධනය හේතු වී තිබේ.

## මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය

2018 වර්ෂය සඳහා වෙන්වූ මූල්‍ය ප්‍රතිපාදන ඵලදායී ලෙස කළමනාකරණය කළ අතර ඒ අනුව මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රතිපාදනයෙන් 82% කි (පුනරාවර්තන වියදම් 93%, ප්‍රාග්ධන වියදම් 57%)

| වියදම් වර්ගය | මුළු ප්‍රතිපාදනය | | මුළු වියදම | | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | වටිනාකම (රු.) | ප්‍රතිශතය | වටිනාකම (රු.) | ප්‍රතිශතය | |
| පුනරාවර්තන | 8,343,394,000 | 68% | 7,800,629,842 | 78% | 93% |
| ප්‍රාග්ධන | 3,923,460,000 | 32% | 2,233,635,124 | 22% | 57% |
| එකතුව | 12,266,854,000 | 100% | 10,034,264,967 | 100% | 82% |

9.10 වගුව : මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය - 2018

# 10. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය

## 10.1.සමාලෝචනය

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ ආරම්භය වර්ෂ 1985 දක්වා දිවෙන අතර, ආරම්භයේදී ඒකාබද්ධ මෙහෙයුම් විධානය ලෙස ස්ථාපනය කරනු ලැබූයේ එවකට සිදුකරනු ලැබූ ක්‍රියාන්විතයන්හිදී ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සඳහාය. වර්ෂ 1999 ජනවාරි මස 04 වන දින ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාංශය පිහිටුවනු ලැබුයේ එවකට පැවති ඒකාබද්ධ මෙහෙයුම් විධානය ප්‍රතිස්ථාපනය කරමින් වන අතර, වර්ෂ 2000 දී කෙටි කලක් පැවති ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාලය යළිත් වරක් ස්ථාපනය කරමින් ඒකාබද්ධ මෙහෙයුම් මුලස්ථානය ලෙස පිහිටුවන ලදී. මානුෂික මෙහෙයුම් අවසානයේ ඒකාබද්ධ මෙහෙයුම් මුලස්ථානය පුළුල් කරමින් 2009 අංක 35 දරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ගැසට් පත්‍රය මඟින් පශ්චාත් යුධමය අභියෝගයන්ට සරිලන ආකාරයට වත්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වර්ෂ 2009 ජුලි 15 වන දින ස්ථාපනය කරන ලදී. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තනතුර වර්තමාන ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවන්ගේ උසස්ම නිලධාරී තනතුර වේ. ඒ අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි පත්කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් සිදුකරනු ලබන අතර, අවස්ථානුකූලව යුද්ධ හමුදාධිපතිවරයා, නාවික හමුදාධිපතිවරයා හෝ ගුවන් හමුදාධිපතිවරයා අතරින් එක් නිලධාරියෙකු ඒ සඳහා පත්කරනු ලබයි. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, ආරක්ෂක විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ විධානය, අධීක්ෂණය සහ පාලනය යටතේ ක්‍රියාකළ යුතුය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වු න්‍යායන් වර්ධනය කිරීමයි.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබද විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වු න්‍යායන් වර්ධනය කිරීම.
- සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයන්ට අදාල කර්තව්‍යයන් සම්බන්ධ කාරණා සම්බන්ධීකරණය, සන්නද්ධ හමුදා මෙහෙයුම් වල සහ ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වු සැලසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- ක්‍රමෝපාය සැලසුම් වලට අදාලව මුදල් වර්ෂයන් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණු වලට කොතෙක් දුරට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම.
- මිනිස් බලය, උපකරණවලට අදාලව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක් දුරට ක්‍රමෝපාය සැලසුම් වලට අනුකූල වන්නේද යන්න පිළිබදව උපදෙස් දීම.
- සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණුවීම් සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ සන්නද්ධ හමුදා විසින් සාමසාධක මෙහෙයුම් සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම් වලට අනුව යුධමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම.

| වියදම | 2018 ප්‍රතිපාදන (රු.මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) | ප්‍රගතිය % |
|---|---|---|---|
| පුනරාවර්තන | 3.2 | 3.0 | 93.87 |
| මුලධන | 65.2 | 62.6 | 95.97 |
| එකතුව | 68.4 | 65.6 | 95.87 |

10.1 වගුව : ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

## 10.2 2018 වර්ෂයේ කාර්යසාධනය

### ➢ ක්‍රියා සහ සැලසුම් ශාඛාව

- 2018.02.10 දින පැවති පළාත් පාලන මැතිවරණ කාලසීමාව තුල ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ඇති වුවහොත් එම තත්ත්වය පාලනය කිරිම සම්බන්ධයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ විශේෂ ක්‍රියාන්විත මැදිරියක් ස්ථාපිතකර ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එසේ ඇති වියහැකි ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් පාලනය කිරීමට අවශ්‍ය භටපිරිස් සුදානම්කර තැබීමටත්, ශ්‍රී ලංකා පොලිසිය විසින් ඉල්ලුම් කළ පරිදි මර්මස්ථාන 167 ක් වෙත පහත සඳහන් පරිදි ත්‍රිවිධ හමුදා භට පිරිස් යොදවා ආරක්ෂාව ලබාදීමත් සිදුකරන ලදී.

| | | |
|---|---|---|
| යුද්ධ හමුදාව | - | 113 x 2746 |
| නාවික හමුදාව | - | 18 x 616 |
| ගුවන් හමුදාව | - | 1 x 32 |

- මහනුවර ප්‍රදේශයේ සහ දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන්හි 2018.03.06 දින සිට 2018.03.08 දින දක්වා දෙපිරිසක් අතර ඇතිවු ගැටුම සම්බන්ධයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ විශේෂ ක්‍රියාන්විත මැදිරියක් ස්ථාපිතකර ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එම ගැටුම් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.
- 2018.04.13 දින සිට 2018.04.15 දින දක්වා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එක්ව සංවිධානය කරනු ලැබූ 2018 අවුරුදු උත්සවය සහ සංගීත ප්‍රසංගයේ ආරක්ෂාව සඳහා මහියංගනය පොලීසිය සමඟින් කටයුතු කිරීමට යුද්ධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.04.20 දින මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් සහ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් එක්ව පවත්වන ලද අලුත් අවුරුදු උත්සවයේ ආරක්ෂාව සඳහා මට්ටක්කුලිය පොලිසිය සමඟින් කටයුතු කිරීමට යුද්ධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- ටෙලිකොම් ආයතනය මඟින් සංවිධානය කරනු ලැබූ සජීවී සංගීත ප්‍රසංගය 2018.04.21 දින බණ්ඩාරවෙල මහ නගර සභා ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. එම සංගීත ප්‍රසංගයේ ආරක්ෂාව සඳහා බණ්ඩාරවෙල පොලීසිය සමඟින් කටයුතු කිරීමට යුද්ධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.16 දින සුගතදාස ක්‍රීඩාංගණයේදී අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මැයි දින රැලියේ ආරක්ෂාව සඳහා යුද්ධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.08.03 දින සිට 2018.09.01 දින දක්වා අ.පො.ස (උ/පෙළ) සහ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයන්හි ප්‍රශ්න පත්‍ර රැගෙන ඒමේ සිට නැවත අදාල ස්ථානයන් වෙත ප්‍රශ්න පත්‍ර රැගෙන යාම සඳහා ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කිරීම සිදු කරන ලදී.
- 2018.08.10 සහ 11 යන දිනයන්හිදී බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර ගමන් ගන්නා මාර්ගයේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහය ලබාදීමට කටයුතු සම්පාදනය කිරීම සිදු කරන ලදී.
- 2018.09.07 දින සිට 2018.09.09 දින දක්වා අප ස්වාමි දුවගේ දේවස්ථානයේ පැවති වාර්ෂික උත්සවය සඳහා පොල්හේන මුහුදු තීරයට නාවික හමුදා ජීවිත ආරක්ෂක කණ්ඩායම් හා මුර යාත්‍රා කණ්ඩායම් ලබාදීම සිදු කරන ලදී.

- 2018.10.31 සහ 2018.11.01 දිනයන්හි බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය සඳහා ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කිරීම සිදු කරන ලදී.
- 2018.11.23 දින සහ 2018.11.25 දින යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ් දූපතෙහි පැවැති කතෝලික දහම් පාසල් අවසාන විභාගයේ ප්‍රශ්න පත්‍ර ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා නාවික හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2018.12.03 දින සිට 2018.12.12 දින දක්වා පැවැති අ.පො.ස (සා/පෙළ) විභාගය සඳහා ත්‍රිවිධ හමුදා ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

## ➢ ආපදා තත්ත්වයන් සඳහා සහන සැලසීම

- 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් කරන ලද ඉල්ලීම මත පහත සඳහන් ආපදා තත්ත්වයන් සඳහා සහන සැලසීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.
- 2017.01.13 දින ගම්පහ දිස්ත්‍රික්කය තුල ඇතිවූ වර්ෂාව සහ දැඩි සුළං තත්ත්වය හේතුවෙන් කොටදෙනිය පොලිස් බල ප්‍රදේශයේ දික්ලන්ද සහ කටුකුරුන්ද ග්‍රාම නිලධාරී වසම්වල නිවාස 300 කට වැඩි ප්‍රමාණයක් ආපදාවට ලක්වූ අතර, සහන සේවා කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා භට පිරිස් සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.01.26 දින රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුද්දුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් කණාදොල කුණු කන්දේ ඇතිවූ ගින්න පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා භටපිරිස් සහාය සහ ගුවන් හමුදා හෙලියානා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.02.06 දින මොණරාගල දිස්ත්‍රික්කයේ හොරොම්බුව ග්‍රාම නිලධාරී වසමට අයත් සුදුවතුරආර දරගොඩයාය කන්ද රක්ෂිතයෙහි ඇතිවූ ගිනි ගැනීම් තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා යුද්ධ හමුදා භට පිරිස් සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.02.12 දින සවස ගම්පහ දිස්ත්‍රික්කයේ හැඳල වත්තල ප්‍රදේශයෙන් මුහුදු ගිය එක් දින යාත්‍රාවක් පසුදින උදෑසන නොපැමිණීම නිසා එම යාත්‍රාව සහ එහි ගමන්ගත් අයවලුන් සොයා ගැනීම සඳහා නාවික හමුදා සහය ලබාදීම සිදුකරන ලදී.
- 2018.02.17 දින මීරිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගිරිඋල්ල දිවුලපිටිය පාරේ නාල්ල මහමෙර වත්තේ ඇතිවූ හදිසි ගින්න මඟින් එහි ඉදිකොට ඇති සන්නිවේදන කුළුනට හානි සිදුවිය හැකි බැවින් එම ගින්න පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා භටපිරිස් සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.03.13 දින මුලතිව් මුහුදු තීරයෙන් ධීවර කටයුතු සඳහා පිටත්වූ ධීවර බෝට්ටුව සමඟ තිදෙනෙකු අතුරුදහන් විය. එම බෝට්ටුව සමඟින් අදාල ධීවරයින් තිදෙනා සොයා ගැනීම සඳහා ගුවන් හමුදාව වෙතින් හෙලියානා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.03.16 දින මුලතිව් නයාරු මුහුදු තීරයෙන් ධීවර කටයුතු සඳහා පිටත්වූ ධීවර යාත්‍රාව සමඟ අතුරුදහන් වූ ධීවරයින් සොයා ගැනීම සඳහා ගුවන් හමුදාව වෙතින් හෙලියානා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.04.11 දින කළුතර දිස්ත්‍රික්කයට අයත් බේරුවල ධීවර වරායෙන් මුහුදු ගිය රම්බෝ ධීවර යාත්‍රාවේ එන්ජිමේ ක්‍රියාකාරීත්වය 2018.04.14 දින ඇණ හිටීම නිසා ධීවර යාත්‍රාව සමඟින් ධීවරයින් 05 දෙනෙකු අතරමං විය. එම ධීවරයින් 05 දෙනා බේරා ගැනීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.07 අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුමාරිගම ග්‍රාම නිලධාරී වසමට අයත් ආන්දල් ඔයෙහි කෘෂිකාර්මික අමුණ කැඩී ජලය කාන්දු විය. එය යථාතත්ත්වයට පත්කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.20 දින කළුතර දිස්ත්‍රික්කයට ඇද හැලුනු වර්ෂාව හේතුවෙන් බුලත්සිංහල, වලල්ලාවිට, පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පහත්බිම් සියල්ල ජලයෙන් යට විය. එම ප්‍රදේශයන්හි ජනතාව බේරා ගැනීම සඳහා එම ප්‍රදේශයන් වෙත නාවික හමුදා බෝට්ටු 02 ක බැගින් ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.21 දින මොණරාගල නගර සීමාව තුල කඩ පෙලක හටගත් ගින්න මැඩ පැවැත්වීම සඳහා ගුවන් හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.23 කළුගඟ ධාරා ප්‍රදේශයේ ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් කළුගඟේ ජල මට්ටම සුළු ගංවතුර තත්ත්වයක් දක්වා ලඟාවූ බැවින් කළුතර දොඩම්ගොඩ, මිල්ලනිය, මදුරාවල, හොරණ, බුලත්සිංහල, ඉංගිරිය, පාලින්දනුවර, කිරිඇල්ල, කුරුවිට, ඇලපාත හා රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පහත් බිම්වල පදිංචි කරුවන් ආරක්ෂිත ස්ථාන වලට රැගෙන යාම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.25 දින පුත්තලම දිස්ත්‍රික්කයේ ගල්ඔරුව ප්‍රදේශයෙන් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර නැගෙනහිර ප්‍රදේශයෙන් කලුඹුලු ඔය පිටාර ගැලීමෙන් පීඩාවට පත් ජනතාව මුදවා ගැනීම සඳහා යුද්ධ හමුදා සහ ගුවන් හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.25 දින රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත වලව්ව අසල පවතින වැව වාන් මට්ටම පැමිණීම හේතුවෙන් එහි පිටවානෙන් සහ සොරොව්වෙන් ජලය පිටවීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැව් බැම්ම කැඩී යාමේ අවධානමක් පැවති බැවින් පිටවාන පිළිසතර කිරීම සඳහා සහ වැලි කොට්ට ඇතිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.26 දින සිට දින 07 ක් සඳහා කැළණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඇලවේලි 04 ක් ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා කැළණිය පෙතියාගොඩ රජමහා විහාරය වෙත නිලධාරී 01 ක් හා සෙසු නිලයින් 40 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ත්‍රිවිධ හමුදාව මඟින් ලබාදීම සිදුකරන ලදී.
- 2018.05.26 දින පැවති අයහපත් කාළගුණික තත්ත්වය හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ඒකල, ජාඇල, බෝපිටිය, උස්වැටකෙයියාව, කටාන ප්‍රදේශ සහ බැලුම්මහර ප්‍රදේශයන් සහ කොළඹ දිස්ත්‍රික්කයේ වැල්ලම්පිටිය, කොළොන්නාව, මුල්ලේරියාව, නවගමුව, වැලිහිඳ, හංවැල්ල, වරාව, බුත්ගමුව යන ප්‍රදේශයන්හි ඇතිවූ ගංවතුර තත්ත්වයෙන් ජනතාව බේරා ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීම සිදුකරන ලදී.
- 2018.06.02 දින 0430 පැයට පමණ අම්පාර දිස්ත්‍රික්කයේ ආරුගම්බේ උල්ලායි ධීවර වරායෙන් මුහුදු ගිය 03 දෙනෙකුගෙන් යුත් එක් දින ධීවර යාත්‍රාවක් එදින පස්වරුවේ ගොඩබිමට නොපැමිණීම නිසා ධීවර යාත්‍රාව සෙවීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.06.04 දින කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල මුහුදු වෙරළට ගොඩ ගසා සිටි තල්මසෙකුගේ මළ සිරුර ඉවත් කිරීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.06.15 දින ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලංකා බීච් හෝටලය ඉදිරිපිට මුහුදේ දිය නෑමට ගිය දෙදෙනෙක් අතුරුදහන් වූ අතර, ඔවුන් සොයා ගැනීම සඳහා නාවික හමුදා කිමිදුම් කරුවන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.06.17 දින 05.00 පැයට පමණ අම්පාර දිස්ත්‍රික්කය තුල හමාගිය දැඩි සුළං තත්ත්වය හේතුවෙන් අම්පාර උහන, නාවින්දන්වේලි, සායින්දමරුදු, තිරුක්කෝවිල්, සමන්තුරෙයි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි නිවාස 136 කට දැඩි අලාභහානි සිදු වූ අතර, එම තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.06.19 දින අලුයම 01.30 පැයට පමණ ඇති වූ තද සුළං තත්ත්වය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය නගරය ආශ්‍රිතව හා පල්ලපිටිය යන ප්‍රදේශවල නිවාස, විදුලි රැහැන් පද්ධති හා ගස් කඩා වැටීම නිසා මාර්ග පද්ධති අවහිර වී තිබූ අතර, එම ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.

- 2018.06.28 පුත්තලම දිස්ත්‍රික්කයේ පාලියාගම වැවේ වාන් මට්ටමේ සිට අඩි 15 ක පමණ ජල ප්‍රමාණයක් රැඳි සොරොව්ව සිරවී තිබූ බැවින් එය දියයට කිමිදී විවෘත කිරීම සඳහා නාවික හමුදා කිමිදුම්කරුවන්ගේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.07 දින 08.00 පැයට ආපදාවට පෙර සූදානම වැඩසටහන පැවැත්වීමට නියමිතව ඇති අතර, සමාරම්භක උත්සවය පැවති මල්වතු ඔය ජර්මන් පාලම අසල භික්ෂු විශ්ව විද්‍යාලය ඉදිරිපිට භූමිය සකස් කර ගැනීම සඳහා යුද්ධ හමුදාව වෙතින් 25 දෙනෙකු සහ ගුවන් හමුදා වෙතින් 20 දෙනෙකුගෙන් යුත් හට පිරිසක් ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.11 දින හෝමාගම ප්‍රදේශයේ හමා ගිය දැඩි සුළං තත්ත්වය හේතුවෙන් හානියට පත් නිවාස වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.13 දින බදුල්ල දිස්ත්‍රික්කයේ බඹරකන්ද ප්‍රදේශයේ ඇතිවූ ගින්න පාලනය කිරීම සඳහා සහ එම ගින්නට මැදි වී සිටි පුද්ගලයින් දස දෙනෙකු බේරා ගැනීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.14 දින ගම්පහ දිස්ත්‍රික්කයේ දික්ඕවිට ධීවර වරායෙන් මුහුදු ගිය ධීවර යාත්‍රාවේ එන්ජිමේ ක්‍රියාකාරීත්වය ඇණ හිටීම හේතුවෙන් ධීවරයන් දෙදෙනෙකු සමඟ යාත්‍රාව අතරමං විය. එම යාත්‍රාව සහ ධීවරයින් දෙදෙනා බේරා ගැනීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.20 දින බදුල්ල දිස්ත්‍රික්කයට අයත් පස්සර මාර්ගය අසල රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.21 දින මොණරාගල දිස්ත්‍රික්කයට අයත් රහානත් කන්ද රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.22 දින බදුල්ල දිස්ත්‍රික්කයට අයත් උඩුහාවර රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.07.24 දින බදුල්ල දිස්ත්‍රික්කයට අයත් කොළොන්ගස්තැන්න රක්ෂිත ප්‍රදේශයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සදහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදි.
- 2018.07.29 දින රත්නපුර දිස්ත්‍රික්කයට අයත් නියදගල ප්‍රදේශයේ පිහිටි සබරගමුව විශ්ව විද්‍යාලයේ ඉහළ කොටසේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.08.05 දින මොණරාගල දිස්ත්‍රික්කයට අයත් සපුගොඩ කන්දේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා අනුව යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.08.02 දින හමාගිය දැඩි සුළං තත්ත්වය හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයට අයත් නවගම්පුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සිවි මුණි සෑ වෙහෙර පන්සලට දැඩි හානි සිදුවූ අතර, එහි පිළිසකර කිරීම් සදහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදි.
- 2018.08.22 දින බදුල්ල දිස්ත්‍රික්කයේ හෙලමුල්ල කඳු රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.08.31 දින ගාල්ල දිස්ත්‍රික්කයේ කලුගල කන්ද රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.08.31 දින "NOKUNU" ස්වේච්ඡා සංවිධානය මගින් පාමංකඩ, තලකොටුව හා වැල්ලවත්ත ප්‍රදේශයන්හි සිදුකළ පිරිසිදු කිරීමේ වැඩසටහන් සඳහා යුද්ධ හමුදාව, ගුවන් හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් හට පිරිස් සහභාගී කරවීමට කටයුතු සිදු කරන ලදී.
- 2018.09.01 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගෝනදෙණිය තේක්ක රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.03 දින බදුල්ල දිස්ත්‍රික්කයේ අලුගොල්ල ගෝනදෙණිය කන්ද ප්‍රදේශයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදි.
- 2018.09.04 දින කොළඹ බ්ලූමැන්ඩල් කුණු කන්දේ හටගත් හදිසි ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා නාවික හා ගුවන් හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.05 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මාපිටකන්ද රක්ෂිතයේ හටගත් හදිසි ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.06 දින බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අම්පිටිහේන රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.07 දින මහනුවර දිස්ත්‍රික්කයට මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුත්තෙට්ටුතැන්න ග්‍රාම නිළධාරී වසමේ වනජීවී කලාපයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.08 දින මහනුවර දිස්ත්‍රික්කයට අයත් රන්දෙණිගල රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.15 දින මොණරාගල දිස්ත්‍රික්කයට අයත් මිනිගල කන්ද රක්ෂිතයේ හටගත් ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.21 දින පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගිරිතලේ වැවෙහි දිය නෑමට ගොස් අතුරුදන් වූ පුද්ගලයන් දෙදෙනෙකු සෙවීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.21 දින බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වෙල, කටුගහකන්ද පතන රක්ෂිතයේ හටගත් ගිනිගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.23 දින මහනුවර දිස්ත්‍රික්කයේ ගුරුගල් ඔය ජලාශයේ දිය නෑමට ගොස් අතුරුදන් වූ වයස අවුරුදු 14 ක දරුවකු සෙවීම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.09.30 දින මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ නගරය හරහා ගලා බසින ඇල පිටාර ගැලීම නිසා පීඩාවට පත්ව සිටින ජනතාවගේ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කරගැනීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.10.01 දින පුත්තලම දිස්ත්‍රික්කයේ මුදරක්කුලිය ප්‍රදේශයේ ඇතිවූ තද සුළං තත්ත්වය හේතුවෙන් කැඩුණු නිවාස යථා තත්ත්වයට පත් කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.10.17 දින ගම්පහ දිස්ත්‍රික්කයට අයත් මීගහවත්ත ප්‍රදේශයේ තෙල් කාන්දුවී රත්ගහවත්ත ඇළට එකතුවී ඇති අතර එම තෙල් කැළණි ගඟට එකතුවීම වැළැක්වීම සඳහා නාවික හමුදාවේ සහ වෙරළාරක්ෂක බලකායේ සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.10.22 දින අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඉත්තෑකුලම වැවේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.11.08 දින මුලතිව් දිස්ත්‍රික්කයෙහි තිත්තාහකුලම් වැව් බැම්ම කැඩීගොස් ඇති අතර කුඹුරු වැඩ සඳහා ගොස් සිටි පුද්ගලයින් 06 දෙනෙකු එම ප්‍රදේශයේ සිරවී ඇති අතර ඔවුන් මුදවා ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.11.27 දින මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර ධීවර වරායෙන් ධීවර කටයුතු සඳහා මුහුදු ගිය දෙවුම් නැමැති ධීවර යාත්‍රාව දෙවුන්දර පුරාණවැල්ල අසල ගල්පරයක වැදී මුහුදුබත් වී ඇති අතර එහි සිටි ධීවරයින් බේරා ගැනීම සඳහා නාවික හා ගුවන් හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.

- 2018.12.11 දින ගාල්ල ධීවර වරායෙන් ධීවර කටයුතු සඳහා ගොස් සිටි බහුදින යාත්‍රාවක පුද්ගලයෙකු මියගොස් ඇති බැවින් එම යාත්‍රාව ඉක්මනින් ගොඩබිම වෙත රැගෙන ඒම සඳහා නාවික හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.12.12 දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාළස්සාකැලේ ජලාශයට ඉහළ කඳු රක්ෂිතයේ ඇතිවූ ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.
- 2018.12.31 දින පුත්තලම දිස්ත්‍රික්කයේ නගර සභා ගබඩාවක ඇතිවූ ගිනි ගැනීම් තත්ත්වය පාලනය කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම සිදුකරන ලදී.

## ➢ වෙනත් ක්‍රියාකාරකම්

- ඇක්ෂන් වායු රයිෆල් ක්‍රීඩාව ශ්‍රී ලංකාවට හඳුන්වාදීම හා වායු රයිෆල් ලංකාවට ආනයනය කිරීම පිළිබඳ අදහස් හා නිර්දේශයන් ආරක්ෂක නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.
- ඔටාවා ප්‍රඥප්තියට අදාලව මූලික වාර්තාවක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුද්ගල නාශක බිම් බෝම්බ පිළිබඳව වාර්තාවක් ආරක්ෂක නිලධාරීන් වෙත ලබාදීමට කටයුතු කරන ලදී.
- දියෙහි ගිලීම් සහ ජලාශ්‍රිතව සිදුවන අනතුරු වැළැක්වීමේ ජාතික ප්‍රතිපත්තියක් සකසා ඉදිරි කටයුතු සඳහා ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.
- සැහැල්ලු අවි සහ කුඩා ආයුධ පරිහරණය, සංසරණය තහනම් කිරීමට අදාල ප්‍රඥප්තිය සම්බන්ධව පියවර ගැනීම සඳහා අදහස් හා යෝජනා ආරක්ෂක නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## ➢ පුහුණු හා මූලධර්ම ශාඛාව

- ආරක්ෂක අමාත්‍යාංශයේ 103-01-07-2401 වැය ශීර්ෂය මගින් ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ පුහුණු කටයුතු සඳහා ප්‍රතිපාදන වශයෙන් රු 2,000,000.00 ක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වෙත ලබා දී ඇත.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් විශ්‍රාම ගැනීමට නියමිත ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් එක් අවුරුදු සහ සය මාසික වෘත්තීය පුහුණු පාඨමාලාවන් පවත්වනු ලබන අතර, පළමු අඩ වසරේ සාමාජිකයින් 512 ක් සඳහා සහ දෙවන අඩ වසරේ සාමාජිකයින් 427 ක් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කරන ලදී.
- 2018.03.08 දින සිට 10 වන දින දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් විපතට පත් කාන්තාවන්ගේ සංගමය (Association of War Afflicted Women -AWAW) මගින් සංවිධානය කරන ලද Regional Seminar on Increasing Women in UN Peace Keeping දකුණු ආසියානු රටවල් 05 ක් නියෝජනය කරමින් රාජතාන්ත්‍රික නිලධාරීන් සහ ආරක්ෂක නිලධාරීන් 14 දෙනෙකු සමඟ දේශීය නිලධාරීන් 23 දෙනකුගේ සහභාගිත්වයෙන් කොළඹ හිල්ටන් හෝටලයේදී පත්වන ලදී. ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් විපතට





පත් කාන්තාවන්ගේ සංගමය විසින් පාඨමාලාව සඳහා වැයවූ සියලු වියදම් දරන ලදී.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 37 ක් සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ශ්‍රී ලංකාවේ රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලය එකතුව සංවිධානය කරන ලද Advance CBRN (Chemical" Biological" Radiological




and Nuclear) Preventive and Responder පාඨමාලාව 2018.04.23 දින සිට 2018.04.27 දින දක්වා රොක් හවුස් යුධ හමුදා කඳවුර ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර, ඒ සඳහා රු. 154,952.50 ක මුදලක් වැය කරන ලදී.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් කාර්යාලය අනුග්‍රහයෙන් බ්‍රිතාන්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 27 ක් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන් 2018.05.14 දින




සිට 2018.05.24 දක්වා වූ දින 10 ක කාලසීමාවක් Managing Defence in The Wider Security Context (MDWSC) පාඨමාලාව Mövenpick Hotel Colombo හිදී පවත්වන ලදී.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සංවිධානයෙන් ත්‍රිවිධ හමුදා නිලධාරීන් තිස් දෙනෙකු සඳහා (30) Executive




Development Programme පාඨමාලාව Postgraduate Institute of Management (PIM) නො 28, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08 ආයතනයේදී 2018.09.10 වන දින සිට 2018.09.14 වන දින දක්වා දින 05 ක් තුල පවත්වන ලද අතර, ඒ සඳහා වැය කරන ලද මුදල රු. 892,500.00කි.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර Defence Dialogue සාකච්ඡාව ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී 2018.10.03 සහ 2018.10.04




යන දෙදින තුල ශ්‍රී ලංකා සහ පකිස්ථාන ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් 20 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී .
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ සංවිධානයෙන් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 74 දෙනෙකු සඳහා Computer Emergency Readiness Team (SL CERT) ආයතනය මගින් පවත්වන ලද Cyber Security එක්දින වැඩමුළුව රොක්




හවුස් යුධ හමුදා කඳවුර ශ්‍රවණාගාරයේදී 2018.11.16 වන දින 0900 - 1600 පැය දක්වා පවත්වන ලද අතර, ඒ සඳහා රු. 50,216.20 ක් වැය වන ලදී.

- 103-01-07-2401 වැය ශීර්ෂය මගින් ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ පුහුණු කටයුතු සඳහා ලබාදුන් රු.2,000,000.00 මුදලින් Advance CBRN පාඨමාලාව සඳහා රු 150,952.50 ද, Executive Development Programme රු. 892,500.00 හා Cyber Security පාඨමාලාව සඳහා රු.50,216.20 වැය වු අතර, එම පාඨමාලා සඳහා මුළු මුදල රු 1,093,668.70 මුදලක් වැය විය. ඉතිරි රු.906,331.30 මුදල සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය ලබාගෙන Defence Attachés/Counselors Posted Abroad පාඨමාලාව රු.900,000.00 මුදලකට 2019 ජනවාරි මස සිට සිදුකිරීමට නියමිතව ඇත.

➢ නාවික හා ගුවන් මෙහෙයුම් ශාඛාව

- 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වෙතින් නියමුවන් රහිත යානා ක්‍රියාකරවීම පිළිබඳ අනුමැතිය ලබා ගැනීමට අයදුම් කරුවන් 872 දෙනෙකු ඉල්ලුම් කළ අතර, එම අයදුම් කරුවන් අතරින් 832 දෙනෙකු සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
- 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වෙතින් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ආරක්ෂක නිෂ්කාෂණ වාර්තා ලබා ගැනීම සඳහා 18 දෙනෙකු ඉල්ලුම් කළ අතර, ඒ සඳහා ආරක්ෂක නිෂ්කාෂණ වාර්තා ලබාදෙන ලදී.
- 2018.01.01 දින සිට 2018.12.31 දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු හට පිරිස් සහය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කළ අතර, ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| සන්නද්ධ හමුදාව/ආයතනය | ප්‍රමාණය |
|---|---|
| යුද්ධ හමුදාව | 16,782 |
| නාවික හමුදාව | 7,772 |
| ගුවන් හමුදාව | 5,472 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 14,476 |
| එකතුව | 44,502 |

10.2 වගුව : ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් සහභාගී කරවීම

| | |
|---|---|
| සම්පූර්ණ පරීක්ෂා කළ ස්ථාන | 1,967,110 |
| මුදුරු කීටයන් සිටින ලද ස්ථාන | 24,174 |
| නිවැරදි කිරීම් සිදු කරන ලද ස්ථාන | 163,147 |
| රතු නිවේදනයන් නිකුත් කළ ස්ථාන | 44,098 |

10.3 වගුව : විශේෂ ඩෙංගු වැඩසටහනට අදාලව පරීක්ෂා කරන ලද ස්ථාන පිළිබඳ විස්තරය

➢ සම්බන්ධීකරණ ශාඛාව

උත්සව කටයුතු සම්බන්ධීකරණය කිරීම

- සේනාධිනායක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් සහ හමුදා ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් 2018 පෙබරවාරි මස 04 වන දින කොළඹ ගාලු මුවදොර පිටියේදී පැවති 70 වන ජාතික නිදහස්




සැමරුම් උත්සවය සහ ඒ හා සමගාමීව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංවිධානයෙන් දිස්ත්‍රික් මට්ටමින් පැවති නිදහස් සැමරුම් උත්සවයන් සඳහා අවැසි ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් 2018 මැයි මස 19 වන දින බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගණයේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදී පැවති ජාතික රණවිරු සැමරුම් උත්සවයේ සහ කැළණිය රජමහා විහාරයේ පැවති පහන් ආලෝක පූජාවේ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.

ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය මත ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාදී පහත සඳහන් කාර්යයන් සිදුකිරීමට අදාලව සම්බන්ධීකරණ කටයුතු කරන ලදී

- දිවයින පුරා පිහිටි ප්‍රධාන පෙළේ පාසල් වෙතින් සංවිධානය කරනු ලබන අධ්‍යාපනික සහ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ත්‍රිවිධ හමුදා ප්‍රදර්ශන කුටි ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- දිවයින පුරා පිහිටි රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ජාතික ලේ බැංකුවේ මග පෙන්වීම යටතේ පවත්වනු ලබන ලේ දන්දීමේ වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක සාමාජිකයන්ගේ සහභාගීත්වය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකා බාල දක්ෂ සංගමය විසින් පවත්වනු ලබන දිස්ත්‍රික් රැලි සහ ජම්බෝරි සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- සිංහල අවුරුදු උදාව නිමිත්තෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජ්‍ය අනුග්‍රහය යටතේ පවත්වන්නට යෙදුනු සූර්ය මංගල්‍ය සැණකෙළි සඳහා ත්‍රිවිධ හමුදාවන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු වෙතින් අපේක්ෂිත සේවා සහාය සම්බන්ධීකරණය කිරීම.
- රාජ්‍ය වෙසක් උත්සවය ඇතුළු ආගමික උත්සව/පූජාවන් සඳහා ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු වෙතින් අපේක්ෂිත සේවා සහායන්/ශ්‍රම දායකත්වය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදේශ තානාපතිවරුන් සඳහා අක්ත පත්‍ර ප්‍රධානය කිරීමේ උත්සවයන්, ගරු ස්වාමීන් වහන්සේලා සඳහා සංඝනායක පදවි ප්‍රධානය කිරීමේ උත්සවයන් සහ පාර්ලිමේන්තු සැසිවාරයන් සඳහා අවැසි ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.
- තරුණ තරුණියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නිලධාරීන් වෙතින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාවට නංවන ලද යොවුන් පුරය වැනි ජාතික වැඩසටහන් / දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන්, උත්සව මාලාවන් සඳහා මෙන්ම දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ සහාය ලබාදීම.
- 2018.02.10 වන දින පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉල්ලුම් කරන ලද ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සහාය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක නිල මෙහෙවර ජනපති ජනතා සේවය ජාතික වැඩසටහන සහ " V 2025 Enterprise Sri Lanka" වැඩසටහන සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- 2018 පෙබරවාරි මස 21 වන දිනට යෙදී තිබූ ජාත්‍යන්තර මව් භාෂා දිනය සහ ලෝක සංචාරක දිනය, ලෝක ළමා දිනය, ජාත්‍යන්තර මානව හිමිකම් දිනය, ජාතික සුරක්ෂිත දිනය ඇතුලු අනෙකුත් ජාත්‍යන්තර සහ ජාතික දිනයන්ට සමගාමීව පවත්වන ලද වැඩසටහන් වෙනුවෙන් ඉල්ලුම් කරන ලද ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ සහාය ලබාදීම.
- දේශීය විදේශීය මළල ක්‍රීඩක සහ ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වයෙන් 2018 පෙබරවාරි මස 22 වන දින සිට 26 වන දින දක්වා කොළඹදී පැවති Sri Lanka Wonder of Asia Ironman 7.3 Colombo Programme වැනි ක්‍රීඩා වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ සහාය ලබාදීම.

- අපවත්වී වදාළ පූජ්‍යපාද දරණාගම කුසලධම්ම නාහිමිපාණන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය 2018 මාර්තු මස 08 වන දින සහ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ අවමංගල්‍ය උත්සවය 2018 මැයි මස 02 වන දින නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේදී පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව පැවැත්වීමට අවැසි ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සහාය සම්බන්ධීකරණය කිරීම.
- විශ්‍රාමික රණවිරුවන් සඳහා රැකියා ලබාදීමේ වැඩ පිළිවෙල යටතේ රණවිරුවන් කෘෂිකාර්මික දැනුමින් සන්නද්ධ කර ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා යොමු කිරීමට අවැසි සම්බන්ධීකරණ සහාය සහ විශ්‍රාමික වෘත්තීය සෙබලුන් රැකියා සඳහා යොමු කිරීමට අවැසි සහාය ලබාදීම.
- 2018.06.26 දින සිට 2018.07.02 දින දක්වා ප්‍රකාශිත මතින් නිදහස් රටක් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතියට සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවැසි සහාය සම්බන්ධීකරණය කිරීම.
- ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සඳහා බැංකු සේවා පහසුකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- කෘෂිකාර්මික ප්‍රදේශවල වගාවට හානි කරනු ලබන වන සතුන්ගෙන් වන හානිය නිසා මතුවන ගැටළු අවම කිරීම සඳහා කෘෂිකර්ම නිලධාරීන් වෙතින් අපේක්ෂිත සේවා සහායන් සම්බන්ධීකරණය කිරීම.

➢ විදේශීය ප්‍රභූවරුන්/රාජ්‍ය අමුත්තන්ගේ පැමිණීම් සහ විදේශ සංචාර සම්බන්ධීකරණය කිරීම

- සිංගප්පූරු අග්‍රාමාත්‍ය ගරු LEE STIEN LOONG මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය (2018.01.22/24) සඳහා ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණය කිරීම.
- ඉන්දුනීසියානු අතිගරු ජනාධිපති ගරු Joko Widodo මැතිඳුන්ගේ ශ්‍රී ලංකා සංචාරය (2018.01.24/25) සඳහා ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණය කිරීම.
- පාකිස්ථාන ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානි ජෙනරාල් Zubair Mahmood Hayat NI (M) සහ එරට හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරය (2018.06.27/30) සඳහා ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණය කිරීම.
- 2018.07.12 සහ 13 යන දිනයන්හි තායිලන්ත අග්‍රාමාත්‍ය ගරු Prayuth Chan –o- Cha මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණය කිරීම.
- 2018 ජූලි මස 28 වන දින සිට අගෝස්තු මස 05 වන දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ වොටර්විලේ ප්‍රදේශයේ පිහිටි කොල්බි විද්‍යාලයේ පැවති Project Common Bond Summer 2018 වැඩසටහන සඳහා ත්‍රස්තවාදින්ගේ ක්‍රියා හේතුවෙන් ජීවිතක්ෂයට පත්වූ හමුදා සාමාජිකයන්ගේ දරුවන් සහභාගි කරවීමට අවැසි සම්බන්ධීකරණ සහාය ලබාදීමට කටයුතු කරන ලදී.
- ජපාන ආරක්ෂක අමාත්‍ය Itsunori Onodera මැතිතුමා ඇතුළු ප්‍රභූ පිරිසගේ ශ්‍රී ලංකා සංචාරය (2018.08.20/22) සඳහා ත්‍රිවිධ හමුදා සහාය සම්බන්ධීකරණය කිරීම.
- 2018.08.20 වන දින සිට 2018.09.02 වන දින දක්වා රුසියාවේ මොස්කව් නුවර පැවති රුසියානු ජාත්‍යන්තර තූර්ය වාදක සැණකෙළිය වෙනුවෙන් ත්‍රිවිධ හමුදා තූර්ය වාදක කණ්ඩායම් සහභාගි කරවීම සඳහා අවැසි කටයුතු සම්බන්ධීකරණය.

## 10.3 අනාගත අපේක්ෂා

- ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම යටතේ ඩේවිඩ් පීරිස් මෝටර් රථ සමාගම සමඟ සම්බන්ධතාවයෙන් යුතුව ත්‍රීවිල්රථ අලුත්වැඩියා කිරීමේ පාඨමාලාව පවත්වාගෙන යාම.
- ජාතික/රාජ්‍ය උත්සව අවස්ථා වලදී ඊට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය මත සිවිල් පරිපාලන නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා සහයෝගය ලබාදීම.
- වැඩ වර්ජන සහ වෙනත් හදිසි අවස්ථාවන් වලදී රජයේ ආයතන පවත්වාගෙන යාම සඳහා අවැසි කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදේශීය ප්‍රභූවරුන් තානාපතිවරුන් සහ විදේශීය හමුදා නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරයන් සහ ත්‍රිවිධ හමුදා අතර සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම.
- ජාතික ආපදාවන් මැඩපැවැත්වීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- වෙනත් රටවල් සමඟ හමුදා සහයෝගය දියුණු කිරීම සඳහා මාණ්ඩලික සාකච්ඡා පැවැත්වීම.
- ජාතික ඩෙංගු මර්ධන කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

# 11. හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය

## 11.1 සමාලෝචනය

හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලයට අයත් විෂය පථයට ගැනෙන සියලුම විෂයන් නිසි අයුරු ක්‍රියාවට නැංවීම, ආරක්ෂක අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම්තුමා විසින් ගනු ලබන තීන්දු තීරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය, යුධ, නාවික, ගුවන් හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීම සහ සම්බන්ධීකරණය කිරීම සහ රාජ්‍ය හා අනෙකුත් ආයතන සමගින් සහයෝගයෙන් ක්‍රියා කිරීම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කිරීම, රජය හා ආරක්ෂක නිලධාරීන් විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ක්‍රියාවේ යෙදවීම හා අධීක්ෂණය කිරීම.

## 11.2 2018 වර්ෂයේ කාර්යසාධනය

- ත්‍රිවිධ හමුදා උත්සව කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාල උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- රාජ්‍ය උත්සව කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.
- විදේශ අමුත්තන්, රාජ්‍යතාන්ත්‍රිකයන් සහ ත්‍රිවිධ හමුදා උසස් නිලධාරින්ගේ මෙතෙර සංචාර සම්බන්ධීකරණය කිරීම සහ අවැසි සහයෝගය ලබාදීම.
- ත්‍රිවිධ හමුදාවන්ගේ විවිධ අවශ්‍යතා සඳහා ඒ ඒ අමාත්‍යාංශ/ආයතන හා සම්බන්ධතාවයෙන් කටයුතු කර එම අවශ්‍යතාවයන් සපුරාදීමට කටයුතු කිරීම.
- විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතනයන් ගේ අවශ්‍යතා සඳහා ත්‍රිවිධ හමුදා දැනුම හා සම්පත් භාවිතා කරමින් ඇවැසි සහාය ලබාදීම හා සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකා තානාපති කාර්යාල වල සේවයේ යෙදී සිටින විදේශීය ආරක්ෂක උපදේශකයින්/සම්බන්ධීකාරකයින් (රටවල් 11 ක් නියෝජනය වන පරිදි 15 දෙනෙකු පමණ) සමගින් හමුදා ආධාරක වැඩසටහන් ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක උපදේශක/ සම්බන්ධීකාරක සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු කිරීම.
- ත්‍රිවිධ හමුදා මූලස්ථාන හා එම කඳවුරු වෙත දේශීය/විදේශීය අයවලුන් ඇතුල්වීම සඳහා අනුමැතිය ලබාදීම සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි/ත්‍රිවිධ හමුදාධිපති වරුන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් හමුවීම/සාකච්ඡා කිරීම සඳහා අවසරය ලබාදීම.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි මෙන්ම ත්‍රිවිධ හමුදාපතිවරුන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් විවිධ උත්සවයන් සඳහා සහභාගිවීම හා විදේශීය තාන්ත්‍රිකයින් විසින් පවත්වනු ලබන ප්‍රිය සම්භාෂණ/උත්සව සඳහා සහභාගීවීම සඳහා වූ අනුමැතිය ලබාදීම හා ත්‍රිවිධ හමුදා නිලධාරින් හමුදා නොවන උත්සව අවස්ථාවන්හි ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගිවීමේදී සහ එකී උත්සව අවස්ථාවන් නියෝජනය වන පරිදි නිල ඇඳුමින් සහභාගිවීම සඳහා ඒඒ සේවාවන් විසින් ඉල්ලා සිටින විටදී අනුමැතිය ලබාදීම. තවද ත්‍රිවිධ හමුදා නිලධාරින් හා සෙසුනිලයින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත සම්බන්ධවීම සැබැඳිව විවිධ සේවාවන් විසින් අනුමැතිය ඉල්ලා සිටියදි අවශ්‍ය පරිදි අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශයේදී පැවැත්වෙන රැස්වීම්/සාකච්ඡා හා දේශන සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම.
- විදේශ කටයුතු නිලධාරීන් වෙතින් කරනු ලබන නිර්දේශයට යටත්ව නියමිත කාලසටහනකට අනුව යාත්‍රා/ පියාසර කරනු නොලබන විදේශීය නාවික යාත්‍රා/ගුවන් යානා වෙනුවෙන් ආරක්ෂක නිෂ්කාශණ ලබාදීම (Diplomatic Clearance)
- ආරක්ෂක හමුදාවන්ට අදාළ ආනයනය කර ඇති භාණ්ඩ රේගුවෙන් මුදා ගැනීම සහ වෙනත් පුද්ගල/ආයතන වෙනුවෙන් ආනයනය කරනු ලබන රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් ගෙනදිය හැකියැයි සැළකෙන සියලු උපකරණ, ගුවන් යානා, ගුවන් යානා උපකරණ සහ බෝට්ටු එංජින් වැනි භාණ්ඩ රේගුවෙන් මුදාගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබාදීම සබැඳිව කටයුතු කිරීම.
- රාජ්‍යතාන්ත්‍රික ප්‍රභූවරුන් සඳහා ගුවන් පහසුකම් සළසාදීම සහ දෛනිකව නියමිතව ගමන් ගන්නා ගුවන් හමුදා ගුවන් යානා මගින් හට ගුවන් පහසුකම් සළසාදීමට අමතරව හෙලිකොප්ටර් යානා වල අවශ්‍යතාවය සඳහා කරනු ලබන ඉල්ලීම අනුව අවශ්‍ය පරිදි කටයුතු සිදුකිරීම.
- නිලධාරීන්ට පැමිණෙන සියලු අමුත්තන්/වාහන පැමිණීමට අවසරය ලබාදීම (ඒ ඒ අංශය විසින් කරනු ලබන ඉල්ලීම් අනුව)
- ත්‍රිවිධ හමුදා සහ වෙනත් අවශ්‍යතාවයන් සඳහා සිතියම්/ගුවන් සිතියම් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම් වලට අනුව සර්වේයර් ජනරාල් ඇමතීම.
- සඳහිරුසෑය ඉදිකිරීම් කටයුතු - මෙහෙයවීම සහ අධීක්ෂණය.
- නිලධාරීන්ට අනුයුක්තව සේවයේ යෙදී සිටින සියලුම ත්‍රිවිධ හමුදා නිලධාරින්/සෙසුනිලයින් ගේ පරිපාලනමය කටයුතු සිදුකිරීම මෙම අමාත්‍යාංශයේ සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යංශයේ විවිධ අංශයන් සඳහා ත්‍රිවිධ හමුදා වෘත්තිය අයවලුන් ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම් මත ලබාදීම් සහ මාරු කිරීම් කටයුතු සිදුකිරීම.
- හමුදාවන්ට අයත් විවිධ ආයතන වෙතට, විශේෂයෙන් අභිමංසල/රණවිරු සෙවණ, මිහිදුසෙත් මැදුර ආදී තැන් වලට සිවිල් පුද්ගලයින්ගේ පැමිණීම හා ඔවුන් විසින් සිදුකරනු ලබන සංග්‍රහ කටයුතු පරිත්‍යාග කිරීම සඳහා වූ අනුමැතිය ලබාදීම.
- කොළඹ නගරය අලංකරණය කිරීමේ කටයුතු සදහා වෙනම ඒකකයක් (CCSCBU) ස්ථාපිතකර ඇති අතර එමගින් අදාල කටයුතු සිදුකිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම.
- වඳවීමේ තර්ජනයට මුහුණපාන සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධ සමුළුවේ ඉදිරි වැඩකටයුතු අධික්ෂණය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා සහභාගීවන රාජ්‍ය උත්සව සඳහා අධිසහායක නිලධාරීන් නම් කිරීම - ජනාධිපති කාර්යාලයෙන් කරනු ලබන ඉල්ලීමකට අනුව ත්‍රිවිධ හමුදා මූලස්ථාන දැනුවත් කිරීමෙන් පසුව එම මූලස්ථානයන් විසින් ඉඳුරාම අදාළ නාමයෝජනා ජනාධිපති කාර්යාලය වෙත ලබාදෙනු ඇත. මෙසේ සහාය දෙනු ලබන ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ ආරක්ෂක නිශ්කාෂණ කටයුතු ලබාගැනීමට කටයුතු කිරීම.







- ආගමික සිද්ධස්ථාන/රජයේ වැදගත් ගොඩනැගිලිවල නඩත්තු/ නව ගොඩනැගිලි ඉදිකිරීම ආදිය සඳහා ආරක්ෂක ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාදීම.
- රජයේ හෝ වෙනත් ආයතන මගින් සිදුකරනු ලබන ජල ආශ්‍රිත ක්‍රීඩා/ගමන් බිමන් හා වෙනත් කටයුතු සඳහා නාවික හමුදා සහාය ලබාදීම.
- රජයේ පාසල් වෙත උපදේශක සේවා සහාය ලබාදීම (තූර්ය වාදන/බාලදක්ෂ/දේශන සහාය)
- විදේශීය ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ ශ්‍රී ලංකා සංචාර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම මෙන්ම විදේශීය හමුදාවන් පුහුණු කටයුතු සඳහා දිවයිනට පැමිණීමේදී එම සංචාර සම්බන්ධීකරණ කටයුතු සඳහා ක්‍රමානුකූලව ත්‍රිවිධ හමුදා මූලස්ථාන වෙත පැවරීම සහ ඒ සඳහා පරිපාලනමය සහාය හා අධීක්ෂණය සිදුකිරීම.
- ඩෙංගු වසංගතය තුරන් කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහ සිආදෙ දායකත්වය සැපයීම (පාසල් මට්ටමින්/ප්‍රාදේශීය මට්ටමින්/දිස්ත්‍රික්ක මට්ටමින් දිවයින පුරා ආවරණය වන පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි සිදුකිරීම).
- සියලු උත්සව සඳහා අවස්ථානුකූලව ත්‍රිවිධ හමුදා තූර්ය වාදන කණ්ඩායම් වල සේවය ලබාදීම සඹැඳිව කටයුතු සැලසීම.
- ගාලුමුවදොර පිටියේ සිදු කරනු ලබන සියලුම උත්සව කටයුතු වරායේ අධිකාරියේ අනුමැතියට යටත්ව අනුමැතිය ලබාදීම.
- රාජ්‍ය උත්සව සඳහා හමුදා සහාය ලබාදීම (නිදහස් දින පෙළපාලිය/රණවිරු සැමරුම් දිනය) හා පළාත් මට්ටමින් පැවැත්වෙන රණවිරු සැමරුම් උත්සව සඳහා අවැසි අනුමැතිය සේවා සහාය සහ ඊට අදාල හට පිරිස් ලබා දීම සම්බන්ධීකරණය කරදීම මියගොස් සිටින රාජ්‍ය නායකයින්ගේ ජන්ම දින/සැමරුම් උත්සව වෙනුවෙන් (ගුණ සැමරුම් උත්සව) පැවැත්වෙන උත්සව අවස්ථාවන් සඳහා කරනු ලබන ඉල්ලීම් අනුව අවශ්‍ය බියුගල් වාදකයින් සහ අවශ්‍ය පරිදි සහාය ලබාදීම.
- නවීකරණය කරනු ලබන බෝට්ටු අපනයනය කිරීම සහ මත්ස්‍ය කර්මාන්තය සඳහා බෝට්ටු අපනයනය පිළිබඳව අවසරය ලබාදීම.(අවශ්‍ය ලියකියවිලි සනාථ කර ගැනීමෙන් අනතුරුව)
- ගාලුමුවදොර පිටිය සහ ප්‍රදීපාගාර පරිශ්‍රයේ සිදුකරනු ලබන ඡායාරූපගත කිරීම සහ ටෙලි නාට්‍ය චිත්‍රපට සඳහා රූගත කිරීම් වලට අනුමැතිය ලබාදීම. (ගුවනේ සිට සිදුකරනු ලබන ඡායාරූප ගත කිරීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයෙන් අනුමැතිය ලබාදෙනු ලැබේ.)
- චිත්‍රපට රූගත කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් - ත්‍රිවිධ හමුදා ඇඳුම් ආයිත්තම්/යාන වාහන ඇතුලත්ව කරනු ලබන දර්ශන සහ ත්‍රිවිධ හමුදා තොරතුරු ඇතුළත් දර්ශනයන් වේනොත් හමුදා කඳවුරු තුළ කරනු ලබන රූගත කිරීම් සම්බන්ධයෙන් අදාල සේවා ප්‍රධානීන්ගේ හෝ අධ්‍යක්ෂ ජනමාධ්‍ය ගෙන් අදහස් නිරීක්ෂණ ලබාගෙන අනුමැතිය ලබාදීම.
- ශ්‍රී ලංකා ධීවරයන් ඉන්දියානු මුහුදු සීමාවේදී ඉන්දීය ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත් විට ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක විසින් නාවික හමුදාවට දැනුම්දීම් සහිතව මෙම නිලධාරින් වෙත දැනුම් දුන් අවස්ථාවේදී ඒ බැව් විදේශ කටයුතු නිලධාරීන් දැනුවත් කිරීම.
- විවිධ උත්සවයන් සඳහා ත්‍රිවිධ හමුදාව මගින් ආරක්ෂාව ලබාදෙනු ලබන ලෙස කරනු ලබන ඉල්ලීම් සඳහා පොලිස් ආරක්ෂාව ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නිලධාරින් වෙත යොමු කිරීම.
- මාධ්‍ය මධ්‍යස්ථානය විසින් මාධ්‍ය ප්‍රචාර ලබාදීම සම්බන්ධයෙන් අනුමැතිය අපේක්ෂා කරනු ලබන විට අවශ්‍ය අනුමැතිය සුදුසු පරිදි ලබාදීම.
- ත්‍රිවිධ හමුදා ප්‍රදර්ශන කුටි ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍ය පරිදි කටයුතු සිදු කිරීම.
- ත්‍රිවිධ හමුදාවන් මගින් සුභසාධන කටයුතු පිණිස මුදල් ඉපයීම සඳහා පවත්වනු ලබන සංදර්ශන/ලොතරැයි පත්/මෝටර් රථ ධාවන තරඟ ආදිය පැවැත්වීම සඳහා කොන්දේසීන්ට යටත්ව අනුමැතිය ලබාදීම.
- විවිධ පුද්ගලයන්ගේ වෙළඳ ව්‍යාපාර නිෂ්පාදන කටයුතු ආරක්ෂක හමුදා අයවලුන් අතරේ වෙළඳාම් කිරීමට කරනු ලබන ඉල්ලීම් ත්‍රිවිධ හමුදාධිපතීන් වෙත යොමු කිරීම.
- දිවයිනේ සිදුවුණු ස්වභාවික විපත් හා මානව ආපදාවන්ට ලක් වූ එම ජනතාව වෙනුවෙන් ආරක්ෂක අංශ සමාජිකයින්ගේ සේවය ලබාදීම.
- වෙසක් උත්සව වැනි පුණ්‍ය උත්සව හා රජය මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ උත්සව අවස්ථාවලදී ආරක්ෂක අංශ වල සේවා සහායන් නොඅඩුව ලබාදීමට කටයුතු සිදුකිරීම.
- වර්තමාන රජය මගින් ගෙන යනු ලබන සංහිඳියා යාන්ත්‍රණයට උපරිම අයුරින් සහයෝගය දැක්වීම.

### අංශයේ ප්‍රගතිය

➢ මහජනතාව වෙනුවෙන් කරනු ලබන මානුෂික සත්කාරක සේවාවන්

- 2018.05.29 දින සිට පැය 48ක කාලයක් පුරා පැවති දුම්රිය වැඩ වර්ජනය සඳහා දෙමටගොඩ, මාලිගාවත්ත, මරදාන, කොළඹ බඩු ගබඩාව, දුම්රිය අංගන හා දුම්රිය ධාවනාගාරවල ආරක්ෂාව සඳහා දුම්රිය ආරක්ෂක සේවා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් යුද්ධ හමුදා සහාය ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම.



- වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් සඳහා ජල පෙරණයන් නාවික හමුදාව විසින් සකස්කර දීම.
- ඩෙංගු රෝගය පැතිරයාම වැළැක්වීම සඳහා මෙම වසරේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා පහත සඳහන් පරිදි හට පිරිස් යොදවා සහාය දැක්වීම.

| | | |
|---|---|---|
| යුද්ධ හමුදාව | - | 15,349 |
| නාවික හමුදාව | - | 6,710 |
| ගුවන් හමුදාව | - | 5,221 |
| සි.ආ.දෙ | - | 12,298 |

- විවිධ අවස්ථාවන් සඳහා තූර්ය වාදන හා සංස්කෘතික කණ්ඩායම් වල සේවා ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් වලට අනුව එම සේවා අවශ්‍යතාවයන් පවතින ප්‍රතිපත්තීන්ට යටත්ව ලබා දීමට කටයුතු කිරීම.
- දිවයිනේ වකුගඩු රෝගීන් වෙනුවෙන් පොලොන්නරුව, මැදවච්චිය, අනුරාධපුර, මහනුවර යන නගර වල ඉදිවන වකුගඩු රෝහල් ව්‍යාපෘති සඳහා ත්‍රිවිධ හමුදා ශ්‍රම දායකත්වය ලබාදීම.
- දිවයිනේ විවිධ ප්‍රදේශවල මේ වනවිට වැව් 9ක් සහ 20 හංදිය වාන් ඇලපාර, ගෝමරංකඩවල විදුලි අලි වැට යන ඉදිකිරීම් යුධ හමුදා ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීම.

## ➢ රජයේ විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් පවත්වනු ලබන උත්සව අවස්ථාවන්හිදී ආරක්ෂක අංශ විසින් සපයනු ලබන දායකත්වය

- රජයේ විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් මෙන්ම විවිධ ආයතන වෙතින් පවත්වනු ලබන විවිධ උත්සව අවස්ථාවන්හිදී ආරක්ෂක අංශ විසින් සපයනු ලබන දායකත්වය හා සහයෝගය අගය කරමින් එම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ගේ විශේෂ ප්‍රශංසාව හිමි වී ඇත.

## ➢ සඳහිරුසෑය ව්‍යාපෘතිය

සඳහිරුසෑය ස්ථූපයේ ඉදිකිරීම් සඳහා ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 1730 පමණ භට පිරිස් ප්‍රමාණයක් යොදවා ඇති අතර එම ඉදිකිරීම් සඳහා අවැසි ගඩොල් ලංකා පිඟන් සංස්ථාවට අයත් ඇලෑපත්තුව, ගල්කඩවල, බිංගිරිය, මහියංගනය හා අම්පාර ප්‍රදේශවල පිහිටි උළු කර්මාන්ත ශාලාවන් වෙතින්ද, වැලි ලබාගැනිමේ කටයුතු කනගරායන්කුලම් හා සිලාවතුර ප්‍රදේශ වලින් ද ලබාගත් අතර අධිකරණය වෙතින් රාජසන්තක කරනු ලබන වැලි තොග ද ස්ථූපයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදි ඇත. තවද ගඩොල් පිළිස්සීමට අවශ්‍ය දර කළුගඟ ව්‍යාපෘතියේ ජලයෙන් යටවන ප්‍රදේශයෙන් සපයාගනු ලබයි.



මෙම ස්ථූපයේ උසින් අඩි 282.6 ක් හා විශ්කම්භය අඩි 255 වන අතර. ස්ථූප කර්මාන්තයට ආවේණිකව ඉදිවන මෙම ස්ථූපය මේ වන විට උසින් අඩි 73.9 ක් නිමකර ඇත. 2020.03.01 දින වන විට ගර්භයේ උස අඩි 90 ක් දක්වා ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## ➢ කොළඹ නගර අලංකරණ ඒකකය

කොළඹ නගර අලංකරණ ඒකකය මඟින් කොළඹ හා අවට නාගරිකයන් තුල ස්ථාපිත ඇවිදින මංතීරු 11 ක් හා ප්‍රධාන උද්‍යාන, ළමා ක්‍රීඩාංගන, වීදි ලාම්පු, ප්‍රධාන මංමාවත් හා පදික වේදිකා නඩත්තු කටයුතු නිරීක්ෂණය කරන අතර නගරයේ අලංකරණයට හානිවන පරිදි අවසර නොලත් ස්ථානවල කැලි කසළ දමන්නන් අත්අංඩගුවට ගැනීමේ කාර්ය සඳහා සිවිල් පොලිසිය වෙත සහායවීම.





කොළඹ හා තදාසන්න ප්‍රදේශවල අනවසර කසළ බැහැර කිරීම වැළැක්වීමේ මෙහෙයුම් මැදිරියක් පැය 24 පුරාවටම ක්‍රියාත්මක වන සේ පළාත් සභා සහ පළාත් පාලන නිලධාරීන් යටතේ දැනට ආරම්භ කර ඇති බැවින් එම මැදිරිය යටතේ නිරීක්ෂණ රාජකාරී කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාවෙන් 30 දෙනෙකුගෙන් (එක් සේවාවකින් 10 දෙනෙකු බැගින්) සමන්විත කණ්ඩායමක් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් දී ඇති උපදෙස් වලට අනුව ක්‍රියාකර ඇත.

ප්‍රසන්න සෞඛ්‍යමත් පුරවරයක අභිමානනීය පුරවැසියන් ලෙස ජීවත්වීමේ පරමලාභය අනාගත පරපුරට දායක කිරීමේ උදාර අධිෂ්ඨානයෙන් යුතුව කොළඹ දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල සාර්ථක කරගැනීමෙහිලා සිය දැනුම සහ ශ්‍රමය යොදා දක්වන ලද අත්‍යංත සම්මානනීය කර්තව්‍ය අගය කොට ගරු මහනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා හා ගරු බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ඉසුරු දේවප්‍රිය මැතිතුමා විසින් “Colombo City Beautification Awards 2017” සහ “Mihisaru Awards 2017” සම්මාන ද්විත්වය කොළඹ නගර අලංකරණය ඒකකය වෙත පිරිනමන ලදී.

## ➢ වඳ වී යාමේ තර්ජනයට මුහුණපාන සත්ත්ව හා ශාක (CITES 2019)

වඳ වී යාමේ තර්ජනයට මුහුණපාන සත්ත්ව හා ශාක විශේෂ පිළිබඳ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 18 වන සමුළුව (CITES COP 2019) 2019.05.23 දින සිට ජුනි මස 03 දින දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පැවැත්වීමට






නියමිතය. එම සමුළුව සඳහා බුද්ධ ශාසන නිලධාරීන් යටතේ CITES COP 18 ශ්‍රී ලාංකීක ලේකම් කාර්යාලය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත.

මෙම සමුළුවේ ආරක්ෂක කටයුතු හා ඉදිකිරීම් කටයුතු සම්බන්ධව මෙම නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතුව ඇත. ඒ සඳහා මේවනවිටත් අතිග රු ජනාධිපතිතුමාගේ මගපෙන්වීම හා උපදෙස් පරිදි විදේශ කටයුතු නිලධාරීන් ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධන හා වනජීවි නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

එම සමුළුවේ ඉදිකිරීම් කටයුතු ත්‍රිවිධ හමුදාවට හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර ඒ සඳහා වැයවන මුදල් සම්බන්ධව CITES COP 18 ශ්‍රී ලාංකික කාර්යාලය වෙත දන්වා ඇත. තවද, මේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා වරින්වර මෙම සමුළුවට සම්බන්ධ පාර්ශවකරුවන් කැඳවා සාකච්ඡා කරමින් පවතී.

## ➢ වෙහෙර විහාරස්ථාන සංවර්ධනය සඳහා ශ්‍රම දායකත්වය සැපයීම

ජනවාරි මස 01 දින සිට අගෝස්තු මස 31 දක්වා කාලය තුල දිවයිනේ වෙහෙර විහාරස්ථාන 284ක සංවර්ධන කටයුතු සඳහා ත්‍රිවිධ, හමුදා සිවිල් ආරක්ෂක බලකා භට පිරිස් 510 ප්‍රමාණයක ශ්‍රම දායකත්වයක් ලබාදී ඇත.

## ➢ මෙම වසරේ පහත සඳහන් පරිදි විදේශීය නාවික යාත්‍රා වලට රටතුලට පැමිණීම සඳහා ආරක්ෂක නිශ්කාෂණ ලබාදී ඇත.

| අනු අංකය | රට | නැව් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඉන්දියාව | 6 |
| 02 | ඉරානය | 3 |
| 03 | පාකිස්ථානය | 1 |
| 04 | මාලදිවයින | 2 |
| 05 | කටාර් රාජ්‍යය | 2 |
| 06 | තායිලන්තය | 1 |
| 07 | ඉන්දුනීසියාව | 2 |
| 08 | ජපානය | 3 |
| 09 | රුසියාව | 2 |
| 10 | ප්‍රංශය | 2 |
| 11 | චීනය | 2 |
| 12 | බංගලාදේශය | 3 |
| 13 | ඇමරිකා එක්සත් ජනපදය | 9 |
| එකතුව | | 38 |

11.1 වගුව : විදේශීය නාවික යාත්‍රා වලට රටතුලට පැමිණීම සඳහා ආරක්ෂක නිශ්කාෂණ ලබා දීම

➢ මෙම වසරේ පහත සඳහන් විදේශීය ගුවන් යානා වලට දිවයිනට පැමිණීමට හා රට හරහා ගමන් කිරීමට ආරක්ෂක නිශ්කාශණ ලබා දී ඇත.

| අනු අංකය | රට | ගුවන්යානා සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඇමරිකා එක්සත් ජනපදය | 77 |
| 02 | පාකිස්ථානය | 2 |
| 03 | බ්‍රිතාන්‍ය | 3 |
| 04 | ජපානය | 7 |
| 05 | කුවේට් | 1 |
| 06 | ඉන්දියාව | 6 |
| 07 | ඕමානය | 4 |
| 08 | ජර්මනිය | 3 |
| 09 | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 1 |
| 10 | බහරේන් | 1 |
| 11 | නවසීලන්තය | 7 |
| 12 | තායිලන්තය | 1 |
| 13 | මැලේසියාව | 2 |
| 14 | ඕස්ට්‍රේලියාව | 9 |
| 15 | රුසියාව | 5 |
| 16 | ස්ලෝවියාව | 1 |
| 17 | ඉරානය | 2 |
| 18 | අසර්බයිජානය | 1 |
| 19 | ප්‍රංශය | 9 |
| 20 | බ්‍රසීලය | 1 |
| 21 | ඇංගෝලියාව | 1 |
| 22 | ස්විස්ටර්ලන්තය | 2 |
| 23 | ඉන්දුනීසියාව | 1 |
| 24 | කටාර් | 2 |
| 25 | යුක්රේනය | 12 |
| 26 | මොරොක්කෝව | 1 |
| එකතුව | | 162 |

11.2 වගුව : විදේශීය ගුවන් යානා වලට දිවයිනට පැමිණීමට හා රට හරහා ගමන් කිරීමට ආරක්ෂක නිශ්කාශන ලබා දීම

➢ වසර තුළදී පහත සදහන් විදේශීය ප්‍රභූවරුන් - රාජතාන්ත්‍රික හා ත්‍රිවිධ හමුදා උසස් නිළධාරීන්ගේ ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහාය ලබා දීම.

- විදේශීය ප්‍රභූවරුන්

(I) එංගලන්ත එඩ්වඩ් කුමරුගේ හා පිරිසගේ සංචාරය - 2018.01.31- 2018.02.04
(II) සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයාගේ සංචාරය -2018.01.22 -24
(III) ඉන්දුනිසියානු ජනාධිපති හා දූත පිරිසගේ සංචාරය - 2018.01.24 - 25
(IV) තායිලන්ත අග්‍රාමාත්‍යවරයාගේ සංචාරය - 2018.07.12 - 13
(V) ජපාන ආරක්ෂක අමාත්‍යවරයා හා දූත පිරිසගේ සංචාරය - 2018.08.20 -22
(VI) රුවන්ඩා ආරක්ෂක අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය -2018.08.29 2018.09.01
(VII) චීන මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ උප අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය - 2018.11.04 -07

- විදේශිය ජාතික ආරක්ෂක විද්‍යාලය

(I) පකිස්ථාන ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.04.16- 20
(II) කොරියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.06.16 -20
(III) චීන ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.06.19 - 21
(IV) සිම්බාබ්වේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.07.01- 07
(V) ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.08.27- 29
(VI) බංගලාදේශ ජාතික ආරක්ෂක විද්‍යාලයේ ශ්‍රී ලංකා සංචාරය - 2018.09.16 - 21

- විදේශීය ත්‍රිවිධ හමුදා උසස් නිලධාරීන්

(I) පාකිස්ථානු යුද්ධ හමුදා ප්‍රධානීගේ සංචාරය -2018.01.14 - 18
(II) නේපාල යුද්ධ හමුදා ප්‍රධානී හා දූත පිරිසගේ සංචාරය -2018.01. 18- 22
(III) ඉන්දියානු යුද්ධ හමුදා ප්‍රධානී හා දූත පිරිසගේ සංචාරය -2018.05 .13 -18
(IV) පාකිස්ථානයේ ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානි කමිටුවේ සභාපතිගේ සංචාරය 2018.06. 27 - 30
(V) ඇමරිකානු පැසිපික් කලාපයේ අණදෙන ජෙනරාල් හා දූත පිරිසගේ සංචාරය -2018.07. 21- 24
(VI) පාකිස්ථානු යුද්ධ හමුදා නිලධාරි මේජර් ජෙනරාල් රෙහාන් අබ්දුල් හා දූත පිරිසගේ සංචාරය 2018.08. 04- 12



## 11.3 අනාගත අපේක්ෂා

- 2019 වසරේ නිලධාරීන් බත්තරමුල්ල - අකුරේගොඩ නව ගොඩනැගිල්ලක ස්ථාපිතවීම අපේක්ෂා කෙරේ.
- එතෙක් දැනට පවතින කාර්යාල පහසුකම් ඉඩකඩ තුලින් වැඩිකර ගැනීම.
- මෙම වසරේදී ඉටුකල සේවාවන් මෙන්ම 2019 වසරේදී ද සිදුකිරීමට බලාපොරොත්තු වේ.
- පොදු මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ආරක්ෂක හමුදාවන් විසින් සිදුවිය යුතුව ඇති සේවාවන් නොපිරිහෙලා සිදුකිරීමට කටයුතු කිරීම

# 12. ජාත්‍යන්තර සබඳතා අංශය

## 12.1 සමාලෝචනය

ආරක්ෂක අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා අංශය ආරක්ෂක ලේකම්තුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ආරක්ෂක ලේකම්තුමාගේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ කටයුතු සඳහා ක්‍රියාකරන ස්වාධීන අංශයක් ලෙස කටයුතු කරනු ලබයි. මීට අමතරව, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම සිදුකරනු ලබයි.

මෙම අංශයේ මූලිකත්වය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරක නිලධාරියකු මගින් සිදුවූ අතර දැනට මෙම අංශයේ සියලු වැඩ කටයුතු ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයට පැවරී ඇති බැවින් ජාතික බුද්ධි ප්‍රධානි මගින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ජාත්‍යන්තර අංශය මගින් පහත සඳහන් කරුණු පිළිබඳව විධිමත් ලෙස කටයුතු කරනු ලබයි.

- ආරක්ෂාව සම්බන්ධයෙන් විදේශයන්හි සිදුකරන සංචාරයන් හා මෙරටට පැමිණෙන ස්වාධීන අංශයන්හි සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ආරක්ෂක ලේකම්තුමා සමග විදේශීය නියෝජිතයන් අතර සම්බන්ධතා හැසිරවීම.
- විදේශ කටයුතු නිලධාරීන් හරහා සම්බන්ධවීම සහ අවශ්‍ය කරන ආරක්ෂක විධිවිධාන සැපයීම.
- ආරක්ෂක ලේකම්තුමාගේ විදේශ සංචාරයන් සඳහා අවශ්‍ය කරන සංක්ෂිප්ත වාර්තා, කථනය, වැඩසටහන් පිළියෙල කිරීම සහ එම සංචාරයන්හිදී ගනු ලබන තීන්දු තීරණ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ආරක්ෂක අමාත්‍යතුමා සහභාගි වන විදේශ සංචාරයන් සඳහා අවශ්‍ය කරන ආරක්ෂක යෙදවුම් පිළියෙල කිරීම.
- විදේශ රාජ්‍යයන් සමග ඇති කර ගන්නා ආරක්ෂක සම්මුතීන් හා අවබෝධතා ගිවිසුම් සම්බන්ධව සම්බන්ධීකරණ කිරීම.
- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාර සඳහා අවශ්‍ය කරන ආරක්ෂක යෙදවුම් පිළියෙල කිරීම.
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේදී ආරක්ෂක අංශ සම්බන්ධයෙන් පැන නැගෙන ගැටළු වලට පිළිතුරු ලබා දීම සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂක නිලධාරීන් සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සමග හා එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ වූ කාර්යාලය සමග පවතින සම්බන්ධතා සම්බන්ධීකරණය කිරීම.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ වැඩ කටයුතු සම්බන්ධයෙන් ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලය සමග සම්බන්ධීකරණය හා එක්සත් ජාතීන්ගේ ත්‍රස්තවාදය වැළැක්වීමේ විධායක අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්බන්ධීකරණ කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝග යන් නවීකරණය කිරීම.
- ආරක්ෂාව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කලාපීය සංවිධාන හා ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.
- ජපානය, චීනය සහ ඉන්දියාව වාර්ෂිකව පවත්වනු ලබන ආරක්ෂක සංවාදයන්හි වැඩකටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර පවතින ත්‍රෛපාර්ශවික සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතාවයේ වැඩකටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර පවතින මිනිස් ජාවාරම සහ අනෙකුත් අපරාධ වැළැක්වීම සම්බන්ධයෙන් සිදුකරනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය.
- අවි ආයුධ වෙළඳාම හා නිරායුධකරණය සම්බන්ධයෙන් පවතින ජාත්‍යන්තර ගිවිසුම්වලට අවශ්‍ය කරන ප්‍රතිපත්ති පිළියෙල කිරීම.
- අන්තර්ජාතික සම්මුතීන්වලට අවශ්‍ය කරන ආරක්ෂක යෙදවුම් පිළියෙල කිරීම.
- ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින විදේශ ප්‍රතිපත්ති සඳහා කැබිනට් ප්‍රකාශ පිළියෙල කිරීම.
- අන්තර්ජාතික වශයෙන් වැදගත්වන ආරක්ෂාව සම්බන්ධ කරුණු පිලිබඳ කැබිනට් ප්‍රකාශ පිළියෙල කිරීම.
- අතුරුදහන්වූවන් හා අත්තනෝමතික ලෙස රැඳවුම් භාරයේ රඳවාගෙන ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් කටයුතු කරන එක්සත් ජාතීන්ගේ කණ්ඩායම් වලට අවශ්‍යය කරන තොරතුරු සකස් කිරීමේදී ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලය සමග සම්බන්ධීකරණය වීම.
- ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලිජිස් සමාගම විදෙස් රාජ්‍යයන් සමග සිදුකරනු ලබන කටයුතු වලදී එම සමාග මේ ඉල්ලීම මත අවශ්‍ය කරන සහය ලබා දීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම්කරණ අංශයට අවශ්‍ය කරන ප්‍රතිපත්ති යෙදවුම් සැපයීම.

## 12.2 2018 වර්ෂයේ කාර්යසාධනය

### ➢ එක්සත් ජාතීන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ සහකාර මහා ලේකම් ආරක්ෂක ලේකම් හමුවීම

දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහකාර මහ ලේකම් ජෙෆ්රි ෆෙල්ට්මන් මහතා 2019 මාර්තු මස 09 වන දින ආරක්ෂක ලේකම් ජනාධිපති නීතිඥ කපිල වෛද්‍යරත්න මහතා ආරක්ෂක අමාත්‍යංශ




පරිශ්‍රයේදී හමුවිය. මෙම සාකච්ඡාවේ දී ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියා ක්‍රියාවලිය සහ ඉඩම් මුදාහැරීම සම්බන්ධ කරුණු සාකච්ඡාවට බඳුන් විය. සංහිඳියා ක්‍රියාවලියේ ප්‍රගතිය සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳ සහකාර මහ ලේකම්වරයා දැනුවත් කරන ලදී. මෙම ක්‍රියාවලිය දැනට ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් ෆෙල්ට්මන් මහතා සිය සතුට පළකළේය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආසියා හා පැසිෆික් කලාපය පිළිබඳ අධ්‍යක්ෂ මාරි යමෂිටා මහත්මිය, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවෙහි සංහිඳියාව සහ සංවර්ධනය පිළිබඳ සහකාර දේශිකා ගීතා සභාර්වල් මහත්මිය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආසියා හා පැසිෆික් කලාපය පිළිබඳ අධ්‍යක්ෂකගේ ලේකම් මාරි සැක් මහත්මිය ද මෙම හමුවට සහභාගි විය.

අමාත්‍යංශයේ සහ ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් මෙම සාකච්ඡාවට සහභාගි විය.

### ➢ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුවන්ඩා ජනරජය අතර ආරක්ෂක සහ සුරක්ෂිතතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම

මෙම ගිවිසුම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජේවර්ධන මහතා සහ රුවන්ඩා ජනරජය වෙනුවෙන් ගරු ජනරාල් ජේම්ස් කාබරෙබේ මහතා විසින් 2018 මැයි 15 වන දින රුවන්ඩාහිදී අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුම මගින් සන්නද්ධ හමුදාවන් අතර සාමය, ස්ථාවරභාවය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම උදෙසා සමීප සහයෝගිතාවය, අන්‍යෝන්‍ය අවබෝධය හා එක්ව කටයුතු කිරීම මෙන්ම ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය යන කරුණු සම්බන්ධයෙන් දෙරට අතර මිත්‍රත්වය සහ සහෝදරත්වය වර්ධනය කිරීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කර ඇත.

➢ 2018 අගෝස්තු 21 වන දින ජපාන ආරක්ෂක අමාත්‍යතුමා ශ්‍රී ලංකා ආරක්ෂක රාජ්‍ය ආමාත්‍යතුමා හමුවීම

ජපන් ආරක්ෂක අමාත්‍ය ගරු ඉට්සුනොරි ඔනොඩෙරා මහතා 2018 අගෝස්තු මස 21 වන දින ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මහතා අමාත්‍යංශ පරිශ්‍රයේදී හමුවිය. මෙම හමුවේදී ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමන් සහ ජපාන ආරක්ෂක ඇමතිතුමන් අතර සුහද සාකච්ඡාවක් පැවැත්විය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු කෙනිචි සුගනුමා මැතිතුමන්, ආරක්ෂක අමාත්‍යංශයේ පාර්ලිමේන්තු කටයුතු, ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ අතිරේක ලේකම්තුමන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති, ගුවන් හමුදාධිපති, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානි, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් හා අමාත්‍යංශ නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

➢ ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර පුද්ගල ජාවාරම හා වෙනත් අන්තර්ජාතික අපරාධ සම්බන්ධයෙන් පවත්වන ඒකාබද්ධ මෙහෙයුම් කමිටු රැස්වීම 5 වන වරටත් 2018 ඔක්තෝබර් මස 17 වන දින ගාලු මුවදොර හෝටලයේදි පවත්වන ලදි

ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර පුද්ගල ජාවාරම හා වෙනත් අන්තර්ජාතික අපරාධ සම්බන්ධයෙන් පවත්වන ඒකාබද්ධ මෙහෙයුම්






කමිටුව 5 වන වරටත් 2018 ඔක්තෝම්බර් මස 17 වන දින කොළඹ ගාලු මුවදොර හෝටලයේදී පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා සම සභාපති වරුන් ලෙස ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ජනාධිපති නීතිඥ කපිල වෛද්‍යරත්න මහතාද, ඕස්ට්‍රිලියාවේ අභ්‍යන්තර කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ වැඩබලන නියෝජ්‍ය ලේකම් (ප්‍රතිපත්ති) ඩේවිඩ් වයිඩ්න් මහතා ද සහභාගී විය.

මෙහි සමාරම්භක දේශනයේ දී අදහස් දක්වමින් ආරක්ෂක ලේකම්තුමන් ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රිලියාව අතර පවත්වන මෙම සමුළුව තුලින් මිනිස් ජාවාරම සහ වෙනත් අන්තර්ජාතික අපරාධ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් සිය හැකියාවන්, දැනුම හා අත්දැකීම් හුවමාරු කරගත හැකි මහඟු අවස්ථාවක් බව සඳහන් කළේය. මිනිස් ජාවාරම සහ වෙනත් අන්තර්ජාතික අපරාධ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එය ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා අප අතර පවතින අවබෝධය වඩාත් වර්ධනය කර ගැනීමට මෙම සමුළුව දෙපාර්ශවයටම ඉතා වැදගත් බව එතුමන් වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දක්වමින් ඩේවිඩ් වයිඩ්න් මහතා, ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාතික මිනිස් ජාවාරම සහ වෙනත් ජාත්‍යන්තර අපරාධ මැඩපැවැත්වීම සඳහා විවිධ නව වැඩසටහන් සකස් කරමින් පවතින බව පැහැදිලි කළේය. අන්තර්ජාතික අපරාධ මර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් සිදුකරනු ලබන





කටයුතු සඳහා ඕස්ට්‍රේලියානු රජය අවශ්‍ය ඕනෑම සහයක් ලබාදීමට කැපවී සිටින බව ඔහු වැඩිදුරටත් අවධාරණය කළේය.

මෙම හමුවේදී, පුද්ගල ජාවාරම හා වෙනත් අන්තර්ජාතික අපරාධ මැඩලීමට සහ එම සිදුකරන අයවලුන් හට දඬුවම් ලබාදීම වෙනුවෙන් ඕස්ට්‍රේලියානු රජය ගෙනයන ක්‍රියාමාර්ග සඳහා තම සහයෝගය නිරතුරුව ලබාදෙන බව ශ්‍රී ලංකා දූත පිරිස විසින් නැවත නැවතත් අවධාරණය කළේය.

# 13. මාධ්‍ය කේන්ද්‍රය

## 13.1 සමාලෝචනය

ස්වාධීන රටක ප්‍රමුඛතම අවශ්‍යතාවයක් වන ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස ආරක්ෂාව සම්බන්ධ තොරතුරු රැස්කිරීම හා ඒවා විශ්ලේෂණය කොට නිවැරදිව, වගකීමකින් යුතුව හා කාර්යක්ෂම ලෙස දේශීය සහ විදේශීය මාධ්‍ය වෙත ලබාදීමත්, විවිධ මාධ්‍ය තුළින් ප්‍රචාරය කරනු ලබන වැරදි හෝ අතිශයෝක්තියෙන් යුතු තොරතුරු නිවැරදි ලෙස හා නිසි අයුරින් දේශීය හා විදේශීය මාධ්‍ය වෙත ලබාදීමත්, මෙම ආයතන විසින් සිදුකරනු ලබයි.

- ජාතික ආරක්ෂාවට අදාල තොරතුරු එක්රැස් කිරීම සහ ඒවා කඩිනමින් මාධ්‍ය වෙත නිකුත් කිරීම.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරු හඳුනා ගැනීම සහ මාධ්‍ය හරහා ඒවා නිශේධනය කිරීම.
- ජාතික ආරක්ෂාවට අදාල තොරතුරු සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යංශයේ අදාල අංශ සමග සහ සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කිරීම.
- ආරක්ෂක නිලධාරීන් යටතේ ඇති ත්‍රිවිධ හමුදාව ඇතුළු අනිකුත් ආයතන සමග ඇති සම්බන්ධතාවයන් වැඩිදියුණු කර ගැනීම.
- අනාගත අවශ්‍යතාවයකදී පරිශීලනය සඳහා පුවත්පත් දත්ත මුලාශ්‍ර ගබඩාවක් පවත්වාගෙන යාම.
- ආරක්ෂක අමාත්‍යංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්වලදී ලිඛිත සහ මුඛ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධීකරණය කිරීම.

## 13.2 2018 වර්ෂයේ කාර්යසාධනය

| ආයතනය | නිලධාරි | සෙසු නිල |
|---|---|---|
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 08 | 16 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 03 | 18 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 01 | 08 |
| ශ්‍රී ලංකා පොලීසිය | 01 | 05 |
| විශේෂ කාර්ය බලකාය | - | 01 |
| සිවිල් ආරක්ෂක බලකාය | - | 03 |
| එකතුව | 13 | 51 |


13.1 වගුව: 2018 වර්ෂයේ කාර්යසාධනය

මෙම මාධ්‍ය කේන්ද්‍රය විසින් වර්ෂය තුළ මාධ්‍ය සාකච්ඡා 02ක්ද, මාධ්‍ය ප්‍රචාර 55ක්ද, මාධ්‍ය ආවරණ 36ක්ද, සිදුකර සාර්ථක ප්‍රගතියක් ලබා ඇත.


| මාසය | මාධ්‍ය සාකච්ඡා | මාධ්‍ය ප්‍රචාර | මාධ්‍ය ආවරණ |
|---|---|---|---|
| ජනවාරි | - | 3 | 3 |
| පෙබරවාරි | - | 3 | 2 |
| මාර්තු | - | 5 | 5 |
| අප්‍රේල් | - | 7 | 3 |
| මැයි | - | 3 | 1 |
| ජුනි | 1 | 9 | 5 |
| ජූලි | - | 5 | 2 |
| අගෝස්තු | 1 | 4 | 3 |
| සැප්තැම්බර් | - | 2 | 2 |
| ඔක්තෝබර් | - | 8 | 3 |
| නොවැම්බර් | - | 3 | 2 |
| දෙසැම්බර් | - | 3 | 5 |
| මුළු එකතුව | 2 | 55 | 36 |

13.2 වගුව: ආයතන මගින් සිදුකළ මාධ්‍ය සාකච්ඡා, මාධ්‍ය ප්‍රචාර සහ මාධ්‍ය ආවරණ


- 2008 සිට 2014 වර්ෂය දක්වා මාධ්‍ය කේන්ද්‍රයේ අවශ්‍යතාවයන් සඳහා මුල්‍ය හා ප්‍රාග්ධන වියදම් සෘජු වැය ශීර්ෂයක් යටතේ ගෙවන ලද නමුත් 2015 වර්ෂයේ සිට මාධ්‍ය කේන්ද්‍රයට අදාල එම වියදම් ආරක්ෂක අමාත්‍යංශයේ අංක 103-01-06 යටතේ නිලධාරීන් වෙත බැරකර ඇති අතර, මාධ්‍ය කේන්ද්‍රයේ අධ්‍යක්ෂකගේ ලිඛිත ඉල්ලීමක් මත මුල්‍ය අවශ්‍යතා ආරක්ෂක නිලධාරීන් වෙතින් සලසාදෙනු ලබයි.
- රුපියල් පන්දහසක මුදලක් (රු. 5000/-) සුළු මුදල් අග්‍රිමය වශයෙන් ආයතන වෙත ලබාදෙන අතර, ඒවා වැය කිරීමෙන් අනතුරුව වියදම් විස්තරය අදාල බිල්පත් සමග ආරක්ෂක නිලධාරීන් වෙත නිරවුල් කරනු ලබයි.





13.1 ප්‍රස්ථාරය: පුනරාවර්තන වියදම් - 2018





13.2 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පුවත්පත් විමර්ශන සාරාංශය - 2018





13.3 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ රූපවාහිනී නාලිකා ප්‍රවෘත්ති විමර්ශන සාරාංශය - 2018




13.4 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ගුවන් විදුලි නාලිකා ප්‍රවෘත්ති විමර්ශන සාරාංශය - 2018




13.5 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ වෙබ් අඩවි විමර්ශන සාරාංශය -2018




13.6 ප්‍රස්ථාරය: 2018 වර්ෂයේ අපරාධ වාර්තා විමර්ශන සාරාංශය- මූලාශ්‍ර: පොලිස් තත්ත්ව වාර්තා

## ගැටළු සහ අභියෝග

මාධ්‍ය ප්‍රචාරණය සහ මහජන සම්බන්ධතාවය වර්තමානයේදී ඉතා වැදගත් කරුණක් වන අතර, මෙම ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින ගැටළු සහ අභියෝග රැසක් මාධ්‍ය කේන්ද්‍රය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව ජාතික අවශ්‍යතාවයන් සඳහා සිවිල් සහ හමුදා සම්බන්ධීකරණය වර්ධනය මෙම ආයතනය මගින් සිදුකර ඇත. එමගින් යහපාලනය ඇති කිරීම සඳහා ජාතික ආරක්ෂාවට සම්බන්ධ ආයතන වෙත මහජනතාවගේ සහයෝගය ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ආරක්ෂක නිලධාරීන් යටතේ පාලනය වන මෙම මාධ්‍ය කේන්ද්‍රය මහජනතාවට ජාතික ආරක්ෂාව පිළිබඳ ආයතනයක් වශයෙන් කටයුතු කළ ද නිවැරදි තොරතුරු ක්‍රමවත්ව හා ඉතා කඩිනමින් ලබාගැනීමට ඇති හැකියාව සීමාසහිත වීම.

මෙම මාධ්‍ය කේන්ද්‍රය වෙතින් මාධ්‍ය නිවේදන භාෂා තුනෙන්ම නිකුත් කළ ද දැනට දමිල මාධ්‍ය සම්බන්ධීකරණ මාධ්‍යවේදියෙකු පමණක් සිටී. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය සම්බන්ධීකරණ මාධ්‍යවේදීන් ආයතනය තුළ නොමැති අතර, රටෙහි ජාතික ආරක්ෂාව වෙනුවෙන් පළවන ජාත්‍යන්තර මාධ්‍ය විස්තර නිවැරදිව සහ ක්‍රමවත්ව ලබාගැනීම සඳහා ඉංග්‍රීසි, දමිළ නාලිකා, නිරීක්ෂණය සඳහා වෘත්තිමය අයවලුන් නොමැති වීම.

මහජනතාව සහ ආයතන සමග ඇති සහයෝගිතාව ඉතාමත් වැදගත් සහ නෛසර්ගික වන බැවින් හා මෙම ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා මාධ්‍යකරණය පිළිබඳව දැනුමක් සහිත අයවලුන් නොමැති හෙයින් ඉහත ආයතන සහ මහජනතාව සමග ඇති සම්බන්ධතාවය සීමා සහිත වී ඇති අතර මාධ්‍ය ප්‍රචාරණය සඳහා ලබාගත හැකි තොරතුරු අවම වීම.

## යෝජනා

- රටෙහි මහජනතාව වෙත ජාතික ආරක්ෂාව සබැඳිව නිවැරදි ක්‍රමවේදයකට තොරතුරු සන්නිවේදනය කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වන මාධ්‍ය කේන්ද්‍රය වෙත ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නිලධාරි/සෙසු නිලයින් අනුයුක්ත කර ඇති අතර, මාධ්‍ය ඒකක වෙතින් දෛනිකව ලබාගන්නා තොරතුරු මෙම මාධ්‍ය කේන්ද්‍රය වෙත ලබාගෙන මහජනතාව වෙත ලබාදීම දැනට සිදුකරන අතර, තවදුරටත් එය ඵලදායි ලෙස ලබා දීම සඳහා මාධ්‍ය පිළිබඳ වෘත්තිමය (වාර්තාකරණය, විශ්ලේෂණය) හැකියාව ඇති අයවලුන් ගෙන් සැදුම්ලත් මාධ්‍ය කණ්ඩායමක් ලබාදීමෙන් නිවැරදිභාවය සමග යථාර්ථය මහජනතාව වෙත එළිදැක්වීමට මෙමගින් හැකිවනු ඇත.
- ඉංග්‍රීසි මාධ්‍ය සම්බන්ධීකරණ (වෘත්තිමය) මාධ්‍යවේදියෙකු හා සිංහල භාෂා සම්බන්ධීකරණ මාධ්‍යවේදියෙකුගේ සේවය ලබා ගැනීමට යෝජනා කිරීම.
- මාධ්‍ය අවස්ථා සහ අනෙකුත් මාධ්‍ය කටයුතු වාර්තා කිරීම සහ ඡායාරූපකරණය සඳහා වීඩියෝ කැමරා, නිශ්චල කැමරා යන්ත්‍ර මිළදී ගැනීමට යෝජනා කිරීම හා එම අයවලුන් හට උපකරණ හැසිරවීම සබැඳිව වැඩමුළු පැවැත්වීමට යෝජනා කිරීම.

## 13.3 අනාගත අපේක්ෂා

- ජනමාධ්‍ය විද්‍යාලය සමග මෙම කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට ජන මාධ්‍ය ක්‍රියාකාරම් පිළිබඳ පුහුණු පාඨමාලා/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කිරීම.
- ජාතික සහ ජාත්‍යන්තරව ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑම් එල්ලවන ආකාරයෙන් නිකුත්වන මාධ්‍ය ප්‍රකාශන ඉතා වේගවත් හා කාර්යක්ෂම ආකාරයට නිශේධනය කිරීම සඳහා අදාල මාධ්‍ය නිවේදන හා ප්‍රකාශ ක්ෂණිකව මාධ්‍ය තුළින් ප්‍රකාශයට පත් කිරීමට විශේෂ විමර්ශන මණ්ඩලයක් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.
- සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් සමග සුහදත්වය/ දැනුම/ වර්ධනය කර ගැනීම සඳහා සම්මන්ත්‍රණ/වැඩමුළු සංවිධානය කිරීම.
- ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකයන් ඒකරාශි කොට ඔවුන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- රටෙහි ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවන්හි අදාල ස්ථානයන් වෙත ගොස් නිවැරදි තොරතුරු මාධ්‍යන් වෙත නිකුත් කිරීම සඳහා කැමරාකරුවන්/වාර්තාකරුවන්/බලයලත් නිලධාරීන්ගෙන් සමන්විත ක්ෂණික විහිදුම් මාධ්‍ය කණ්ඩායම් ස්ථාපිත කිරීමට යෝජනා කිරීම. (ප්‍රවාහන පහසුකම් සහිත)
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් මාධ්‍ය කේන්ද්‍රයෙහි කාර්ය මණ්ඩලය වෙත ත්‍රෛභාෂා පුහුණුවක් ලබාදීමට සැලසුම් කිරීම.
- ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් සිදුකරනු ලබන ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් හා අදාල මාසික හෝ ත්‍රෛමාසික සඟරා/පුවත්පත් එළිදැක්වීමට යෝජනා කිරීම.
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ තොරතුරුවල ආරක්ෂාව සුරක්ෂිතකර ගැනීම සඳහා (සයිබර් ප්‍රහාර) සුදුසු විශේෂඥ දැනුමක් ඇති සම්පත් දායකින් හා දියුණු උපකරණ කේන්ද්‍රය වෙත ලබාගැනීමට යෝජනා කිරීම.

# අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය

# 14. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

## 14.1. සමාලෝචනය

2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක පනත මගින් 2009 දෙසැම්බර් මස 09 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මුහුදේදී ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම, ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රිය කලාපය තුල නීතිමය බලතල ක්‍රියාත්මක කිරීම, සමුද්‍රිය දූෂණයෙන් සමුද්‍රිය පරිසරය ආරක්ෂා කිරීම, සුරක්ෂිත සහ සාමකාමී සාගර කලාපයක් ඇති කිරීම යන දැක්ම සහ මෙහෙවර පෙරදැරිව ආරක්ෂක නිලධාරීන් යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනයක් වශයෙන් හැඳින්විය හැක. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය තුල නීතිවිරෝධී ක්‍රියාකාරකම් වල නිරතව සිටින නෞකා, යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රිය කලාපය තුල අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා එකී පනත මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත බලය ලබාදී ඇත. වැරදිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෑම නිලධාරියෙක්ම 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය ප්‍රකාරව සාම නිලධාරියෙකු වශයෙන් හඳුන්වනු ලබයි.

2010 මාර්තු මස 03 වන දින නිළ වශයෙන් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළ සීඝ්‍ර වර්ධනයක් අත්කරගෙන ඇත. මේ වන විට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දිවයින වටා මුහුදු තීරය ආවරණය වන පරිදි වෙරළ ආරක්ෂක ආයතන, ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන සහ ජීවිතාරක්ෂක මුරකුටි ස්ථාපිත කර ඇති අතර, අක්වෙරළ නිරීක්ෂණ නෞකා (OPV), වේග මුර නෞකා (FPV), වේග මුර යාත්‍රා (FPC), වෙරළ ආරක්ෂක යාත්‍රා (IPC) සහ වරාය ආරක්ෂක යාත්‍රා වෙරළ ආරක්ෂක රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත.

## 14.2 2018 වර්ෂයේ කාර්යසාධනය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පහත සඳහන් අංශයන් සහ එක් එක් වෙරළ ආරක්ෂක බල ප්‍රදේශයන්ගේ පූර්ණ සාමූහිකත්වය යටතේ වෙරළ ආරක්ෂක මෙහෙයුම් හා පරිපාලන රාජකාරි කටයුතු සම්බන්ධයෙන් මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධීකරණය වී කටයුතු කරනු ලබයි

➢ මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් 2018 වර්ෂය තුළදී පහත සඳහන් මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී.

- **ජීවිතාරක්ෂක රාජකාරීන්**

වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් 2018 වසර තුල ජීවිතාරක්ෂක මුර කුටි 13ක ජීවිතාරක්ෂක මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර 2018 වර්ෂය තුලදී මුහුදේ අනතුරට පත් පුද්ගලයින් 228 ක් බේරා ගැනීම (විදේශිකයින් 104 ක් ඇතුළුව) සිදු කරන ලදී.

- **නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා සිදුකරනු ලැබූ වෙරළ ආරක්ෂණ මෙහෙයුම්**

දිවයින වටා ඇති මුහුදු තීරයේ සිදුවන සියලුම නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති සියලුම යාත්‍රා යොදවනු ලබන අතර, ඉන් වේග ප්‍රහාරක මුර යාත්‍රා (FPB) 10 ක් සහ වෙරළබඩ මුර යාත්‍රා (IPC) 02 ක් උතුරු විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. ඉතිරි මුර යාත්‍රා වයඹ, බටහිර සහ දකුණු ප්‍රදේශයන් තෝරාගත් ප්‍රධාන/ ධීවර වරායන් වල රාජකාරීන්හි යොදවා ඇති අතර, මිරිස්ස ප්‍රදේශයේ තල්මසුන් නැරඹීමේ කටයුතු සිදුකරන යාත්‍රා නිරීක්ෂණයට ද වෙරළ ආරක්ෂක යාත්‍රා යොදවනු ලබයි. තවද, ශ්‍රී ලංකාවේ මුහුදු ආරක්ෂක හැකියාව වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ජපාන රජය මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පරිත්‍යාග කළ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක සමාරක්ෂා සහ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක සමුද්‍රාරක්ෂා යන මීටර් 30 ක් දිගකින් යුතු වේග මුර යාත්‍රා 02 ක් 2018 අගෝස්තු මස 29 දින ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා එක්වූ අතර, එම යාත්‍රා බටහිර විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කරයි.

- **නීති විරෝධී, අක්‍රමවත්, වාර්තා නොවන මසුන් මැරීම් නිරීක්ෂණය**

පහත සඳහන් ධීවර වරායන්හි පිහිටුවා ඇති ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන මගින් මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා බහු දින ධීවර යාත්‍රා පිටවයාමේදී සහ නැවත වාරායට ඇතුලුවීමේදී එම යාත්‍රාවන් පරීක්ෂාවට ලක්කරනු ලැබේ. එහිදී එම යාත්‍රා පිටත්වීමේදී යම්කිසි නීති විරෝධී ධීවර උපාංග තිබේද යන්න පරීක්ෂා කරන අතර, නැවත වරායට පැමිණීමේදී ඔවුන් විසින් නීති විරෝධී මත්ස්‍යයින් හෝ වෙනත් ද්‍රව්‍ය රැගෙන එනු ලබන්නේ දැයි පරීක්ෂා කිරීම සිදු කරයි.

| | | |
|---|---|---|
| 1 කල්පිටිය | 7. ගාල්ල | 13. තංගල්ල |
| 2. මීගමුව | 8. මිරිස්ස | 14. හම්බන්තොට |
| 3. දික්ඕවිට | 9. දෙවුන්දර | 15. කිරින්ද |
| 4. බේරුවල | 10. ගන්දර | 16. ඔළුවිල් |
| 5. හික්කඩුව | 11. නිල්වැල්ල | 17. වලච්චේනෙයි |
| 6. අම්බලන්ගොඩ | 12. කුඩාවැල්ල | 18. කොඩ්ඩේ |

- **මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්**

වෙරළ තීරයේ ජීවත්වන ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා ක්‍රමානුකූලව සිදුකරනු ලැබේ. එම වැඩ සටහන් යටතේ පහත සඳහන් කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී.

- ❍ මුහුදේදී ජීවිත ආරක්ෂාව
- ❍ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රිය පරිසර ආරක්ෂණය
- ❍ වෙරළ ආරක්ෂණය
- ❍ ජීවිත බේරාගැනීම්
- ❍ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්
- ❍ නීති විරෝධීව මසුන් මැරීම වැළැක්වීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම
- ❍ වෙරළ ආරක්ෂිත ශාක සිටුවීම


- **සෝදිසි සහ බේරාගැනීමේ මෙහෙයුම්**

මෙම ආයතනය සතුව ඇති සම්පත් උපයෝගී කර ගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදුකරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතු වලට සහය ලබා දීම සිදු කරන අතර, පොලිසිය විසින් උදව් ඉල්ලා සිටි අවස්ථාවන්හිදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමද සිදු කරයි.

- **මුහුදු නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්**

ශ්‍රී ලංකා මුහුදු තීරය තුල නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කරනු ලැබූ අතර, අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ සංවිධාන සහ රාජ්‍ය ආයතනවලට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, නාවික හමුදාව සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග එක්ව ඉන්දියානු ධීවරයින් පෙරළා සියරටට යැවීම සහ ශ්‍රී ලාංකික ධීවරයින් නැවත සිය රටට ගෙන්වා ගැනීමේ මෙහෙයුම් සිදු කරනු ලබන අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

- ❍ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙරටට එවන ලද ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව -11.
- ❍ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලද ඉන්දියානු ධීවරයින් සංඛ්‍යාව -139.





14.1 ප්‍රස්ථාරය : මුහුදු නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්

### ➢ සමුද්‍රීය පරිසර ආරක්ෂණය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් තෙල් කාන්දුවීම් අනතුරු සඳහා ප්‍රතිචාර දැක්වීම සිදු කරන අතර, ඒ සඳහා විශේෂිත පුහුණු කණ්ඩායම් 24 පැය පුරාවට සූදානම්ව තබා ඇත. එම කණ්ඩායම විසින් 2018 ජනවාරි මස 16 වන දින කොළොන්නාව හින්ඇළ මාර්ග යට දැවිතෙල් කාන්දු වූ අවස්ථාව, 2018 සැප්තැම්බර් මස 08 වන දින මුතුරාජවෙල ආසන්න මුහුදේ තෙල් නලයක සිදුවූ තෙල්කාන්දුව සහ 2018 සැප්තැම්බර් මස 11 වන දින කොඩ්බේ ධීවර වරායේ ධීවර යාත්‍රාවකින් ඇතිවූ තෙල් විසිර යාමද සාර්ථකව කළමනාකරණය කරන ලදී. තවදුරටත් කැස්බෑ බිත්තර සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කැස්බෑ පැටවුන් ආරක්ෂා සහිතව මුහුදට මුදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර පරිසර හිතකාමී වැඩසටහන් සහ පුනරුදය වැඩසටහන යටතේ වෙරළ ආරක්ෂක කඳවුරු ආශ්‍රිත මුහුදු තීරයන් වල කඩොලාන ශාක වගාකිරීමේ කටයුතු ද අඛණ්ඩව සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නෞකා / යාත්‍රා දිවයින වටා මුහුදුතීරය ආවරණය වන පරිදි යාත්‍රා අනුයුක්ත කර ඇති ආකාරය පහත සිතියම මඟින් දැක්වේ.



**RDSR- REGIONAL DIRECTOR SOUTHERN REGION**
**RDNR- REGIONAL DIRECTOR NORTHERN REGION**
**RDWR- REGIONAL DIRECTOR WESTERN REGION**
**RDER- REGIONAL DIRECTOR EASTERN REGION**

- ★ (blue) **OPV-OFFSHORE PATROL VESSEL**
- ★ (red) **FPV - PAST PATROL VESSEL**
- ● (red) **FPB - PAST PATROL BOAT**
- ● (yellow) **IPC - INSHORE PATROL CRAFT**
- ● (dark red) **HPC-HARBOUR PATROL CRAFT**

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ උතුරු පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

- කන්කසන්තුරේ වරාය
  (FPC – 10)
  CG 401
  CG 402
  CG 403
  CG 404
  CG 405
  CG 406
  CG 407
  CG 408
  CG 409
  CG 410
- පේදුරුතුඩුව
  CG 204
- කරේයිනගර්
  CG 203

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ බටහිර පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

- ශ්‍රීලංවෙආනෞ ''සුරක්ෂා'' (OPV)
- ශ්‍රීලංවෙආනෞ ''සමුද්‍රරක්ෂා'' (FPV)
- ශ්‍රීලංවෙආනෞ ''සමාරක්ෂා'' (FPV)
- දික්ඕවිට ධීවර වරාය (IPC– 01)
  CG 202
- කොළඹ වරාය (HPC)02)
  CG 101
  CG 102
- කල්පිටිය (IPC– 01)
  CG 205

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ දකුණු පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

- ගාල්ල වරාය (IPC – 01)
  CG 208
- මිරිස්ස වරාය (IPC – 02)
  CG 206
  CG 207
- කිරින්ද වරාය (IPC – 01)
  CG 201

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ නැගෙනහිර වෙත**

- ත්‍රිකුණාමලය වරාය (IPC)03)
  CG 209
  CG 210
  CG 80 (Fire Boat)

### ➢ පුද්ගල හා පරිපාලන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සහ වෙරළ ආරක්ෂක පුද්ගල හා පරිපාලන කාර්යාලයේ කටයුතු සිදු කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුද්ගල හා පරිපාලන) යටතේ පුද්ගල හා පරිපාලන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් ප්‍රධාන වශයෙන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නෞකා, යාත්‍රා, ආයතන, අනුඛණ්ඩ හා උප අනුඛණ්ඩ වල පුද්ගල අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා කටයුතු කරනු ලබයි. පුද්ගල හා පරිපාලන දෙපාර්තමේන්තුව මඟින් 2018 වර්ෂයේදී කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වෙරළ ආරක්ෂක පුද්ගලයින් රාජකාරී අවශ්‍යතාවයන් පරිදි මෙම දෙපාර්තමේන්තුව ඇතුළත මාරු කිරීම.
- සියලුම වෙරළ ආරක්ෂක පුද්ගලයන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා මානව දත්ත කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ දුක්ගැනවිලි හා අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර විසඳුම් ලබා දීම.

- සියලුම වෙරළ ආරක්ෂක පුද්ගලයින් සඳහා වෙරළ ආරක්ෂක හැඳුනුම්පත් නිකුත් කිරීම සහ අළුත් කිරීම.
- ඉඩම් පවරා ගැනීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාල වැඩසටහන් සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට පැවරෙන රාජකාරීන් සම්බන්ධීකරණය කිරීම.

ඉහත කාර්යයන්ට අමතරව පහත සඳහන් කාර්යයන් 2018 වර්ෂය තුළ ඉටුකර ඇත.

- 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට නිලධාරීන් 06 ක් සහ වෙරළ ආරක්ෂක පුද්ගලයින් 84 ක් නාවික හමුදාව වෙතින් අනුයුක්ත කළ අතර, 2018 දෙසැම්බර් මස 31 දින වන විට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත සම්පූර්ණ ප්‍රමාණය නිලධාරීන් 93 ක් සහ වෙරළ ආරක්ෂක පුද්ගලයින් 1300 කි. ඔවුන් වෙරළ ආරක්ෂක ආයතන, ජීවිතාරක්ෂක මුරකුටි, නෞකා සහ මුර යාත්‍රාවල සේවයේ යෙදවීම.
- වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ පෞද්ගලික අභියාචනා 120ක් සඳහා නිසි පියවර ගැනීම.
- වෙරළ ආරක්ෂක කඳවුරු සහ අනුබණ්ඩ ආශ්‍රිතව ඇති වෙරළ තීරයන් සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හිදී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක සාමාජිකයින් විසින් පිරිසිදු කිරීම.
- ජාතික ආහාර නිෂ්පාදන 2018 වැඩසටහන යටතේ 2018 ඔක්තෝබර් මස 15 වන දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා දකුණු ප්‍රාදේශිකයෙහි ආහාර බෝග - 615, බටහිර ප්‍රාදේශිකයෙහි ආහාර බෝග - 376, උතුරු ප්‍රාදේශිකයෙහි ආහාර බෝග - 290 ක් සහ නැගෙනහිර ප්‍රාදේශිකයෙහි ආහාර බෝග -414 ක් ආදී වශයෙන් වගා කටයුතු සිදුකිරීම.
- ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන යටතේ සියලුම වෙරළ ආරක්ෂක කඳවුරු, අනුබණ්ඩ, නෞකා හා යාත්‍රා වල 2018 වර්ෂය පුරාම නිරන්තර ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාවට නංවනු ලැබූ "පුනරුදය" පරිසර සංරක්ෂණ වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2018.11.05 වන දින සියලුම වෙරළ ආරක්ෂක බල ප්‍රදේශ ආවරණය වන පරිදි පැල සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- 2018 ජනවාරි මස 21 වන දින ශ්‍රී ලංකා නාවික තටාකාංගනයෙහි නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර ඒ සඳහා අවශ්‍ය වෙරළ ආරක්ෂක පුද්ගලයින් 07 දෙනෙකු ලබාදීම.
- 2018 අගෝස්තු 28 වන දින කොඩ්බේ වෙරළ ආරක්ෂක අනුබණ්ඩය වෙත තෙල් විසිරුම් හා නෞකාවකට ගොඩවීම හා නිරීක්ෂණය කිරීමේ පාඨමාලාවන් හදාරන ලද වෙරළ ආරක්ෂක පුද්ගලයින් 23 දෙනෙකු ලබාදීම.
- 2018 නොවැම්බර් 30 වන දින ශ්‍රීලංනානෞ විජය ආයතනයට අනුයුක්තව වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කල්පිටිය වෙත තල්මසුන් නැරඹීමේ නිරීක්ෂණ රාජකාරි සඳහා වෙරළ ආරක්ෂක පුද්ගලයින් 09 දෙනෙකු ලබා දීම
- 2018 නොවැම්බර් 30 වන දින ශ්‍රීලංනානෞ එළාර ආයතනයට අනුයුක්තව වෙරළ ආරක්ෂක ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන යක් ස්ථාපිත කර ඒ සඳහා අවශ්‍ය වෙරළ ආරක්ෂක පුද්ගලයින් 11 දෙනෙකු ලබා දීම.

| අනු | විදේශීය පාඨමාලා, සමුළු සහ අභ්‍යාස | පාඨමාලා ප්‍රමාණය | සහභාගී ගණ | රට |
|---|---|---|---|---|
| 1 | ආසියානු වෙරළ ආරක්ෂක ප්‍රධානීන්ගේ 14 වන වැඩමුළු මට්ටමේ රැස්වීම | 1 | 1 | බංගලාදේශය |
| 2 | ආසියානු වෙරළ ආරක්ෂක ප්‍රධානීන්ගේ 14 වන රැස්වීම | 1 | 2 | බංගලාදේශය |
| 3 | යාත්‍රා ගමනා ගමන පද්ධති (VTS) සම්බන්ධ ආසියානු ක්‍රියාකරුවන්ගේ හැකියාව සංවර්ධනය කිරීමේ පුහුණු පාඨමාලාව | 1 | 2 | චීනය |
| 4 | 05වන ඉන්දු ලංකා ආරක්ෂක කතිකාව | 1 | 1 | ඉන්දියාව |
| 5 | සමුද්‍රිය සෝදිසි කිරීම් හා මුදවා ගැනීම් 2018 (SAREX 18) | 1 | 1 | ඉන්දියාව |
| 6 | ජ්‍යෙෂ්ඨ නිලධාරින් සඳහා වූ පෞර්ෂත්ව හා ඵලදායිතාව සංවර්ධනය කිරීමේ ශිෂ්‍යත්වය | 1 | 1 | ඉන්දියාව |
| 7 | මත් ද්‍රව්‍ය සඳහා නීති බලාත්මක කිරීම සම්බන්ධ වැඩමුළුව | 1 | 1 | ඉන්දියාව |
| 8 | 'DOSTI' මූලික සැලසුම් සම්මන්ත්‍රණය | 1 | 2 | ඉන්දියාව |
| 9 | 'DOSTI' අභ්‍යාසයට අදාලව ඉන්දියානු වෙරළ ආරක්ෂක නෞකාවන්හි පැවැත් වූ යාත්‍රා හැසිරවීමේ පුහුණුව | 1 | 2 | ඉන්දියාවේ සිට මාලදිවයින දක්වා |
| 10 | ආසියානු වෙරළ ආරක්ෂක ප්‍රධානීන්ගේ රැස්වීම සඳහා වූ BAKAMLA'S හැකියාවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 1 | 1 | ඉන්දුනීසියාව |
| 11 | වේග මුර සංචාර යාත්‍රාවන්හි යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යෑම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 1 | 8 | ජපානය |
| 12 | සමුද්‍රිය නීති බලාත්මක කිරීම සම්බන්ධ වැඩමුළුව | 1 | 1 | ජපානය |
| 13 | සමුද්‍රිය සෝදිසි කිරීම් හා මුදවා ගැනීම්, සමුද්‍රිය ව්‍යසන නිවාරණය හා පරිසර ආරක්ෂාව සම්බන්ධ පාඨමාලාව | 1 | 1 | ජපානය |
| 14 | සමුද්‍රිය ආරක්ෂණ සහ ආරක්ෂණ ප්‍රතිපත්ති විද්‍යාපති උපාධිය | 1 | 2 | ජපානය |
| 15 | වැඩමුළු මට්ටමේ වෙරළ ආරක්ෂක ගෝලීය සමුළුව 2018 | 1 | 1 | ජපානය |
| 16 | නාවික පොලිසියෙහි සමුද්‍රිය ආරක්ෂක පරිපාලනය ඉහළ නැංවීමේ පාඨමාලාව | 1 | 3 | කොරියාව |
| 17 | සමුද්‍රිය සුරක්ෂිතභාවය සහ ආරක්ෂණ කිරීමේ ආයතනයන් ශක්තිමත් කිරීම පුහුණු වැඩසටහන | 1 | 1 | කොරියාව |
| 18 | පෙර සහභාගිවූවන් සඳහා වූ සමුද්‍රිය සෝදිසි කිරීම් හා මුදවා ගැනීම්, සමුද්‍රිය ව්‍යසන නිවාරණය හා පරිසර ආරක්ෂාව සම්බන්ධ පාඨමාලාව | 1 | 2 | මලයාසියාව |
| 19 | රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ඨික හා පුපුරණ ද්‍රව්‍ය, හඳුනාගැනීමේ පුහුණුව (CBRNE)CIT) | 1 | 2 | මාලදිවයින |
| 20 | ත්‍රි පාර්ශවීය DOSTI අභ්‍යාසය | 1 | 2 | මාලදිවයින |
| 21 | 9 වන BARRACUDA අභ්‍යාසය | 1 | 1 | පකිස්ථානය |
| 22 | Hamilton Water Jet පුහුණුව | 1 | 3 | සිංගප්පූරුව |
| 23 | ලෝක ආරක්ෂක බළකාය සහ අන්තර්ගෝලීය මහා සම්මේලනය මඟින් සරණාගතයින් පිළිබඳ දත්ත සැකසුම් ප්‍රතිපත්ති පිළිබඳ සම්මේලනය | 1 | 1 | ස්පාඤ්ඤය |
| 24 | සැලසුම් සහ සූදානම පිළිබඳව කාර්ය සාධක බලකායේ තුන්වන රැස්වීම | 1 | 1 | තායිලන්තය |
| 25 | "ආරක්ෂක කාර්යක්ෂමතාව ක්‍රියාත්මක කිරීම" පිළිබඳ ක්‍රියාකාරී මට්ටමේ වෙරළ ආරක්ෂක බලකායේ ගෝලීය සමුළුව පිළිබඳ උප කලාපීය වැඩමුළුව | 1 | 2 | එක්සත් රාජධානිය |
| 26 | ජාත්‍යන්තර සමුද්‍රිය නිලධාරි පාඨමාලාව | 2 | 2 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 27 | අන්තර්ජාතික සමුද්‍රිය විෂය දැනුවත් කිරීමේ වැඩමුළුව | 1 | 2 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 28 | ජාත්‍යන්තර සමුද්‍රිය නෞකාවන්ට ගොඩවීමේ පාඨමාලාව | 1 | 1 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 29 | සමුද්‍රිය ත්‍රස්තවාදය පිළිබඳ සිවිල් සහ හමුදාමය ප්‍රතිචාර පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 1 | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 30 | ඇමෙරිකා එක්සත් ජනපද වෙරළ ආරක්ෂක විද්‍යාපීඨ 2022 පාඨමාලාව | 1 | 1 | ඇමෙරිකා එක්සත් ජනපදය |

14.1 වගුව : විදේශීය පාඨමාලා, සම්මන්ත්‍රණ සහ පුහුණු අභ්‍යාස

| අනු අංකය | දේශීය පාඨමාලාව | පාඨමාලා ප්‍රමාණය | සහභාගී වූ ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 1 | වෙරළ ආරක්ෂක රාජකාරි හඳුන්වාදීමේ පාඨමාලාව | 3 | 128 | - |
| 2 | RFD යාත්‍රා හැසිරවීම සහ ජලතරණ පාඨමාලාව | 2 | 22 | - |
| 3 | තෙල් කාන්දුවීම් පිළිබඳ සූදානම් වීමේ හා ප්‍රතික්‍රියා මාර්ග පිළිබඳ පාඨමාලාව | 3 | 109 | - |
| 4 | නාවික යාත්‍රාවන් සඳහා ගොඩවීමේ නිලධාරී පාඨමාලාව | 1 | 23 | - |
| 5 | සෝදිසි කිරීම් හා මුදවා ගැනීම පිළිබඳ පාඨමාලාව | 1 | 20 | - |
| 6 | සමුද්‍රීය යාත්‍රා පරීක්ෂා කිරීමේ පාඨමාලාව | 1 | 13 | ඔස්ට්‍රේලියානු මායිම් ආරක්ෂක බලකාය (ABF) විසින් පවත්වන ලදී. |
| 7 | සමුද්‍රීය යාත්‍රාවන් සඳහා ගොඩවීමේ සහ යාත්‍රා පරීක්ෂා කිරීමේ පාඨමාලාව | 2 | 60 | නාවික හමුදා පුද්ගලයන් 10 දෙනෙකු සහභාගී වන ලදී. |
| 8 | සමුද්‍රීය නීති බලාත්මක කිරීම පිළිබඳ නිලධාරී පාඨමාලාව | 1 | 8 | ඇමෙරිකානු වෙරළ ආරක්ෂක නිලධාරීන් විසින් පවත්වන ලදී. |
| 7 | සමුද්‍රීය යාත්‍රාවන් සඳහා ගොඩවීමේ සහ යාත්‍රා පරීක්ෂා කිරීමේ පාඨමාලාව | 2 | 60 | නාවික හමුදා පුද්ගලයන් 10 දෙනෙකු සහභාගී වන ලදී. |
| 8 | සමුද්‍රීය නීති බලාත්මක කිරීම පිළිබඳ නිලධාරී පාඨමාලාව | 1 | 8 | ඇමෙරිකානු වෙරළ ආරක්ෂක නිලධාරීන් විසින් පවත්වන ලදී. |
| 9 | ව්‍යසන නිවාරණය හා පරිසර ආරක්ෂාව සම්බන්ධ පාඨමාලාව | 2 | 36 | - |
| 10 | සමුද්‍රීය නීති බලාත්මක කිරීමේ උපදේශක අදියර II පාඨමාලාව | 1 | 8 | ඇමෙරිකානු වෙරළ ආරක්ෂක නිලධාරීන් විසින් පවත්වන ලදී |
| 11 | සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ නිලධාරී පාඨමාලාව | 3 | 14 | - |
| 12 | උපදේශක තාක්ෂණික පාඨමාලාව | 2 | 50 | උසස් පුහුණු මධ්‍යස්ථානය - 10 මහරගම ගුරු පුහුණු මධ්‍යස්ථානය - 40 |
| 13 | මූලික ජීවිතාරක්ෂක හා බේරාගැනීම් පාඨමාලාව | 6 | 122 | - |
| 14 | මූලික ජීවිතාරක්ෂක හා බේරාගැනීම් නැවත ආවර්ජන පාඨමාලාව | 3 | 22 | - |
| 15 | ජීවිතාරක්ෂක අතර මැදි පාඨමාලාව | 4 | 39 | - |
| 16 | ජීවිතාරක්ෂක අතර මැදි නැවත ආවර්ජන පාඨමාලාව | 3 | 27 | - |
| 17 | ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් පාඨමාලාව | 3 | 38 | - |
| 18 | ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් ආවර්ජන පාඨමාලාව | 2 | 24 | - |
| 19 | ජීවිතාරක්ෂක රිදී පදක්කම සඳහා සූදානම් කිරීමේ පාඨමාලාව | 1 | 2 | - |
| 20 | පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව | 2 | 26 | - |

14.2 වගුව : දේශීය පුහුණුඃ

| අ/අ | දේශීය පාඨමාලාව | පාඨමාලා ප්‍රමාණය | සහභාගි වූ ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 1 | මූලික ජීවිතාරක්ෂක හා ප්‍රතිස්ථාපන පාඨමාලාව | 5 | 161 | ශ්‍රීලංයුහ පුද්ගලයන් සඳහා |
| 2 | මූලික ජීවිතාරක්ෂක හා ප්‍රතිස්ථාපන පාඨමාලාව | 4 | 125 | ශ්‍රීලංනාහ පුද්ගලයන් සඳහා |
| 3 | මූලික ජීවිතාරක්ෂක හා ප්‍රතිස්ථාපන පාඨමාලාව | 3 | 36 | ශ්‍රීලංගුහ පුද්ගලයන් සඳහා |
| 4 | මූලික ජීවිතාරක්ෂක හා ප්‍රතිස්ථාපන පාඨමාලාව | 2 | 22 | සිවිල් පුද්ගලයන් සඳහා |
| 5 | මූලික ජීවිතාරක්ෂක හා ප්‍රතිස්ථාපන පාඨමාලාව | 1 | 49 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාල සිසුන් සඳහා |
| 6 | ජීවිතාරක්ෂක අතරමැදි පාඨමාලාව | 2 | 28 | ශ්‍රීලංනාහ පුද්ගලයන් සඳහා |
| 7 | ජීවිතාරක්ෂක රිදී පදක්කම සඳහා සූදානම් කිරීමේ පාඨමාලාව | 1 | 2 | ශ්‍රීලංනාහ පුද්ගලයන් සඳහා |

14.3 වගුව : වෙනත් හමුදා සහ ආයතන සඳහා ලබා දෙන ලද ජීවිතාරක්ෂක පුහුණු පාඨමාලා

## ➢ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශය විසින් මෙම දෙපාර්තමේන්තුව තුල පවතින ගොඩනැගිලි හා ඉදිකිරීම් අවශ්‍යතාවයන් තක්සේරු කර ඊට අදාල ඉදිකිරීම් කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයයි. නව ගොඩනැගිලි ඉදිකිරීම (ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන, ජීවිතාරක්ෂක ආරක්ෂක කුටි) දැනට පවතින ගොඩනැගිලි නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම යනාදී කටයුතු සිවිල් ඉංජිනේරු අංශය මගින් සිදුකරනු ලබන අතර, සිවිල් ඉංජිනේරු අංශය මගින් ඉදිකළ ගොඩනැගිලි පිළිබඳ විස්තර හා අනාගතයේදී ගොඩනැගීමට සැලසුම් කර ඇති ඉදිකිරීම් කටයුතු පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ.

2018 දෙසැම්බර් මස 31 දින වන විට නිම කරන ලද ව්‍යාපෘති

| අනු අංකය | විස්තරය | වියදම (රුපියල්) |
|---|---|---|
| 1. | ජීවිතාරක්ෂක මුරකුටි මිරිස්ස ප්‍රතිසංස්කරණය කිරීම | 40,493.00 |
| 2. | ජීවිතාරක්ෂක මුරකුටි හික්කඩුව ප්‍රතිසංස්කරණය කිරීම | 75,688.00 |
| 3. | ජීවිතාරක්ෂක මුරකුටි බෙන්තොට ප්‍රතිසංස්කරණය කිරීම | 1,380,864.00 |

14.4 වගුව : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් ජීවිතාරක්ෂක මුරකුටි ප්‍රතිසංස්කරණය කිරීම


මිරිස්ස ජීවිතාරක්ෂක කුළුණ ප්‍රතිසංස්කරණය කිරීම


හික්කඩුව ජීවිතාරක්ෂක කළුණ ප්‍රතිසංස්කරණය කිරීම


බෙන්තොට ජීවිතාරක්ෂක කුළුණ ප්‍රතිසංස්කරණය කිරීම

| අනු අංකය | විස්තරය | වියදම (රුපියල්) |
|---|---|---|
| 1. | වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද පොදු භෝජනාගාරය ඉදිකිරීම | 930,432.91 |
| 2. | වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද ජල ටැංකි රඳවනය ඉදිකිරීම | 140,000.00 |

14.5 වගුව : අවසන් කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ව්‍යාපෘති


වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද ජල ටැංකි රඳවනය ඉදිකිරීම


වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද පොදු භෝජනාගාරය ඉදිකිරීම

| අනු අංකය | විස්තරය | වියදම (රුපියල්) |
|---|---|---|
| 1. | ශ්‍රීලංවෙආ වරුණ ආයතනය විතැන් කිරීමේ ව්‍යාපෘතිය (අදියර 1) | 4,930,828.80 |
| 2. | වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද ආරක්ෂක වැට ඉදිකිරීම | 888,673.00 |
| 3. | වෙරළ ආරක්ෂක අනුබණ්ඩ හලාවත නිළධාරී නිවාසය ඉදිකිරීම | 1,502,968.50 |

14.6 වගුව : නිම නොකරන ලද ව්‍යාපෘති



වෙරළ ආරක්ෂක අනුබණ්ඩ කිරින්ද ආරක්ෂක වැට ඉදිකිරීම



වෙරළ ආරක්ෂක අනුබණ්ඩ හලාවත නිලධාරී නිවාසය ඉදිකිරීම





ශ්‍රී ලංකාවෙ ආ වරුණ ආයතනය විතැන් කිරීමේ ව්‍යාපෘතිය (අදියර 1)

| අනු අංකය | විස්තරය | පිරිවැය (රුපියල්) |
|---|---|---|
| 01 | ඇස්තමේන්තුගත පිරිවැය | 2,894,223.37 |
| 02 | අමුද්‍රව්‍ය පිරිවැය | 2,060,479.99 |
| 03 | කම්කරු පිරිවැය | 568,125.00 |
| 04 | අධීක්ෂණ පිරිවැය | 170,250.00 |
| සම්පූර්ණ කාර්ය පිරිවැය | | **2,798,854.99** |

14.7 වගුව : 2018 වර්ෂයේ සියලුම සුළු ව්‍යාපෘති හා නඩත්තු කටයුතු

## ➢ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| අ/අ | ව්‍යාපෘතිය | විස්තරය |
|---|---|---|
| 01 | ශ්‍රීවෙආදෙ වෙත අයත් නෞකා සහ යාත්‍රාවන්හි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම | ශ්‍රී ලංකා නාවික හමුදාව ලබාදී ඇති සම්පූර්ණ මුදල රු. 9,189,475.54 |
| 02 | ශ්‍රීලංවෙආදෙ වෙත ජපාන රජයේ මුල්‍යාධාර යටතේ වේග මුර නෞකා 02 ක් (CG 501 සහ CG 502) ප්‍රධානය කිරීම. | 2018 ජූලි මස 10 වන දින ''ශ්‍රීලංවෙආනෞ සමුද්‍රාරක්ෂා'' සහ ''ශ්‍රීලංවෙආනෞ සමාරක්ෂා'' වශයෙන් මෙම නෞකා අධිකාරියට පත්කරන ලදී. |
| 03 | ඉංජිනේරු අංශයේ රාජකාරි කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය කිරීම | මේ සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල රු. 2,808,029.80 ක් වශයෙන් ගණන් බලා ඇත. |
| 04 | ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් වෙරළ ආරක්ෂක මුර යාත්‍රා (IPC) දෙකක් ලබා ගැනීම | රු. 75,181,365.50 ක් වැය වී ඇත. 2018 සැප්තැම්බර් මස 07 වන දින නාවික හමුදාව මගින් භාරදෙන ලදී. |
| 05 | තෙල් විසිරුම් ප්‍රතිචාර කළමනකරණ උපකරණ ගබඩාකර තැබීම සඳහා කන්ටේනර් බහාළුම් 04 ක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 960,000.00 |
| 06 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් රථ වාහන සඳහා අළුත්වැඩියාව හා සේවා කටයුතු සිදු කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු 5,547,416.23 |
| 07 | තෙල් විසුරුම් ප්‍රතිචාර කළනකරණය සඳහා Mitsubisi Fuso වර්ගයේ Crane Truck රථයක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 11,270,000.00 |
| 08 | තෙල් විසුරුම් ප්‍රතිචාර කළමනකරණ රාජකාරි කටයුතු සඳහා Toyota Single Cab රථ දෙකක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 10,811,693.72 |
| 09 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා පිටත දහන යන්ත්‍ර (OBM) 04 ක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 1,486,257.00 |
| 10 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා රිබ්ස් (RHIB) වර්ගයේ යාත්‍රා 02 ක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 2,769,677.70 |
| 11 | තෙල් විසුරුම් ප්‍රතිචාර කළමනකරණ රාජකාරි කටයුතු සඳහා Leyland Flat Bed Truck රථයක් ප්‍රසම්පාදනය කිරීම. | මේ සඳහා වැය කළ මුළු මුදල රු. 4,500,000.00 |

14.8 වගුව : 2018 වර්ෂයේ ඉංජිනේරු අංශයේ ප්‍රගතිය

## ➢ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය

| අනු අංකය | ව්‍යාපෘතිය | විස්තරය / වැය වූ මුදල |
|---|---|---|
| 1 | වෙආස්කි කිරින්ද ආයතනයේ ආරක්ෂක වැට සඳහා විදුලි පහන් පද්ධතිය ස්ථාපිත කිරීම | රු. 550,000.00 |
| 2 | ශ්‍රී ලංවෙආ වරුණ ආයතනයේ ඇතැම් ගොඩනැගිලි ව්‍යුහයන් වෙනත් ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීම හේතුවෙන් ඒ සඳහා විදුලි හා විද්‍යුත් පද්ධතියක් නැවත සකස් කිරීම. | රු. 465,000.00 |
| 3 | බලපිටිය ජීවිතාරක්ෂක පුහුණු පාසල සඳහා නව 40 KVA විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපනය කිරීම. | රු. මිලියන 1.7 |
| 4 | ශ්‍රීලංවෙආදෙ මූලස්ථානය සඳහා 40 KVA නව විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපනය කිරීම. | රු. මිලියන 1.7 |
| 5 | ශ්‍රීලංවෙආදෙ මූලස්ථානයේ ස්ථාපිත කර තිබූ 30 KVA විදුලි ජනක යන්ත්‍රය වෙආස්කි පානදුර ආයතනයෙහි ප්‍රතිස්ථාපනය කිරීම. | රු. 45,000.00 |
| 6 | වෙආ දික්ඕවිට, හලාවත සහ ඔළුවිල් යන ආයතනයන් වල නව 05 KVA විදුලි ජනක යන්ත්‍රයක් බැගින් ස්ථාපිත කිරීම. | රු. 520,000.00 |
| 7 | ශ්‍රීලංවෙආදෙ මූලස්ථානය, වෙආස්කි කිරින්ද සහ බලපිටිය ජීවිතාරක්ෂක පුහුණු පාසල යන ස්ථානයන්හි Furuno FAR 2127 වර්ගයේ රේඩාර් යන්ත්‍රය බැගින් සවි කිරීම. | නාවික හමුදාවේ MDA ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලදී. |
| 8 | අධ්‍යක්ෂ ජනරාල් තුමන්ගේ නිළ නිවස ප්‍රතිසංස්කරනය කිරීම සහ එහි විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම | රු. 45,000.00 |
| 9 | වෙආස්කි අනුබණ්ඩ පානදුර සහ කිරින්ද පොදු භෝජනාගාරයන්හි විදුලි පද්ධතිය හා විදුලි බෙදාහැරීම් ජාලය වැඩි දියුණු කිරීම. | රු. 899,000.00 |

14.9 වගුව : 2018 වර්ෂයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශයේ ප්‍රගතිය



වෙආස්කි කිරින්ද ආයතනයේ ආරක්ෂක වැට සඳහා ආරක්ෂක විදුලි පහන් පද්ධතියක් සවි කිරීම



බලපිටිය ජීවිතාරක්ෂක පුහුණු පාසල සඳහා නව 40 KVA විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපනය කිරීම.




වෙරළ ආරක්ෂක පානදුර ආයතනයේ 30 kva විදුලි ජනකයක් ස්ථාපිත කිරීම.



මිරිස්සේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු මුලස්ථානයේ Furuno FAR 2127 වර්ගයේ රේඩාර් යන්ත්‍රයක් සවි කිරීම.




දික්ඕවිට හලාවත සහ ඔලුවිල් යන ස්ථානවල 05 KVA විදුලි ජනක යන්ත්‍ර ස්ථාපනය කිරිම




වෙරළ ආරක්ෂක පානදුර පොදු භෝජනාගාරයේ විදුලි පද්ධතිය සවිකිරීම හා වැඩි දියුනු කිරීම.

## ➢ සැපයුම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමත් සමඟ ඊට සමගාමීව වෙරළ ආරක්ෂක සැපයුම් දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා අවශ්‍යය විෂයයන් මිළදී ගැනීම හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී සැපයුම් දෙපාර්තමේන්තුව විශේෂ කාර්යභාරයක් පැවරී ඇත. මෙම සැපයුම් දෙපාර්තමේන්තුවේ නිලධාරී තිදෙනෙකු, ජ්‍යෙෂ්ඨ නාවිකයින් 03 දෙනෙකු සහ කණිෂ්ට නාවිකයින් 12 දෙනෙකුගෙන් සමන්විතව ඇත.

| වැය විෂයය | වැය ශීර්ෂය | වෙන්කල ප්‍රතිපාදනය (රු) | සත්‍ය වශයෙන් වැය වූ ප්‍රතිපාදන මුදල (රු) | ඉතිරි ප්‍රතිපාදන මුදල (රු) |
|---|---|---|---|---|
| වැටුප් හා වේතන | 1001 | 120,000.00 | 104,432.00 | 15,568.00 |
| දේශීය ගමන් වියදම් | 1101 | 230,000.00 | 229,980.00 | 20.00 |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 1201 | 2,760,000.00 | 2,753,165.38 | 6,834.62 |
| ඉන්ධන | 1202 | 2,250,000.00 | 2,250,000.00 | - |
| ආහාර හා නිලඇදුම් | 1203 | 8,200,000.00 | 8,199,972.23 | 27.77 |
| වෙනත් | 1205 | 4,500,000.00 | 4,497,383.30 | 2,616.70 |
| වාහන නඩත්තු වියදම් | 1301 | 3,200,000.00 | 3,176,997.98 | 23,002.02 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ නඩත්තු | 1302 | 800,000.00 | 799,837.19 | 162.81 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1303 | 1,100,000.00 | 1,098,902.28 | 1,097.72 |
| ප්‍රවාහන - කුලී | 1401 | 500,000.00 | 499,616.80 | 383.20 |
| තැපැල් හා සංනිවේදන | 1402 | 2,475,000.00 | 2,474,835.84 | 164.16 |
| විදුලිය සහ ජලය | 1403 | 9,500,000.00 | 9,497,897.05 | 2,102.95 |
| බදු කුලී | 1404 | 100,000.00 | 78,493.16 | 21,506.84 |
| සේවා | 1409 | 2,500,000.00 | 2,496,011.02 | 3,988.98 |
| නිල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම | 1703 | 15,000.00 | 12,218.50 | 2,781.50 |
| එකතුව | | 38,250,000.00 | 38,169,742.73 | 80,257.27 |


14.10 වගුව : මුදල් සාරාංශය - 2018 දෙසැම්බර් මස 31 වන දිනට පුනරාවර්තන ප්‍රතිපාදන




14.2 ප්‍රස්ථාරය : මුදල් සාරාංශය - 2018 දෙසැම්බර් මස 31 වන දිනට පුනරාවර්තන ප්‍රතිපාදන

| වැය විෂයය | වැය ශීර්ෂය | වෙන්කල ප්‍රතිපාදනය (රු) | සත්‍ය වශයෙන් වැය වූ ප්‍රතිපාදන මුදල (රු) | ඉතිරි ප්‍රතිපාදන මුදල (රු) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා සැකසුම් | 2001 | 2,000,000.00 | 1,997,114.65 | 2,885.35 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ | 2002 | 30,000,000.00 | 29,998,959.80 | 1,040.20 |
| වාහන | 2003 | 3,000,000.00 | 2,993,572.71 | 6,427.28 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | 3,000,000.00 | 2,997,452.63 | 2,547.37 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ | 2103 | 4,000,000.00 | 3,995,060.02 | 4,939.98 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | 10,000,000.00 | 9,999,947.45 | 52.55 |
| පරිගණක මෘදුකාංග වැඩි දියුණු කිරීම් | 2106 | 200,000.00 | 196,785.00 | 3,215.00 |
| පුහුණු කිරීම් හා හැකියාවන් වර්ධනය කිරීම | 2401 | 1,000,000.00 | 999,001.13 | 998.87 |
| එකතුව | | 53,200,000.00 | 53,177,893.39 | 22,106.60 |

14.11 වගුව : මුදල් සාරාංශය - 2018 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන




14.3 ප්‍රස්ථාරය : මුදල් සාරාංශය - 2018 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන

## 14.3 අනාගත අපේක්ෂා

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නාවික අවේක්ෂණ හා සන්නිවේදන ජාලය වැඩිදියුණු කිරීම
- ආ.ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් 'ශ්‍රීලංවෙආනෞ සමුද්‍රාරක්ෂා' සහ 'ශ්‍රීලංවෙආනෞ සමාරක්ෂා' යන නෞකා ද්විත්වය සඳහා 20 KVA විදුලි ජනක යන්ත්‍රයන් අත්පත් කර ගැනීම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක කිරින්ද, හලාවත සහ පානදුර යන අනුබණ්ඩයන්හි නව රේඩාර් යන්ත්‍ර ස්ථාපිතකිරීම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සමස්ත සන්නිවේදන ජාලය වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් 'ශ්‍රීලංවෙආනෞ සුරක්ෂා' නෞකාව වියලි දියත් මගට ගෙන එහි නඩත්තු කටයුතු සිදුකිරීම සහ එම නෞකාවේ නව විදුලි ජනක යන්ත්‍ර 02 ක් ප්‍රතිස්ථාපනය කිරීම.
- වෙරළ ආරක්ෂක උතුරු බල ප්‍රදේශය තුළ වෙරළ ආරක්ෂක ගොඩබිම් ආයතන ව්‍යාප්ත කිරීම. ඒ යටතේ වෙත්තලෙයිකේනි, මාදගල් සහ ගුරුනගර් යන ප්‍රදේශයන් ආවරණය වන පරිදි වෙරළ ආරක්ෂක අනුබණ්ඩ ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.
- ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම.
- වෙරළ ආරක්ෂක ස්ථානගත කිරීම ඔළුවිල් ආයතනයේ නව අවි ගබඩාවක් ස්ථාපිත කිරීම.
- ජනාධිපති කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ''පුනරුදය'' රුක් රෝපණ ජාතික වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කිරීම.
- කොඩ්බේ ධීවර වරාය තුල කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා සමුද්‍රිය පරිසර සංරක්ෂණ අධිකාරියේ සහයෝගය ලබා ගැනීම සහ ධීවර ප්‍රජාව දැනුවත් කර අවිධිමත් කසල බැහැර කිරීම් අවම කිරීම.

# 15.රාජ්‍ය බුද්ධි සේවාව

## 15.1 සමාලෝචනය

ආරක්ෂක අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය බුද්ධි සේවාව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින තර්ජනයන් හඳුනාගෙන ඒ පිළිබඳව පූර්ව බුද්ධි තොරතුරු අදාල පාර්ශවයන් වෙත ලබාදෙමින් එම තත්ත්වයන් වළක්වා ගැනීම අපේක්ෂිතව ස්ථාපිත කර ඇති ස්වාධීන ආයතනයක් වේ. මෙම සේවාව විසින් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් දේශීය වශයෙන් පැන නගින ආරක්ෂක, ආර්ථික, සමාජීය, සංස්කෘතික, හා අනෙකුත් සෑම විෂය ක්ෂේත්‍රයක් මෙන්ම විදේශීය වශයෙන් ඇතිවන තර්ජනයන් පිළිබඳව ලබාගන්නා බුද්ධි තොරතුරු විවිධ ක්‍රමෝපායන් අනුසාරයෙන් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පෙර සඳහන් කරන ලද පරිදි රටේ යහපැවැත්ම උදෙසා තීරණ ගන්නා මට්ටමේ අධිකාරීන් දැනුවත් කරනු ලබයි.

## 15.2 2018 වර්ෂයේ කාර්යසාධනය

රාජ්‍ය බුද්ධි සේවාව විසින් ජාතික ආරක්ෂාවට අදාලව ඉටු කරනු ලබන සමහර කාර්යයන් පහතින් දක්වා ඇත.

- තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය.
- රහසිගත පරීක්ෂණ පැවැත්වීම.
- සන්නද්ධ හමුදා, පොලිසිය, තෝරාගත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, සංවිධාන සහ පුද්ගලයින් ඇතුළුව සංවේදී ආයතනවලට බඳවා ගන්නා අයදුම්කරුවන් සම්බන්ධයෙන් පසුබිම් පරීක්ෂණ පැවැත්වීම.
- ප්‍රභූ ආරක්ෂාව සහ රාජ්‍ය කටයුතු පිළිබඳ තර්ජන තක්සේරු වාර්තා සැපයීම.
- සහෝදර ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ජාතික ආරක්ෂක ගැටලු සම්බන්ධ විදේශ සම්බන්ධතා පැවැත්වීම.

## 15.3 අනාගත අපේක්ෂා

- රාජකාරි නියුතු නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට කටයුතු සූදානම් කිරීම.
- වෘත්තීමය කාර්යය මණ්ඩල වැඩි කර ගැනීම.
- අන්තර්ජාතික ත්‍රස්තවාදී කණ්ඩායම් වල තර්ජන හඳුනාගෙන ඒ පිළිබඳව අදාල බුද්ධි අංශ සමඟ ක්‍රමානුකූලව කටයුතු කිරීම.
- භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා අතරම නව තාක්ෂණය උපයෝගී කර ගැනීම.

# 16. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය

## 16.1 සමාලෝචනය

1986 වර්ෂයේදී ආරක්ෂක නිලධාරීන් යටතේ මෙම පුහුණු පාසැල භාෂා පුහුණු මධ්‍යස්ථානය වශයෙන් ආරම්භ කෙරුණ අතර, ආරක්ෂක අංශ නිලයින්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කර කියවීම, ලිවීම හා කථනය වැඩි දියුණු කිරීම ප්‍රධාන අරමුණ විය. මේ වන විට පාඨමාලා 96 ක් සාර්ථකව යුධ, නාවික, ගුවන් හමුදා හා පොලිස් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් වෙත පවත්වා ඇති අතර, නිලධාරීන් 146 ක් හා සෙසුනිලයන් 8387 දෙනෙකු එම පාඨමාලාවන් හදාරා ඇත.

2018 වර්ෂයේ සිට ආරම්භ කළ ප්‍රංශ හා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවන්හි ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාවේ නිලධාරීන් 08 ක් සහ සෙසු නිලයින් 17 ක් හා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවේ සෙසු නිලයින් 153 ක්ද සාර්ථකව පාඨමාලාවන් හදාරා විසිර ගොස් ඇත.

## 16.2 2018 වර්ෂයේ කාර්යසාධනය


2018 වර්ෂය තුළ මෙම ආයතනය වෙතින් සිදුකරන ලද පාඨමාලා පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ.

| පාඨමාලාව | කාලසීමාව | පාඨමාලාව හදාරන ලද සිසුන් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | නිලධාරි | සෙසුනිල |
| **අංක 96 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව** | 2018.01.23 - 2018.07.24 | 06 | 120 |
| **අංක 01 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව** | 2018.01.29 - 2018.04.03 | - | 45 |
| **අංක 02 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව** | 2018.04.26 - 2018.07.31 | - | 48 |
| **අංක 03 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව** | 2018.08.14 - 2018.11.15 | - | 60 |
| **අංක 01 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව** | 2018.06.12 - 2018.10.12 | 08 | 17 |
| **එකතුව** | | 14 | 290 |

16.1 වගුව: 2018 වර්ෂයේ පවත්වන ලද පාඨමාලා විස්තරය

| පාඨමාලාව | කාලසීමාව | පාඨමාලාව හදාරන ලද සිසුන් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | නිලධාරි | සෙසුනිල |
| **අංක 97 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව** | 2018.08.14 - 2019.01.23 | 06 | 68 |
| **අංක 04 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව** | 2018.12.03 - 2019.03.08 | - | 46 |
| **අංක 02 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව** | 2018.10.23 - 2019.02.22 | 07 | 22 |
| **එකතුව** | | 13 | 136 |

16.2 වගුව: 2018 වර්ෂයේ ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් වීමට නියමිත පාඨමාලා විස්තරය




16.1 ප්‍රස්ථාරය : 2018 වර්ෂයේ පවත්වන ලද ඉංග්‍රීසි, ප්‍රංශ හා දමිළ පාඨමාලාවන් සඳහා සහභාගි වූ ත්‍රිවිධ හමුදා සහ පොලිස් විශේෂ කාර්යය බළකා සාමාජිකයින්

### ➢ ආයතනය මුහුණ පා ඇති වෙනත් ගැටළු

- නිත්‍ය කාර්ය මණ්ඩලය සඳහා සහ පාඨමාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රමාණවත් පරිදි නවාතැන් පහසුකම් නොතිබීම.
- පාලන කටයුතු සඳහා සැහැල්ලු වාහනයක සහ බර වාහනයක අවශ්‍යතාවය
- නවතමයෙන් ආරම්භ කරන ලද ඉංග්‍රීසි, ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව සඳහා ඉන්ධන අවශ්‍යතාවය සපුරා ගැනීම. (පාඨමාලා විෂයානුබද්ධ දේශන හා ක්‍රියාකාරකම් වලට අදාල සිසු සිසුවියන් හා දේශකයන් ප්‍රවාහනයට අදාල ඉන්ධන අවශ්‍යතාව)
- ගිලන් රථයක අවශ්‍යතාවය (රියදුරෙකු සමග හා තෙල් අනුමැතිය සමග)
- දෙමළ භාෂා උපදේශක පාඨමාලාවට සහ ප්‍රංශ භාෂා පාඨමාලාව සඳහා උපදේශක පුහුණු උපදේශක වරුන්ගේ අවශ්‍යතාවය

## 16.3 අනාගත අපේක්ෂා


- ✸ නිලධාරි නිවස්නයක් හා බලලත් නිලධාරි/ සැරයන් නිවස්නයක් ඉදිකිරීම.
- ✸ නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම.
- ✸ ශිෂ්‍ය නිලධාරීන්ගේ නේවාසිකාගාරය ඉදිකිරීම.
- ✸ කඳවුර ආරක්ෂක වළල්ල වටා මුර කුටි 05 ක් ඉදිකිරීම.

# 17.ශ්‍රී ලංකා ජාතික ආරක්ෂණ අධ්‍යයන ආයතනය

## 17.1 සමාලෝචනය

2016 ක් වූ ජූලි මස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (Institute of National Security Studies Sri Lanka) INSSSL) පිහිටුවන ලදී. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය ආරක්ෂක නිලධාරීන් යටතේ ක්‍රියාත්මක වේ.

මෙම අධ්‍යයන ආයතනය, ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව ආරක්ෂක වටපිටාව පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගැනීමට සහ ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් හරහා විවාද, සාකච්ඡා, පර්යේෂණ හා විශේෂඥ දැනුම සම්බන්ධව ක්‍රියාකිරීමට පිහිටුවන ලද්දකි. ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික පිහිටීම එය නිරන්තරයෙන් සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජනයන්ට බඳුන් වීමට හේතුවී ඇත.එබැවින් ශ්‍රී ලංකාවේ ආරක්ෂාව තහවුරු කරනු වස්, ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට ආරක්ෂාව හා ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් හා මූලෝපායික චින්තකයන් ආකර්ෂණය කරගත යුතුය.




| ප්‍රතිපත්ති ප්‍රකාශනය-INSSSL | ඉදිරිපත් කළ දිනය | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව | 2018 ජනවාරි | ඉදිරිපත් කරන ලදී |
| මාධ්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය : වැරදි තොරතුරු, ව්‍යාජ පුවත් සහ ජාතික ආරක්ෂාව: | 2018 ජූනි | ඉදිරිපත් කරන ලදී |

17.1 වගුව: ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විස්තරය | ප්‍රතිපාදන (රු.) | 2018.08.31 දිනට වියදම (රු.) | ශේෂය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 15,000,000 | 9,635,691 | 5,364,309 |
| ප්‍රාග්ධන වියදම් | 4,000,000 | 1,527,148 | 2,472,852 |

17.2 වගුව: ආයතන මූල්‍ය ප්‍රගතිය

## 17.2 2018 වර්ෂයේ කාර්යසාධනය

ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය ජාතික ආරක්ෂාව පිළිබඳ විවිධ මාතෘකා යටතේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබයි.

- තර්ජනාත්මක විශ්ලේශණ
- ප්‍රකාශන
- වට මේස සාකච්ඡා
- ආරක්ෂක මැදිරි
- සම්මන්ත්‍රණ
- මහජන දේශන

### සම්මන්ත්‍රණ/ වැඩමුළු/විද්වත් සංවාද

➢ ''ව්‍යාජ පුවත් සහ වැරදි තොරතුරු කළමනාකරණය'' පිළිබඳ සම්මන්ත්‍රණය



2018 ජූනි මස 14 වන දින ''මාධ්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය: වැරදි තොරතුරු, ව්‍යාජ පුවත් සහ ජාතික ආරක්ෂාව'' පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර එහි ප්‍රමුඛතම පරමාර්ථය වූයේ වත්මන් මාධ්‍ය භාවිතය වෙනස් කිරීම පිළිබඳ රාජ්‍ය, පෞද්ගලික, මාධ්‍ය හා බහුපාර්ශවීය අංශයන්හි තොරතුරු හා අනාගත සැලසුම් එක්රැස් කිරීම මගින් ස්වාධීන නිරීක්ෂණයක් කිරීමයි.

➢ මුණසිංහ ආයතනය සමඟ ඒකාබද්ධව පැවැත් වූ වැඩමුළුව.




ශ්‍රී ලංකාව සහ ඉන්දියන් සාගරයේ තිරසාර නීල හරිත ආර්ථිකය පිළිබඳ පර්යේෂණ වැඩමුළුවක් 2018 ජූලි මස 18 වන දින කොළඹ රේණුකා හෝටලයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාව වටා ඇති ඉන්දියානු සාගර සම්පත් ජාතික තිරසාර සංවර්ධන උපාය මාර්ගයේ වැදගත් අංගයක් විය යුතු බව මෙහි දී හඳුනාග න්නා ලදී. එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපන පාසල (UKSO) ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (INSSSL) හා සංවර්ධනය සඳහා වූ මුණසිංහ ආයතනය (MIND), ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම පර්යේෂකයින් සහ පාර්ශ්වකරුවන් එක්ව මෙම මූලික වැඩමුළුව සංවිධානය කරනු ලැබීය.

➢ ''ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව දකුණු ආසියාවට බලපාන ආකාරය'' පිළිබද සම්මන්ත්‍රණය, INSSSL

''ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව දකුණු ආසියාවට බලපාන ආකාරය'' යන මාතෘකාව යටතේ 2018 සැප්තැම්බර් මස 18 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (INSSSL) විසින් සම්මන්ත්‍රණයක්






සංවිධානය කළේය. මෙහි දී අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බංග්ලාදේශ නියෝජිතයන් සදහා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව පිළිබදව කරුණු ඉදිරිපත් කරන ලදී .

## වට මේස සාකච්ඡා

### ➢ ''දකුණු ආසියාවේ කලාපීය ආරක්ෂක පරිසරයේ ප්‍රවණතා''

''දකුණු ආසියාවේ කලාපීය ආරක්ෂක පරිසරයේ ප්‍රවණතා'' නම් වූ වට මේස සාකච්ඡාව 2018 මැයි 31 වන දින මෙම ආයතනයේ (INSSSL) ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ආචාර්ය මල්ලිකා ජෝසප් විසින් මෙහිදී ප්‍රධාන දේශනය පවත්වන ලදී. ඇය INSSSL සම්පත් සංසදයෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වන අතර, දැනට හේග්හි සන්නද්ධ ගැටුම් වැළැක්වීම සඳහා පාදක කරගත් ගෝලීය හවුල්කාරිත්වයේ ප්‍රතිපත්ති උපදේශක වශයෙන් සේවය කරයි. (GPPAC).

### ➢ "BMISTC හි ශ්‍රී ලංකාවේ භූමිකාව'' පිළිබඳ සාකච්ඡා වටය



2018 සැප්තැම්බර් මස 20 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය විසින් BMISTC හි ශ්‍රී ලංකාවේ භූමිකාව පිළිබඳව සාකච්ඡා වටයක් පවත්වන ලදී. මේ සඳහා කිත්මිණ හේවගේ, රොහාන් මාසකෝරාල, හේමන්ති රණසිංහ, සංජීව ඩයස් ඇතුළු INSSSL හි කාර්ය මණ්ඩලය සහභාගී විය.

### ➢ "OBOR හි දකුණු ආසියාවේ භූමිකාව'' පිළිබඳ සාකච්ඡා වටය

2018 නොවැම්බර් මස 15 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය විසින් "OBOR හි දකුණු ආසියාවේ භූමිකාව'' පිළිබඳ සාකච්ඡා වටයක් පවත්වන ලදී. මේ සඳහා විශ්ලේෂකයන් රැසක් සහභාගී විය. ඒ අතර INSSSL හි පර්යේෂක විශ්ලේෂකයකු හා ඉන්දියානු ජවහල්ලානේරු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන මහාචාර්ය ස්වරන් සිං "Swaran Singh" ගේ සහභාගීත්වය විශේෂ විය.

## ආරක්ෂක මැදිරි

### ➢ උපාය මාර්ගික මෙවලමක් ලෙස සාගර විද්‍යාව භාවිතා කිරීම



11 වන ආරක්ෂක මැදිරිය 2018 මාර්තු මස 29 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. සිවිල් ආරක්ෂක හා සංවර්ධන අතිරේක ලේකම් එන්.ජී. පණ්ඩිතරත්න, INSSSL ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය චුලනි අත්තනායක මහත්මිය මෙහි ප්‍රධානත්වය දරන ලද අතර ශ්‍රී ලංකාවේ වෙරළ ආරක්ෂක බලකායේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කොමඩෝර් එන් එන් ජයරත්න මහතා, උපාය මාර්ගික මෙවලමක් ලෙස සාගර විද්‍යාව, පිළිබඳ දේශනය ඉදිරිපත් කරන ලදි.

### ➢ ව්‍යාජ පුවත්, තොරතුරු සහ උපාමාරුව පිළිබඳ සිංගප්පූරු දෘෂ්ටිකෝණය




සිංගප්පූරුවේ ජාතික ආරක්ෂක මධ්‍යස්ථානයේ ප්‍රධාන ආචාර්ය ශෂී ජයකුමාර් මහතා විසින් දොළොස්වන ආරක්ෂක මැදිරියෙහි ප්‍රධාන දේශන පවත්වන ලදී. ඔහුගේ දේශනය ''ව්‍යාජ පුවත්, තොරතුරු සහ උපාමාරුව: සිංගප්පූරුවේ දෘෂ්ටිකෝණය'' පිළිබඳව වූ අතර එය ජූලි 5 වන දින ආරක්ෂක අමාත්‍යංශයේ දී පැවැත්විය. ආරක්ෂක අමාත්‍යංශ ලේකම්, (ජනාධිපති නීතිඥ) කපිල වෛද්‍යරත්න මහතා විසින් මෙහි ප්‍රධානත්වය දරන ලදී.

## තර්ජනාත්මක විශ්ලේෂණය

### ➢ ''ආහාර සුරක්ෂිතතාවය''

2017 ජනවාරි 23 දින ආරක්ෂක අමාත්‍යංශයේ දී 7 වන තර්ජනාත්මක විශ්ලේෂණය ''ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම'' මැයෙන් පවත්වන ලදී. ප්‍රතිපත්ති සම්පාදක මට්ටමින් ආහාර වගාව සහ කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා තිරසාර යාන්ත්‍රණයක් යෝජනා කිරීම මෙම වැඩමුළුව සංවිධානය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය විය.



## මහජන දේශන

### ➢ ''චීනය තුල ඉන්දියාවේ තෝරාගත් සහභාගීත්වය'' පිළිබද මහජන දේශනය

2018 දෙසැම්බර් 24 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේ ''චීනය තුළ ඉන්දියාවේ තෝරාගත් සහභාගීත්වය'' පිළිබද මහජන දේශනයක් මහාචාර්ය ස්වරන් සිං (Swaran Singh) ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

### ➢ නාරම්බැද්ද සටන, තිසර සංදේශය හා දැදිගම පරක්‍රමබාහු පිළිබඳ මහජන දේශනය

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය වශයෙන් රටෙහි ස්වෛරීත්වය උදෙසා උපායමාර්ගික ප්‍රවේශයන් පිළිබඳ විවිධ පර්යේෂණයන් රැසක් මෙහෙයවා තිබේ. එහි තවත් එක් පියවරක් වශයෙන් "නාරම්බැද්ද සටන, තිසර සංදේශය හා දැදිගම පරාක්‍රමබාහු" යන තේමාව යටතේ 2018 නොවැම්බර් මස පළමුවන දින ප්‍රසාද් ෆොන්සේකා මහතාගේ ප්‍රධානත්වයෙන් මහජන දේශනයක් සංවිධානය කරන ලදී. මෙහිදී දඹදෙණි සමයේ සිට ගම්පොළ සමය දක්වා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ නොවිසඳුණු ගැටලු රැසක් නිරාකරණය කරන ලදී. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර, මහාචාර්ය විනී විතාරණ, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් රැසක් මේ සඳහා සහභාගී විය.

### ➢ ශ්‍රී ලංකාවේ සාගර දූෂණය පිළිබඳ ප්‍රසිද්ධ දේශනය





2018 ඔක්තෝබර් 12 වන දින, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (INSSSL) මගින් සංවිධානය කොට ආචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා විසින් ''ශ්‍රී ලංකාවේ සමුද්‍ර දූෂණය'' පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් පවත්වන ලදී .

## අනුස්මරණ දේශන මාලාව

### ➢ වාර්ෂික අනුස්මරණ දේශනය - ගෞරවයට පාත්‍ර වූ අභාවප්‍රාප්ත මේජර් ජෙනරාල් විජය විමලරත්න මහතාගේ අනුස්මරණ දේශනය.

අභාවප්‍රාප්ත මේජර් ජෙනරාල් විජය විමලරත්න මහතාගේ අනුස්මරණ දේශනය 2018 අගෝස්තු 8 දින පවත්වන ලදී. මෙහි මුඛ්‍ය දේශනය මේජර් ජනරාල් උදය පෙරේරා (RWP RSP VSV USP USA WC) විසින් සිදු කරන ලදී.



ජාතික ආරක්ෂාව පිළිබඳ බුද්ධි මණ්ඩලය ලෙස INSSSL විසින් මෙම දේශනය පවත්වනු ලැබුවේ ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා, ආරක්ෂක හා ආරක්ෂක කටයුතු සඳහා කැපී පෙනෙන මූලෝපායිකයෙකු හා නායකයෙකු වූ මේජර් ජනරාල් විජය විමලරත්න මහතාගේ 26 වැනි ජන්ම සංවත්සරය සිහිකරමින් ඔහු කළ දායකත්වය අගය කිරීම වෙනුවෙනි. මෙම වාර්ෂික අනුස්මරණ දේශනය ඉලක්කය වූයේ යුද්ධ වීරයන් සහ යුද්ධ හමුදා මූලෝපායන්වල අනාගත පරම්පරාවන් දැනුවත් කිරීමයි.

මෙම දේශනය හරහා දැනුම හුවමාරු කර ගැනීම අරමුණු කරගත් ආයුධ සන්නද්ධ හමුදාවන්ගේ ඊළඟ පරම්පරාවේ වෘත්තීමය ආකල්ප වර්ධනය කිරීම හා මූලෝපායික චින්තනය ඇඳ ගැනීම බලාපොරොත්තු විය.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ සභාපති ආරක්ෂක අමාත්‍යංශ ලේකම් (ජනාධිපති නීතිඥ) කපිල වෛද්‍යරත්න මහතා, ආරක්ෂක අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, කීර්තිමත් හමුදා නිලධාරීන්, විද්වතුන් හා අභාවප්‍රාප්ත මේජර් ජනරාල් විජය විමලරත්න මහතාගේ පවුලේ සාමාජිකයන් සහභාගී විය.

## ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය එහි පළමු සමාරම්භක ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ''දකුණු ආසියාවේ සාමූහික ආරක්ෂක ප්‍රතිපත්තියක් කරා: ශක්තිමත් භාවය සහ ස්ථාවරත්වය ගොඩනැංවීම'' යන මාතෘකාව යටතේ 2018 දෙසැම්බර් 16 වන දින Shangri-La හෝටල් පරිශ්‍රය තුළ පවත්වන ලදී .

මෙම සම්මන්ත්‍රණය ප්‍රධාන සැසිවාර 3 කින් සමන්විත විය.

| | |
|---|---|
| **පළමු ඉදිරිපත් කිරීම** | |
| ඉන්දියානු සාගරය තුළ චීන- ඉන්දියානු නාවික සහභාගීත්වය | මහාචාර්ය ස්වරන් සිං (Swaran Singh) (ඉන්දියාව) |
| **දෙවන ඉදිරිපත් කිරීම** | |
| එක්සත් ජනපද-චීනය ගැටුම් උත්සන්න කිරීම: ජපානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? | ආචාර්ය සටෝරු නගාඕ (Satoru Nagao) (ජපානය ) |
| **තෙවන ඉදිරිපත් කිරීම** | |
| චීනයේ සේද මාවත: ප්‍රගතිය හා භාවිතයන් | ආචාර්ය හුවාන්ග් යුන්සොන්ග් (Huang Yunsong) (චීනය) |
| **සිව්වන ඉදිරිපත් කිරීම** | |
| ඉන්දියානු සාගරයේ සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය | කපිතාන් පී කේ වර්ණකුලසූරිය (P K Warnakulasooriya) (ශ්‍රී ලංකාව) |
| **පස්වන ඉදිරිපත් කිරීම** | |
| ඉන්දියානු සාගරයේ චීනයේ නැගීම: මාලදිවයින් ඉදිරි දර්ශනයක් | ආචාර්ය රෂීදා එම් දිදී (Rasheeda M Didi) (මාලදිවයින) |
| **සයවැනි ඉදිරිපත් කිරීම** | |
| ඉන්දියානු සාගරයේ භූ-දේශපාලනය: ශ්‍රී ලාංකික දෘෂ්ඨිය | මහාචාර්ය අසංග අබේගුණසේකර (Asanga Abeyagoonasekera) සහ සාවිත්‍රි සෙල්පෙරුම (Savithri Sellapperumage) මෙනවිය (ශ්‍රී ලංකාව) |

17.3 වගුව : සැසිවාර 1 - ඉන්දියානු සාගරයේ සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතාව (මූලසුන: පලිහක්කාර තානාපතිතුමන්)

| | |
|---|---|
| **පළමු ඉදිරිපත් කිරීම** | |
| ප්‍රචණ්ඩකාරී අන්තවාදය ප්‍රතික්ෂේප කිරීම | තානාපති අම්ජාඩ් මජීඩ් අබ්බාසි (Amjad Majid Abbasi ) (පකිස්ථානය) |
| **දෙවන ඉදිරිපත් කිරීම** | |
| නිර්ලිබරර්වාදීන්, තන්ත්‍රය නීත්‍යානුකූල කිරීම සහ ''ප්‍රධාන ප්‍රවාහය'' අන්තවාදය: පාලක ප්‍රභූන් සහ දකුණු ආසියාවේ බහුතරවාදී අන්තවාදය අතර ඇතිව ඇති අනුකම්පා විරහිත කිරීම | ආචාර්ය රංග ජයසූරිය ( Ranga Jayasooriya) ( ශ්‍රී ලංකාව) |
| **තෙවන ඉදිරිපත් කිරීම** | |
| යෞවන රැඩිකලීකරණයේ ද්‍රවයන් හඳුනා ගැනීම | මේජර් ජනරාල් ඒ ඒන් ඒම් මුනිරුස්මාන්( Maj Gen A N M Muniruzman) (බංගලාදේශය) |
| **සිව්වන ඉදිරිපත් කිරීම** | |
| දකුණු ආසියාවේ පවත්නා විචක්ෂණශීලී අන්තවාදය ගෝලීය ප්‍රවනතා සහ බලපෑම්වලට එරෙහිව සටන් කිරීම | මේජර් ජනරාල් රවිප්‍රිය ( Maj Gen Ravipriya) (ශ්‍රී ලංකාව) |

17.4 වගුව: සැසිවාර 2 : ප්‍රචණ්ඩකාරී අන්තවාදය ප්‍රතික්ෂේප කිරීම. (මූලසුන: මේජර් ජනරාල් උදය පෙරේරා)

| | |
|---|---|
| **පළමු ඉදිරිපත් කිරීම** | |
| ආසියාවේ සහ ඉන් ඔබ්බෙහි ආරක්ෂක අභියෝග: යුරෝපීය ඉදිරි දර්ශනය | ආචාර්ය ෆ්‍රැන්කොයිස් නිකොලාස් (Prof. Francoise Nicolas) (ප්‍රංශය) |
| **දෙවන ඉදිරිපත් කිරීම** | |
| BIMSTEC හරහා ආරක්ෂණ සහයෝගීතාවයෙන්: කලාපීය දෘෂ්ටිය | නටාෂා ප්‍රනාන්දු මහත්මිය (Ms. Natasha Fernando) (ශ්‍රී ලංකාව) |
| **තෙවන ඉදිරිපත් කිරීම** | |
| දකුණු ආසියාවේ නව කලාපීය වාදය | ආචාර්ය උත්තම සින්හා (Dr.Uttam Sinha) (ඉන්දියාව) |
| **සිව්වන ඉදිරිපත් කිරීම** | |
| ගෝලීයකරණය වූ දකුණු ආසියාවේ ආර්ථික හා සමාජීය තර්ජන | කසුනි රණසිංහ මහත්මිය (Ms.Kasuni Ranasinghe) (ශ්‍රී ලංකාව) |

17.5 වගුව: සැසිවාර 3 :කලාපීයකරණය හරහා ආරක්ෂක න්‍යාය පත්‍රය. (මූලසුන: රම්ලා වහබ්-සල්මන් මහත්මිය)






## නිළ සංචාර

➢ INSSSL අධ්‍යක්ෂ ජනරාල් තුමන් වොෂින්ටන් හිදී ආචාර්ය රෝගර් කන්ගස් මහතා මුණ ගැසෙයි.

අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා 2018 අප්‍රේල් මස 25 වන දින ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් හිදී ආචාර්ය රෝගර් කන්ගස් මහතා මුණ ගැසුණි. ආචාර්ය කන්ගස් මහතා ක්‍රමෝපායික අධ්‍යනය පිළිබඳ දකුණු ආසියාතික මධ්‍යස්ථානයේ අධ්‍යයන පීඨාධිපති සහ මහාචාර්යවරයෙකු වශයෙන් සේවය කරනු ලබයි.



➢ අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා හඩ්සන් ආයතනයේ බුද්ධි මණ්ඩලය ඇමතීම.

අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා 2018 අප්‍රේල් මස 20 දින වොෂින්ටන්හි පවතින කීර්තිමත් බුද්ධි මණ්ඩලයක් වන හඩ්සන් ආයතනයේ මණ්ඩල සාකච්ඡාවක දී ''ඉන්දියානු සාගරය තුළ චීනයේ බලපෑම වර්ධනය වීම: එක්සත් ජනපදයේ සහ එහි කලාපීය මිත්‍ර පාර්ශ්වයන්ගේ මැදිහත් වීම'' යන මැයෙන් දේශනයක් පවත්වනු ලැබීය.



මෙහිදී, අසංග අබේගුණසේකර මහතා විසින් ඉන්දියානු සාගර කලාපය තුළ, දිවයිනේ භූ මූලෝපයික වැදගත්කම උපයෝගී කර ගනිමින් කලාපීය ස්ථාවරභාවය කෙරෙහි ශ්‍රී ලංකාව ඉටු කරන කාර්ය භාරය පිළිබද අවධාරණය කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා රාජ්‍ය පරිපාලනය පිළිබද ඇමරිකානු සංගමයේදී 21 වන සියවසේ රාජ්‍ය අංශයේ නායකත්වය පිළිබද දේශනයක් පවත්වන ලදී.

අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා විසින් කීර්තිමත් රාජ්‍ය පරිපාලන පිළිබඳ ඇමෙරිකානු සමාජය (ASPA) තුළ ''සින්සිනාටි පරිච්ඡේදය සහ උතුරු කෙන්ටකි විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය'' පිළිබඳ උසස් උපාධි සිසුන්ට 2018 පෙබරවාරි මස 20 දේශනයක් පවත්වන ලදී.

➢ ජාත්‍යන්තර සමුළු සඳහා INSSSL සහභාගීත්වය -2018

INSSSL පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය චුලනි අත්තනායක සහ පර්යේෂණ විශ්ලේෂක ප්‍රියංකා මුණසිංහ මෙනවිය 2018 ජනවාරි 31 සිට පෙබරවාරි 01 දින දක්වා නේපාලයේ කත්මන්ඩු හිදී පවත්වන ලද අර්බුද කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී විය.



පර්යේෂණ විශ්ලේෂක ප්‍රියංකා මුණසිංහ මෙනවිය 2018 මාර්තු මස 20 සිට 23 දක්වා බංගලාදේශයේ ඩකා හිදී ''ප්‍රචණ්ඩ අන්තවාදීත්වයට එරෙහිව: දරා සිටීමේ හැකියාව සහ ධාරිතාවය ගොඩ නැංවීම'' යන මැයෙන් පවත්වන ලද ජාතික වැඩමුළුවට සහභාගී විය. මෙම වැඩසටහන බංගලාදේශ සාමය සහ ආරක්ෂක අධ්‍යයන ආයතනය සහ බංගලාදේශයේ ත්‍රස්තවාදී පර්යේෂණ ආයතනය විසින් එක්ව සංවිධානය කරන ලද්දකි.

අධ්‍යක්ෂ ජනරාල් අසංග අබේගුණසේකර මහතා, ජාත්‍යන්තර උපාය මාර්ගික අධ්‍යයන ආයතනයේ (IISS) ආරාධනය මත සිංගප්පූරුවේ පැවති 17 වන Shangri-La සංවාදය සඳහා සහභාගී විය. මෙම සංවාදය ''ඉහළ පෙළේ'' (Track one) අන්තර් - ආණ්ඩු ආරක්ෂක මණ්ඩපයක් වන අතර එය ස්වාධීන බුද්ධි මණ්ඩලයක් වන ජාත්‍යන්තර උපාය මාර්ගික අධ්‍යයන ආයතනය (IISS) විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර මෙම සංවාදය ආරක්ෂක අමාත්‍යවරුන්, ස්ථිර අමාත්‍යාංශ ප්‍රධානීන් සහ ආසියා- පැසිපික් රාජ්‍යයන්ගේ යුධ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

➢ INSSSL අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රසල්ස් සහ බර්ලින්හි බුද්ධි මණ්ඩල හා ආරක්ෂක ආයතන වෙත සංචාරය කරන ලදී

2018 නොවැම්බර් 5 - 9 දිනවල කොන්රඩ් ඇඩෙනියර් ස්ටිෆ්ටුන් (Konrad Adenaue Stiftung) විසින් ආරක්ෂක ප්‍රතිපත්ති විශේෂඥයින් සහ බුද්ධි ප්‍රවීණයන්ගේ සාමාජිකයින් සඳහා අධ්‍යයන හා සාකච්ඡා වැඩසටහනක් සඳහා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල් අසංග අබේගුණසේකර මහතා බ්‍රසල්ස් හා බර්ලින් වෙත ආරාධනා කරනු ලැබීය. වැඩසටහනේ දී ඔහු නේටෝ මූලස්ථානය, යුරෝපීය බාහිර ක්‍රියාකාරී සේවාව, බ්‍රසල්ස් හා බර්ලිනයේ බුද්ධි මණ්ඩල සහ ජර්මනියේ ෆෙඩරල් චාන්සලර්ස් හි සංචාරය කරන ලදී. ඉන්දු-පැසිෆික්හි ආරක්ෂාව හා ස්ථාවරත්වය පිළිබඳ කොන්රඩ් ඇඩෙනියර් ස්ටිෆ්ටුන්හි (Konrad Adenaue Stiftung) පැවති සාකච්ඡාවකදී ඔහුට ආරාධනා කරනු ලැබුවේ මහාචාර්ය රාජා මොහාන්(Prof. Raja Mohan), ආචාර්ය ඩේවිඩ් බ්‍රුස්ටර් (Dr. David Brewster), වයිස් අද්මිරාල් ප්‍රදීප් චෞහාන්(Vice Admiral Pradeep Chauhan), ආචාර්ය අහමඩ් එස්. මන්සූර් (Dr. Ahmed S. Mansoori) සහ CSIS වොෂින්ටන් හි බ්‍රයන් හාර්ඩින්( Brian Harding) වේ. ගෝලීය රාජ්‍ය ප්‍රතිපත්ති ආයතනයේ ආචාර්ය ගරිමා මොහාන් (Dr. Garima Mohan) විසින් විද්වත් සාකච්ඡාව මෙහෙයවනු ලැබීය.2018 සැප්තැම්බර් මස 2 වැනි දින 36 වන කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණයට අධ්‍යක්ෂ ජෙනරාල් අසංග අබේගුණසේකර මහතා සහභාගී විය.

➢ අධ්‍යක්ෂ ජනරාල් අසංක අබේගුණසේකර මහතා 2018 ඔක්තෝබර් 18 වන දින CICA හිදී (අන්තර්ජාතික හා විශ්වාසනීය ගොඩ නැංවීම පිළිබඳ සම්මේලනය පිළිබඳ සම්මේලනය) ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

2018 අගෝස්තු මාසයේ දී CICA හි සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව පත් විය. 2012 දී එහි නිරීක්ෂණ රාජ්‍යයක්ව සිට ශ්‍රී ලංකාව 27 වැනි සාමාජිකයා බවට පත්විය. ශ්‍රී ලංකාව CICA හි පූර්ණ සාමාජිකයකු වීමෙන් පසුව මෙහිදී ඔහු සමාරම්භක ප්‍රකාශය සිදු කළේය.





2018 නොවැම්බර් 21 වන දින බාලි (ඉන්දුනීසියාව) හි වූ ආසියා බුද්ධි මණ්ඩල සමුළුවට සහ කොස්තාටි සැලසුම් සමුළුවට අධ්‍යක්ෂ ජෙනරාල් අසංග අබේගුණසේකර මහතා සහභාගී විය.



2018 දෙසැම්බර් මස 17 වන දින ඉන්දියාවේ ආරක්ෂක අධ්‍යන හා විශ්ලේෂන ආයතනයේ (IDSA) හි වූ 11 වන දකුණු ආසියානු සමුළුවට අධ්‍යක්ෂ ජෙනරාල් අසංග අබේගුණසේකර මහතා සහභාගි විය.

## INSSSL සංචාර

2018 ඔක්තෝබර් 31 වන දින INSSSL කාර්ය මණ්ඩල සාමාජිකයින් ශ්‍රී ලංකා සංඥා බලකාය - SLSC (Sri Lanka Signal Crop) වෙත පැමිණි අතර එහිදී හමුදාවේ නිලධාරීන් විසින් ජාතිය වෙනුවෙන් කරන ලද කැපකිරීම අගය කරන ලදී.





## ප්‍රකාශන

➢ INSSSL ආරක්ෂක කාර්තුමය ප්‍රකාශනය

INSSSL කාර්තුමය ප්‍රකාශනය, සෑම මාස තුනකට වරක් අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද විවිධ වූ වැඩ සටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබන පුවත් සගරාවකි. මෙහි අන්තර්ගතය INSSSL ආයතනය විසින් පවත්වනු ලැබූ වැඩ සටහන්, ක්‍රියාකාරකම්, මෑත කාලීන ප්‍රකාශන හා අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ සේවක මණ්ඩලය විසින් සහභාගී වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත වේ. මෙම ලුහුඬු සගරාව දේශීය සහ ජාත්‍යන්තර ශාස්ත්‍රඥයින්, බුද්ධිමතුන්, පර්යේෂණ ආයතන හා වෙනත් උනන්දුවක් දක්වන පිරිස් අතර බෙදා හරිනු ලබයි.










➢ INSSSL ආරක්ෂක සමාලෝචනය 2018

INSSSL ආරක්ෂක සමාලෝචනය, 2018 ආරක්ෂක අධ්‍යයනයන් සඳහා පර්යේෂණ වේදිකාවක් සැකසීමේත් ජාතික, කලාපීය, ජාත්‍යන්තර ආරක්ෂාව සහ භූ දේශපාලනය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේත් ඉලක්කයෙන් යුතුව ප්‍රකාශයට පත් විය. මෙම සමාලෝචනය මගින් ප්‍රකාශයට පත් වූ ලිපි ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආරක්ෂක සන්දර්භයන්හි මෑතකාලීන සංසිද්ධීන් පිළිබඳ විද්වතුන් විසින් රචනා කරන ලද ලිපි පෙළක් ලෙස හඳුනා ගතහැකි වේ. එම ලිපි පෙළ බුද්ධිය දේශපාලනීකරණය වීම - නව පරීක්ෂණ ආකෘතියක් අයදුම් කිරීම, සමුද්‍ර ගැටළු ජය ගැනීම සඳහා වන උපාය මාර්ග: ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්,

සමුද්‍රීය සේද මාවත සහ ජපානයේ ඉන්දු - පැසිපික් මැදිහත්වීම: ශ්‍රී ලංකා-ජපාන උපායමාර්ගික හවුල්කාරිත්වයේ උපයෝගිතාවය, : පශ්චාත් ගැටුම් සමාජ වල කාර්ය සාධනය: සහයෝගිතාවය, ප්‍රතිසන්ධානය සහ ප්‍රජා සම්මිශ්‍රණය,යාවනයන්ගේ කැරළි ගැසීම: තරුණ අසහනය ශ්‍රී ලංකාවේ දේශපාලන ආරක්ෂාව සඳහා තර්ජනයකි, පලිබෝධ ද්‍රව්‍ය වන්දි ගිවිසුම (FMCT) පිළිබඳ සාකච්ඡා කිරීමෙහි සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ බාධාවන්, පාරිසරික ආරක්ෂණ අභියෝග සහ දකුණු ආසියාවේ භූගෝලීය වැදගත්කම පිළිබඳ පාලන පරතරය විශ්ලේෂණය කිරීම ලෙස දැක්විය හැකිය. බොහෝ තොරතුරු වලින් පොහොසත් මෙම ලිපි පෙළ අධ්‍යයනය ආරක්ෂක හා උපාය මාර්ගික අධ්‍යයනයේ නිරත වන්නා වූ හා ඒ සම්බන්ධ උනන්දුව ඇති අයගේ අවබෝධය සඳහා උපයෝගී වනු ඇත .




## 17.3 අනාගත අපේක්ෂා

| වැඩසටහන් | ක්‍රියාකාරකම් ගණන |
|---|---|
| ආරක්ෂක සමාලෝචන පළ කිරීම | 1 |
| ප්‍රධාන තේමාවන් සහිත ප්‍රදේශ ආවරණය වන පොත් ප්‍රකාශයට පත් කිරීම | 2 |
| ප්‍රධාන තේමාවන් සහිත ප්‍රදේශ ආවරණය කිරීම | 5 |
| වාර සඟරා නිපැයුම් ක්ෂේත්‍ර ආවරණය කිරීම | 1 |
| පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම | 1 |
| ජාතික සම්මන්ත්‍රණ පැවැත්වීම | 1 |
| සත්කාරක / සම සත්කාරක ජාත්‍යන්තර / කලාපීය සම්මන්ත්‍රණ | 3 |
| කලාපීය ආරක්ෂක කතිකාවන් පැවැත්වීම | 1 |
| පාර්ශවකරුවන්ගේ සාකච්ඡා / උපදේශනයන් සඳහා පහසුකම් සැලසීම / සත්කාරක | 12 |
| වට මේස සාකච්ජා සඳහා පහසුකම් සැලසීම | 12 |
| මහජන දේශන | 12 |
| පුවත් ලිපි සැකසීම (ආරක්ෂක කාර්තුමය) | 4 |
| ජාත්‍යන්තර පර්යේෂණ සේවකයින් බඳවා ගැනීම | 2 |
| ජාත්‍යන්තර පර්යේෂණ පුහුණු සේවකයින් බඳවා ගැනීම | 4 |

17.6 වගුව: ඉදිරි වැඩසටහන්

# 18. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම

## 18.1 සමාලෝචනය

සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම ජාතික වැදගත්කමකින් යුක්ත වන්නාවූත්, ජාතික ආර්ථිකය නොකඩවා පවත්වා ගෙන යා හැකි වූත්, වැදගත් ස්ථානයන්ට ආරක්ෂාව ලබාදිය හැකි වන පරිදි රජයට අයත් සීමිත සමාගමක් ලෙස ආරක්ෂක නිලධාරීන් යටතේ පිහිටුවා ඇත. මෙම සමාගම ප්‍රථමයෙන් ප්‍රමුඛ ආරක්ෂක ලංකා සමාගම ලෙස 2006.10.26 වන දින සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේ සංස්ථාපනය කර ඇති අතර, පසුව 2007.02.23 වන දින එහි නම රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත. ''රැක්මට මුල්තැන'' යන්න මෙහි අදහස වේ.

ශ්‍රී ලංකා ද්වීපයේ ඒකීය භාවය සහ භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම දිවි හිමියෙන් කැප වූ ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයේ විශ්‍රාමික සහ නීත්‍යනුකූලව ඉවත්වූ රණවිරුවන් තවදුරටත් ජාතික මෙහෙවර උදෙසා තම අභිමානය රැකෙන පරිදි සේවයේ යෙදවීම සහ ඔවුන්ගේ ශ්‍රමය සූරා නොගෙන ආර්ථිකය සංවර්ධනය කිරීමේ අභිප්‍රායෙන් මෙම ආයතනය පිහිටුවන ලදී. දිවයිනේ සියලුම ප්‍රදේශ ආවරණය කරමින් රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආර්ථික මර්මස්ථාන විශාල ප්‍රමාණයක් සඳහා අභිමානවත් සේවාවක් ලබා දීමත් සේවය සඳහා යොදවනු ලබන සියලුම දෙනා සන්නද්ධ හමුදා සහ පොලීසියේ විශ්‍රාම ලැබූ අයවලුන් වීමත් එම නිසා විනයානුකූලත්වය, කාර්යක්ෂමතාවය, කැප කිරීමේ හැකියාව මත අභිමානවත් ආරක්ෂක සේවාවක් ලබා දීම මෙම සමාගමේ මූලික අරමුණ වේ. තවදුරටත් ආයතනය මඟින් සැපයෙන සේවාවන් පුළුල් කරමින් රක්නා ආරක්ෂක ලංකා සමුද්‍රිය ආරක්ෂක අංශය 2011 මාර්තු මස 22 ස්ථාපනය කරන ලදී. මේ අනුව ඉන්දියන් සාගරයේ යාත්‍රා කරනු ලබන විදෙස් වෙළඳ නෞකා සඳහා ආරක්ෂාව සපයා දෙමින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට හැකිවී ඇති අතර ඒ තුලින් ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වී ඇත.

➢ රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ව්‍යුහය

- ගොඩබිම් ආරක්ෂක අංශය - ආයතන වෙත ආරක්ෂක සේවාවන් සැපයීම.
- සමුද්‍රී ආරක්ෂක අංශය - වෙළඳ නාවික කටයුතු සඳහා ආරක්ෂක සේවාවන් සැපයීම.
- කේටරින් සේවා අංශය

### දැක්ම

විවිධාකාර සම්බන්ධතාවයන් ඇති සහ උපායමාර්ගික වැදගත්කමක් ඇති රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන ආරක්ෂා කිරීම සඳහා සෑම අංශයකින්ම කැපී පෙනෙන වෙළඳ සහ කර්මාන්ත ආරක්ෂක සේවයක් ස්ථාපිත කිරීම.

### මෙහෙවර

උපාය මාර්ගිකව වැදගත්කමක් ඇති රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන ආරක්ෂා කිරීමේ කර්තව්‍යයට උර දීමෙන්, සහ එමගින් ආර්ථික මර්මස්ථාන සඳහා එම ස්ථාන වලට ආරක්ෂාව සැපයීමෙන් ජාතික ආර්ථිකයේ ප්‍රගතියට දායක වීම.

### අරමුණු

- ජාතික සංවර්ධනයේ ක්‍රියාවලියට දායක වීම.
- ජාතික ව්‍යසන අවස්ථාවකදී උපකාර ලබාදීම.
- විරැකියාව විසදීම සඳහා රජයට සහය ලබාදීම.
- සම්ප්‍රදායික ගොඩබිම් මෙහෙයුම් ප්‍රචාරනය කිරීම තුලින් නව සේවා ලාභීන් ලබා ගැනීම.
- සන්නද්ධ සේවා වල පසුබිම සහිත මානව සම්පත් සඳහා පමණක් ගැලපෙන ව්‍යාපෘති ප්‍රගුණ කිරීමෙන් ඔබ්බටයාම තුලින් එවන් අයගේ පවුල්වල සාමාජිකයන්ටත් පොදු මහජනතාවටත් අවස්ථාව ලැබෙන සේ එවන් උපකාර කිරීම් කෙරෙහි අවධානය ලක්කිරීම.
- සන්නද්ධ හමුදා සහ පොලිස් සේවාවේ සේවා මුක්ත මෙන්ම විශ්‍රාම ගිය නිලධාරී සහ නිලධාරිනියන් වෙනුවෙන් රජය අපේක්ෂා කරන සුභ සාධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සහාය වීම.
- විශ්‍රාම ගිය නිලධාරී සහ නිලධාරිනියන් වෙනුවෙන් රජය අපේක්ෂා කරන සුභ සාධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සහාය වීම.
- ''ආරක්ෂක සේවා'' සැපයීමේ යෙදී සිටීමෙන් ආරක්ෂක සහ මහජන ආරක්ෂාව පිළිබඳ නිලධාරීන්ට රටතුල නීතිය සහ සාමය පවත්වා ගැනීම පෞද්ගලික අංශයේ නිලධාරී සහ නිලධාරිනියන්ගේ සේවා ප්‍රමිතීන් "උසස් ප්‍රමිතිගත කිරීම" සඳහා සහාය වීම.
- රක්නා සමාගමේ සේවකයින්ට පමණක් නොව බාහිර සේවාලාභීන් සඳහාද ගැලපෙන තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධ සේවාස්ථ පුහුණු වීමේ අවස්ථා වැඩිදියුණු කිරීම.
- සමාජ සුභ සාධන ක්‍රියාදාමයන් හඳුන්වා දීම.

## 18.2 2018 වර්ෂයේ කාර්යසාධනය

➢ අධ්‍යක්ෂ මණ්ඩලය

**නාලක කලුවැව මහතා**
සභාපති සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
ජනාධිපති අතිරේක ලේකම්
ජනාධිපති ලේකම් කාර්යාලය

**ආර්. පී. ආර්. රාජපක්ෂ මහතා**
අධ්‍යක්ෂ සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු)
ආරක්ෂක නිලධාරීන්

**බී. ඒ. ටී. රුද්‍රිගෝ මහතා**
අධ්‍යක්ෂ සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
අනුගාරක කාර්යාලය (Comptroller General's Office)
මුදල් නිලධාරීන්

ප්‍රධාන විධායක නිලධාරී **රියර් අද්මිරාල් ඩී.එම්.එස්. දිසානායක** RWP RSP VSV USP ndu ADIDSS hdmc MMS Msc (MS&S)

➢ සේවක සංඛ්‍යාව

සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සියලුම සේවකයින් වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අතර වයස අවුරුදු 60 දක්වා වාර්ෂිකව සේවය දීර්ඝ කරනු ලබයි.

මෙහිදී අනුමත සේවක සංඛ්‍යාවක් නොමැති අතර ආරක්ෂක සේවාව සැපයීම ගිවිසුම් ගතවන ආයතනයන් සඳහා එම ගිවිසුම් ප්‍රකාරව සැපයිය යුතු ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව අනුව ආයතනයේ ආරක්ෂක නිලධාරී සංඛ්‍යාව තීරණය වේ. තවද, මෙම ආරක්ෂක නිලධාරීන්ගේ හෝ කාර්ය මණ්ඩලය ස්ථාන මාරුවීම සිදු නොවන අතර අප සමාගම තුල පමණක් මාරුවීම් සිදුකරනු ලබයි.

ඒ අනුව 2018.12.31 දිනට සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අ. | සේවයේ නියුතු | | |
| | කණිෂ්ට ආරක්ෂක නිලධාරීන් | 492 | |
| | කාන්තා ආරක්ෂක නිලධාරීන් | 100 | |
| | සංචාරක ආරක්ෂක නිලධාරීන් | 07 | |
| | ප්‍රධාන ආරක්ෂක නිලධාරීන් | 08 | |
| | ස්ථාන භාර ආරක්ෂක නිලධාරීන් | 99 | |
| | ලියාපදිංචි සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් | 06 | 712 |
| | කාර්යාල කාර්ය මණ්ඩලය | 77 | |
| | කොට්ඨාස කලමණාකරුවන් | 5 | 82 |
| | | | 794 |
| ආ. | ලියාපදිංචි සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් | | 530 |

## ➢ ගොඩබිම් මෙහෙයුම් අංශය

ගොඩබිම් මෙහෙයුම් අංශය යටතේ රාජ්‍ය ආයතන වලට සහ පෞද්ගලික ආයතන වලට ආරක්ෂක සේවා සැපයීම සිදු කරන අතර 2018.12.31 දිනට පහත සඳහන් ආයතන වෙත ආරක්ෂක සේවා සපයා ඇත.

**ආයතනයේ නම**

1 මිල්කෝ ආයතනය
2 බ්‍රැන්ඩික්ස් ආයතනය
3 පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය
4 ග්‍රහලෝකාගාරය (තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)
5 ශ්‍රී ලංකා රේගුව
6 ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
7 ස්වධීන රූපවාහිනී සේවය
8 සතුට බිල්ඩර්ස් පුද්ගලික ආයතනය
9 ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
10 සී නොර් ආයතනය
11 රුහුණු විශ්ව විද්‍යාලය
12 ලංකා විදුලිබල මණ්ඩලය
13 ඇමති නිල නිවස - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
14 ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය
15 රජයේ කර්මාන්ත ශාලාව
16 ශ්‍රී ලංකන් එයාර් ලයින් කටුනායක
17 ලංකා වානේ සංස්ථාව
18 සමාගම් රෙජිස්ටාර් කාර්යාලය
19 මැලිබන් ආයතනය
20 සමුද්‍රිය පරිසර ආරක්ෂක අධිකාරිය
21 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය
22 පොල් වගා කිරීමේ මණ්ඩලය
23 සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම
24 මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
25 ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
26 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
27 රිජිට් ටයර් සමාගම
28 පොල් පර්යේෂණ මධ්‍යස්ථානය
29 ශ්‍රී ලංකා පදනම් ආයතනය
30 ජාතික රක්ෂණ භාර අරමුදල
31 ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - තිස්සමහාරාමය
32 පරමාණු ශක්ති අධිකාරිය
33 ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
34 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය
35 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය
36 මැරන්ගෝනි ටයර් ඉන්ඩස්ට්‍රිස් පුද්ගලික සමාගම
37 ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
38 දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව
39 සංචාරක සංවර්ධන අධිකාරිය
40 ලංකා රෝහල
41 හවුස් ඔෆ් ෆැෂන් ආයතනය
42 මුම්ටාස් මහල් ගොඩනැගිල්ල
43 ලිට්රෝ ගෑස් සමාගම
44 වැලිබල් ෆිනෑන්ස් සමාගම
45 නිලේකා ජුවලර්ස්
46 ජාතික රූපවාහිනී සංස්ථාව
47 මැලිබන් කිරි හා කෘෂි නිෂ්පාදන සමාගම - කැකිරාව

ඉහත ඇතුලත් නොවූ 2019.01.01 දිනට ආරක්ෂක සේවා සැපයීමට නියමිත ආයතන.

| ආයතනය | ආරක්ෂක නිලධාරී සංඛ්‍යාව |
|---|---|
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 161 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 12 |

## ➢ ගොඩබිම් මෙහෙයුම් අංශයේ භෞතික ප්‍රගතිය

| මාසය | ඉලක්කගත ආරක්ෂක නිලධාරී සංඛ්‍යාව | සේවයේ යෙදුණු ආරක්ෂක නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|
| 2018 ජනවාරි | 900 | 921 |
| 2018 පෙබරවාරි | 900 | 932 |
| 2018 මාර්තු | 900 | 872 |
| 2018 අප්‍රේල් | 950 | 845 |
| 2018 මැයි | 950 | 845 |
| 2018 ජුනි | 950 | 838 |
| 2018 ජුලි | 1000 | 876 |
| 2018 අගෝස්තු | 1000 | 689 |
| 2018 සැප්තැම්බර් | 1000 | 715 |
| 2018 ඔක්තොම්බර් | 1050 | 689 |
| 2018 නොවැම්බර් | 1050 | 719 |
| 2018 දෙසැම්බර් | 1050 | 712 |

18.1 වගුව : ආරක්ෂක නිලධාරී

| මාසය | ඉලක්කගත මුරවාර සංඛ්‍යාව | ඉටුකරන ලද සත්‍ය මුරවාර |
|---|---|---|
| 2018 ජනවාරි | 27000 | 28081 |
| 2018 පෙබරවාරි | 27000 | 27289 |
| 2018 මාර්තු | 27000 | 30712 |
| 2018 අප්‍රේල් | 28500 | 26644 |
| 2018 මැයි | 28500 | 28650 |
| 2018 ජුනි | 28500 | 27480 |
| 2018 ජුලි | 30000 | 28922 |
| 2018 අගෝස්තු | 30000 | 28576 |
| 2018 සැප්තැම්බර් | 30000 | 23574 |
| 2018 ඔක්තොම්බර් | 31500 | 25581 |
| 2018 නොවැම්බර් | 31500 | 23960 |
| 2018 දෙසැම්බර් | 31500 | 24282 |

18.2 වගුව : මාසික මුරවාර (Shifts)

## ➢ සමුද්‍ර මෙහෙයුම් අංශය

| මාසය | ඉලක්ක | | සත්‍ය | |
|---|---|---|---|---|
| | අවි සහිත | අවි රහිත | අවි සහිත | අවි රහිත |
| 2018 ජනවාරි | 24 | 445 | 12 | 158 |
| 2018 පෙබරවාරි | 24 | 495 | 12 | 158 |
| 2018 මාර්තු | 24 | 495 | 5 | 172 |
| 2018 අප්‍රේල් | 24 | 495 | 18 | 181 |
| 2018 මැයි | 24 | 495 | 17 | 239 |
| 2018 ජුනි | 24 | 495 | 16 | 223 |
| 2018 ජුලි | 24 | 567 | 9 | 216 |
| 2018 අගෝස්තු | 24 | 567 | 11 | 213 |
| 2018 සැප්තැම්බර් | 24 | 567 | 9 | 228 |
| 2018 ඔක්තොම්බර් | 26 | 639 | 8 | 233 |
| 2018 නොවැම්බර් | 26 | 639 | 7 | 225 |
| 2018 දෙසැම්බර් | 26 | 639 | 11 | 214 |

18.3 වගුව : සමුද්‍ර මෙහෙයුම් අංශය යටතේ 2018 වර්ෂය සඳහා මුහුදු ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදවීම.

| මාසය | සමාගම් ගණන | ලියාපදිංචි ආරක්ෂක නිලධාරීන් |
|---|---|---|
| **2018 ජනවාරි** | 11 | 465 |
| **2018 පෙබරවාරි** | 11 | 463 |
| **2018 මාර්තු** | 11 | 460 |
| **2018 අප්‍රේල්** | 11 | 485 |
| **2018 මැයි** | 11 | 526 |
| **2018 ජූනි** | 11 | 539 |
| **2018 ජූලි** | 08 | 537 |
| **2018 අගෝස්තු** | 08 | 533 |
| **2018 සැප්තැම්බර්** | 08 | 532 |
| **2018 ඔක්තෝම්බර්** | 08 | 532 |
| **2018 නොවැම්බර්** | 08 | 531 |
| **2018 දෙසැම්බර්** | 08 | 530 |


18.4 වගුව : ගිවිසුම්ගතවී ඇති මුහුදු ආරක්ෂක සමාගම් සහ ලියාපදිංචි වී ඇති සමුද්‍ර ආරක්ෂක නිලධාරීන්

| මාසය | ඉලක්කගත ලාභය | සත්‍ය ලාභය |
|---|---|---|
| **2018 ජනවාරි** | 0.50 | 0.99 |
| **2018 පෙබරවාරි** | 0.50 | 1.00 |
| **2018 මාර්තු** | 0.50 | 0.92 |
| **2018 අප්‍රේල්** | 0.50 | 0.74 |
| **2018 මැයි** | 0.50 | 0.88 |
| **2018 ජූනි** | 0.50 | 0.52 |
| **2018 ජූලි** | 0.50 | 0.60 |
| **2018 අගෝස්තු** | 0.50 | 0.95 |
| **2018 සැප්තැම්බර්** | 0.50 | 0.81 |
| **2018 ඔක්තෝම්බර්** | 0.50 | 0.50 |
| **2018 නොවැම්බර්** | 0.50 | 0.91 |
| **2018 දෙසැම්බර්** | 0.50 | 1.00 |


18.5 වගුව : කේටරින් සේවාව යටතේ මූල්‍ය ප්‍රගතිය - ලාභය (රු. මිලියන)

| මාසය | ඉලක්ක | | සත්‍ය | |
|---|---|---|---|---|
| | ආදායම | බදුවලට පෙර ලාභය | ආදායම | බදුවලට පෙර ලාභය |
| **2018 ජනවාරි** | 0.98 | 3.14 | 65.76 | 6.85 |
| **2018 පෙබරවාරි** | 60.99 | 3.05 | 69.21 | 10.08 |
| **2018 මාර්තු** | 60.99 | 3.05 | 67.74 | 8.05 |
| **2018 අප්‍රේල්** | 63.12 | (5.77) | 64.95 | 7.65 |
| **2018 මැයි** | 63.13 | (5.76) | 74.41 | 17.71 |
| **2018 ජූනි** | 63.13 | (5.77) | 75.17 | 7.98 |
| **2018 ජූලි** | 69.28 | 7.92 | 69.27 | 2.40 |
| **2018 අගෝස්තු** | 69.29 | 7.92 | 85.64 | 18.46 |
| **2018 සැප්තැම්බර්** | 69.29 | 7.92 | 63.9 | (5.23) |
| **2018 ඔක්තෝම්බර්** | 79.77 | 14.47 | 70.16 | 9.7 |
| **2018 නොවැම්බර්** | 79.78 | 14.48 | 69.99 | 18.5 |
| **2018 දෙසැම්බර්** | 79.78 | 14.48 | 82.42 | 21.7 |

18.6 වගුව : ආයතනයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - (රුපියල් මිලියන)




18.1 ප්‍රස්ථාරය : අයවැයගත ආදායම හා සත්‍ය ආදායම




18.2 ප්‍රස්ථාරය : අයවැයගත බදු පෙර ලාභය හා සත්‍ය බදු පෙර ලාභය

➢ අදාල කාලය තුළ පැන නගින ලද ගැටළු සහ අභියෝග.

- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ රජයේ සමාගම්, රාජ්‍ය සංස්ථා සඳහා ආරක්ෂක සේවා සැපයීම පිළිබඳ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2010.08.12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 445 නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.
- ගුණාත්මක සේවයක් ලබා දීමට සාපේක්ෂව මිල ගණන් ඉහළ වන බැවින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අවම මිල ගණන් යටතේ ප්‍රසම්දපාදන කටයුතු කිරීම හේතුවෙන් ආරක්ෂක සේවා අහිමි වීම.
- බස්නාහිර පළාත තුළ ඇති ආයතනවලට ආරක්ෂක සේවා සැපයීමේදී ආරක්ෂක නිලධාරීන්ගේ හිඟතාවය සහ බඳවා ගැනීමේ අපහසුතාවය.
- සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් ස්වාධීනව විවිධ සමුද්‍ර ආරක්ෂක සමාගම් සමඟ නැව්ගත වීම.
- සමුද්‍රිය අධි අවදානම් කලාපය කුඩාවීම හේතුවෙන් සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදවීම අඩුවීම.
- වර්තමානයේ බොහෝ වෙළඳ නැව් සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් රහිතව යාත්‍රා කිරීමට පෙළඹී සිටීම.
- සමුද්‍ර ආරක්ෂක සමාගම් අතර තරඟකාරිත්වය මත මිල ගණන් අඩුවීම.
- විදේශීය රටවලින් පැමිණි සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් අඩු මිල ගණන් යටතේ මුහුදු ආරක්ෂක සේවයේ යෙදීම.
- විදේශීය සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් ශ්‍රී ලංකාව හරහා නැව්ගත වීම.

## 18.3 අනාගත අපේක්ෂා

- සෑම කාර්තුවකම ආරක්ෂක කටයුතු සඳහා ආරක්ෂක නිලධාරීන් 150 බැගින් බඳවා ගැනීම මඟින් ආදායම වැඩි කර ගැනීම.
- විශ්ව විද්‍යාල ඇතුළු අධ්‍යාපන ආයතන සඳහා ආරක්ෂක සේවා සැපයීම.
- ලංකා බැංකුව සහ මහජන බැංකුව වැනි විශාල ප්‍රමාණයේ ආයතන (1000 කට වැඩි ආරක්ෂක නිලධාරීන් අවශ්‍ය වන) වෙත ආරක්ෂක සේවා සැපයීම.
- ආරක්ෂක නිලධාරීන්ගේ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිකර ගැනීම.
- දැනට ආරක්ෂක සේවා සපයන ආයතන තවදුරටත් රඳවා ගැනීම සඳහා කටයුතු කිරීම.
- වැඩි මිල ගණන් යටතේ පෞද්ගලික අංශය වෙත සහ තරු පංති හෝටල් සඳහා ආරක්ෂක සේවා සැපයීම.
- මුහුදු ආරක්ෂක නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදවීම සඳහා පෞද්ගලික මුහුදු ආරක්ෂක සමාගම් සමඟ ගිවිසුම් ගත වීම.
- වෙබ් අඩවිය වැඩිදියුණු කර මුහුදු ආරක්ෂක කටයුතු පිළිබඳ ජාත්‍යන්තරව පුළුල් ප්‍රචාරයක් ලබා දීම.
- කේටරින් සේවාවේ ආදායම වැඩි කර ගැනීම සඳහා නව ආහාර වට්ටෝරු හඳුන්වා දීම.
- කේටරින් අංශය වෙත පාරිභෝගික ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා පියවර ගැනීම.

# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වූ ආයතනයන්හි ප්‍රගතිය

# 19. ජාතික ශිෂ්‍යභට බලකාය

## 19.1 සමාලෝචනය

1881 වර්ෂයේදී කොළඹ රාජකීය විද්‍යාලයෙහි එවකට විදුහල්පතිව සිටි ජෝන් බී කල් නැමැති විදුහල්පති තුමන්ගේ සරඹ කිරීම තුලින් විනය වර්ධනය යන සංකල්පය මත කුඩා කණ්ඩායමකින් ආරම්භ කරන ලද ශිෂ්‍යභට බලකාය වසර 107ක් පුරා විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් 1988 අප්‍රේල් මස 29 වන දින ජාතික ශිෂ්‍යභට බලකාය නමින් 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා හා පරිපූරක හමුදාව පනතට අනුව ප්‍රතිසංවිධානය විය.

මෙසේ ප්‍රතිසංවිධානය වූ ශිෂ්‍යභට බලකායට පසු කාලීනව යුධ අංශයට අමතරව, ගුවන්, නාවික හා පොලිස් ශිෂ්‍යභට අංශයන්ද එක් විය. මිනිස් බල උපයෝගීතා පනත අනුව ශිෂ්‍යභට කණ්ඩායමකට බැඳී කඳවුරුගත වීමට අවශ්‍ය වයස් සීමාව අවුරුදු 16 - 20 ත් අතර පරාසයක් වුවද ශිෂ්‍යභට තූර්යවාදන අංශ වල අවශ්‍යතාවය පරිදි වයස් පරාසය 14 - 20 ත් ලෙස සංශෝධනය විය.

ප්‍රධාන පාසල් සඳහා පමණක් ලබා දී තිබූ ශිෂ්‍යභට කණ්ඩායම් පිහිටුවීමේ අනුමැතිය 2015 වර්ෂයෙන් පසු තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය මත වත්මන් රජය පියවර රැසක්ම ගන්නා ලද අතර, ජාතික ශිෂ්‍යභට බලකාය ආරක්ෂක රාජ්‍ය නිලධාරීන් යටතට ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි දිවයින පුරා ජාතික ශිෂ්‍යභට බලකායේ බලඇණි 38 ක් ස්ථාපිත කර ඇත. වාර්ෂිකව බාලක බාලිකා බණ්ඩ 4,397 ක් පුහුණු කටයුතු සිදු කරනු ලබයි. ඒ හරහා ශිෂ්‍යභටයින් 109,925 ක් ශිෂ්‍යභට බලකායේ නිලධාරීන් විසින් පුහුණු කරනු ලබයි.

### දැක්ම

පැමිණෙන සෑම අභියෝගයකටම ඉතා හොඳින් මුහුණු දිය හැකි ක්‍රියාශීලී විනය ගරුක බවින් යුතු විශිෂ්ට නායකත්ව ගුණාංග වලින් හෙබි තරුණ පරපුරක් බිහි කිරීම.

### මෙහෙවර

සැලසුම් කරන ලද පුහුණු පාඨමාලාවක් තුලින් ශිෂ්‍යභටයින් තුළ චරිතවත් බව, චිත්ත ධෛර්යය, ක්‍රීඩාශීලි බව, ආත්ම විශ්වාසය, ස්වයං විනය, ප්‍රජා හැඟිම්, වික්‍රමාන්විත හැඟිම්, වගකීම් දැරීම්, සුහදශීලී බව යන ගුණාංග වර්ධනය කර ජාතියේ සේවය සඳහා යෙදවිය හැකි ඕනෑම ජීවන පැවැත්මකට නායකත්වය දිය හැකි සාරධර්ම වලින් පිරිපුන් තරුණ පරපුරක් බිහි කිරීම.

### අරමුණු

ජාතික ශිෂ්‍යභට බලකායේ අරමුණු පහත පරිදි වේ.

- නායකත්වය, නිර්මාණශීලිත්වය හා සාමූහික ක්‍රියාකාරකම් සඳහා ධෛර්යමත් කිරීම.
- තාරුණ්‍යයේ ප්‍රතිරූපය වර්ධනය කිරීම.
- අනාගත නායකත්වය සඳහා සාමූහික ක්‍රියාකාරකම් වල මූලික සිද්ධාන්තය හා පුද්ගලයන් අතර, අනෙකුත් කුසලතා වර්ධනය කිරීම.
- තරුණයන් හට ප්‍රජා සේවාවන් හා වගකීම් දැරීමේ හැකියාව වර්ධනය කිරීමෙහි වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ශාරීරික මානසික හා සාමාජීය වශයෙන් වර්ධනය වීමට අවස්ථාව ලබා දීම.
- තිරසාර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීම.

ශිෂ්‍යභට බලකාය තුළින් පුහුණුව ලබා සමාජගත වන දරුවන් තුල ගොඩනැංවෙන මනා ශික්ෂණය හා නායකත්වයෙහි අගය හොඳින් දන්නා තම ළමා කාලය ශිෂ්‍යභටයෙකු ලෙස ක්‍රියා කළ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්, ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවර රුවන් විජේවර්ධන මැතිතුමන්ට ශිෂ්‍යභට බලකායේ කටයුතු වඩාත් පුළුල් කිරීමට ලබා දුන් උපදෙස් අනුව 2018 වර්ෂයේදී බලකාය වෙතින් විශාල මෙහෙවරක් කරනු ලැබීය.

2016 වර්ෂයේදී නැවත ආරම්භ කරන ලද කණිෂ්ට ශිෂ්‍යභට කටයුතු පළමු පියවර ලෙස ත්‍රිකුණාමලය හා මොණරාගල දිස්ත්‍රික්ක වල ආරම්භ වූ අතර, දැනට සියලු පළාත් ආවරණය වන ලෙස විශාල වශයෙන් පාසල් වල ආරම්භ කර ඇත. මේ වන විට පළාත් මට්ටමේ කණිෂ්ට ශිෂ්‍යභට කඳවුරු 02 ක් පවත්වා අවසන් කර ඇත.

## 19.2 2018 වර්ෂයේ කාර්යසාධනය

- දිවයින පුරා කණිෂ්ට ශිෂ්‍යභට කටයුතු ආරම්භ කර ප්‍රචලිත කිරීම.
- කඳවුරුගතව පුහුණුව ලබන ශිෂ්‍යභට සංඛ්‍යාව 47000ක් දක්වා වැඩි කිරීම.
- සෑම පාසලකම ශිෂ්‍යභට බණ්ඩ ආරම්භ කිරීම.

ඊට අමතරව වාර්ෂිකව පහත සඳහන් කඳවුරු පවත්වන ලදී.

➢ රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වෙන ඇගයීම් කඳවුරු
- යුධ බාලක ඇගයීම් කඳවුරු
- යුධ බාලිකා ඇගයීම් කඳවුරු
- නාවික, ගුවන්, පොලිස් බාලක බාලිකා ඇගයීම් කඳවුරු
- තූර්ය වාදන පෙරදිග, අපරදිග, බාලක බාලිකා කඳවුරු

➢ පාසල් මට්ටමේ පුහුණු කඳවුරු

➢ බලඇණි මට්ටමේ පුහුණුවීම්
- එක් දින කඳවුරු
- දෙදින කඳවුරු

➢ පළාත් මට්ටමේ පුහුණුවීම්
- එක් දින කඳවුරු
- දෙදින කඳවුරු

➢ නිලධාරී පුහුණු කඳවුරු හා පාඨමාලා
- ආධුනික නිලධාරී පුහුණු පාඨමාලාව
- නිලධාරී පුහුණු පාඨමාලාව
- බණ්ඩභාර නිලධාරී පාඨමාලාව
- තූර්යවාදන නිලධාරී පුහුණු පාඨමාලාව


➢ ජාතික මට්ටමේ කඳවුරු
- ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලක ශූරතා හර්මන් ලෝස් කුසලාන කඳවුර
- ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලිකා ශූරතා ද සොයිසා කුසලාන කඳවුර
- සමස්ත ලංකා පෙරදිග තූර්යවාදන බාලක කඳවුර
- සමස්ත ලංකා පෙරදිග තූර්යවාදන බාලිකා කඳවුර
- සමස්ත ලංකා අපරදිග තූර්යවාදන බාලක කඳවුර
- සමස්ත ලංකා අපරදිග තූර්යවාදන බාලිකා කඳවුර
- කණිෂ්ට ශිෂ්‍යභට ශූරතා කඳවුර
- ජාතික නිදහස් දින උත්සව පෙළපාලිය

➢ විදේශ සංචාර
- විදේශ රටවල ආරාධනාවෙන් එම රටවල හමුදා උත්සව, ජනරජ දින උත්සව හා නිදහස් දින උත්සව සඳහා සහභාගි වීම.

➢ විශේෂ කඳවුරු
- ශිෂ්‍යභට උසස් පාඨමාලාව
- කණිෂ්ට නායකත්ව පාඨමාලාව
- තූර්යවාදන කොනොනි පාඨමාලාව

| ශිෂ්‍යභට බණ්ඩ ව්‍යාපෘතිය | කණිෂ්ට | ජ්‍යෙෂ්ඨ | එකතුව |
|---|---|---|---|
| 2016 | 32 | 1893 | 1925 |
| 2017 | 978 | 2326 | 3034 |
| 2018 | 1437 | 2960 | 4397 |

19.1 වගුව : ශිෂ්‍යභට බණ්ඩ ව්‍යාපෘතිය





19.1 ප්‍රස්ථාරය : ශිෂ්‍යභට බළඇණි ව්‍යාප්තිය

➢ කැඳවුරු ගත වූ ශිෂ්‍යභට සංඛ්‍යාව

| ශිෂ්‍යභට බළඇණි ව්‍යාපෘතිය | කණිෂ්ට | ජ්‍යෙෂ්ඨ | එකතුව |
|---|---|---|---|
| **2016** | 400 | 29726 | 30126 |
| **2017** | 7150 | 32640 | 39790 |
| **2018** | 7878 | 30065 | 37943 |

19.2 වගුව : ශිෂ්‍යභට බළඇණි ව්‍යාප්තිය





19.2 ප්‍රස්ථාරය : ශිෂ්‍යභට බළඇණි ව්‍යාප්තිය

| විස්තරය | ශිෂ්‍ය භටයින් සංඛ්‍යාව |
|---|---|
| අපේක්ෂිත | 38090 |
| 2018.12.31 දින වන විට ඇගයීම් කැඳවුරු සඳහා සහභාගී වූ ශිෂ්‍යභට සංඛ්‍යාව | 37943 (99.61%) |

➢ නව ශිෂ්‍යභට බළඇණි ආරම්භ කිරීම


| ශිෂ්‍යභට බළඇණි ව්‍යාපෘතිය | කණිෂ්ට | ජ්‍යෙෂ්ඨ | එකතුව |
|---|---|---|---|
| **2016** | 32 | 195 | 227 |
| **2017** | 978 | 433 | 1240 |
| **2018** | 459 | 836 | 1295 |

19.3 වගුව : ආරම්භ කරන ලද ශිෂ්‍යභට බළඇණි





19.3 ප්‍රස්ථාරය : ආරම්භ කරන ලද ශිෂ්‍යභට බළඇණි

➢ කණිෂ්ට ශිෂ්‍යභට පුහුණුව 2018 වසරේ සිට ආරම්භ කිරීම.




| විස්තරය | බළඇණි සංඛ්‍යාව |
|---|---|
| අපේක්ෂිත | 500 |
| 2018.12.31 දිනට ස්ථාපිත කර ඇති | 458 (91.6%) |


➢ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට පුහුණුව 2018




| විස්තරය | බළඇණි සංඛ්‍යාව |
|---|---|
| අපේක්ෂිත | 500 |
| 2018.12.31 දිනට ස්ථාපිත කර ඇති | 410 (82%) |

## ➢ ජාතික ශිෂ්‍යභට බලකායේ මූල්‍ය ප්‍රගතිය

2016 වසරේ ජාතික ශිෂ්‍යභට බලකාය රු. මිලියන 343.21 ක පුනරාවර්තන වියදමක් දරන ලද අතර ප්‍රාග්ධන වියදම රු. මිලියන 28.87 ක් විය. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි සෑම ජාතික පාසලකම, මධ්‍ය මහා විද්‍යාලයකම සහ මහා විද්‍යාලයකම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට ඛණ්ඩ ව්‍යාප්ත කිරීමේ ජාතික ශිෂ්‍යභට බලකායේ ප්‍රාග්ධන අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අයවැය ප්‍රතිපාදන යොදාගන්නා ලදී. මූලික ප්‍රතිපාදන වලට අමතරව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පය පරිදි කණිෂ්ට ශිෂ්‍යභට ඛණ්ඩ ආරම්භ කිරීම සඳහාද රු. මිලියන 40 ක් වෙන්කරන ලදී.





19.4 ප්‍රස්ථාර : 2015, 2016 අයවැය ප්‍රතිපාදන

| වැය ශීර්ෂය | 2018 සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන (රු. මිලියන) | 2018.12.31 දිනට වැයකර ඇති මුදල | |
|---|---|---|---|
| | | වියදම (රු. මිලි.) | % |
| පුනරාවර්තන | 457.10 | 417.21 | 91.27% |
| ප්‍රාග්ධන | 35.50 | 17.72 | 49.93% |
| එකතුව | 492.60 | 434.93 | 88.29% |

19.4 වගුව : මූල්‍ය ප්‍රගතිය 2018


| වැය ශීර්ෂය | | අනුමත ප්‍රතිපාදන (රු. මි.) | වියදම් (රු. මි.) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1003 | කඳවුරු දීමනා | 23.54 | 21.69 | 92.14% |
| 1102 | ශිෂ්‍යභට විදේශ සංචාර | 9.65 | 4.27 | 44.21% |
| 1203 | සලාක හා නිල ඇඳුම් | 138.6 | 133.6 | 96.39% |
| 1204 | වෛද්‍ය පහසුකම් | 0.8 | 0.77 | 96.25% |
| 1205 | වෙනත් සැපයීම් | 3.0 | 1.88 | 62.66% |
| 1401 | ප්‍රවාහන | 56.7 | 52.87 | 93.29% |
| 1409 | වෙනත් සේවා (රජක සේවා, නවාතැන්) | 12.9 | 9.08 | 70.28% |
| එකතුව | | 245.19 | 224.16 | 91.42% |

19.5 වගුව : 2018.12.31 දිනට ශිෂ්‍යභට පුහුණුව සඳහා දරන ලද වියදම් සංයුතිය




19.5 ප්‍රස්ථාර : වියදම් සංයුතිය

## ➢ ජාතික ශිෂ්‍යභට බලකායේ ව්‍යුහය




### • ජාශිබ මූලස්ථානය

ජාතික ශිෂ්‍යභට බලකායේ මූලස්ථානය, අංක 15, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල යන ස්ථානයේ ස්ථාපිත කර ඇති අතර එහි නිලධාරීන් 43 දෙනෙකු, සෙසු නිලයින් 36 දෙනෙකු හා සිවිල් සේවකයින් 41 දෙනෙකු සේවය කරනු ලැබේ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යංශයේ මගපෙන්වීම මත පාලන, භට කාර්ය සම්පාදන කාර්යයන් මත ශිෂ්‍යභට පුහුණුවීම් වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

### • පුහුණු මධ්‍යස්ථානය - රන්ටැඹේ

ජාතික ශිෂ්‍යභට බලකාය සතු එකම පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹේ ස්ථාපිත කර ඇත. එහි නිලධාරීන් 22 දෙනෙකු, සෙසු නිලයින් 47 ක්, සහ සිවිල් සේවකයින් 61 දෙනෙකු සේවය කරනු ලැබේ.

### • පළාත් මූලස්ථාන

සියලුම පළාත් ආවරණය වන පරිදි පළාත් මූලස්ථාන 9 ක් ස්ථාපිත කර ඇති අතර නිලධාරීන් 7 දෙනෙකු සහ සිවිල් සේවකයින් 9 දෙනෙකු සේවය කරනු ලබයි.

### • බලඇණි මූලස්ථාන


මුළු දිවයිනම ආවරණය වන පරිදි බලඇණි 38ක් ස්ථාපිත කර ඇත. ප්‍රධාන පරමාර්ථය වන්නේ පාසල් වල ශිෂ්‍යභට ඛණ්ඩ පුහුණුවීම් කටයුතු සිදු කිරීම වන අතර ඒ මගින් ශිෂ්‍යභටයින් හර්මන්ලෝස් කුසලාන කඳවුර හා ද සොයිසා කුසලාන කඳවුර සඳහා සුදුසුකම් ලැබීමට පුහුණුවීම් කටයුතු සිදු කරනු ලැබේ. නිලධාරීන් 114 දෙනෙකු, සෙසු නිලයින් 323 ක් හා සිවිල් සේවකයින් 55 දෙනෙකු බලඇණි වල රාජකාරී සිදුකරනු ලැබේ.

## ➢ 2018 වසර අවසානයේදී ශිෂ්‍යභට බලකායේ ව්‍යාපෘතිය

ශිෂ්‍යභට බලකායට බැඳී කටයුතු කරන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයින්හට ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය, මාලදිවයින හා නේපාලය යන සාර්ක් රටවල පැවැත්වෙන ජනරජ දින, ජයග්‍රාහි දින, විශේෂ කඳවුරු හා පා ගමන් සඳහා සහභාගී වීමට ආරාධනා ලැබේ. එම සංචාරයන් සඳහා වන සියලු වියදම් ආරක්ෂක රාජ්‍ය නිලධාරීන් වෙතින් දරන අතර, අනෙක් පසට එම රටවල ශිෂ්‍යභටයින්ටද හර්මන්ලෝස් තරඟාවලියට පැමිණ ශ්‍රී ලාංකීය ශිෂ්‍යභටයන්ගේ දැනුම හා අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාව හිමිවී ඇත.

මේ අනුව ශිෂ්‍යභට බලකායට බැඳී පුහුණුව ලද ශිෂ්‍යභටයින් හට මනා විනයක් හා චිත්ත ශක්තියක්, නායකත්ව පුහුණුවක්, ශාරීරික හා මානසික නිරෝගීබවක් හා යහපැවැත්මක්, විවිධ කුසලතාවන් හා සබැඳි නිපුණතාවයක්, දේශීය විදේශීය ශිෂ්‍යභටයන් සමඟ කටයුතු කිරීමේ හැකියාවක් ලැබෙන බැවින් ශ්‍රී ලාංකීය සමාජ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබා දිය හැකි පුරවැසියෙක් බවට පත්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1 ජාශිබ - ගාල්ල
2 ජාශිබ - නුවර
3 ජාශිබ - කොළඹ
4 ජාශිබ - කුරුණෑගල
5 ජාශිබ - අනුරාධපුර
6 ජාශිබ - බදුල්ල
7 ජාශිබ - ගම්පහ
8 ජාශිබ - රත්නපුර
9 ජාශිබ - කෑගල්ල
10 ජාශිබ - තංගල්ල
11 ජාශිබ - පොළොන්නරුව
12 ජාශිබ කළුතර
13 ජාශිබ - මාතලේ
14 ජාශිබ - කුලියාපිටිය
15 ජාශිබ - මොනරාගල
16 ජාශිබ - මාතර
17 ජාශිබ - අම්පාර
18 ජාශිබ - නුවරඑළිය
19 ජාශිබ - පන්නිපිටිය
20 ජාශිබ - යාපනය




21 ජාශිබ - ත්‍රිකුණාමලය
22 ජාශිබ - වව්නියාව
23 ජාශිබ - සෙංකඩගල
24 ජාශිබ - හම්බන්තොට
25 ජාශිබ (ගැ) - වයඹ
26 ජාශිබ (ගැ) - බස්නාහිර
27 ජාශිබ (ගැ) - දකුණ
28 ජාශිබ (ගැ) - මධ්‍යම
29 ජාශිබ (ගැ) - සබරගමුව
30 ජාශිබ (ගැ) - උතුර
31 ජාශිබ (ගැ) - නැගෙනහිර
32 ජාශිබ (ගැ) - උතුරුමැද
33 ජාශිබ (ගැ) - ඌව
34 ජාශිබ - මුලතිව්
35 ජාශිබ - පුත්තලම
36 ජාශිබ - කිලිනොච්චිය
37 ජාශිබ - මන්නාරම
38 ජාශිබ - මඩකලපුව

## 2018 වර්ෂයේ විශේෂ අවස්ථා

### කනිෂ්ඨ ශිෂ්‍යභට නියමු ව්‍යාපෘති බස්නාහිර පළාත් කඳවුර





### කනිෂ්ඨ ශිෂ්‍යභට බාලක බාලිකා ඇගයීම් කඳවුර - 2018





### ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට බාලක බාලිකා ඇගයීම් කඳවුරු - 2018





**සියවස් සැමරුම් හර්මන්ලෝස් කුසලාන කඳවුර - 2018**








**ද සොයිසා කුසලාන කඳවුර - 2018**




**පෙරදිග තූර්යවාදන ඇගයීම් කඳවුර - 2018**





**අපරදිග තූර්යවාදන ඇගයීම් කඳවුර - 2018**





# 20. රණවිරු සේවා අධිකාරිය

## 20.1 සමාලෝචනය

යුධමය ව්‍යසනය හේතු කොට ගෙන විපතට පත් ආබාධිත රණවිරුවන් හා ජිවිත පරිත්‍යාග කළ රණවිරුවන්ගේ පවුල් වල සමාජික සාමාජිකාවන්ගේ ජිවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන 1999 අංක 54 දරණ පනතින් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.

### කාර්යභාරය

(1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතට අනුව)

- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන් සහ පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල හා පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මිය ගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට නිවාස සැපයීම සහ සහාය වීම.
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට වෛද්‍ය පහසුකම් සැපයීම සහ සහායවීම.
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සළසා දීම සහ ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහායවීම.
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණු ඇති ව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම
- අධිකාරියේ කාර්යභාරයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා කටයුතු ක්‍රියාත්මක කිරීම.

## 20.2 2018 වර්ෂයේ කාර්යසාධනය

➢ ආයතනික ප්‍රගතිය

### මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 ( රුපියල් මිලියන ) | | |
|---|---|---|---|
| | වෙන්කරන ලද ප්‍රතිපාදන | කාර්ය සාධනය | ප්‍රගතිය % |
| පුනරාවර්තන වියදම් (A) | 111.06 | 79.15 | 71.26 |
| ප්‍රග්ධන වියදම් (B) = C+D+E+F | 529.98 | 412.78 | 77.88 |
| මුලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරිම ( C ) | 8.00 | - | - |
| ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම ( D ) | 25.50 | 0.98 | 3.80 |
| සංවර්ධන ව්‍යාපෘති ( E ) | 168.65 | 93.74 | 55.67 |
| ක්‍රියාන්විතයේදී ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් පුනරුත්තාපනය කිරිම | 7.60 | 4.49 | 59.08 |
| නිවාස සැපයීම හා එහිලා සහය වීම | 22.20 | 21.50 | 96.84 |
| වෛද්‍ය පහසුකම් සැපයීම හා එහිලා සහයවීම | 8.80 | 3.56 | 40.45 |
| අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව ලබා දීම | 28.66 | 21.32 | 74.38 |
| එලදායි සේවා නියුක්තියක් සුරක්ෂිත කරලීම | 34.60 | 4.38 | 12.66 |
| අධිකාරියේ ක්‍රියාකාරකම් ඉටුකිරිමට අවශ්‍ය වන අනෙකුත් දෑ සහ ක්‍රියාකාරකම් | 66.50 | 38.49 | 57.87 |
| සුභසාධන ව්‍යාපෘති ( 750/-) ( F ) | 327.83 | 318.06 | 97.02 |
| මුළු එකතුව (G = A + B ) | 641.04 | 491.93 | 76.74 |

20.1 වගුව : 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

### භෞතික ප්‍රගතිය

- ක්‍රියාන්විතයේදී ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම.

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති ආබාධිත රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වයන් හේතුවෙන් ඔවුන් මුහුණ පාන අපහසුතා මඟහරවාලීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- ආබාධිත උපකරණ ලබා දීම.
- සනීපාරක්ෂක ආධාර ලබා දීම.
- ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු පැවැත්වීම.

| ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළගාවීම | වාර්ෂික වෙන්කිරීම | වැය කරන ලද මුදල |
| සනීපාරක්ෂක ආධාර - නව | 57 | 57 | 3.45 | 2.55 |
| සනීපාරක්ෂක ආධාර - පැරණි | 30 | 30 | | |
| ආබාධිත උපකරණ ලබා දීම | 400 | 245 | 1.95 | 0.87 |
| ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු | 08 | 08 | 2.20 | 1.07 |

20.2 වගුව : ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්තාපනය



- නිවාස සැපයීම හා සහාය වීම.



ක්‍රියාන්විතයේදී ආබාධිත රණවිරුවන් සඳහා සහ මියගිය හෝ සොයාගත නොහැකි රණවිරුවන්ගේ යැපෙන්නන්ට රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍ය යටතේ නිවාස සැපයීම හා එහිලා සහාය වීම වෙනුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය.
- නිවාස ණය ලබා දීම.
- ඉඩම් ලබා දීම.

| නිවාස සැපයීම සහ සහය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළගාවීම | වාර්ෂික වෙන් කිරිම | වැය කරන ලද මුදල |
| නිවාස ණය ලබා දීම - නව | | 79 | 19.50 | 21.19 |
| නිවාස ණය ලබා දීම - වාරික | | 12 | | |
| විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය - පූර්ණ නිවාස | 488 | 106 | 1.50 | 0.11 |
| විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය - අර්ධ නිවාස | 425 | 1154 | | |
| ඉඩම් කොටස් ලබා දීම - ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් | | 32 | | |
| ඉඩම් කොටස් ලබා දීම - ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිර්දේශ කිරිම | | 22 | | |
| ඔප්පු/ බලපත්‍ර ලබා දීම (නිර්දේශ ඉදිරිපත් කිරිම) | | 211 | | |
| ඉඩම් කච්චේරි සඳහා නාම ලේඛන යොමු කිරිම | | 83 | | |
| ඉඩම් කච්චේරි පැවැත්වීම | | 03 | | |

20.3 වගුව : නිවාස සැපයීම සහ සහය වීම

- වෛද්‍ය පහසුකම් සැපයීම සහ සහාය වීම.

ආබාධිත රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ලඟම ඥාතීන් හා දිවි පිදු, අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යක් ලෙස වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම යන කරුණ සඳහන් කළ හැකිය.

| වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| වෛද්‍ය ආධාර - නව | 80 | 68 | 8.80 | 3.56 |
| වෛද්‍ය ආධාර - පැරණි | 840 | 506 | | |

20.4 වගුව : වෛද්‍ය පහසුකම් සැපයීම

- ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සළසා දීම.



රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාවක් සැලසීම වෙනුවෙන් විවිධ වූ ශිෂ්‍යත්ව රණවිරු සේවා අධිකාරිය මඟින් පිරිනමනු ලබයි. එම ශිෂ්‍යත්ව පහත පරිදි වේ.

- රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය
- අ.පො.ස උ. පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය
- උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර
- මාපිය කැපකරු ශිෂ්‍යත්ව
- කුසලතා ප්‍රවර්ධන ආධාර/ණය

| අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| රණවිරු දූදරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව - නව | 650 | 259 | 17.86 | 14.74 |
| රණවිරු දූදරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව -පැරණි | 1378 | 1037 | | |
| අපොස සා/පෙළ /උපෙළ ශිෂ්‍යත්ව - නව | 450 | 286 | | |
| අපොස සා/පෙළ /උපෙළ ශිෂ්‍යත්ව - පැරණි | 680 | 692 | | |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර - නව | 70 | 100 | | |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර - පැරණි | 240 | 261 | | |
| මා පිය කැපකරු ශිෂ්‍යත්ව ආධාර | 800 | 658 | 4.80 | 5.10 |
| කුසලතා ප්‍රවර්ධන ආධාර | 60 | 25 | 3.00 | 1.18 |
| කුසලතා ප්‍රවර්ධන ණය | 04 | 01 | 2.00 | 0.30 |

20.5 වගුව : අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වන්නන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම.

- ඵලදායි සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහය වීම

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ ඵලදායී සේවානියුක්තිකයන් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම වෙනුවෙන් රණවිරු ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පහත ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

- ස්වයංරැකියා ණය ලබා දීම.
- ස්වයංරැකියා ආධාර ලබා දීම.
- ව්‍යවසාය පුහුණු වැඩමුළු පැවැත්වීම

ඒ අනුව 2018 වසරේ ප්‍රගතිය පහත පරිදි වේ.

| ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| ස්වයං රැකියා ණය ලබා දීම | 100 | 15 | 20.00 | 4.12 |
| වාරික ගෙවීම | | 11 | | |
| ස්වයං රැකියා ආධාර ලබා දීම | 50 | 05 | 2.50 | 0.25 |
| ව්‍යාවසාය පුහුණු වැඩමුළු පැවැත්වීම | 45 | 01 | 4.06 | 0.01 |

20.6 වගුව : ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීම

අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේදී පහත සඳහන් ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන
- රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ
- රණවිරු සංසද දිස්ත්‍රික් නිළධාරින් දැනුවත් කිරීම
- ජාතික රණවිරු දිනය පැවැත්වීම
- මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු සිදු කිරීම
- යාකබැද්ද රණවිරු වැඩිහිටි නිවාසය
- ''විරුසර'' වරප්‍රසාද කාඩ්පත් ලබා දීම
- රණවිරු කාන්තා වැඩමුළු පැවැත්වීම
- ක්‍රීඩා සමාජ ගොඩනැගීම
- සෙන්හිරු සියපත ව්‍යාපෘතිය

| ව්‍යාපෘතිය / වැඩසටහන | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | ඉලක්කය කරා ළඟාවීම | වාර්ෂික වෙන් කිරීම | වැය කරන ලද මුදල |
| මාපිය රැකවරණ | 37,250 | 35,842 | 327.83 | 318.06 |
| මාපිය සුරැකුම | 1,470 | 1,280 | 33.32 | 31.14 |
| සංසද නිළධාරින් දිස්ත්‍රික් දැනුවත් කිරීම | 20 | 20 | 1.00 | 0.29 |
| කාන්තා වැඩමුළු පැවැත්වීම | 50 | 05 | 5.79 | 0.40 |
| රණවිරු දිනය | 09 | 09 | 7.75 | 7.12 |
| ක්‍රීඩා සමාජ ගොඩනැගීම | 09 | 05 | 0.84 | 0.56 |
| රණවිරු ගම්මාන යටිතල පහසුකම් සංවර්ධනය | 05 | - | 0.95 | - |
| විරුසර වරප්‍රසාද කාඩ්පත් ලබා දීම | | 41640 | 1.00 | 0.01 |
| යාකබැද්ද වැඩිහිටි නිවාසය සැකසීම | | | 1.02 | 0.56 |
| මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානය නඩත්තු කටයුතු සිදු කිරීම | | | 0.84 | 0.56 |
| සෙන්හිරු සියපත ව්‍යාපෘතිය | 04 | 04 | 4.00 | 0.52 |

20.7 වගුව : අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම





### ගැටළු, අභියෝගතා හා විසඳුම් යෝජනා

#### ගැටළු

➢ අරමුදල් හිඟය නිසා ඇතිවන ගැටළු

- රණවිරු අවශ්‍යතාවය සඳහා මුදල් නොලැබීම.
- ආබාධිත උපකරණ ඇතුළු ආබාධිත භාණ්ඩ ලබා ගැනීමේ දුෂ්කරතා.
- වෛද්‍ය ආධාර ප්‍රදානය කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැතිවීම.
- රණවිරු ශිෂ්‍යත්ව මුදල වැඩ කර දීමට අපහසු වීම සහ ඉල්ලුම පරිදි ලබාදීමට මුදල් හිඟවීම.

➢ වෙනත් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණයෙන් සේවා ඉටු කිරීමේදී ඇති වන ගැටළු

- නිවාස තනා දීමට ඉඩම් නොමැති වීම හා ඔප්පු බලපත්‍ර ලබා ගැනීමේ අපහසුතා.
- රණවිරු ප්‍රජාව වෙත සේවය සලසන වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන බද්ධ නොවීම.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී යුද්ධය තිබෙන අවධියේ මෙන් වෙනත් ආයතන වල සහයෝගය නොමැතිවීම.
- රණවිරු පළාත් කාර්යාල සඳහා සුදුසු ස්ථාන ලබා නොදීම.

#### අභියෝගතා

ඉහත දක්වා ඇති ප්‍රධාන ගැටළු වලට මුහුණ දෙමින් රණවිරු ප්‍රජාව වෙත උපරිම සේවයක් සැලසීම.

#### 20.3 විසඳුම් යෝජනා

- රණවිරු අධිකාරිය සහ රණවිරු ප්‍රජාව ගරු ජනාධිපතිතුමන්ගේ සෘජු අධීක්ෂණය යටතේ රාජ්‍ය මැදිහත් වීමක් සිදු කර සමස්ත රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන තුලින් ජනතාව දැනුවත් කර රණවිරු අභිමානය ගොඩනැගීම.
- රණවිරු සේවා අධිකාරිය වෙත සැපයෙන රාජ්‍ය මුදල් ප්‍රමාණය වැඩිකිරීම.
- රණවිරු සේවයට දායක වන අනෙකුත් රාජ්‍ය හා වෙනත් ආයතන සමග රාජ්‍ය මට්ටමින් සම්බන්ධීකරණයක් ගොඩ නැගීම.
- රණවිරු පවුල් වල සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහා අග්‍රහාර වැනි සෞඛ්‍ය ක්‍රම වලට දායක කරවීම.
- රාජ්‍ය බැංකු රණවිරු ප්‍රජාවට විශේෂ කොට සැලකීමට උපදෙස් දීම.
- පළාත් පාලන ආයතන මට්ටමින් රණවිරු ගෞරවය හා අභිමානය සමස්ත රණවිරු සේවය සැලසීම සඳහා දායක කර ගැනීම.
- රණවිරු ප්‍රජාව මුහුණ දෙන වැටුප්, විශ්‍රාම වැටුප් හා වෙනත් වෘත්තීය ගැටළු විසඳීමට රාජ්‍ය මැදිහත් වීම වැඩි කිරීම.

# 21. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

## 21.1 සමාලෝචනය

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (ආසේඅමාවි) ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් හට අණ සහ මාණ්ඩලික රාජකාරින් පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන විද්‍යාලයකි. මෙහිදී යුධ, ගුවන්, නාවික යන ත්‍රිවිධ හමුදා නිලධාරීන් හට ස්වකීය රාජකාරී ජීවිතයේදී අවශ්‍ය ආරක්ෂක විෂය ක්ෂේත්‍රය පිළිබඳව අණ හා මාණ්ඩලික දැනුම, ශිල්ප ඥානය ලබා දීම සේම විනය, පෞර්ෂ්‍යය හා වෘත්තීමය කුසලතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා පුහුණුව හා දැනුම ලබාදෙනු ලබයි. එම අරමුණ පෙරදැරිව 1998 වසරේ අගෝස්තු මස 28 දා යුද්ධ හමුදා ආරක්ෂක මාණ්ඩලික විද්‍යාලය නමින් මෙම විදුහල ආරම්භ විය. ලෝකයේ වෙනත් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලවල මෙන් ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ යුධ පුහුණු පරිසරයක් ඇති කිරීමෙහිලා, යුධ න්‍යාය හා දර්ශනයන් නැවත සංස්කරණය කර යුගයට අවැසි ඒකාබද්ධ පුහුණු පාඨමාලාවක් සකස් කර 2007 වසරේ ජනවාරි මස 22 දා මෙම ආයතනය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය බවට පරිවර්තනය කෙරිණි. මෙම විද්‍යාලයට ත්‍රිවිධ හමුදාවන් වෙතින් තෝරා ගනු ලබන නිලධාරීන් හට මාණ්ඩලික නිලධාරී දෙවන ශ්‍රේණිය හා ඊට ඉහළ තනතුරුවල රාජකාරීන් සාර්ථකව ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාදීමටත්, එකී නිලධාරීන් තුළ පෞද්ගලික හා වෘත්තීයමය වශයෙන් සදාචාරාත්මක සංවර්ධනය ඇතිකිරීමත්, ත්‍රිවිධ හමුදාව තුළ දක්ෂ නායකයන් බිහි කිරීමත් මෙම විද්‍යාලය මඟින් සිදු කෙරේ.

එම අරමුණ පෙරදැරි කරගනිමින් 2018 වර්ෂය තුළ ත්‍රිවිධ හමුදා නිලධාරින් 126 දෙනෙකු හට හා විදේශීය හමුදා නිලධාරින් 14 දෙනෙකු හට සාර්ථකව පාඨමාලාව පවත්වන ලදී. එම ශිෂ්‍ය නිලධාරින් 140 දෙනාගෙන් ශිෂ්‍ය නිලධාරින් 134 දෙනෙකු සාර්ථකව පාඨමාලාව සමත්වූ අතර ශිෂ්‍ය නිලධාරින් දෙදෙනෙකු පාඨමාලාව අසමත් වූ බවත් ශිෂ්‍ය නිලධාරින් 04 දෙනෙකු විනය හේතුන් මත පාඨමාලාවෙන් ඉවත් කර ඒකකයන් වෙත රපෝර්තු කරවන ලදි. ඒ අතරින් පශ්චාත් උපාධිය ශිෂ්‍ය නිලධාරින් 104 දෙනෙකු ලබාගැනීමට සමත්විය. 2018 වර්ෂය අධ්‍යයන හා පරිපාලන යන දෙඅංශයෙන්ම සාර්ථක වසරකි. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය දකුණු ආසියාවේ ප්‍රමුඛතම හමුදා අධ්‍යයන ආයතනයක් වශයෙන් ලබා ඇති කීර්තිය තහවුරු වන අන්දමින් 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක වී ඇත.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ආරක්ෂක රාජ්‍ය නිලධාරීන් යටතේ පාලනය වන අතර මෙම විද්‍යාලය පාලක මණ්ඩලයක් මගින් පාලනය කරනු ලබයි. එහි ප්‍රධානියා ලෙස ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් කටුයතු කරන අතර ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ද, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ඇතුළු ත්‍රිවිධ හමුදාපතිවරුන් ද, සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උප කුලපතිද, භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකුද, ආසේඅමාවි සේනාවිධායක සහ ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ එම පාලක මණ්ඩලයට ඇතුළත් වේ. මෙම විද්‍යාලයේ කාර්ය මණ්ඩලය ත්‍රිවිධ හමුදා නිලධාරින්, සෙසුනිලයින් හා යුද්ධ හමුදා සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම ආරක්ෂක නිලධාරීන් යටතේ බඳවාගෙන ඇති සිවිල් සේවක නිලධාරින් හා සේවකයන් ද සේවය කරනු ලබයි. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ සේනාවිධායකවරයා ය.

2018 වර්ෂය තුලදී ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය විසින් පාඨමාලා අංක 12 සාර්ථකව පවත්වා නිම කළ අතර එය 2018 ජනවාරි මස 03 වන දින ආරම්භ වී 2018 දෙසැම්බර් මස 13 වන දින නිමා විය. මෙම පාඨමාලාව සඳහා පහත සඳහන් පරිදි දේශීය සහ විදේශීය නිලධාරින් හා නිලධාරිණියන් සහභාගි විය.

| | |
|---|---|
| යුද්ධ හමුදා ශිෂ්‍ය නිලධාරින්/නිලධාරිණියන් | 72 |
| නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් | 27 |
| ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින්/නිලධාරිණියන් | 27 |
| විදේශීය ශිෂ්‍ය නිලධාරින් | 14 |
| සම්පූර්ණ ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව | 140 |

2018 වර්ෂය තුළ බොහෝ සංකල්පනාත්මක නිර්මාණයන් හඳුන්වා දෙන ලදී. විද්‍යාලයීය හර පද්ධතිය නිසි පරිදි ක්‍රියාවට නැගීමට හැකි වූ අතර එම හර පද්ධතියට ශිෂ්‍ය නිලධාරින් අනුගත වීම තුළින් ඔවුන්ගේ විනය, පෞරුෂ්‍යය, වෘත්තීයමය කුසලතා දැනුම හා පුද්ගලික සංවර්ධනයට මග පාදන ලදී. එමගින් ආයතනයේ ප්‍රවර්ධනයට දායකත්වය ලබා ගැනීමත් ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ මනා පෞරුෂ්‍යයක් නිර්මාණය කිරීමත් අපේක්ෂා කෙරේ. එම හර පද්ධතිය ඉගෙනුම, අවංකත්වය, ගරුත්වය, සුසංවරය, විශිෂ්ඨත්වය, නව්‍යතාව, කාලානුගතිකත්වය, වෘත්තිය නිපුණත්වය, සාධනීය විධානය, පිවිතුරු පරිසරය, ක්‍රියාකාරි සිද්ධාන්තය : ස්ථානෝචිත ප්‍රඥාව වේ.

## 21.2 2018 වර්ෂයේ කාර්යසාධනය

### ➢ විද්‍යාලයේ අධ්‍යාපන කටයුතුවල ප්‍රගතිය

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ එම පාඨමාලාව අධ්‍යයන වාර 4 කින් සමන්විත වු අතර **පළමුවන වාරය** 2018 ජනවාරි මස 03 දින සිට 2018 අප්‍රේල් මස 06 වන දින දක්වා සති 13 ක කාලයක් තුළ පහත සදහන් විෂය පද්ධතින් හදාරන ලදි.

- ත්‍රිවිධ හමුදාවන් හි විවිධ අංශ
- සංග්‍රාමික සේවා ආධාර
- අණ දිම, අණ දිමේ සහය සහ තීරණ ගැනිම
- යුධෝපාය, ක්‍රියාන්විත හා සටන්
- බුද්ධි හා මාණ්ඩලික රාජකාරි
- ප්‍රධාන හා හට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි
- යුධ ක්‍රියාන්විත අදියරයන්
- පර්යේෂණ ක්‍රමවේදයන්
- ශ්‍රි ලාංකික අධ්‍යයන

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ විෂය දැනුම හා භෞතික ප්‍රගතිය සංවර්ධනය කිරීම සඳහා විවිධ පුහුණු අභ්‍යාස සිදුකළ අතර, විෂය නිර්දේශයට අනුව ඔවුන්ගේ අණ හා මාණ්ඩලික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා පළමු වාරය තුල සිදුකරන ලද ත්‍රිවිධ හමුදා විෂය ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන්හි විවිධ අවස්ථාවන් කිහිපයක් පහත සඳහන් ඡායාරූපවලින් පෙන්වා දිය හැකිය.



**මාස්ටර් රයිටර් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.01.19 දින යුද්ධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර එමඟින් විවිධ රාජකාරි සේවා ලිපි ලිවීම සැබැඳිව ඇති නීති සහ ක්‍රමවේදයන් පිළිබඳ නිවැරදි හා මනා පුහුණුවක් ලබාදිම අරමුණ විය.



**රවුන්ඩ් රොබින් අභ්‍යාසය :**

මෙම අභ්‍යාසය 2018.01.09 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරීන්ගේ සිතීමේ සහ තීරණ ගැනීමේ ශක්තිය ආත්ම විශ්වාසය නායකත්ව ගුණාංග හා හැකියාවන් වර්ධනය කිරීමත් මහජනතාව ඉදිරියේ ආත්ම විශ්වාසයෙන් යුතුව නායකයෙකු වශයෙන් කතා කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි.



**තන්ඩර් ස්ට්‍රයික් අභ්‍යාසය :**

මෙම අභ්‍යාසය 2018.03.01 දින සහ 02 වන දින ගුවන් ශිෂ්‍ය නිලධාරීන් සඳහා පැවතුන අතර එහි අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරීන් විසින් ක්‍රියාන්විතයකට ගුවන් බලය ප්‍රායෝගිකව යෙදවීමේ හැකියාවන් ඔප්නැංවීම සඳහා පුහුණුව ලබාදීමයි.



**ටියුටෝරියල් එස්ටිමේට් අභ්‍යාසය :**

මෙම අභ්‍යාසය 2018.03.17 දින සිට 2018.03.23 දින දක්වා විද්‍යාල පරිශ්‍රයේදී යුද්ධ හමුදා සහ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් සඳහා පැවැත්විණ. එහි අරමුණ වූයේ යුධ ක්‍රියාන්විත සඳහා යුධ ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සඳහා බුද්ධි තොරතුරු රැස්කිරීම සහ එම බුද්ධි තොරතුරු මත සැලසුම් සුදානම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබාදීම අරමුණ විය.

මෙම පාඨමාලාවේ **දෙවන වාරය** 2018 අප්‍රේල් මස 17 දින සිට 2018 ජුලි මස 25 වන දින දක්වා සති 15 කාලයක් තුළ පහත සඳහන් විෂයන් හදාරන ලදි.

- ගුවන් සටන් ක්‍රම.
- ජාත්‍යන්තර සම්බන්ධතා.
- සිවිල් අධිකාරීන් වෙත හමුදා ආධාර.
- යුධ ක්‍රියාන්විත අධියරයන්.
- උපක්‍රමික අධ්‍යයන.

විෂය නිර්දේශයට අනුව ඔවුන්ගේ අණ හා මාණ්ඩලික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන වාරය තුල සිදුකරන ලද ත්‍රිවිධ හමුදා විෂය ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන්හි විවිධ අවස්ථාවන් කිහිපයක් පහත සඳහන් ඡායාරූපවලින් පෙන්වා දිය හැකිය



**අපර් කට් අභ්‍යාසය :**

මෙම අභ්‍යාසය 2018.05.05 දින සිට 2018.05.12 දින දක්වා යුද්ධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් නාරම්මල ප්‍රදේශයේ පැවැත්විණ. එහි අරමුණ වූයේ බලසේනා මට්ටමින් ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සැලසුම් පුහුණු කිරීම වේ.



**කොන්ටිකි අභ්‍යාසය :**

මෙම අභ්‍යාසය 2018.07.01 දින සිට 2018.07.04 දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් කිතුල්ගල සිට කොස්ගම දක්වා වූ ප්‍රදේශයන්හි කැළණි ගඟ ආශ්‍රිතව පැවැත්වුණි. මෙම අභ්‍යාසය පැවැත්වූයේ ශිෂ්‍ය නිලධාරීන් තුළ නායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහාත් නිර්මාණශීලීත්වය හා වෘත්තීය නිපුණතාව ඇති කරනු වස් ප්‍රායෝගික අභියෝගාත්මක ක්‍රියාකාරකම් හරහා ඔවුන්ගේ ආත්ම ශක්තිය ඉහළ නැංවීමේ අභිප්‍රායෙනි.



**කොන්ක්‍රිට් ජන්ගල් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.05.17 දින සිට 2018.05.21 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් කුරුණෑගල ඇතුගල ප්‍රදේශයේදි පවත්වන ලදි. මෙම අභ්‍යාසයේ අරමුණ වුයේ නාගරික පරිසරයකදි ප්‍රහාරක හා ආරක්ෂාකාරි මෙහෙයුම් බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබද අවබෝධය ලබාදිමයි.



**ෂැඩෝ ඩාන්ස් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.06.20 දින සිට 2018.06.28 දින දක්වා යුද්ධ හමුදා හා ගුවන් හමුදා නිලධාරි වෙනුවෙන් විද්‍යාලීය භුමියේදි පවත්වන ලදි. මෙහි අරමුණ වුයේ යුධ සැලසුම් පරික්ෂා කිරිමේ ක්‍රමවේදයක් මගින් සැලසුම් තහවුරු කර ගැනිම සහ සේනාංක මට්ටමේ ඒකාබද්ධ මෙහෙයුම් සැලසුම් කිරිම පුහුණු කිරිමයි.

පාඨමාලාවේ **තෙවන වාරය** 2018 අගෝස්තු මස 20 දින සිට 2018 ඔක්තෝබර් මස 17 වන දින දක්වා සති 10 කාලයක් තුළ පහත සඳහන් විෂයන් හදාරණ ලදී.

- ජාත්‍යන්තර මානව නීතිය පිළිබද වැඩමුළුව
- ඒකාබද්ධ මෙහෙයුම්
- කළමනාකරණය
- නාවික සටන් ක්‍රම
- ප්‍රතිත්‍රස්තවාදි ක්‍රියාන්විත මෙහෙයුම්
- විදේශ අධ්‍යාපන චාරිකාව

විෂය නිර්දේශයට අනුව ඔවුන්ගේ අණ හා මාණ්ඩලික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරිම සඳහා තෙවන වාරය තුල සිදුකරන ලද ත්‍රිවිධ හමුදා විෂය ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන්හි විවිධ අවස්ථාවන් කිහිපයක් පහත සඳහන් ඡායාරුපවලින් පෙන්වා දිය හැකිය.



**ඉන්ක් බ්ලොට් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.09.04 දින සිට 2018.09.08 දින දක්වා යුද්ධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදි පවත්වන ලදී. මෙහි අරමුණ වුයේ සේනාංකයක මට්ටමේ ප්‍රති-ත්‍රස්ථවාදි ක්‍රියාන්විත සඳහා භට පිරිස් යෙදවිමේ සැලසුම් සකස් කිරිම පිළිබඳව අවබෝධයක් ලබාදිමයි.



**ට්‍රයිඩන්ට් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.09.06 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් ත්‍රිකුණාමලය නාවික හමුදා මුලස්ථානයේදි පවත්වන ලදි. මෙහි අභිප්‍රාය වුයේ ක්‍රියාන්විත සැලසුම් පිළිබද පුහුණුවක් ලබාදිමයි.



**රොක් ඒප්ස් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.09.17 දින සිට 2018.09.21 දින දක්වා කාලය තුළ ගුවන් ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුනු අතර 2018.09.17 දින ගුවන් හමුදා චින වරාය කඳවුරට ගොස් එහිදි මෙම අභ්‍යාසය ප්‍රායෝගිකව හැදෑරු අතර මෙහි අරමුණ වුයේ කදවුරු ආරක්ෂක විධිවිධානයන් සැලසුම් කිරිම පිළිබද න්‍යයාත්මකව හා ප්‍රායෝගිකව පුහුණුවක් ලබාදිමයි.



**පර්පල් ටර්ටල් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.07.18 දින සිට 2018.07.22 දින දක්වා කාලය තුල ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහලේදී පැවැත්විණ. මුහුදේ සහ ගොඩබිම යන උභය මෙහෙයුම් සඳහා පුහුණුවක් ලබාදිම මෙහි අරමුණයි.

පාඨමාලාවේ **හතරවන වාරය** 2018 ඔක්තෝබර් මස 26 දින සිට 2018 දෙසැම්බර් මස 13 වන දින දක්වා සති 08 කාලයක් තුල පහත සඳහන් විෂයන් හදාරන ලදි.

- යුධ තාක්ෂණය
- එක්සත් ජාතින්ගේ සාම සාධක මෙහෙයුම්
- ක්‍රියාන්විත සඳහා පුහුණුවිම්
- ආරක්ෂාව
- පරිපාලන අධ්‍යයන
- න්‍යෂ්ටික ජිව විද්‍යාත්මක හා රසායනික යුධ කටයුතු

විෂය නිර්දේශයට අනුව ඔවුන්ගේ අණ හා මාණ්ඩලික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා හතරවන වාරය තුල සිදුකරන ලද ත්‍රිවිධ හමුදා විෂය ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන්හි විවිධ අවස්ථාවන් කිහිපයක් පහත සඳහන් ඡායාරූපවලින් පෙන්වා දිය හැකිය.



**ගෝස්ට් වෝක් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.11.27 දින වැලිවේරිය පුගොඩ සහ කිරිදිවැල යන ප්‍රදේශයන්හිදි යුද්ධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් සිදු කරන ලදි. යුධ ක්‍රම උපායන් පිළිබඳව භට පිරිස් රහිතව ලිඛිතව බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන යුධ අභ්‍යාසයක් වන අතර එය යුධ මුලධර්ම මත පිහිටා බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන අභ්‍යාසයකි.



**සී ලයන් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.11.12 දින විදුහල් පරිශ්‍රයේදි පැවැත් වු අතර නාවික ක්‍රියාන්විත පිළිවෙත්වල වර්තමාන හා අනාගත යුධ මෙහෙයුම් හි ප්‍රධාන සංකල්ප ප්‍රතිපත්ති හා ගැටළු පිළිබදව ඉගැන්විම මෙමගින් බලාපොරොත්තු වේ.



**මැග්නම් ෆෝස් අභ්‍යාසය :**
මෙම අභ්‍යාසය 2018.10.27 දින සිට 2018.11.02 දින දක්වා විදුහල් භූමියේදි පවත්වන ලද අතර මෙය මාණ්ලික යුධ උපක්‍රමික ක්‍රියාදාමයන්හි මාණ්ඩලික නිලධාරියෙකු නිසි තිරණ ගැනිම සහ විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරිම උදෙසා පුහුණුවක් ලබාදිම අරමුණු කරගෙන සිදු කරන ලදි.



**යුධ තාක්ෂණික වැඩමුළුව :**
ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ තාක්ෂණය පිළිබද දැනුම වැඩි දියුණු කිරිම සදහා 2018 නොවැම්බර් මස 16 දින සිට 18 දින දක්වා යුධ තාක්ෂණය පිළිබද වැඩමුළුව මෙම විද්‍යාලයේදි පවත්වන ලදි. මෙම වැඩමුළුව ඉන්දියානු ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ නිලධාරින් විසින් පවත්වන ලදී.


### ආරක්ෂක සේවා අණ  හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ පළමු වාරයේ සිට හතරවන වාරය දක්වා අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය

| | | පළමු අධ්‍යයන වාරය | | | | | දෙවන අධ්‍යයන වාරය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | >80% අති දක්ෂ | 70 - 80% ඉතා හොඳයි | 50 - 70% හොඳයි | 40 - 50% සාමාන්‍යයි | <40% සාමාන්‍ය පහළ | >80% අති දක්ෂ | 70 - 80% ඉතා හොඳයි | 50 - 70% හොඳයි | 40 - 50% සාමාන්‍යයි | <40% සාමාන්‍ය පහළ |
| 1. | අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යයන විෂය කටයුතු වල ප්‍රගතිය | 5.81% | 22.86% | 63.48% | 7.45% | 0.4% | 5.82% | 22.20% | 65.85% | 5.90% | 0.23% |
| 2. | පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය | 100% | | | | | 100% | | | | |

21.1 වගුව : ආරක්ෂක සේවා අණ  හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ පළමු හා දෙවන වාරයේ අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය


| | | තුන්වන අධ්‍යයන වාරය | | | | | හතරවන අධ්‍යයන වාරය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | >80% අති දක්ෂ | 70 - 80% ඉතා හොඳයි | 50 - 70% හොඳයි | 40 - 50% සාමාන්‍යයි | <40% සාමාන්‍ය පහළ | >80% අති දක්ෂ | 70 - 80% ඉතා හොඳයි | 50 - 70% හොඳයි | 40 - 50% සාමාන්‍යයි | <40% සාමාන්‍ය පහළ |
| 1. | අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යයන විෂය කටයුතු වල ප්‍රගතිය | 5.37% | 29.37% | 63.11% | 1.94% | 0.21% | 4.14% | 23.37% | 66.81% | 4.71% | 0.97% |
| 2. | පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය | 89% | | | | | 76.47 % | | | | |

21.2 වගුව : ආරක්ෂක සේවා අණ  හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ තෙවන හා හතරවන වාරයේ අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය





21.1 ප්‍රස්ථාරය : පළමු වාරයේ සිට හතරවන වාරය දක්වා සිසුන්ගේ ප්‍රගතිය


- **අධ්‍යාපනික දර්ශකයන්**
  - ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය





21.2 ප්‍රස්ථාරය : මාණ්ඩලික පාඨමාලාවට ත්‍රිවිධ හමුදා නිලධාරි සහභාගිවීමේ වර්ධනය




21.3 ප්‍රස්ථාරය : මාණ්ඩලික පාඨමාලාව සමත්විම.




21.4 ප්‍රස්ථාරය : ආරක්ෂක විද්‍යාවේදී Msc (Defence Studies) හිමිගැන්වීම





21.5 ප්‍රස්ථාරය : දේශිය සහ විදේශිය ශිෂ්‍ය සහභාගිත්වය

| අ/අ | කාර්ය සාධක දර්ශකය | | ළගාවු ඉලක්කයන් |
|---|---|---|---|
| 01 | • ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය | • ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය සහභාගිත්වය 140 දක්වා වැඩිවිය.<br>• මාණ්ඩලික පාඨමාලාව සමත්විම ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරිම.<br>• ආරක්ෂක විද්‍යාවේදී (M Def SS) හිමිගැන්විම ප්‍රතිශතය ක්‍රමිකව වර්ධනය කිරිම.<br>• විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධනය කිරිම. | • 2017 වර්ෂය තුළ ශිෂ්‍ය සහභාගිත්වය 132 ක් වු අතර එය 2018 වර්ෂයේදි ශිෂ්‍යයින් 140 ක් දක්වා වැඩිවිය.<br>• 2017 වර්ෂය තුළ ශිෂ්‍ය සමත්විම 128 ක් වු අතර 2018 වර්ෂයේදි එය 134 දක්වා ඉහළ ගොස් ඇත.<br>• 2017 වර්ෂය තුළ Msc (D & SS) හිමිගැන්විම ශිෂ්‍යයින් 119 ක් වු අතර 2018 වර්ෂයේදි එය 104 දක්වා අඩුවිමක් සිදුවි ඇත.<br>• 2017 වර්ෂය තුළ සහභාගි වු විදේශ ශිෂ්‍යයන් සංඛ්‍යාව 14 ක් වු අතර 2018 වර්ෂයේදි එය 14 ක් විය. |

21.3 වගුව : කාර්ය සාධක දර්ශකය - අධ්‍යාපනික දර්ශක

## ➢ අධ්‍යාපනික සංවර්ධන දර්ශකය




21.6 ප්‍රස්ථාරය : පුස්තකාල පහසුකම් සංවර්ධන විම.

| අ/අ | කාර්යසාධක දර්ශකය | කාර්යසාධක මිණුම් | ළගාවු ඉලක්කය |
|---|---|---|---|
| 01 | • පරිශීලනය කරනු ලබන පොත්හි ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරිම<br>• පුහුණුවීම් කටයුතු සඳහා ඉදුරාම ඇවැසි නව උපාංගයන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වර්ධනය කිරිම. | 2017 වර්ෂය තුල පැවති පොත් ප්‍රමාණය 10982 ක් වු අතර එය 2018 වර්ෂය තුලදී 12124 ක් දක්වා වර්ධනය කර ගැනිමට හැකිවිය. සමස්ත පුස්තකාල කටයුතු පරිගණක ජාලගත කරන ලදි. | 2018 වර්ෂය තුලදි විද්‍යාලය වෙත පුහුණු කටයුතු සඳහා රු. මිලියන 30.01 ක මුදලක් වියදම් කර මුලධන භාණ්ඩ මිලදි ගන්නා ලදි. |

21.4 වගුව : කාර්ය සාධක දර්ශකය - අධ්‍යාපනික සංවර්ධන දර්ශක

## ➢ පාඨමාලාවේ ප්‍රගතිය

2018 අධ්‍යයන වර්ෂයේ පවත්වන ලද පාඨමාලා අංක 12 හි ශිෂ්‍ය නිලධාරින් 140 ක් වු අතර එමගින් ශිෂ්‍යයන් 04 දෙනෙක් විනය කඩකිරිම් හේතුන් මත ඒකකයන් වෙත නැවත රපෝර්තු කරවන ලදි. ඒ අනුව යුද්ධ හමුදාවේ නිලධාරින් 68 ක්ද, නාවික හමුදාවේ නිලධාරින් 27 ක්ද, ගුවන් හමුදාවේ නිලධාරින් 27 ක් සහ විදේශ රටවල් 10 ක් නියෝජනය කරමින් නිලධාරින් 14 දෙනෙකු ද අයත් විය. ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ විදේශීය නිලධාරින් පාඨමාලාව ඉතා සාර්ථකව හදාරා සමත්වීමෙන් ''පීඑස්සී'' (psc) යන සුදුසුකම ලබා ගැනීමට හැකි වු අතර නිලධාරින් දෙදෙනෙකු පමණක් සමත් විමට නොහැකිවිය. ඒ අනුව මෙම පාඨමාලාවේ සමත්වීමේ ප්‍රතිශතය 99%ක් වන අතර, 93% ක ප්‍රමාණයක් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිරිනමන Msc (Defence Studies) උපාධිය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. මෙම පාඨමාලාවේ උපාධි ප්‍රධානෝත්සවය 2018.12.12 දින අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍ය නිලධාරියා අතිගරු ජනාධිපති තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



පාඨමාලාවේ හොදම සේනාවිධායක සමීක්ෂණ නිබන්ධනය ඉදිරිපත් කළ ශිෂ්‍ය නිලධාරියා අතිගරු ජනාධිපති තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



බංගලාදේශ නාවික හමුදාවේ ශිෂ්‍ය නිලධාරියෙකු අතිගරු ජනාධිපති තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



ඉන්දියානු යුධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරියෙකු අතිගරු ජනාධිපති තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.

## ක්‍රියාත්මක කර ඇති සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### ➢ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති

මාණ්ඩලික පාඨමාලාවේ ශිෂ්‍ය නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරිම වෙනුවෙන් සියලු පහසුකම් සහිත සිව් මහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකර එය 2018.12.12 දින අතිගරු ජනාධිපති තුමන් අතින් විවෘත කරන ලදී.









විද්‍යාලය තුල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ගොඩනැගිලි උචිත මට්ටමක නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 12.19 ක ප්‍රමාණයක් වැයකර ඇත. තවත් රුපියල් මිලියන 80 ක වියදමක් දරා තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිලි 02 ක් ඉදිකිරීමට හැකියාව ලැබිණ.





මෙම විද්‍යාලයේ නිලධාරි නිවස්නය සඳහා අඩුපාඩුවක්ව පැවති ආහාර ගබඩා කිරීමේ කාමර සදහා ගබඩා කාමර ඇතුළත්ව කාර්යාල පහසුකම්ද ඇතුලත්ව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර 2018.12.11 වන දින සේනාවිධායක විසින් විවෘත කරන ලදි.





නවතමයෙන් පහත සදහන් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සහ අනෙකුත් පරිපාලන ව්‍යාපෘතින් ස්ථාපිත කර ඇති අතර එමගින් මාණ්ඩලික පාඨමාලාව සදහා සහභාගිවන දේශිය සහ විදේශිය ශිෂ්‍ය නිලධාරින්ගේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල තොරතුරු තාක්ෂණ අවශ්‍යතා වැඩිදියුණු කිරීමට හැකිවූ අතර, නවීන තාක්ෂණ පාඨමාලාවන් හා අනෙකුත් පරිපාලන රාජකාරීන් සඳහා යොදවා ගැනීම තුළින් ආයතනික ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී ඇත.

- පරිගණක ජාල පද්ධතිය නවතමයෙන් ස්ථාපිත කිරිම (Fiber Optic).
- තාක්ෂණික යුධ මෙහෙයුම් අභ්‍යාස මධ්‍යස්ථානය ස්ථාපිත කිරිම (War Gaming Centre).
- ස්වයංක්‍රිය හුවමාරුව නවතමයෙන් ස්ථාපිත කිරිම.
- CCTV පද්ධතිය නවතමයෙන් ස්ථාපිත කිරිම.
- IPTV ජාලගත කිරිම.

### ➢ මූල්‍ය සමාලෝචනය

2018 වසර සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෙත මහා භාණ්ඩාගාරය වෙතින් පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 140.20 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 258.91 ක් ද මුදල් ප්‍රතිපාදන ලබාදී ඇති නමුත් වර්ෂ අවසානය වනවිට ද්‍රවශීලි මුදල් ලෙස පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 134.17 ක් ලබාදුන් අතර ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 234.13 ක මුදලක් ලබාදෙන ලදී.

මෙම වසර තුල විද්‍යාලයේ පුරප්පාඩුව පැවැති සිවිල් සේවක තනතුරු සඳහා නව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කිරීම නිසා වැටුප් සඳහා වන වියදම් හා ශිෂ්‍ය නිලධාරීන් වැඩිවීම නිසා අනෙකුත් පරිපාලන වියදම් පසුගිය වසරට සාපේක්ෂව ඉහළ යාමක් සිදුවූ අතර, ඒ සඳහා අවැසි අමතර ප්‍රතිපාදන රුපියල් මිලියන 8.20 ක් මහා භාණ්ඩාගාරය වෙතින් ලබාදෙන ලදී.

රුපියල් මිලියන 17.92 ක ප්‍රතිපාදන යොදවා ගනිමින් නවතමයෙන් තොරතුරු තාක්ෂණ හා සිසිටිවි කැමරා සවි කිරීමේ ව්‍යාපෘතිය අදියර II ආරම්භ කරන ලදී. එමගින් දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල තොරතුරු තාක්ෂණ අවශ්‍යතා වැඩිදියුණු කිරීමට හැකිවූ අතර, නවීන තාක්ෂණ පාඨමාලාවන් හා අනෙකුත් පරිපාලන රාජකාරීන් සඳහා යොදවා ගැනීම තුළින් ආයතනික ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට හැකි විය. මෙම පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරින්, රාජ්‍ය සේවයේ නියුතු පරිපාලන සේවා නිලධාරින් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා දිරිගැන්විය හැකිය.

ප්‍රාග්ධන වියදම් තුළින් සැලසුම් කර තිබූ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිලි 02 රුපියල් මිලියන 80.00 ක් යොදවා නිම කිරීමට කටයුතු කල අතර, ඒ තුළින් විද්‍යාලයේ ඉගෙනුම ලබන දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට හැකි විය.

ප්‍රාග්ධන වියදම තුළින් රුපියල් මිලියන 142.87 ක් වැයකොට පසුගිය වසරේ වැඩ ආරම්භ කරන ලද සිව්මහල් පුස්තකාල හා විභාග ශාලා ගොඩනැගිල්ල මෙම වසරේ වැඩ අවසන් කොට අතිග රු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලද අතර, එමගින් ශිෂ්‍ය නිලධාරින්ගේ අධ්‍යයන කටයුතු වඩාත් සාර්ථකව ඉටුකර ගැනිමට මහගු පිටුවහලක් ලැබේ.

තවද රුපියල් මිලියන 3.5 වැය කර නිලධාරින් නිවස්නය සඳහා කාර්යාලයක් ඇතුළුව ගබඩා කාමර ගොඩනැගිල්ලක් ඉදිකරන ලද අතර, එමගින් නිලධාරි නිවස්නයේ කටයුතු වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරිමට හැකියාව ලැබි ඇත. තවද රුපියල් මිලියනයක් පමණ වැය කොට පැසිපන්දු ක්‍රිඩා පිටියක් හා විවෘත සිනමා අංගනයක් ඉදිකරන ලදි. එමගින් ශිෂ්‍ය නිලධාරින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයවලුන්ගේ ක්‍රිඩා හා රසවින්දන පහසුකම් වැඩි දියුණු කිරිමට හැකිවිය.

ඉහත ව්‍යාපෘතින්වලට අමතරව රුපියල් මිලියන 12.19 ක වියදමක් දරමින් මෙම විද්‍යාලයේ ගොඩනැගිලි නවීකරණය කිරීමට කටයුතු කළ අතර ඒ මගින් ගොඩනැගිලි 8 ක් දීර්ඝ කාලීනව භාවිතයට ගත හැකි මට්ටමට පත්කිරීමට හැකි විය. මෙම ගොඩනැගිලි දීර්ඝ කාලයක් භාවිතා කිරීමට හැකිවීම තුළින් නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැයවන විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබිණ.

එමෙන්ම රුපියල් මිලියන 30.01 ක මුදලක් වැයකර ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කරන ලදී. මෙම මිලදී ගැනීම් ක්ෂය ප්‍රතිසම්පාදනය සඳහා මෙන්ම විද්‍යාලයීය අවශ්‍යතාවන් වෙනුවෙන් යොදවා ගන්නා ලදී.

| අනු අංකය | වැය ශීර්ෂය | අනු වැය විෂය | මුදල (ආසන්න) රුපියල් මිලියන | මුළු මුදල (ආසන්න) රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 16.92 | 234.48 |
| | | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 30.14 | |
| | | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 187.42 | |
| 2 | පුනාවර්තන | වැටුප් හා දීමනා | 47.27 | 134.15 |
| | | සැපයුම් | 32.14 | |
| | | නඩත්තු | 7.58 | |
| | | ගිවිසුම්ගත සේවා | 47.16 | |
| එකතුව | | | 368.63 | 368.63 |

21.5 වගුව : 2018 වර්ෂය සඳහා මිලදී ගැනීම්

➢ මධ්‍යකාලීන ක්‍රියාකාරකම්

ප්‍රාග්ධන මධ්‍යකාලීන සැලැස්මේ ප්‍රමුඛතාවන්ගෙන් මෙම විද්‍යාලයේ පහත සදහන් කාර්යයන් ක්‍රියාවට නැංවීමට යෝජිතව ඇත.

- මුලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 523 යි.

විද්‍යාලයේ පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාවේ පාලන කටයුතු වෙනුවෙන් ස්ථාපිත කර ඇති අංශ සහ ආයතන එක් ස්ථානයක ස්ථාපිත කිරිමේ අරමුණින් විද්‍යාලයේ මුලස්ථාන ගොඩනැගිල්ල තැනීම සදහා කැබිනට් අනුමැතිය ලබාගැනිමට ඉදිරිපත්කර ඇත.

- සෙසුනිළයින් හට භට නිවාස පහසුකම් සැලසීම සදහා සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සදහා රුපියල් මිලියන 42.

මෙම විද්‍යාලයේ රාජකාරි කරනු ලබන ත්‍රිවිධ හමුදාවට අයත් සෙසුනිළයින් හට භට නිවාස පහසුකම් සැලසිම වෙනුවෙන් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සදහා කැබිනට් අනුමැතිය ලැබි ඇත.

- මෙම විද්‍යාලයේ රාජකාරි කරනු ලබන ත්‍රිවිධ හමුදාවට අයත් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින්ගේ නවාතැන් පහසුකම් සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 89.30 ක මුදලක් වැයකර තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සදහා කැබිනට් අනුමැතිය ලැබි ඇත.

## 21.3 අනාගත අපේක්ෂා

✸ විද්‍යාලය සඳහා නව මිලදී ගැනීම
- ගිලන් රථය.
- ගලි බවුසර් රථය.
- ට්‍රැක්ටර් රථය (ටේලරය සමග).

✸ කුළී ගෙවීමේ පදනම මත වාහන ලබා ගැනීම
- ආසන 26/29 වායුසමීකරණය කරන ලද බස් රථයක්.
- සුඛෝපභෝගී මාදිලියේ කාර් රථ 05 ක් (විශ්වවිද්‍යාල දේශකයන් රැගෙන ඒම සහ රැගෙන යාම සදහා).
- ආසන 7/8 වායුසමීකරණය කරන ලද වෑන් (KDH) රථ 02 ක්.

විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරිම සදහා 2019 වර්ෂය සදහා පහත සදහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කෙරේ.
- ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ මුලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරිම.
- ත්‍රිවිධ හමුදාවට අයත් සෙසුනිළයින් හට භට නිවාස පහසුකම් සැලසීම සදහා සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම.
- ත්‍රිවිධ හමුදාවට අයත් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින්ගේ බළලත් නිලධාරින් හා සැරයන් නිවස්නය සහ නවාතැන් පහසුකම් සදහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරිම.
- තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතියේ තුන්වන අදියර ක්‍රියාත්මක කිරිම.
- අංග සම්පූර්ණ ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරිම.

ඉලක්කගත ප්‍රතිඵල සඳහා අධ්‍යාපන වැඩසටහන් නිසි ලෙස ක්‍රියාත්මක කළ අතර අධ්‍යයන වැඩසටහනේ වෙනසක් සිදුවී නොමැති අතර ඉගැන්වීමේ ක්‍රමවේදයන් වඩාත් දියුණු කරන ලදී.

✸ කාර්ය මණ්ඩල කුසලතා වර්ධනය

අණ හා මාණ්ඩලික අධ්‍යයනය නමැති සංකල්පය යටතේ වන අධ්‍යාපන ආයතනයක් වශයෙන් මෙම විද්‍යාලයේ කාර්ය කුසලතා සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩලයේ (අධ්‍යයන/පරිපාලන) සාමාජිකයෙක්ම අධ්‍යයන හා පුහුණු වැඩසටහනකට ඇතුළත් කරන ලදී. විද්‍යාලය වෙතින් වාර්ෂිකව පවත්වනු ලබන විදේශීය අධ්‍යයන සංචාරයට සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමාජිකයින් එක්කරන ලදී. එමගින් විදේශීය හමුදාවන් සමග කටයුතු කිරීමටත් එම ත්‍රිවිධ හමුදාවන්වල සංයුතිය හා ක්‍රියා කරන ආකාරය පිළිබඳව හා ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳව දැනුම් සම්භාරයක් ලබා ගැනීමටත් හැකියාව ලැබිණ. 2018 වර්ෂයේදී රටවල් 11 ක් මෙම සංචාරයට ඇතුලත් විය. එනම් ඕස්ට්‍රේලියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඊශ්‍රායලය, ඉන්දුනීසියාව, ජපානය, පිලිපීනය, රුසියාව, රුවන්ඩාව, දකුණු කොරියාව සහ තුර්කිය යන රටවල් වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයට වඩාත් පුළුල් දැනුමක් ලබා දීම සඳහා අන්‍යෝන්‍ය හුවමාරු වැඩමුළු වැඩසටහන් යටතේ බංගලාදේශ හා පකිස්ථාන ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයින් මෙම විද්‍යාලයට පැමිණ විශේෂ අධ්‍යයන වැඩමුළු පවත්වන ලදී. මෙම විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයන් ද බංගලාදේශ හා පාකිස්ථාන මාණ්ඩලික විද්‍යාලවල එවැනිම වැඩමුළු පවත්වන ලදී. ඉන්දියානු ආරක්ෂක හමුදාව වෙතින් පැමිණි උපදේශකයින් විසින් හමුදා තාක්ෂණික වැඩමුළුවක් පවත්වන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩල හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු සහ දේශන ඇතුළත් වු අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. පුහුණු සැසි හා වැඩමුළු සඳහා ආරාධිත දේශකයින් ද සහභාගි කරවාගනු ලැබූ අතර පිටත රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත ද අධ්‍යයන චාරිකා පවත්වන ලදී.

## ප්‍රගතියේ පොදු ඇගයීම, උගත් පාඩම්, ගැටළු සහ අභියෝග

### ✸ උගත් පාඩම්

නිසි ලෙස සැලසුම් කරන ලද පාරදෘශ්‍ය මිලදී ගැනීමේ සැලසුමක් මගින් සාර්ථක මුල්‍ය පාලනයක් ඇති කිරීමට විද්‍යාලය සමත් වී ඇත. සියලු ව්‍යාපෘති සඳහා අනුමත මුදල ඒ සඳහා වැයවන මුදල හා ඉතිරි මුදල වැනි කරුණු පිළිබඳ අවධානයෙන් යුතුව ප්‍රතිපාදන හැසිරවීමට නිලධාරීන් දිරිගන්වන ලදී. එමගින් මුල්‍ය නම්‍යශීලීත්වයට මගපෑදීමෙන් කාර්යක්ෂමතාව හා ප්‍රතිලාභය ඉහළ ගොස් ඇත.

### ✸ ගැටළු සහ අභියෝග

සමස්ථ වශයෙන් 2018 වසර තුළ මුල්‍යමය කටයුතු සිදුකිරීමේදී සැළකිය යුතු ගැටළු සහගත තත්ත්වයක් පැන නොනැගුනු අතර 2018 වර්ෂයට අදාල මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 24.78 ක් හා පුනරාවර්ථන වියදම් සඳහා රුපියල් මිලියන 6.03 ක ද්‍රවශීලී මුදල් ලබා නොදීම හේතුවෙන් එම බිල්පත් 2019 වර්ෂය සඳහා ගෙනයාමට සිදුවිය. මෙමගින් 2019 වර්ෂයේ මෙම විද්‍යාලයේ කටයුතු ඵලදායිව පවත්වාගෙන යාමට ගැටලු මතු වේ.

මෙම විද්‍යාලයේ පුහුණු කටයුතුවල අවශ්‍යතා හා පාලන කටයුතු සිදුකිරීම සඳහා විද්‍යාලය තුළ සුදුසු හා ප්‍රමාණවත් වාහන පද්ධතියක් නොමැති වීම නිසා ගැටළු පැන නැගෙන බැවින් ප්‍රවාහන අංශය සවිමත් කිරීම සඳහා මෙම විද්‍යාලයේ අබලන් වෙමින් පවතින පරිහරණයට ගත නොහැකි වාහන වෙනුවට නව වාහන ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. ඒ අනුව මෙම විද්‍යාලය වෙත ගිලන් රථය, ගලි බවුසරය හා ට්‍රැක්ටර (ට්‍රේලරය සමඟ) වාහන මිලදී ගැනීමට හා කුළී ගෙවීමේ පදනම මත ආසන 26/29 වායුසමීකරණය කරන ලද බස් රථයක්, සුඛෝපභෝගී මාදිලියේ කාර් රථ 05 ක් (විශ්වවිද්‍යාල දේශකයන් රැගෙන ඒම සහ රැගෙන යාම සඳහා), ආසන 7/8 වායුසමීකරණය කරන ලද වෑන් (ණෘ්‍ය) රථ 02 ක් ලබාගැනීමට අවශ්‍යව ඇති බව පෙන්වා දෙමි. විශේෂයෙන්ම මෙම විද්‍යාලයට අඩුපාඩුව පවතින ගිලන් රථයක් සහ ගලි බවුසරයක් මිලදී ගැනීමට විශේෂ අවධානයක් යොමුකළ යුතුව ඇත.

## ආයතනික සංවර්ධනය සඳහා යෝජිත ක්‍රියාකාරකම්

### ✸ සංවිධානය

ශිෂ්‍ය නිලධාරින්ගේ පර්යේෂණ පත්‍රිකාවන් සඳහා අවශ්‍ය වන පහසුකම් විධිමත් ලෙස සැලසීමට විද්‍යාලයට අවශ්‍ය වී ඇත. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් වු අධ්‍යයන අංශයක් සම්බන්ධීකරණ අංශය යටතේ පිහිටුවීම විද්‍යාලයේ අභිලාෂය වී ඇත. ඒ සඳහා වන පුරප්පාඩු පිරවීම සඳහා විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවන් වෙතින් පැමිණෙන කාර්ය මණ්ඩලයක් මේ සඳහා අවශ්‍ය වේ. එමෙන්ම පුහුණු ආධාරක කටයුතු සඳහාම යෙදවිය හැකි හට කණ්ඩායමක් ද විද්‍යාලයේ අවශ්‍යතාවකි. මෙම අවශ්‍යතාවන් දෙකම සපුරා ගැනීමට අමතර ප්‍රතිපාදන අවශ්‍ය නොවේ.

### ✸ ප්‍රාග්ධනය

මෙම විද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ නවාතැන් පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින්ගේ බනි/සැර නිවස්න පහසුකම් සැලසීම සඳහා රුපියල් මිලියන 89.30 ක් වැයකර අංග සම්පූර්ණ තෙමහල් ගොඩනැගිල්ලක් ද සෙසුනිලයින්ගේ නේවාසික ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා රුපියල් මිලියන 42 ක් වැයකර තෙමහල් ගොඩනැගිල්ලක් ද ඉදිකිරීමට සැලසුම් කර ඇත. තවද, මෙම විද්‍යාලයේ ප්‍රධාන පරිපාලන කාර්යාල ගොඩනැගිල්ලක් නොමැති බැවින් කාර්යාල පහසුකම් සැපයීම සඳහා තෙමහල් පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 523.46 ක වැය කර ඉදිකිරීමට ද යෝජනා කර තිබේ. එමගින් ප්‍රධාන කාර්යාල පහසුකම් සැපයීමට හැකියාව ලැබෙන අතර මෙම විද්‍යාලයට පැමිණෙන විදේශ දූත පිරිස් වෙනුවෙන් දේශන සහ සාකච්ඡා ශාලා පහසුකම් සැපයීමට ද හැකියාව ලැබේ. තවද, මෙම විද්‍යාලය සියලුම පහසුකම් සහිත ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුම් කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 89.32 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. ඒමගින් මෙම විද්‍යාලයේ කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍ය නිලධාරීන්ගේ කායික මානසික සංවර්ධනය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

# 22. ආරක්ෂක සේවා විද්‍යාලය

## 22.1 සමාලෝචනය

ත්‍රිවිධ හමුදා හා පොලිස් දෙපාර්තමේන්තු සමාජිකයින්ගේ දරු දැරියන් හට ජනප්‍රිය පාසල් ලබා දීම පිළිබඳ පැනනැගී ඇති අසීරුතාවයන් මගහරවා ගැනීම හා ඔවුන් සඳහා උසස් තත්ත්වයේ අධ්‍යාපනික අවස්ථාවක් ලබා දීම අරමුණු කරගෙන 2007 ජනවාරි 17 දින මැලේ විදිය කොළඹ 02 හි කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය ආරම්භ කර ඇත. තවද ආරක්ෂක සේවා පාසල් සංකල්පයට අනුව දිවයිනේ සියලුම පළාත් ආවරණය වන පරිදි ආරක්ෂක සේවා විද්‍යාල පද්ධතියක් ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යාම පිළිබඳව ලබා ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මේ වන විට කොළඹ ආරක්ෂක විද්‍යාලය හා කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. මෙම විද්‍යාලයෙහි අධ්‍යාපනයට අදාළ සියලුම වගකීම් අධ්‍යාපන නිලධාරීන් විසින් ද පරිපාලනය හා යටිතල පහසුකම් සංවර්ධනයේ අදාළ වගකීම් ආරක්ෂක නිලධාරීන් විසින් ද දරනු ලැබේ.

## 22.2 2018 වර්ෂයේ කාර්යසාධනය

➢ ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ

වර්ෂ 2007 ජනවාරි මස 17 වන දින ආරම්භ කර රජයේ ජාතික පාසලක් වශයෙන් පවත්වා ගෙන යනු ලබන අතර මේ වනවිට විද්‍යාලයේ සිසු සිසුවියන් 3428 ක් පමණ අධ්‍යාපනය හදාරනු ලබයි. තවද, මෙම විද්‍යාලය සිසු සිසුවියන්ගේ අධ්‍යයන කටයුතු වලට අමතරව බාහිර ක්‍රියාකාරකම් හා දක්ෂතාවයන් ඉහළ නැංවීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපන නිලධාරීන් හා ආරක්ෂක අමාත්‍යාංශයෙහි මග පෙන්වීම යටතෙහි පවත්වා ගෙන යනු ලැබේ





➢ කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස

2009 ජනවාරිමස 29 වන දින ආරම්භ කරන ලද මෙම පාසල වයඹ පළාත් අධ්‍යාපන නිලධාරීන් යටතේ මිශ්‍ර පාසලක් වශයෙන් පවත්වාගෙන යනු ලබන අතර මේ වනවිට 11 වන ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන් 1415 ක ගෙන් යුතුව පවත්වාගෙන යනු ලැබේ.




### ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්ට අදාලව 2018 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් පරිදි මූල්‍ය ප්‍රතිපාදන වෙන්ව ඇති අතර ඊට අදාලව 2018 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| අනු අං | සංවර්ධන ව්‍යාපෘතීන් | මුදල් ප්‍රතිපාදන (රු. මිලියන) | 22018.12.31 වන දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | අක්මුදල් ලැබීම් (රු. මිලියන) | වියදම (රු. මිලියන) |
| 01 | නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම - කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය<br>සූර්ය බල විදුලි පද්ධතියක් සවිකිරීම - කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය<br>පොදු පහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම - කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය | 369 | 93.03 | 93.03 (බිල්පත්/ටෙන්ඩර්පත් පිරිනමා ඇති මුදල - රු. මිලියන 100.1) |

22.1 වගුව : ආයතනයේ මූල්‍ය ප්‍රගතිය - 2018 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රාග්ධන වියදම්

### ආයතනයේ ප්‍රගතිය

➢ ආයතනයේ සාමාන්‍ය කටයුතුවල ප්‍රගතිය


කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි පරිපාලනය, යටිතල පහසුකම්, සංවර්ධන හා නඩත්තු කටයුතු ආරක්ෂක රාජ්‍ය නිලධාරීන් යටතේ ස්ථාපිත විද්‍යාලයීය පරිපාලන අංශය මඟින් සිදු කරනු ලබන අතර, ඊට අදාලව පහත ඡේදය යටතේ දක්වා ඇති යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබයි

➢ කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයීය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම

කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය වෙත දුරබැහැර ප්‍රදේශ වලින් පැමිණ අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබන සිසු දරු දැරියන් හට වඩාත් ආරක්ෂාකාරී , සෞඛ්‍ය සම්පන්න හා උසස් තත්ත්වයේ නවීන පහසුකම් සහිතව අධ්‍යාපන කටයුතු හා පෞර්ෂ වර්ධනයට අදාල බාහිර ක්‍රියාකාරම් බාධාවකින් තොරව කරගෙන යෑම වෙනුවෙන් අවශ්‍ය නේවාසිකාගාර පහසුකම් ලබා දීම අරමුණු කර ගෙන එම නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ඒ අනුව රු. මිලියන 448.1 ක (ශ්‍රම කුලිය රහිතව) සිව් මහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ලබා දී ඇති අමප/14/1078/503/098 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇත.

| අනු අංකය | විස්තරය | ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන ආයතනය | 2018.12.31 වන දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍යමය |
| 01 | නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම | 6 (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 77% | රු. මිලියන 53.63 (බිල්පත්/ටෙන්ඩර්පත් පිරිනමා ඇති ප්‍රමාණය - රු. මිලියන 21.8) |

22.2 වගුව : කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලීය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රගතිය





➢ කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා සූර්ය බල විදුලි පද්ධතිය ස්ථාපනය කිරීම


කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා මාසිකව වැයවන විදුලි බිල්පත් වියදම් අවම කර ගැනීම හා පරිසර හිතකාමී දීර්ඝකාලීන ආර්ථිකමය ප්‍රතිලාභ සහිත විකල්ප බලශක්ති පද්ධතියක් ස්ථාපනය කර ගැනීම වෙනුවෙන් ලබා දී ඇති අමප/16/1993/703/080 හා 2016 ඔක්තෝම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව රු. මිලියන 30 ක මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් සැපයුම්කරුවෙකු තෝරාගැනීම සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇති අතර, 2019 වර්ෂය තුළ අදාල ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතය.

➢ කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස වෙනුවෙන් නව පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස වෙනුවෙන් පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාලව ලබාදී ඇති අමප/17/1118/703/048 හා 2017 ජුනි මස 21 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 2018 වර්ෂ අවසානය වන විට ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් වලින් 13% ක් පමණ නිම කර ඇති අතර, සම්පූර්ණ ව්‍යාපෘතිය 2019 වර්ෂය අවසානයට ප්‍රථම නිමකිරීමට අපේක්ෂිතය.

| අනු අංකය | විස්තරය | ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන ආයතනය | 2018.12.31 වන දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍යමය |
| 01 | නව පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා නාවික හමුදාව | 13% | රු. මිලියන 39.4 (බිල්පත් / ටෙන්ඩර්පත් පිරිනමා ඇති ප්‍රමාණය රු. මිලියන 57) |

22.3 වගුව : කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස වෙනුවෙන් නව පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය







## 22.3 අනාගත අපේක්ෂා

2019 වර්ෂය වෙනුවෙන් කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්ට අදාලව පහත දැක්වෙන සංවර්ධන ව්‍යාපෘතීන් වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිතය.

| අනු අංකය | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලීය නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ නිම කිරීම සහ නේවාසිකාගාරය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිළදී ගැනීම |
| 02 | කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා සූර්ය බල විදුලි පද්ධතියක් සවිකිරීම |
| 03 | කුරුණෑගල ආරක්ෂක සේවා විරු දරු විදු පියස වෙනුවෙන් නව පොදු පහසුකම් සහිත ගොඩනැගිල්ලෙහි වැඩ නිමකිරීම |

22.4 වගුව : 2019 වර්ෂට අදාල අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන්